**273 වන කාණ්ඩය - 13 වන කලාපය**
தொகுதி 273 - இல. 13
**Volume 273 - No. 13**

**2019 අගෝස්තු 22වන බ්‍රහස්පතින්දා**
2019 ஓகஸ்ட் 22 , வியாழக்கிழமை
**Thursday, 22nd August, 2019**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද:**

2019 අගෝස්තු 22 වන දින "ඩේලි නිවුස්" වාර්තාව

මහජන **බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**

වතු පාසල්වල දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ ගණිත සහ විද්‍යා විෂය ඉගැන්වීමේ පහසුකම්


---

# பிரதான உள்ளடக்கம்


**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமை:**

2019 ஓகஸ்ட் 22ஆம் திகதிய 'டெய்லி நியூஸ்' அறிக்கை

**மக்கள் வங்கி (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம் முறை மதிப்பிடப்பட்டது - விவாதம் ஒத்திவைக்கப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

பெருந்தோட்டப் பாடசாலைகளில் தமிழ்மொழிமூலம் உயர்தர கணித, விஞ்ஞானப் பாடங்களைக் கற்பிப்பதற்கான வசதிகள்


---

# PRINCIPAL CONTENTS


SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE:

"Daily News" Report of 22nd August, 2019

PEOPLE'S BANK (AMENDMENT) BILL:

Second Reading - Debate Adjourned

ADJOURNMENT MOTION:

Facilities for Teaching Advanced Level Maths and Science Subjects in Tamil Medium in Estate Schools

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019 අගෝස්තු 22වන බ්‍රහස්පතින්දා***
*2019 ஓகஸ்ட் 22 , வியாழக்கிழமை*
*Thursday, 22nd August, 2019*

**පූ.භා.10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J. M. ANANDA KUMARASIRI] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ව්‍යාපාර හා වාණිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, මම ව්‍යාපාර හා වාණිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ නියෝගය;
(ii) 2018 වර්ෂය සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;
(iii) 2012 වර්ෂය සඳහා සීමාසහිත ලංකා සතොස ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ
(iv) 2014 වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැදවච්චිය, රෝහල ඉදිරිපිට පාර, අංක 131/බී දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්.කේ. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය: බදුල්ල දිස්ත්‍රික්කය
### 500 கிராமிய பாலங்கள் கருத்திட்டம்: பதுளை மாவட்டம்
### RURAL BRIDGES PROJECT: BADULLA DISTRICT

54/'18

**1.** **ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) එවකට පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ආරම්භ කරන ලද ග්‍රාමීය පාලම් 500 ව්‍යාපෘතිය නමින් ව්‍යාපෘතියක් දැනට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයෙන් තෝරාගෙන ඇති පාලම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ දැනට අබලන් වී ඇති අනෙකුත් පාලම් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அப்போதைய மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சின் கீழ் ஆரம்பிக்கப்பட்ட 500 கிராமிய பாலங்கள் கருத்திட்டம் என்ற பெயரில் கருத்திட்டமொன்று தற்பொழுது நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றதா என்பதையும்;

(ii) ஆமெனின், இக்கருத்திட்டத்தின் நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்திற்காக பதுளை மாவட்டத்திலிருந்து தெரிவு செய்யப்பட்டுள்ள பாலங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(iv) பதுளை மாவட்டத்தில் தற்சமயம் பழுதடைந்துள்ள ஏனைய பாலங்களை அபிவிருத்தி செய்வதற்கு அமைச்சிடம் உள்ள வேலைத்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether a project by the name of "500 Rural Bridges Project", which was initiated under the then Ministry of Provincial Councils, Local Government and Sports, is implemented at present;

(ii) if so, the objectives of the said project;

(iii) the number and the names of the bridges selected for this project from the District of Badulla; and

(iv) the programme in existence with the Ministry regarding the development of the other bridges in a dilapidated status in the District of Badulla?

(b) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් පාලම් 500ක් ඉදිකිරීමේ සැලැස්මක් ඉදිරිපත් කර නැත. එනමුදු දැනටමත් මෙම අමාත්‍යාංශ විසින් සමස්ත දිවයිනම ආවරණ වන පරිදි ක්‍රියාත්මක වන ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය පාලම් 1,318ක් ඉදිකර අවසන් කර ඇති අතර මහජන අයිතිය සඳහා ද පවරා දී ඇත.

(ii) මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ අරමුණු වන්නේ,

රටේ ජාතික ආර්ථික වර්ධනය අරමුණු කර ගනිමින් ජනතාවගේ සංචලනය සහ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම.

ග්‍රාමීය ජනතාවගේ පොදු සුරක්ෂිත බව වර්ධනය කිරීම.

ග්‍රාමීය ප්‍රදේශවල මෙතෙක් භාවිතයට නොගත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම මෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් නව නිෂ්පාදන අවස්ථා සඳහා ඔවුන්ගේ දේශීය දැනුම භාවිතයට ගැනීම.

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩ අවසන් කර ඇති පාලම් සංඛ්‍යාව 89කි. ඇමුණුම 01 බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) බදුල්ල දිස්ත්‍රික්කය සඳහා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති පාලම් සංඛ්‍යාව 18කි. ඇමුණුම 02 බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

තවද, එක්සත් රාජධානි ණය ආධාර මත ග්‍රාමීය පාලම් 175ක් හා නෙදර්ලන්ත ණය ආධාර මත ග්‍රාමීය පාලම් 200ක් ඉදිකිරීම සඳහා පිළිවෙළින් 2019.02.27 හා 2019.02.22 යන දිනවලදී කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර ඇත. එසේම හංගේරියානු ණය ආධාර මත පාලම් 100ක්, බෙල්ජියම් ණය ආධාර මත පාලම් 60ක් හා ඔස්ට්‍රියානු ණය ආධාර මත පාලම් 04ක් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම ව්‍යාපෘතියක් නැහැ කියලා අපේ ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් වුණා. මා දන්නා තරමින් හිටපු අමාත්‍ය ෆයිසර් මුස්තාපා මැතිතුමාගේ කාලයේ මගේ මැතිවරණ කොට්ඨාසයටත් පාලම් 12ක් ලැබුණා. ඒ පාලම් දොළහේ වැඩ මම මේ වනකොට අවසන් කරලා තිබෙනවා. නමේ තිබෙන ප්‍රශ්නයක් නිසා මෙහෙම ව්‍යාපෘතියක් නැහැ කියලා එතුමා කිව්වාද දන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය දැනගන්න අවශ්‍යයි. ෆයිසර් මුස්තාපා මැතිතුමා, ඇමතිතුමා වශයෙන් හිටපු කාලයේ මගේ මැතිවරණ කොට්ඨාසයට පාලම් 12ක් ලැබුණා. ඔබතුමාට ඒ අමාත්‍ය ධුරය ලැබුණාට පස්සේ මේ ව්‍යාපෘතිය දිගටම ක්‍රියාත්මක වනවා කියලා හිතලා මිනිස්සු ඉල්ලීම් කළා. නමුත් තවම අපට ඒ ව්‍යාපෘති ලැබිලා නැහැ. ඒ ව්‍යාපෘතිය නතර වෙලාද, නැත්නම් මේ වෙනුවෙන් වෙන් වූ මුදල් අවසන් වෙලාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් තිබුණු ගිවිසුම් අවසන් වෙලා තිබෙනවා. ඒ අනුව නව ගිවිසුම් දෙකක් ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කරලා තිබුණා. ඒ අනුව, 2019.02.22 හා 2019.02.27 කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. ඒ සම්බන්ධ කටයුතු දැන් සිදු වෙමින් පවතිනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදුල්ල දිස්ත්‍රික්කය සම්බන්ධ නිසා අපේ චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඇමතිතුමාගෙන් අහන්න ඕනෑ කාරණය මෙයයි. ජාතික ආණ්ඩුව තුළ මේ අමාත්‍යාංශයට දීර්ඝ කාලයක් සම්බන්ධ වෙලා හිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරු. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරයා වෙලා හිටියත් අපේ දිස්ත්‍රික්කයට පාලම් ලබා දෙන්න කටයුතු කළා. ඒ පාලම් ඉදිකිරීමේ වැඩසටහන සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයට දැවැන්ත මුදලක් ලැබිලා තිබෙන බව අපි දන්නවා. නමුත් ඒක එක දිස්ත්‍රික්කයකට සීමා වෙච්ච, ඒ දිස්ත්‍රික්කය තුළ පාලම් හදන ව්‍යාපෘතියක් හැටියට තමයි ක්‍රියාත්මක වෙන්නේ, ගරු ඇමතිතුමා. ඒ නිසා කනගාටුවෙන් හෝ මේ කාරණා මම කියන්න ඕනෑ.

අපි ඔබතුමන්ලාට අවස්ථා ගණනාවකදීම කරුණු කිව්වා. අපේ දිස්ත්‍රික්කයේ ඉතාම දුෂ්කර ප්‍රදේශවල පාලම් ප්‍රශ්නය තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනකු ඇමතිවරයා හැටියට සිටි කාලයේ අර්බුද තිබියදීත්, ප්‍රශ්න තිබියදීත් අපේ ජනතාවගේ අවශ්‍යතා වෙලා තිබුණු පාලම් ව්‍යාපෘති අපට ලැබුණා. නමුත්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඇමතිවරයා හැටියට ඔබතුමාට අදවත්, දැන්වත් කියන්න පුළුවන්කමක් තිබෙනවාද, ඒ පාලම් ව්‍යාපෘති ප්‍රමාණය දිස්ත්‍රික්ක වශයෙන් දෙනවාද කියලා? ප්‍රශ්න තිබියදීත් පසුගිය කාලයේ ඇමතිවරයා ඇවිල්ලා මුල් ගලක් තියලා ගියා. නමුත්, ගරු ඇමතිතුමනි, අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, ඔබතුමාටත් අප දිගින් දිගටම කරුණු කීවත් පලක් වුණේ නැහැ. ඒ ඉදි කිරීම් සීමා වෙලා තිබෙන්නේ එක්තරා දිස්ත්‍රික්කයකටයි කියන කාරණය අද රටටම ප්‍රශ්නයක්. ගරු අමාත්‍යතුමනි, අපට තිබෙන ප්‍රශ්නය මේකයි. ඉදිරියට මේ ආණ්ඩුව තුළ ඉන්නවාද නැද්ද, ඉදිරියේදී සහයෝගය දෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය තුළ අපි අදටත් ඉන්නවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් අහන්නේ, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් වන අපේ ප්‍රදේශවලටත් එක පාලමක් හෝ දෙන්න පුළුවන් හයියක් ගරු අමාත්‍යතුමා හැටියට ඔබතුමාට තිබෙනවාද කියලායි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්, පසුගිය පාලන සමයේම විශේෂ අවධානයක් යොමු කරලා තිබුණේ උතුර සහ නැඟෙනහිර ප්‍රදේශ සඳහායි. ඒක වරදක් නොවෙයි. ඕනෑ නම් මට ඒ කරුණු වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්න පුළුවන්කම තිබෙනවා. මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව, ත්‍රිකුණාමලය, මඩකලපුව, යාපනය, අම්පාර කියන දිස්ත්‍රික්කවලට තමයි සුවිශේෂ අවධානයක් පෙර සිටි ඇමතිතුමා යොමු කරලා තිබුණේ. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඒ කෙසේ වෙතත්, ඔබතුමා සඳහන් කරන පාලම් සංඛ්‍යාව අපට ලබා දුන්නොත්, දැනට අප අත්සන් කර තිබෙන නව ගිවිසුම් දෙක අනුව ඒවාත් එම වැඩ පිළිවෙළට ඇතුළත් කරන්න අපට පුළුවන්.

## රෝහල්වලට ඔක්සිජන් සැපයීම: විස්තර

## வைத்தியசாலைகளுக்கு ஒட்சிசன் வழங்கல்: விபரம்

SUPPLY OF OXYGEN TO HOSPITALS: DETAILS

95/'18

2. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මධ්‍යම රජයට අයත් රෝහල්වලට ඔක්සිජන් වායුව සපයනු ලබන සමාගම් කවරේද;

(ii) ඒ සඳහා මාසිකව වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

(iii) එම සමාගම් විසින් හිඟයකින් තොරව අදාළ සේවාව රෝහල්වලට ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පළාත් සභාවලට අයත් රෝහල්වලට ඔක්සිජන් වායුව සපයනු ලබන සමාගම් කවරේද;

(ii) පළාත් සභාවලට අයත් රෝහල්වලට ඔක්සිජන් වායුව සැපයීම සඳහා මාසිකව වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

(iii) එම මුදල් සෘජුව පළාත් සභා වෙත මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන්නේද;

(iv) ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල කොපමණද;

(v) ඒ සඳහා පළාත් රෝහල්වලට වාර්ෂිකව අවශ්‍ය වන මුදල කොපමණද;

(vi) අදාළ මුදල් නියමිත කාල සීමාව තුළ දී ලැබී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்திய அரசாங்கத்துக்கு சொந்தமான வைத்தியசாலைகளுக்கு ஒட்சிசன் வாயுவை வழங்கும் கம்பனிகள் யாவை;

(ii) இதற்காக மாதாந்தம் செலவிடப்படும் மொத்தப் பணத்தொகை யாது;

(iii) அக்கம்பனிகள் பற்றாக்குறையின்றி குறிப்பிட்ட சேவையினை வைத்தியசாலைகளுக்கு வழங்குகின்றனவா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மாகாண சபைகளுக்குச் சொந்தமான வைத்தியசாலைகளுக்கு ஒட்சிசன் வாயுவை வழங்கும் கம்பனிகள் யாவை;

(ii) மாகாண சபைகளுக்குச் சொந்தமான வைத்தியசாலைகளுக்கு ஒட்சிசன் வாயுவை வழங்குவதற்காக மாதாந்தம் செலவிடப்படும் மொத்தப் பணத்தொகை யாது;

(iii) இப்பணத் தொகை பொதுத் திறைசேரியினால் நேரடியாக மாகாணசபைக்கு வழங்கப்படுகின்றதா;

(iv) இதற்காக பொதுத் திறைசேரியினால் வருடாந்தம் ஒதுக்கீடு செய்யப்படும் பணத்தொகை யாது;

(v) இதற்காக மாகாண வைத்தியசாலைகளுக்கு வருடாந்தம் தேவைப்படும் பணத்தொகை யாது;

(vi) குறிப்பிட்ட பணத்தொகை உரிய காலப்பகுதியில் கிடைக்கப்பெற்றுள்ளதா;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) the companies that supply oxygen to hospitals of the Central Government;

(ii) the total amount of money spent on that monthly; and

(iii) whether these companies provide the relevant service to hospitals without any shortage?

(b) Will he state-

(i) the companies that supply oxygen to hospitals of the provincial councils;

(ii) the total amount of money spent for the supply of oxygen to hospitals of the provincial councils;

(iii) whether those monies are directly disbursed to the provincial councils by the General Treasury;

(iv) the amount of money allocated by the General Treasury for that purpose annually;

(v) the amount of money required by the hospitals of the provincial councils for that purpose annually; and

(vi) whether the relevant funds have been received in stipulated time?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ගෑස් වර්ල්ඩ් (පුද්) සමාගම
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ්

(ii) රුපියල් මිලියන 61ක් පමණ වේ.

(iii) ඔව්.

(ආ) (i) ගෑස් වර්ල්ඩ් (පුද්) සමාගම.
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ්.

(ii) රුපියල් මිලියන 22ක් පමණ වේ.

(iii) නැත. වෛද්‍ය සැපයීම් අංශය මඟින් ප්‍රතිපූර්ණය කරනු ලබයි.

(iv) වාර්ෂිකව බිලියන 50ක් පමණ වෛද්‍ය සැපයීම් අංශය වෙත වෛද්‍ය සැපයීම් සඳහා වෙන් කරනු ලබන අතර, එම මුදලින් කොටසක් ඔක්සිජන් වායුව සැපයීම සඳහා යොදවනු ලබයි.

(v) රුපියල් මිලියන 266ක් පමණ වේ.

(vi) ප්‍රමාදවීම් සිදු වුවද ආදළ මුදල් ලැබී ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය ඇහුවේ පළාත් සෞඛ්‍ය නිලධාරින්ගේ සමුළුවකදී මේ සම්බන්ධව විශේෂයෙන්ම සාකච්ඡා වුණු නිසා. පළාත් සහ යටතේ තිබෙන රෝහල්වලට ඔක්සිජන් සැපයීම සම්බන්ධව කෝටි 50ක් විතර හිඟයක් ඒ සැපයුම්කරුවන්ට තියෙන බව දැන ගන්න ලැබුණා. ඒ නිසා දැන් ඒ පළාත් රෝහල්වලට ඔක්සිජන් සැපයීම විශාල ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. මේක ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. මුදල් එන ප්‍රමාණයත් එක්ක නේ ආපසු ගෙවන්න වෙන්නේ. ගරු ඇමතිතුමනි, දැන් ඒ වාගේ තත්ත්වයක් තිබෙනවා. අපි කෝප් කමිටුවේදීත් මේ ගැන කථා කළා. සමහර වෙලාවට ඖෂධ හිඟයක් ඇති කරන තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. ඒක මේ හදිසි මිලදී ගැනීම්වලට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ඇතුළතින් සකස් කරන වැඩ පිළිවෙළක් බවට පත් වෙලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, අද ඇදුම රෝගයට දෙන hydrocortisone කියන බෙහෙත සහ ක්ෂය රෝගය සඳහා දිනපතා ගන්න බෙහෙත්වලින් එක බෙහෙතක් දැන් ලංකාවේම නැහැ. ඔබතුමා දන්නවා, ඒ රෝගයට බෙහෙත් තුනක් හතරක් ගන්නා බව. ඒ බෙහෙත් හතරෙන් එක බෙහෙතක් අද ලංකාවේ නැහැ. මට ඒ බෙහෙතේ නම මතක නැහැ. පසුව මම ඒ බෙහෙතේ නම කියන්නම්. ඒ නිසා අර අනෙක් බෙහෙත් තුන ගත්තාට හරියන්නේත් නැහැ. මොකද, නැවත වෙන වෙන ප්‍රශ්න ඇති වෙන්න පුළුවන් නිසා. ඒ වාගේම ඇස්ප්‍රින් ලක්ෂයක් ඉල්ලුවාම දෙන්නේ 5,000යි. මේ වාගේ ප්‍රශ්නයකුත් තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ කාරණයත් එක්ක ඇතිවෙලා තිබෙන ගැටලු විසඳීම සඳහා ඔබතුමාට යම් ක්‍රියාමාර්ගයක් තිබෙනවාද කියලා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පැහැදිලිවම ඒ සඳහා පියවර අරගෙන තිබෙනවා. සමහර වෙලාවට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීම අඩු වෙනකොට ප්‍රසම්පාදනයේදී මෙවැනි යම් යම් ප්‍රශ්න ඇති වෙනවා. නමුත්, සම්පූර්ණයෙන්ම අපි එවැනි හිඟයක් නැතිව කරගෙන යනවා. සමහර වෙලාවට එම තොග ලැබීමේදී නොයෙකුත් ප්‍රමාද දෝෂ ඇති වෙනවා. සමහර අවස්ථාවල -ඊයේ- මට කියනවා, මේ බෙහෙත නැහැ කියලා. MSD එකෙන් අහලා බලනකොට, අද airlift කරනවා කියලා කියනවා. එතැන ඉඳලා supply කරනවා. එහෙම තමයි වෙන්නේ. ඒ හැර ඔය කියනවා වාගේ විශාල හිඟයක් නැහැ. එම ඖෂධ දෙක පිළිබඳව සොයා බලා මම ඔබතුමාට දන්වන්නම්.

ඒ වාගේම ඔක්සිජන් සඳහා මට දන්වලා තිබෙන්නේ, "ප්‍රමාදවීම් සිදු වුවද, අදාළ මුදල් ලැබී ඇත" කියලා ඒ ගැනත් මම ඔබතුමාට කියන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ සඳහා ක්‍රමවේදයක් තිබුණා නම් හොඳයි. අපි COPE එකේදීත් ඒ ගොල්ලන්ට යෝජනා කළේ, ක්‍රමවේදයක් check කරන්න කියන එකයි. [බාධා කිරීමක්] මම ප්‍රශ්නය අහලා ඉන්නම්. නැත්නම්, මූලාසනයෙන් මට ඉඩ දෙන්නේ නැහැ.

මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. වෛද්‍යවරු අදත් වැඩ වර්ජනයක් පටන් අරගෙන තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතිය ගැසට් කරන්නේ කවදාද කියලා. ඒ කාලයේ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේත් මෙය ගැසට් කළා. නමුත්, ක්‍රියාත්මක වුණේ නැහැ. වෛද්‍ය අධ්‍යාපනය සඳහා වන අවම ප්‍රමිතිය ගැසට් කරන්නේ කවදාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. එහෙම නැත්නම් "S" තුනේ ප්‍රශ්නය දිගින් දිගටම බලපානවා. එම නිසා මේ ප්‍රශ්නය අවසන් කරන්නේ කවදාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක ගැසට් කරන්න යවලා තිබෙන්නේ. වෛද්‍ය නිලධාරින්ගේ සංගමය දන්නවා, ඒක ගැසට් එකට යැව්වා කියලා. ඒ නිසා තමයි strike කරන්නේ. ඊට පස්සේ කියනවා, අපේ strike එක නිසා තමයි හම්බ වුණේ කියලා. ඒවා වෘත්තීය සමිති ක්‍රියාත්මක කරන පැරණි ක්‍රම.

## උමා ඔය සංවර්ධන ව්‍යාපෘතියෙන් පීඩාවට පත් ජනතාව: සහන
### உமா ஓயா அபிவிருத்திக் கருத்திட்டத்தினால் பாதிக்கப்பட்ட மக்கள்: நிவாரணம்
### PEOPLE AFFECTED BY UMA-OYA DEVELOPMENT PROJECT: RELIEF

155/'18

**3. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් නිවාස සහ ව්‍යාපාරික ස්ථානවලට හානි සිදුවීමෙන් පීඩාවට පත්ව සිටින ජනතාවට අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ගැනෙන කරුණු සම්බන්ධයෙන් සහන ලබා දීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) உமா ஓயா அபிவிருத்திக் கருத்திட்டம் காரணமாக வீடுகளுக்கும் தொழில்முயற்சி இடங்களுக்கும் சேதமேற்பட்டமையால் பாதிக்கப்பட்டுள்ள மக்களுக்கு உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் கீழ் வருகின்ற விடயங்கள் சம்பந்தமாக நிவாரணங்களை வழங்குவதற்காக அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House of the measures that will be taken by the Ministry of Internal and Home Affairs and Provincial Councils and Local Government to provide relief to the issues faced by the people due to the damages caused to their houses and business entities following the Uma-Oya development project, falling under the purview of the Ministry?

(b) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කර ඇත්තේ එම ව්‍යාපෘතිය අයත් වන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ය. මෙම සහන කටයුතු සැලසීම සම්බන්ධයෙන් 2017.07.10 දින බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති විශේෂ රැස්වීමේදී ගන්නා ලද තීරණයක් අනුව මේ සඳහා සෘජු මැදිහත්වීම දිස්ත්‍රික් ලේකම් වෙත පවරා ඇත. 2017.07.18 දිනැති හා අමප/17/1553/704/025 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කර ඇත.

මූලික තොරතුරු - 2019.07.17 දිනට,

| | |
|---|---|
| හානියට පත් නිවාස සංඛ්‍යාව | 9,036 |
| තක්සේරුවට යොමු කර ඇති සංඛ්‍යාව | 8,626 |
| තක්සේරු කර ඇති නිවාස සංඛ්‍යාව | 8,385 |
| ලැබී ඇති තක්සේරුවෙන්, හානි නොවූ නිවාස අඩු කිරීම | (375) |
| ගෙවීම් කිරීමට සුදුසු තක්සේරු වාර්තා සංඛ්‍යාව | 8,010 |

[ගරු වජිර අබේවර්ධන මහතා]

මෙම හානි අතරින්,

වන්දි ගෙවන ලද සංඛ්‍යාව - පූර්ණ වන්දි - 172

ප්‍රතිසංස්කරණ වන්දි - 7,047

එකතුව - 7,219

මෙම නිවාස 7,219 සඳහා රුපියල් මිලියන 1,044.2 වන්දි ගෙවීම් සිදු කර ඇත. ඇමුණුමෙහි සඳහන් කර ඇත. අමුණුම **සභාගත*** කරමි.

එමෙන්ම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ව්‍යාපෘතිය අයත් ෆරාබ් සමාගම වෙතින් නිවාස 348ක් සඳහා රුපියල් මිලියන 42.1ක් නිවාස කුලිය ලෙස ගෙවා ඇත.

අංක අමප/17/1553/704/025 හා 2017.07.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එකී අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි කඩිනමින් ඉටු කළ යුතු අනුඅංක 21ක් යටතේ වන ක්‍රියාකාරකම් සඳහන් කර ඇති අතර ඒවා පහත පරිදි වේ.

| නිර්දේශ අංකය | විස්තරය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | විශාල ප්‍රමාණයේ භූගත ළිං හයක් (6)ක් ඉදි කිරීම | මහජනතාවගෙන් එල්ල වූ දැඩි විරෝධය හමුවේ මහවැලි සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.07.31 දින පැවති රැස්වීමකදී නල ළිං ඉදි කිරීම නතර කරන ලදී. |
| 02 | ජල ටැංකි සපයා නොමැති පවුල් ඒකක සඳහා පානීය ජල ටැංකි බෙදා දීම | ජලය ගබඩා කර සැපයීමටද හැකි වන පරිදි ලීටර් 10,000 ප්‍රමාණයේ ටැංකිද ඇතුළත්ව ජල ටැංකි 6792ක් මිලදී ගෙන නිවාස ඒකක අතරේ බෙදා දී ඇත. |
| 03 | ජලය බෙදා හැරීම සඳහා ජල බවුසර් 20ක් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ලබා දීම | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ජල බවුසර් 21ක් ලබා දුන් අතර එම බවුසර් මඟින් පීඩාවට පත් පිරිස් වෙත මාස 6කට අධික කාලයක් ජලය සැපයීම සිදු කිරීමෙන් පසු එම ජල බවුසර් සපයන ලද ආයතන වෙත නැවත භාර දී ඇත. |
| 04 | යෝග්‍ය වන්දි ගෙවීමේ ක්‍රියාවලියක් සඳහා අමතර කාර්ය මණ්ඩලයක් මඟින් තක්සේරු කටයුතු සිදු කිරීම | • වෙනත් දිස්ත්‍රික්කවලින් අමතර කාර්ය මණ්ඩලයක් ගෙන්වාගෙන නිවාස 9036ක් පිළිබඳ තක්සේරු කටයුතු සිදු කර ඇත.<br>• තවදුරටත් නිවාස 241ක තක්සේරු වාර්තා ලැබීමට නියමිතය.<br>• හානියට පත් නිවාස 9036 අතරින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් පදිංචියට නොසුදුසු බවට ලබා දුන් වාර්තා මත නිවාස 244ක් සම්බන්ධයෙන් නැවත වරක් එම ආයතනයේ විශේෂ කණ්ඩායමක් මඟින් එම නිවාස පරීක්ෂා කර වාර්තා යොමු කර ඇත.<br>• නිවාස 244න් නිවාස 160ක් සඳහා පූර්ණ තක්සේරුව ලබා දිය යුතු බවට නිර්දේශ කිරීම මත එම නිවාස තක්සේරුව මේ දිනවල සිදු වෙමින් පවතී.<br>• එම නිවාස 244ට අමතරව, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවාගෙන තිබූ වන්දි කඩිනම් කිරීමේ කමිටු විසින් හඳුනාගත් තවත් නිවාස 166ක් සම්බන්ධයෙන් උමා ඔය ව්‍යාපෘති ඉංජිනේරු කණ්ඩායමක් විසින් ව්‍යුහාත්මක පරීක්ෂාවක් සිදු කළ අතර, එහිදී නිවාස 23ක් පූර්ණ හානි වූ නිවාස වශයෙන් හඳුනාගත් අතර එම නිවාස සම්බන්ධ පූර්ණ තක්සේරුව ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. |
| 05 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ඒකකයක් බණ්ඩාරවෙල ස්ථාපිත කිරීම | අවශ්‍ය අවස්ථාවලදී සහය දීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ බදුල්ල කාර්යාලයේ නිලධාරීන් සූදානමින් සිටින අතර ඒ සඳහා සහය අවශ්‍ය වූ විට සහය ලබා ගත හැක. |
| 06 | බර වාහන ගමන් කිරීම නිසා අබලන් වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | • ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා රුපියල් මිලියන 208ක් වැය කර මාර්ග 7ක කාපට් අතුරා ඇත.<br>• පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් මාර්ග 41ක් ප්‍රතිසංස්කරණය කර ඇත. |
| 07 | වන්දි ගෙවීම් කටයුතු සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙතින් වෙන් කරන ලද රුපියල් මිලියන 1,089 කින් 2019.07.15 දිනට රුපියල් මිලියන 922ක් වියදම් දරා ඇත.<br>මීට අමතරව උමා ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ෆරාබ් සමාගම විසින් නිවාස කුලී සහ වන්දි ගෙවීම සඳහා රු.201,549,632.40ක් වියදම් දරා ඇත. |
| 08 | සහන කාර්යාලය සඳහා අමතර කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීම | අවශ්‍ය අමතර කාර්ය මණ්ඩලය ඌව පළාත් ප්‍රධාන ලේකම් විසින් ලබා දී ඇති අතර 2018.12.31 දිනෙන් සහන කාර්යාලයේ කාර්ය භාරය අවසන් කර ඇත. |
| 09 | ප්‍රගති සමාලෝචන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම | • මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන්ද<br>• දෙසති ප්‍රගති සමාලෝචන රැස්වීම් දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන්ද<br>සංවිධානය වේ.<br>• අවසන් වරට දෙසති ප්‍රගති සමාලෝචන රැස්වීම 2019.05.02 දින පවත්වන ලදී.<br>• ජාතික මට්ටමේ රැස්වීමක් 2019.06.10 දින පවත්වන ලදී.<br>• 2019.07.15 දින පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ද මේ පිළිබඳව සාකච්ඡා කරන ලදී. |
| 10 | යෝජිත බණ්ඩාරවෙල විසල් ජල යෝජනා ක්‍රමය කඩිනමින් ආරම්භ කිරීම | • මේ වන විට එම ජල ව්‍යාපෘතියේ ජල තුළු මහ ඉදි කිරීම සඳහා මුල් ගල තබා ඇත.<br>• එහි ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය 15%ක මට්ටමේ පවතී. |
| 11 | බලපෑමට ලක් වූ ප්‍රදේශවල කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම | යෝජිත වැව් 7න් වැව් 3ක වැඩ කොටස් අවසන් කර ඇත. |
| 12 | නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා ඉඩමක් ලබාගෙන අදාළ පවුල් වෙත භුක්තිය බාර දීම වශයෙන් නම් කර ඇත | නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා බණ්ඩාරවෙල, කිතල්ඇල්ල පාරේ පිහිටි කිනලන්වත්ත ඉඩමෙන් අක්කර 03ක්ද බණ්ඩාරවෙල, කිතල්ඇල්ල පාරේ අම්පිටිය හංදිය අසල අක්කර 14ක වපසරියකින් යුත් දික්අරාව වත්ත ඉඩමද අත්පත් කර ගැනීමේ කටයුතු මේ වන විට අමාත්‍යාංශ මට්ටමින් සිදු කරමින් පවතී. |
| 13 | බලපෑමට ලක් වූ ප්‍රදේශවල පාසල් ප්‍රතිසංස්කරණය කිරීම | ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා බලපෑමට ලක් වූ ප්‍රදේශවල පාසල් 20ක් ප්‍රතිසංස්කරණය කර ඇත. |
| 14 | බලපෑමට ලක් වූ පවුල් විසින් බැංකු වෙතින් ලබාගෙන ඇති ණය සඳහා වසර දෙකක සහන කාලයක් ලබා දීම | බැංකු ආයතන ගෙන්වා සාකච්ඡා කළද ඔවුන් විසින් ප්‍රකාශ කර ඇත්තේ මේ පිළිබඳ ජාතික මට්ටමින් අදාළ බැංකු වෙත උපදෙස් ලබා දිය යුතු බවයි. |
| 15 | බලපෑමට ලක් වූ ප්‍රදේශවල රාජකාරි ආවරණය කිරීම වෙනුවෙන් උපරිම වසරක කාලයක් සඳහා ග්‍රාම නිලධාරීන් සඳහා ගමන් වියදම් දීමනා ලබා දීම | අදාළ ගෙවීම් කටයුතු සිදු කර ඇත. |
| 16 | ජල හිඟය අවම කර ගැනීම සඳහා පට්ටිපොල සිට බණ්ඩාරවෙල දක්වා දුම්රියෙන් ජලය රැගෙන ඒම | එක් වරක් ගෙන්වන ලද ජල ටැංකිය, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් සිදු කරන ලද විද්‍යාගාර පරීක්ෂණයේදී එම ජලය පානය කිරීමට නුසුදුසු බව අනාවරණය වූයෙන් දුම්රියෙන් ජලය ගෙන ඒමේ වැඩසටහන නතර කරන ලදී. |
| 17 | වගා හානි සහනාධාර ලබා දෙනු වෙනුවට විකල්ප ආදායම් මාර්ග හඳුන්වා දීම | වගා වන්දි ලබා දීමේ කටයුතු පූර්ණ වශයෙන් ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් සිදු කරනු ලබයි. |
| 18 | උමඟේ ජල කාන්දුව වසා දැමීම සඳහා ජාත්‍යන්තර සහය ලබා ගැනීම | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ඊට අදාළ කටයුතු සිදු කරනු ලබයි. |
| 19 | විද්වත් කමිටුවක් විසින් ලබා දෙන උපදෙස් මත විදුම් කටයුතු සිදු කිරීම | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ඊට අදාළ කටයුතු සිදු කරනු ලබයි. |
| 20 | ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන වැඩපිළිවෙලක් සංවිධානය කිරීම | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ඊට අදාළ කටයුතු සිදු කරනු ලබයි. |
| 21 | හදිසි අවස්ථාවලදී ත්‍රිවිධ හමුදාවේ සහය ලබා ගැනීම | හදිසි අවස්ථාවකදී යොදා ගැනීම සඳහා අදාළ සහන ඒකක සූදානම් කර ඇත. |

මෙම ව්‍යාපෘතිය භාර රේඛීය අමාත්‍යාංශය ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය කටයුතු කරනු ලබන අතර, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ කටයුතු බදුල්ල දිස්ත්‍රික් ලේකම් විසින් සිදු කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම වෙනුවෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මම ඇහුව ප්‍රශ්නය තමයි, උමා ඔය ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාවට ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් යම් මුදලක් දැරුවා ද කියන කාරණය. පිළිතුර වශයෙන් කියනවා, එහෙම නැහැ, ඒ කටයුතු මහවැලි අමාත්‍යාංශයෙන් කෙරෙන්නේ කියලා.

ගරු ඇමතිතුමනි, මේ ව්‍යසනයේ බරපතළකම ඔබතුමා දන්නවා. ඔබතුමා මෙම අමාත්‍යාංශයේ ඇමති ධුරය දරන කාලය තුළ නොවෙයි, මේ පිළිතුර සැපයූ ලේකම්වරු පසුගිය කාලයට සම්බන්ධ පිළිතුර මෙතැනට සපයා නැහැ. මම දන්නා ආකාරයට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඌව පළාත් සභාවට දැවැන්ත මුදලක් යොමු කළා, මේ ප්‍රදේශය ආවරණය වන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා. ඔබතුමා ඒ ගැන සොයා බලන්න. මේ පිළිතුරේ ඒක නැහැ. ගරු ඇමතිතුමනි, මේ ප්‍රදේශයෙන් බැහැරව පළාතේ වෙනත් කොට්ඨාස, උමා ඔය නිසා පීඩාවට පත් වෙච්ච ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හඳුනා ගෙන ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් ටික හදන්නයි පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මුදල් එව්වේ.

නමුත් එසේ නොකොට ඡන්ද -මනාප- ලබා ගැනීම වෙනුවෙන් මේ තීන්දුවෙන් බැහැරව කටයුතු කළා. මේක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් සාකච්ඡාවට භාජන වූ කාරණයක්. අඹතැන්න කියන ග්‍රාමය මේ කටයුතුවලට සම්බන්ධ වෙලා නැහැ. ඒ ප්‍රදේශවලත්, ඊට එහා ගිය ප්‍රදේශවලත් මේ මුදල් යොදවා කටයුතු කළා. ඒ මුදල් යොදවා කටයුතු කිරීමේදී එම නිලධාරීන් වෙනත් විධියකට කටයුතු කර තිබෙනවා නම්, අමාත්‍යාංශයට ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගන්න පුළුවන්ද, ඒ ගන්නා පියවර කුමක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිතුර ඇතුළේ ඒ කරුණු සඳහන් වනවා. මම ඒ කරුණු කියෙව්වේ නැහැ.

උදාහරණයක් හැටියට බර වාහන ගමන් කිරීම නිසා අබලන් වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම දක්වන්න පුළුවන්. ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා රුපියල් මිලියන 208ක් වැයකර මාර්ග 7ක කාපට් අතුරා ඇත. ඒ වාගේම, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මාර්ග 41ක් ප්‍රතිසංස්කරණය කර ඇත. මේ පිළිතුරේ තවදුරටත් සඳහන් වනවා, බලපෑමට ලක් වූ ප්‍රදේශවල පාසල් ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන්. ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා බලපෑමට ලක්වූ ප්‍රදේශවල පාසල් 20ක් ප්‍රතිසංස්කරණය කර ඇත.

චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට මේ පිළිතුර ලබා දෙන්න මට පුළුවන්. මෙහි දීර්ඝ විස්තරයක් තිබෙනවා. ඔබතුමා මෙය කියවා බලා පළාත් සභාව මඟින් මුදල් ලබා දී ඇති ප්‍රමාණය සහ මුදල් වැයකොට ඇති ප්‍රමාණය පිළිබඳව විග්‍රහයක් මට දුන්නොත්, මට නැවත මේ ගැන පරීක්ෂණයක් කරලා, එහෙම අසාධාරණයක් සිදුවෙලා තිබෙනවා නම්, පළාත් සභාවට කොමිසම හරහා මුදල් යවන්න පුළුවන්. ඒ ගැනත් මේ පිළිතුරේ දීර්ඝ වශයෙන් තැනින් තැන සඳහන් වනවා. ඒ දෙක ගළපා, අසාධාරණයක් සිදුවී තිබෙනවා නම් ඒ කොතැනද කියලා මට කිව්වොත් ඒ ගැන කටයුතු කරන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන සංවර්ධනය කළ මාර්ග පිළිබඳව බැලුවොත් ඒවා අදාළ කොට්ඨාසයට සම්බන්ධ නැහැ. ඒ කොට්ඨාසයෙන් බැහැර වෙලා තමයි ඒ මුදල් යොදවා තිබෙන්නේ. එම නිසා ඔබතුමා ඒ පිළිබඳව සොයා බලන්න.

අනෙක් කාරණය, මෙම ව්‍යසනයට පත් වූ ජනතාවගේ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය කර ගැනීමට අපට තවම බැරි වෙලා තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් අසාර්ථක වෙලා තිබෙනවා. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙන්න පුළුවන්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙන්න පුළුවන්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙන්න පුළුවන්, එම අමාත්‍යාංශවලට ආපදාවට ලක් වූ කණ්ඩායම යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඉදිරි වැඩ පිළිවෙළ හදන්න පුළුවන් වෙලා නැහැ. දැන් අවුරුදු 6-7කට ළං වී ගෙන එනවා. දෛනික ජීවිතයේ ආදායම් මාර්ගය කරගත් ගොවි බිම්වල වගා කටයුතු කිරීම අද ඒ ගොවීන්ට අහිමි වෙලා තිබෙනවා. ඔවුන්ට විකල්ප රැකියා නැහැ. මම හිතන විධියට ඒ සඳහා අපි වැඩ පිළිවෙළක් සැදිය යුතුයි.

තවමත් එම ජනතාවට පානීය ජලය ලබා දෙන්නේ බවුසර්වලින්. මොකද, උල්පත් සිඳී යෑම නිසා. ඒක බරපතළ ප්‍රශ්නයක්. මේ පිළිබඳව අධ්‍යයනය කර, කළ හැකි වැඩ පිළිවෙළක් ගැන අපි දිගින් දිගටම, දිගින් දිගටම යෝජනා කළා. විකල්ප ආදායම් මාර්ග සහ රැකියා සඳහා යන්න පුළුවන් ක්‍රමවේදයක් හඳුන්වා දුන්නා. උදාහරණයක් විධියට ගත්තොත්, ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඇඟලුම් ක්ෂේත්‍රයට සම්බන්ධ කර්මාන්ත කිපයක් හදන්න කියලා කිව්වා. නමුත්, ඒ සඳහා වැඩ පිළිවෙළක් නැහැ. එම ජනතාවට ආදායම් මාර්ගයක් නොමැති නිසා පන්සලට දාන වේල දෙන්න බැරි වෙලා තිබෙනවා; දරුවන් පාසලට යවා ගන්න බැරි අමාරු තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා අමාත්‍යාංශයෙන් කාලීන වැඩ පිළිවෙළක් හදන්න කියලා අපි යෝජනා කරනවා.

ගරු ඇමතිතුමනි, භූ අභ්‍යන්තරයේ දිගින් දිගටම සිද්ධ වන වෙනස්වීම් තුළ ඒ ප්‍රදේශ අලුතින් හානියට පත් වනවා. වන්දිය ගෙව්වාට පස්සේ තවත් හානියට ලක් වනවා. අද වැස්සොත් ඒ ගෙදර තවත් හානියට පත් වනවා. ඒවාට වන්දි ගෙවීමට ක්‍රමවේදයක් නැහැ. වන්දියක් ගෙව්වාට පස්සේ නැවත වන්දි ගෙවන්න බැහැ. ඒ නිසා මේ කියන කාරණා දෙක තේරුම් අරගෙන අමාත්‍යාංශය හැටියට ඉදිරි වැඩ පිළිවෙළක් සකස් කළ හැකිද කියලා මම අහනවා.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය ගත්තාම මහ ජනතාවගේ පැත්තෙන් ගැටලුවක් තිබෙන බව පෙනෙනවා. විශේෂයෙන් මම හැන්සාඩ් ගතකළ පිළිතුරේ copy එකක් එතුමාට ලබා දෙන්නත් පුළුවන්. ඒ අතර, අදාළ ප්‍රාදේශීය ලේකම්වරුත්, අදාළ පළාත් පාලන කොමසාරිස්වරුත්, අනෙක් අයත් එකට සම්බන්ධ කරගෙන වෙනම සාකච්ඡාවක් මන්ත්‍රීතුමාට ලබා දෙන්නත් මට පුළුවන්කම තිබෙනවා. ඒ ගැන බලන්න පුළුවන්. පිළිතුරේ සඳහන් කර තිබෙනවා, ජලය ගබඩා කර සැපයීමට හැකිවන පරිදි ලීටර් 10,000 ප්‍රමාණයේ ටැංකි ඇතුළත් ජල ටැංකි 6,792ක් බෙදා දුන්නා කියලා. ඒ වාගේම, බවුසර් 21කින් ජලය බෙදා හරිනවා කියලා තිබෙනවා. හැබැයි, මන්ත්‍රීතුමාගේ අදහස අනුව මේ කියන කාරණාවලට අමතරව තවත් ප්‍රශ්න තිබෙන බව පැහැදිලියි. ඒ ගැන වෙනම සාකච්ඡාවක් මම ලබා දෙන්නම්.

## උප පොලිස් පරීක්ෂකවරු: උසස්වීම්
உப பொலிஸ் பரிசோதகர்: பதவியுயர்வு
SUB-INSPECTORS OF POLICE: PROMOTIONS

222/'18

**4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවයේ, උප පොලිස් පරීක්ෂක තනතුරේ දැනට සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) බඳවාගැනීම් කාර්යපටිපාටියට අනුව ඔවුන්ට පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම් ලබාදිය යුත්තේ කවර කාලයකින් පසුවද;

(iii) ඒ අනුව නියමිත කාලසීමාව සම්පූර්ණ කළ උප පොලිස් පරීක්ෂවරුන්ට උසස්වීම් ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை பொலிஸ் சேவையில் உப பொலிஸ் பரிசோதகர் பதவியில் தற்போதுள்ள உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) ஆட்சேர்ப்பு நடைமுறைகளுக்கேற்ப இவர்களுக்கு பொலிஸ் பரிசோதகர் பதவி வரையிலான பதவியுயர்வுகள் எவ்வளவு காலத்திற்குப் பின்னர் வழங்கப்பட வேண்டும் என்பதையும்;

(iii) இந்த உரிய காலத்தினைப் பூர்த்திசெய்துள்ள உப பொலிஸ் பரிசோதகர்களுக்குப் பதவியுயர்வு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he inform this House-

(i) the total number of officers presently holding the post of Sub-Inspector of Police at Sri Lanka Police Department;

(ii) the period of service after which they should be promoted to the post of Inspector of Police according to the recruitment procedure; and

(iii) whether promotions have been given to the Sub-Inspectors of Police who have completed the stipulated period of service?

(b) If not, why?

**ගරු රුවන් විජේවර්ධන මහතා (ජනමාධ්‍ය කැබිනට් නොවන අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ருவன் விஜயவர்தன - வெகுசன ஊடக அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சரும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ruwan Wijewardene - Non-Cabinet Minister of Mass Media and State Minister of Defence)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 4,975යි.

(ii) ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් හා නියාමන සේවා ගණයේ උප පොලිස් පරීක්ෂක තනතුරට අදාළව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST/07-01-70/03/2014 හා 2015.04.10 දිනැතිව අනුමත කර ඇත. නමුත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව පිහිටුවන තෙක් එහි මුල් පිටපත් අත්සන් කර නොතිබුණි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටිය අනුව උසස්වීම් ලබාදීම සඳහා උප පොලිස් පරීක්ෂක තනතුරේ සම්පූර්ණ කළ යුතු සේවා කාලය වසර 09කි. මේ වනවිට උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකස් කර පොලිස්පති විසින් ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගැනීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල් සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. එයට අදාළ නිරීක්ෂණ හා නිර්දේශ ලද පසු ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(iii) ජාතික පොලිස් කොමිෂන් සභාවේ අංක NPC/ED/NGO/PR/140/15 හා 2016.07.18 දිනැති ලිපිය මඟින් පොලිස්පති වෙත දන්වා ඇති පරිදි කටයුතු කර 2016.05.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි උප පොලිස් පරීක්ෂක තනතුරේ වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කළ උප පොලිස් පරීක්ෂකවරුන් 539කට, කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන් 56කට මේ වනවිට පොලිස් පරීක්ෂක තනතුරේ උසස්වීම් ලබා දී ඇත. නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලද පසු ඊට අනුකූලව උසස්වීම් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පොලීසියේ උසස්වීම් සම්බන්ධ ප්‍රශ්න දැන් දිගින්-දිගටම යොමු වෙනවා. පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් සැරයන් තනතුර දක්වා උසස් කිරීමේදී ඇති වූ ප්‍රශ්න පිළිබඳව ඊයේත් මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් අහලා තිබෙනවා මා දැක්කා. විශේෂයෙන් උප පොලිස් පරීක්ෂක තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම් දීමේදී නියමිත කාල සීමාවට අනුව ඒ කටයුතු සිද්ධ වෙනවාය කියලා දැන් ඔබතුමාට මේ ගරු සභාවට යම් සහතිකයක් දෙන්න පුළුවන්ද? එහෙම නැතිව, ආණ්ඩුවට හිතුණු වෙලාවක උසස්වීම් දුන්නොත් සැලකිය යුතු

පිරිසකට අසාධාරණයක් සිද්ධ වෙනවා. නිශ්චිත කාල වකවානු තුළ මේ උසස්වීම් ලබාදීම සඳහා යම් ක්‍රමවේදයක් සකස් කර තිබෙනවාද?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)

ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන ගොඩක් දුරට කථා වෙලා තිබෙනවා. නිශ්චිත වෙලාවක් හරියටම කියන්න බැහැ. දැන් සිටින පොලිස්පතිතුමා සමඟ සාකච්ඡා කරලා පුළුවන් තරම් ඉක්මනින් ඒ කටයුතු කරන්න අප බලාපොරොත්තු වෙනවා. හැම ක්ෂේත්‍රයකම වාගේ, පොලීසියේත් උසස්වීම් සම්බන්ධයෙනුත් ගැටලු, ප්‍රශ්න තිබෙනවා. පුළුවන් තරම් ඉක්මනින් ඒ ගැටලු නිරාකරණය කරන්න අප කටයුතු කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අප්‍රේල් 21වන දා සිදු වුණු ප්‍රහාරයෙන් පසුව, ජාතික ආරක්ෂාව පිළිබඳව යළිත් වටයකින් අපි විශේෂයෙන් සාකච්ඡා කරන්න පටන්ගෙන තිබෙනවා. මහජන ආරක්ෂාව සැලසීමේදී පොලිස් නිලධාරින්ගේ කාර්යභාරය අතිවිශිෂ්ටයි. ඒ අය විශාල වගකීමක් දරනවා. නමුත්, ඔවුන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමේදී පොලිස් දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නැති බව තමයි පෙනෙන්නේ. මීට කලින්, මාස 6කට වතාවක් ඔවුන්ට ලබා දුන් සපත්තු කුට්ටම දැන් ඒ නියමිත කාලයකට ලැබෙන්නේ නැහැ. ඔවුන් වර්ෂාව මධ්‍යයේ රාජකාරිය කරනවා. වර්ෂාව කියලා ඔවුන්ට පැත්තකට වෙලා ඉන්න බැහැ නේ. නමුත්, ඔවුන්ට අවශ්‍ය raincoats පවා අවශ්‍ය ප්‍රමාණයට නිකුත්වෙලා නැහැ. ඔබතුමා සොයා බැලුවොත් පෙනෙයි, සාමාන්‍යයෙන් වසර 10කට වරක් නිකුත් කෙරෙන journey mattress එක නොලැබුණු පොලිස් නිලධාරින් සිටින බව. මේවා අවම පහසුකම්. අගමැතිවරයාගේ ආරක්ෂාවට රුපියල් ලක්ෂ 6,000ක වාහන ගෙන්වන වෙලාවේ, පොලිස් නිලධාරින්ට රාජකාරි කිරීමට අවශ්‍ය මූලික අවම පහසුකම් ටිකවත් සැපයීම වෙනුවෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමුවෙලා තිබෙනවාද? ඒ පහසුකම් සපයන්න අමාත්‍යාංශය හැටියට ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)

ගරු මන්ත්‍රීමනි, පොලිස් නිලධාරින්ගේ ඒ පහසුකම් ලබාදීම අපේ වගකීමක්. අපි පුළුවන් තරම් හරි වෙලාවට ඒ වැඩ කටයුතු කරනවා. නමුත්, ඒ වාගේ අපහසුතාවකට පත් වෙලා ඉන්නවා නම්, ඒ ගැන සොයා බලා පුළුවන් තරම් ඉක්මනින් ඒ පහසුකම් ටික ලබා දෙන්න අප කටයුතු කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 5 -273/'18- (1), ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

**ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හන්තාන වතුයායේ විශ්‍රාම ගැන්වූ වතු සේවකයන්: ඊපීඑෆ්, ඊටීඑෆ් සහ විශ්‍රාම පාරිතෝෂික

ஓய்வுபெற்ற ஹந்தானை தோட்டத் தொழிலாளர்கள்: ஊ.சே.நிதியம், ஊ.ந.நிதியம் மற்றும் பணிக்கொடை

RETIRED ESTATE WORKERS OF HANTHANA ESTATE: EPF, ETF AND PENSION GRATUITY

361/'18

**6. ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු හන්තාන වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වන විටත් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, ලියාපදිංචි සාමාජික අංකය, සේ.නි.භා. අරමුදල්, සේ.අ.අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக்கள் தோட்ட அபிவிருத்திச் சபைக்குச் சொந்தமான ஹந்தானை தோட்டத்தில் 2002 ஆம் ஆண்டில் தொழில் புரிந்த தோட்டத் தொழிலாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2000ஆம் ஆண்டு தொடக்கம் 2015ஆம் ஆண்டு வரை இத்தோட்டத்தில் தொழில் புரிந்து ஓய்வெடுக்கச் செய்யப்பட்ட ஆண் மற்றும் பெண் தோட்டத் தொழிலாளர்களின் எண்ணிக்கை தனித்தனியாக யாது என்பதையும்;

(iii) அவ்வாறு ஓய்வெடுக்கச் செய்யப்பட்ட தொழிலாளர்களில் இன்றளவில் ஊழியர் நம்பிக்கை பொறுப்பு நிதி, ஊழியர் சேமலாப நிதி மற்றும் ஓய்வூதியப் பணிக்கொடை செலுத்தப்படாத தொழிலாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அவ்வாறான தொழிலாளர் ஒவ்வொருவரினதும் பெயர், அங்கத்தவர் இலக்கம், ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதி, ஊழியர் சேமலாப நிதி மற்றும் பணிக்கொடை ஊதியத்தின் நிலுவை தனித்தனியாக யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු වේලු කුමාර් මහතා]

asked the Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development:

(a) Will he inform this House-
   (i) the number of estate workers who served in 2002 in the Hanthana Estate that belonged to Janatha Estate Development Board;
   (ii) separately, the number of male and female estate workers who went on retirement from 2000-2015 after serving in this estate;
   (iii) the number of retired workers, out of the aforesaid workers, who have not been paid Employees Provident Fund (EPF), Employees Trust Fund (ETF) and pension gratuity; and
   (iv) the name of each of the aforesaid worker, the membership number and the amount due from the EPF, ETF and Pension Gratuity, separately?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වතු කම්කරුවන් 814

(ii)

| වර්ෂය | සේවය කර විශ්‍රාම ගැන්වූ | | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|
| | පිරිමි සංඛ්‍යාව | ගැහැනු සංඛ්‍යාව | |
| 2000 | 5 | 7 | 12 |
| 2001 | 14 | 11 | 25 |
| 2002 | 14 | 4 | 18 |
| 2003 | 14 | 17 | 31 |
| 2004 | 14 | 7 | 21 |
| 2005 | 7 | 13 | 20 |
| 2006 | 10 | 6 | 16 |
| 2007 | 10 | 14 | 24 |
| 2008 | 15 | 26 | 41 |
| 2009 | 21 | 26 | 47 |
| 2010 | 9 | 22 | 31 |
| 2011 | 32 | 29 | 61 |
| 2012 | 11 | 43 | 54 |
| 2013 | 35 | 34 | 69 |
| 2014 | 9 | 19 | 28 |
| 2015 | 14 | 18 | 32 |
| Total : | **234** | **296** | **530** |

(iii) සේ.නි.භා අරමුදල - 82
සේවක අර්ථ සාධක අරමුදල - 356
විශ්‍රාම පාරිතෝෂිකය - 446

(iv) ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ සංඛ්‍යාලේඛන අනුව, මේ වන විට ගෙවීමට තිබෙන EPF, ETF හා gratuity දීමනා කොයි කාලය වන විට ලබා දෙන්න සැලසුම් කර තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව කාලයේ, ඒ වාගේම, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ අවුරුදු 20ක්, for 20 years, මේ ජනවසම, රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුවල EPF, ETF හා gratuity ගෙව්වේ නැහැ. පස්සේ, දින සියයේ ආණ්ඩුව කාලයේ වැවිලි කර්මාන්ත ඇමතිවරයා විධියට මම කැබිනට් පත්‍රිකාවක් දමලා මිලියන 1,800ක් ඉල්ලා ගත්තා, ඒවා ගෙවන්න. මම රවි කරුණානායක ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමා ඒකට එකඟ වීම ගැන. හැබැයි, ඒකෙන් අපට හම්බ වුණේ මිලියන 1,000යි. ඒ මිලියන 1,000 අපි වතු කම්කරුවන්ට ලබා දුන්නා. තව මිලියන 800ක විතර හිඟයක් තිබෙනවා. ඒ මිලියන 800 අපි මංගල ඇමතිතුමාගෙන්; මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබෙනවා. එතුමා ඒ මුදල දෙනවා කියලා පොරොන්දු වෙලා තිබෙනවා. මම මුදල් ඇමතිතුමාටත් මේ කාරණය කිව්වා. කොබ්බෑකඩුව ඇමතිතුමාගේ කාලයේ මේ වතු සියල්ලම පවරා ගත්තේ LRC එකට. LRC එකෙන් ඒවා රාජ්‍ය වැවැලි සංස්ථාවටයි, ජනවසමටයි දුන්නා.

චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩු කාලයේ වතු පෞද්ගලික අංශයට දෙන කොට lease agreement එක අත්සන් කළේ ජනවසමයි, රාජ්‍ය වැවිලි සංස්ථාවයි. ඒ ගොල්ලන් තමයි සමාගම්වලට දෙනකොට අයිතිකාරයන් හැටියට lease agreement එක අත්සන් කළේ. මම මුදල් අමාත්‍යාංශයට කීප වතාවක්ම කියලා තිබෙනවා, මේ බදු කුලිය - lease rent එක - එන්න ඕනෑ රාජ්‍ය වැවිලි සංස්ථාවටයි, ජනවසමටයි කියලා. නමුත් මේ අය ඒක දෙන්නේ නැහැ. Lease rent එක එන්න ඕනෑ රාජ්‍ය වැවිලි සංස්ථාවටයි, ජනවසමටයි. ඒ අය තමයි අයිතිකරුවන් හැටියට සමාගම් නවයකට මේවා බදු දුන්නේ. නමුත් භාණ්ඩාගාරය මේ බදු මුදල තියා ගන්නවා. අවුරුද්දකට බිලියන 1,500ක් lease rent එක එන්න ඕනෑ, ජනවසමටයි, රාජ්‍ය වැවිලි සංස්ථාවටයි. මේ මුදල දෙන්නේ නැතුව මේ ආයතන දෙක නඩත්තු කරන්න බැහැ. මම මුදල් ඇමතිතුමාගෙන් මේ මුදල ඉල්ලා තිබෙනවා. මට පොරොන්දු වෙලා තිබෙනවා, කොටසක් හෝ ලබා දෙනවා කියලා. ඉතාම කෙටි කාලයක් තුළ අපි මේ ප්‍රශ්නය විසඳන්න බලාපොරොත්තු වෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, පසු ගිය කාලයේ තිබුණු හිඟ මුදලෙන් අඩක් මේ කාල සීමාව තුළ ගෙවීම පිළිබඳව. නමුත් ගෙවීම අතපසු වූ නිසා නැවත වරක් එහි ලොකු හිඟයක් ගොඩනැගෙමින් තිබෙනවා.

ඒ වාගේම මම ස්තුතිවන්ත වෙනවා, රජයේ ප්‍රතිපත්තියක් හැටියට වතු කම්කරුවන්ට පර්චස් හතක ඉඩමක් ලබා දීමේ ඒ වැඩ කටයුත්ත ඉතා ශීඝ්‍රයෙන් දියත් කරගෙන යෑම ගැන. නමුත් වතු කිහිපයක, විශේෂයෙන්ම හන්තාන වත්ත, මාවිල, බෝහිල්, SPC ආයතනයට අයිති රන්ගල, හුන්නස්ගිරිය ප්‍රදේශයේ තිබෙන වතුවල ඒ පර්චස් හතක ඉඩම් ලබා දීම තවමත් ක්‍රියාත්මක වෙලා නැහැ. පර්චස් හතක ඉඩමක් ලබා දීම පිළිබඳව ඔබතුමාගේ ඒ වැඩසටහන මේ කාල සීමාව තුළ අවසන් කරන්න පුළුවන්ද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යහපාලන ආණ්ඩුව බලයට පත් වුණු විගසම මම වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට සිටියදී පර්චස් හතක් වතු කම්කරුවන්ට ලබා දෙන්න කැබිනට් පත්‍රිකාවක් දැම්මා. එයට අතිගරු ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණා. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට අපි තමයි වතු කම්කරුවාගේ ඉඩම් අයිතිය පිළිගත්තේ. අපි ඒ ගැන ආඩම්බර වෙනවා. ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාත් එක්ක ගිහිල්ලා නේ හන්තාන වත්තේ ඉඩම් බෙදුවේ. ඒක මතක නැද්ද?

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

මතකයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමායි, අගමැතිතුමායි එක්ක ගිහිල්ලා තමයි හන්තාන වත්තේ ඉඩම් කැබලි 500ක් දුන්නේ. හැබැයි, තව ටිකක් දෙන්න තිබෙනවා. ඒක මම පිළිගන්නවා. අපි ඒක ක්‍රියාත්මක කරනවා.

## වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ වූ ආයතන: බඳවාගත් සේවකයන්
### வடமேல் மாகாண முதலமைச்சரின் கீழுள்ள நிறுவனங்கள்: ஆட்சேர்க்கப்பட்ட ஊழியர்கள்
### INSTITUTIONS UNDER CHIEF MINISTER OF NORTH-WESTERN PROVINCIAL COUNCIL: EMPLOYEES RECRUITED

459/'19

**7. ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) මෑතකදී විසුරුවා හරින ලද වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පැවති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනවල නම් හා ලිපිනය කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පාලනය වූ ආයතන සඳහා බඳවාගනු ලැබූ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) බඳවා ගනු ලැබූ සේවකයන්ගේ නම් හා බඳවාගත් තනතුරු වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(v) එසේ සේවකයන් බඳවා ගැනීමට පළාත් සභාව අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அண்மையில் கலைக்கப்பட்ட வடமேல் மாகாண முதலமைச்சரின் கீழ் உள்ள அமைச்சுக்கள், திணைக்களங்கள் மற்றும் ஏனைய நியதிச்சட்ட நிறுவனங்களின் எண்ணிக்கை எவ்வளவு;

(ii) மேற்படி ஒவ்வொரு நிறுவனத்தினதும் பெயர் மற்றும் முகவரி யாது;

(iii) நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்ததன் பின்னர் வடமேல் மாகாணசபையின் முதலமைச்சரின் கீழ் நிருவகிக்கப்பட்ட நிறுவனங்களுக்கு ஆட்சேர்க்கப்பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை எவ்வளவு;

(iv) ஆட்சேர்க்கப்பட்ட ஊழியர்களின் பெயர்கள் மற்றும் ஆட்சேர்க்கப்பட்ட பதவிகளை வெவ்வேறாக குறிப்பிடுவாரா:

(v) அவ்வாறு ஊழியர்களை ஆட்சேர்ப்பதற்கு மாகாணசபை பின்பற்றியுள்ள முறையியல் யாது;

என்பதை அவர் இச் சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of departments, Ministries and other statutory bodies which were coming under the Chief Minister of the North-Western Provincial Council, which was dissolved recently;

(ii) the names and addresses of each of those institutions;

(iii) the number of employees recruited to institutions which were coming under the purview of the Chief Minister of the North-Western Provincial Council after the Government of Good Governance came to power;

(iv) the names of the employees recruited and the posts to which they were recruited, separately; and

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

(v) the methodology adopted by the Provincial Council to recruit those employees?

(b) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පවතින අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු, වෙනත් ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව 11කි.

(ii) එම එක් එක් ආයතනවල නම් හා ලිපිනය පහතින් සඳහන් කර ඇත.

1. වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නුවර පාර, කුරුණෑගල.
2. වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල.
3. වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල.
4. වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල.
5. වයඹ පළාත් පරිසර අධිකාරිය, දඹුල්ල පාර, කුරුණෑගල.
6. වයඹ සංවර්ධන අධිකාරිය, කුරුණෑගල.
7. මානව සම්පත් සංවර්ධන අධිකාරිය, කුරුණෑගල.
8. යන්ත්‍රෝපකරණ අධිකාරිය, කුරුණෑගල.
9. කර්මාන්ත සේවා කාර්යාංශය, නුවර පාර, කුරුණෑගල.
10. ජනකලා කේන්ද්‍රය, නුවර පාර, කුරුණෑගල.
11. පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය, මාලිගාව, කුරුණෑගල.

(iii) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පාලනය වන ආයතන සඳහා බඳවා ගෙන ඇති සේවකයන් සංඛ්‍යාව 4,932කි.

(iv) ඔව්. මේ සමඟ අමුණා ඇති සංයුක්ත තැටියේ සම්පූර්ණ විස්තරය තිබෙනවා. එම සීඩී තැටිය ගරු මන්ත්‍රීතුමාට ලබා දෙන්න පුළුවන්.

<u>පසුබිම් වාර්තාව</u>

වයඹ පළාත් වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පවතින අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව 11කි. වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පාලනය වන ආයතන සඳහා බඳවා ගෙන ඇති මුළු සේවක සංඛ්‍යාව 4,932ක් වන අතර එයින් පළාත තුළ ලබා දුන් ගුරු පත්වීම් සංඛ්‍යාව 4,048ක් වේ. එසේ බඳවා ගෙන ඇති මුළු සේවකයන්ට පත්වීම් ලබා දුන් ආකාරය සඳහන් සංයුක්ත තැටිය ගරු මන්ත්‍රීතුමා වෙත ඉදිරිපත් කරනවා. එහි දීර්ඝ විස්තරයක් තිබෙනවා. ඔබතුමාට එය බලන්න පුළුවන්.

(v) ඔව්. මේ සමඟ අමුණා ඇති සංයුක්ත තැටියේ සම්පූර්ණ වාර්තාව තිබෙනවා. එම සංයුක්ත තැටි මම **සභාගත*** කරනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයේ (අ) (v) කොටසට උත්තරය මොකක්ද? එම සේවකයන් බඳවා ගත් ක්‍රමවේදය මොකක්ද කියලා එයින් අසා තිබෙනවා.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

මොකක්ද ගරු මන්ත්‍රීතුමනි?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්නයේ (අ) (v) වැනි කොටසට පිළිතුර?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

බඳවා ගනු ලැබූ සේවකයන්ගේ නම් හා බඳවා ගත් තනතුරු වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද කියන ප්‍රශ්නයද?

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

නැහැ, ගරු ඇමතිතුමනි. "එසේ සේවකයන් බඳවා ගැනීමට පළාත් සභාව අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය කවරේද කියන ප්‍රශ්නය.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරය ඒ සංයුක්ත තැටියේ තිබෙනවා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

හොඳයි, ගරු ඇමතිතුමනි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව අධ්‍යයනය කර බලා, යම් ගැටලු සහගත තත්ත්වයක් තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරන්න පුළුවන් කියන කාරණය මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි. අනෙක් එක, විසුරුවා හැර ඇති අවස්ථාවක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, පළාත් සභා පනතේ සඳහන් වගන්ති අනුව, යම් යම්

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ආයතනවලට පත් කිරීම් සහ අනෙක් කටයුතු කිරීමට යෑමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදන උල්ලංඝනය වෙන බව අපට පෙනී යනවා. ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කර කරුණු ඉදිරිපත් කළොත්, අපට හොඳ ක්‍රියාමාර්ගයකට යන්න පුළුවන්කම තිබෙනවා කියලා මා හිතනවා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

බොහොම පැහැදිලි පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. මීට පෙරත් මම අහපු ප්‍රශ්නයකදී පිළිතුර වශයෙන් ඔබතුමා මට ලිපි ගොනුවක්ම ලබා දුන්නා. ඒ වෙනුවෙන් මම ඔබතුමාට විශේෂ ස්තුතියක් මේ අවස්ථාවේදී පුද කරනවා. මේ ප්‍රශ්නයට ඔබතුමා යටතේ තුන්වැනි වතාවට තමයි පිළිතුරු ලැබෙන්නේ, ගරු ඇමතිතුමනි. ඒක ඔබතුමාගේ වැරැද්දක් නොවෙයි. මේ අමාත්‍යාංශය කීප වතාවක් එහාට මෙහාට වෙනස් වුණා. දැන් පළාත් සභා විසුරුවා හැරලා තමයි තිබෙන්නේ. පළාත් සභා විසුරුවන්න පෙර අපි ඉදිරිපත් කරපු ප්‍රශ්නවලටත් උත්තර නොලැබුණු අවස්ථා තිබෙනවා. පළාත් සභාවයි, මහාණ්ඩුවයි එහෙම නැත්නම් රේඛීය අමාත්‍යාංශය අතර සට්ටනයක් දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණු බව අපි අවිවාදයෙන් යුතුව පිළිගන්න වනවා. දැන් ටිකකට කලින් මගේ පැරැණි මිත්‍රයා, චමින්ද විජේසිරි මැතිතුමා ඔබතුමාගෙන් ඇහුවේ ඔබතුමාට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. ඒක දිගින් දිගටම ආපු ප්‍රශ්නයක්. පළාත් සභාවේ මේ අවිධිමත් ක්‍රමය, එහෙම නැත්නම් ඒගොල්ලන්ට වාසි විධියට හදා ගත්ත ක්‍රමය දිගින් දිගට පැවතීම නිසා පළාතක ජනතාව රේඛීය අමාත්‍යාංශය, පළාත් අමාත්‍යාංශය කියලා බෙදලා කටයුතු කිරීමේ ඵලවිපාකයට මුහුණ දීම සාධාරණ නැහැ, ගරු ඇමතිතුමනි.

ඒ නිසා මම ඔබතුමාට මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට යොමු කරන්නේ මෙයයි. දැනට පළාත් සභා විසුරුවා අවසානයි. නමුත් දැනුත් පළාත් සභාවේ දේශපාලනයක් සිදු වනවා කියලා තමයි මට පෙනෙන්නේ. නිලධාරින් හරහා පළාත් සභාව පාලනය වෙද්දීත් දැඩි දේශපාලනයට හසු වෙලා ජනතාව දුක් විඳිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය ඇහුවා නම් හොඳයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්නය තමයි මම මේ අහන්නේ. පළාත් සභාවයි, මහාණ්ඩුවයි අතර සට්ටනයක් ඇති වෙලා තිබියදීත් පළාතේ ජනතාව ප්‍රශ්නවලට මුහුණ දෙනවා. මේ ප්‍රශ්නයට විසඳුමක් ඊළඟ පළාත් සභාව පිහිටෙව්වත් ලැබෙන විධියක් මට පෙනෙන්න නැහැ. මොකද, එතැනත් අර්බුදයක් ගොඩ නැඟෙන නිසායි. විශේෂයෙන්ම පුත්තලම, කුරුණෑගල කියන පළාත් දෙක තමයි මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙන්නේ. එක් එක්කෙනාට වුවමනා විධියට බඳවා ගැනීම් සිදු නොවන ආකාරයට, සමතුලිත, විධිමත් පරීක්ෂණයක් පවත්වලා, -මේ මොහොතේ පළාත් සභාවට කවුරුවත් බලධාරින් නැහැනේ- මේ පළාත් සභාවේ කටයුතු යම්කිසි විමර්ශනයකට භාජන කරන්න බැරිද?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ඇත්ත වශයෙන්ම මම ඒ ගැන තමයි අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාට කලිනුත් කිව්වේ. දැනට ලංකාවේ විශාලම ජනගහනයක් ඉන්නේ වයඹ පළාතේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 30ක් වාගේම, පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16ක් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16ක් තිබෙන දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව, ආනමඩුව ප්‍රදේශවල අදටත් පළාත් පාසල්වල, පළාත් ආයතනවල නිලධාරින්ගේ බරපතළ හිඟයක් ඇති වෙලා තිබෙනවා. ආණ්ඩුකාරවරුන්ගේ ඇතැම් මැදිහත් වීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සීමාව උල්ලංඝනය කරමින් සිදු වන අවස්ථා අපට වාර්තා වෙලා තිබෙනවා. එවැනි කරුණු නැවත අධ්‍යයනය කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළොත් අපට නිවැරදි තැනකට ගමන් කරන්න අවශ්‍ය මාර්ගය සකසා ගන්න පුළුවන්.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

මා මේ කරුණ ඉදිරිපත් කරන්නේ අතුරු ප්‍රශ්නයක් විධියට නොවෙයි. ගරු අමාත්‍යතුමනි, ආපසු උත්තර ලබා ගැනීමට නොව ඔබතුමාගේ අවධානය යොමු කරවීමටයි මේ කාරණය කියන්නේ. ඔබතුමා ම කියපු වනාතවිල්ලුව, නවගත්තේගම ආදී ප්‍රාදේශීය සභාවල පුරප්පාඩු පෙන්වා, කුරුණෑගලින් පත් වන මහ ඇමතිවරයා හෝ ආණ්ඩුකාරවරයා ඒ දිස්ත්‍රික්කයේ අයගෙන් ඒ තනතුරු පුරවනවා. ඒ බලය පාවිච්චි කරලා ඒ තනතුරු පුරවලා ඉතාම කෙටි කාලයක් තුළදී ඒ අය ස්ථාන මාරු ලබා ගෙන යනවා. ඒ නිසා නැවත පුරප්පාඩු ඇති වෙනවා. මෙය පුත්තලම දිස්ත්‍රික්කයට දිගින් දිගටම සිදු වන හානියක්. එය, රෝහල් පද්ධතියටත් එහෙමයි, පාසල් පද්ධතියටත් එහෙමයි, සුළු සේවක පද්ධතියටත් එහෙමයි. මෙය දිගින් දිගටම සිදු වනවා, ගරු අමාත්‍යතුමනි. එම නිසා මෙය නවත්වන්න ක්‍රමවේදයක් මේ මොහොතේදී හැදුවේ නැත්නම්, ඉදිරියේදී පළාත් සභාව පිහිටුවලා නැවත මහ ඇමතිවරයකු පත් වුණාට පසුවත් ඒ කටයුත්ත දිගටම සිදු වේවි. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්නේ, ඒ ප්‍රදේශවලට පත්වීම් ලබා දීමේදී අඩුම තරමින් අවුරුදු 4ක් හෝ 5ක් හෝ සේවය කරන බවට agreement එකකට ආ යුතුය කියන කාරණයට. උපාධි සුදුසුකමින් ගන්න බැරි නම් අ.පො.ස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵලවලින්, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵලවලින් බඳවාගෙන හෝ ඒ ප්‍රදේශයේ සේවය කරන්න පුළුවන් පිරිසක් පත් කර ගන්න පුළුවන් ක්‍රමවේදයක් මහ ආණ්ඩුවත් පළාත් සභාත් එකතු වෙලා ඇති කරන්න කියන එක තමයි මා ඔබතුමාට කියන්නේ.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන ලේකම්වරුන්ගේ සාකච්ඡාවේදී අපි මේ ප්‍රශ්නයට අවධානය යොමු කර තිබෙනවා. ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා කියන කාරණය සම්පූර්ණ ඇත්ත. මටත් ඒ ප්‍රදේශය පිළිබඳව අවබෝධයක් තිබෙන නිසායි මා එසේ කිව්වේ. පළාත් ලේකම්වරුන්ගේත් එකඟතාව ලබා ගෙන, ප්‍රධාන ලේකම්වරුන්ගේ වාර්තාත් සමඟ මා මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්නම්.

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ නියඟයෙන් පීඩාවට පත් ජනතාව: පානීය ජල ගැටලුව

குருணாகல் மாவட்டத்தில் வறட்சியினால் பாதிக்கப்பட்ட மக்கள்: குடிநீர்ப் பிரச்சினை

DROUGHT-AFFECTED PEOPLE OF KURUNEGALA DISTRICT: DRINKING WATER PROBLEM

580/'19

**8. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

(අ) (i) පසුගිය දිනවල පැවති දැඩි නියඟය හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) පීඩාවට පත්වූ එම පවුල් පිළිබඳ වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) නියඟය නිසා පීඩාවට පත් වූ ජනතාවගේ පානීය ජල ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, அனர்த்த முகாமைத்துவ மற்றும் கால்நடை வளங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த தினங்களில் நிலவிய கடும் வறட்சி காரணமாக குருணாகல் மாவட்டத்தில் பாதிப்புக் குள்ளான குடும்பங்களின் எண்ணிக்கை யாது;

(ii) பாதிப்புக்குள்ளான இக்குடும்பங்கள் பற்றி அறிக்கையிடப்பட்ட பிரதேச செயலாளர் பிரிவுகள் வெவ்வேறாக யாவை;

(iii) வறட்சி காரணமாக பாதிப்புக்குள்ளான மக்களின் குடிநீர்ப் பிரச்சினையைத் தீர்ப்பதற்கு அமைச்சு மேற்கொண்ட நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Disaster Management and Livestock Development:

(a) Will he inform this House-

(i) the number of families that have been affected by the severe drought that prevailed recently in the District of Kurunegala;

(ii) separately, the names of the Divisional Secretaries' Divisions from which the affected families have been reported; and

(iii) the steps taken by the Ministry to solve the problem of drinking water of the people affected by the drought?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2019 ජූලි 03 වන දිනට ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ උපරිම තත්ත්ව වාර්තාව අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවුල් 4,399ක් දැඩි නියඟය හේතුවෙන් පීඩාවට පත්ව ඇත.

(ii)

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පවුල් සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | අඹන්පොළ | 541 | 1,613 |
| 2. | උඩුබද්දාව | 249 | 776 |
| 3. | කොටවෙහෙර | 25 | 93 |
| 4. | පොල්පිතිගම | 1,975 | 6,330 |
| 5. | කුලියාපිටිය නැඟෙනහිර | 293 | 1,263 |
| 6. | මාස්පොත | 59 | 214 |
| 7. | ගිරිබාව | 544 | 1,373 |
| 8. | මාවතගම | 173 | 566 |
| 9. | පොල්ගහවෙල | 185 | 548 |
| 10. | ගල්ගමුව | 355 | 1,439 |
| | | 4,399 | 14,215 |

(iii) ජාතික අය වැය චක්‍රලේඛ 03/2016 අනුව පානීය ජල ගැටලුව පවතින දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පානීය ජලය බෙදාහැරීමට රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ප්‍රතිපාදන නිකුත් කරනු ලබයි.

ඊට අමතරව, අමාත්‍යාංශය මඟින් ලීටර් 1000 ජල ටැංකි, ට්‍රැක්ටර් බවුසර් හා ලොරි බවුසර් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අවශ්‍යතාව මත එම දිස්ත්‍රික්කවලට ලබාදී ඇත. ඒ අනුව, පොදු ස්ථානවල ස්ථාපිත කර ඇති ජල ටැංකිවලට ට්‍රැක්ටර් බවුසර් හා ලොරි බවුසර් යොදාගනිමින් අඛණ්ඩව ජල සැපයීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සම්බන්ධීකරණය කරනු ලබයි. මෙම ට්‍රැක්ටර් බවුසර් හා ලොරි බවුසර් සඳහා ඉන්ධන, රියැදුරන් හා රිය සහායකයන් සඳහා අතිකාල, බටා සහ පිරිසිදු ජලය සඳහා ගෙවීම් කිරීමට ජාතික අය වැය චක්‍රලේඛ 03/2016 අනුව නිකුත් කරනු ලබන ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් යොදා ගනු ලබයි.

2019.08.21 දින වන විට කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන ඇතුළත් ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම

| Activity | Drinking Water |
|---|---|

**Given Allocation as at 2019.08.21**

| Sum of Amount | | |
|---|---|---|
| District_N | DSD_N | Total |
| Kurunegala | 10 Ds Divisions | 500,000.00 |
| | Alawwa | 94,400.00 |
| | Ambanpola | 173,700.00 |
| | Galgamuwa | 172,800.00 |
| | Giribawa | 99,400.00 |
| | Kotavehera | 56,400.00 |
| | Kuliyapitiya East | 72,000.00 |
| | Maspotha | 37,058.00 |
| | Mawathagama | 57,800.00 |
| | Narammala | 35,000.00 |
| | Polgahawela | 100,000.00 |
| | Weerambugedara | 41,530.00 |
| | Weerambugedara/Polpithigama/Narammala/Pannala/Alawwa/Udubaddawa | 705,823.00 |
| Kurunegala Total | | 2,145,911.00 |

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමාත් සභාවේ හිටියා නම් ඉතාම හොඳයි. මම පළමුවෙන්ම කියන්න ඕනෑ මා සෑහීමට පත්වෙන්නේ නැති බව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ නියඟය නිසා පීඩාවට පත්වෙච්ච පවුල් ප්‍රමාණය හාරදහස් හත්සිය ගණනක් හැටියට සඳහන් කිරීම පිළිබඳව. එතුමා ලබාදුන් ඒ පිළිතුරේ සඳහන් වුණේ සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවුල් 150යි, 200යි, 300යි වශයෙන් ඉතාම අඩු පවුල් ප්‍රමාණයක් ගැන. සාමාන්‍යයෙන් පවුල් 150ක් කිව්වාම, එක ග්‍රාම නිලධාරි වසමක් නියෝජනය කරන පවුල් ප්‍රමාණයක්. හැබැයි, අපි මේ දිස්ත්‍රික්කයේ ප්‍රායෝගිකව ජීවත්වන පුද්ගලයන් හැටියටත්, දේශපාලකයන් හැටියටත් දැක්කා, නියඟය නිසා කොපමණ පවුල් ප්‍රමාණයක් මොනතරම් පීඩාවට පත්වුණාද කියන එක. ඒ නිසා මම පළමුව මේ සංඛ්‍යාලේඛන පිළිබඳව සෑහීමට පත් වෙන්නේ නැහැ.

මේ වෙලාවේ ගරු ඇමතිතුමා ගරු සභාවේ සිටියා නම් හොඳයි. මේ වාගේ සංඛ්‍යාලේඛන ලබා දීමෙන්ම තේරෙනවා, ආපදා තත්ත්ව සඳහා ලබා දී තිබෙන විසඳුම් මොනවාද කියලා. නිලධාරින්ගෙන් තමයි ගරු ඇමතිතුමාට මේ සංඛ්‍යාලේඛන සහ දත්ත ලැබෙන්න ඇත්තේ. විශේෂයෙන්ම ඒ පිළිබඳව මගේ කනගාටුව පළ කරනවා. ඒ නිසා මෙම තොරතුරු ලබා දුන් නිලධාරින් පිළිබඳව වහාම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද, ඔවුන් ලබා දී තිබෙන්නේ සත්‍ය තොරතුරු නොවෙයි. බීමට වතුර ටිකක් නැතුව ගම් පිටින්, ප්‍රදේශ පිටින් වැව් පිට්ටනිවල ළිං හාරගෙන වතුර හොයපු, වතුර සොයාගෙන ට්‍රැක්ටර්වලින්, අත් ට්‍රැක්ටර්වලින් කිලෝමීටර් ගණන ගිය, විවිධාකාරයෙන් පීඩාවට පත් වූ මිනිසුන් බුරුතු පිටින් අපි දැක්කා. මේ සංඛ්‍යාලේඛන ගැන නම් මම කිසිම ආකාරයකින් සෑහීමකට පත් වෙන්නේ නැහැ. මේක ප්‍රායෝගික නොවන පිළිතුරක් බව මම ප්‍රසිද්ධියේම කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

කරුණාකර ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මේ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වුණොත් හොඳයි. කොයි ආකාරයෙන් නිර්ණායක අරගෙන මේ ඉලක්කම් ටික ගෙනාවාද කියලා මම දන්නේ නැහැ. වතුර නැතුව පිපාසයෙන් මැරෙන්න ඔන්න මෙන්න කියලා ඉන්න කිහිප දෙනෙකුගේ සංඛ්‍යාලේඛනයක් මෙතැනට ගෙනැවිත් තිබෙනවා කියලා තමයි මට පෙනෙන්නේ. ඒ පිළිබඳව මගේ කනගාටුව පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. කුරුණෑගල දිස්ත්‍රික්කය කියන්නේ, ජනාවාසකරණය අතින් කොළඹ දිස්ත්‍රික්කයට සහ ගම්පහ දිස්ත්‍රික්කයට පස්සේ වේගයෙන් දියුණු වන දිස්ත්‍රික්කයක්. පසුගිය කාලවල නියඟය එනකොට ඒ නියඟයෙන් අපේ ජනතාව මාස ගණන් පීඩා වින්දා. ගංවතුර එනකොට,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ප්‍රශ්නය අහනවා. අදත් මේ වෙනකොට තදබල වැස්ස. කථාවක් තිබෙනවා, "කරදරය ඔබට කරදර කරන තුරු ඔබ කරදරයට කරදර නොකර සිටින්න" කියලා. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය "කරදරය කරදර කරන තුරු කරදරයට කරදර නොකර සිටින" අමාත්‍යාංශයක්ද? ආපදා සඳහා ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් පිළිබඳව විද්‍යාත්මකව කටයුතු කර තිබෙනවාද? ඒ සම්බන්ධ වැඩ සටහනක් තිබෙනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා අහපු ප්‍රශ්නවලට මම ලබා දුන් සංඛ්‍යාලේඛන පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැති බව කිව්වා. මම ඒ ගැන කියන්න ඕනෑ. රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යමාට අද මේ සභාවට පැමිණිය නොහැකි නිසා තමයි මෙම සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න කියලා මට දුන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අදහස මම නැවත එතුමාගේ අවධානයට යොමු කරන්නම්.

තිබෙන වැඩ පිළිවෙළ පිළිබඳවත් ඔබතුමා ඇහුවා. ඇත්ත වශයෙන්ම අමාත්‍යාංශය සතුව වැඩ පිළිවෙළ තිබෙනවා. ඔබතුමාට ඒ පිළිබඳව දැන ගන්න අවශ්‍ය නම්, පසුව දීර්ඝ විස්තරයක් ලබා දෙන්න අපට පුළුවන්.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාට මේ ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් දෙන්න බැහැ.

කරදරය, ආපදාව ආවාට පසු, සිටින රාජ්‍ය තන්ත්‍රය සහ ගමේ සිටින නිලධාරි කට්ටලය උපයෝගී කරගෙන තාවකාලික, ක්ෂණික විසඳුම් සකස් කිරීම තමයි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය තුළ සිදු වන්නේ.

මට අහන්න තිබෙන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් කරන්නේ, මැතිවරණයක් ආවාම රාජ්‍ය නිලධාරින් මැතිවරණයට යොදා ගන්නවා වාගේ ආපදා අවස්ථාවක් ආවාම තාවකාලිකව ඒ නිලධාරින් ඒ කටයුතුවලට යොමු කරන එකද? ඒ සංකල්පයෙන් බැහැරව ගිහින් ඒ පිළිබඳ සොයා බලන්න, ගවේෂණය කරන්න, පෙර සූදානම් ඇති කරන්න යම් සේවකයන් පිරිසක්, යම් නිලධාරි කණ්ඩායමක්, පූර්ණ කාලීන සේවක පිරිසක් සිටින සංවිතයක් ඇති කිරීමට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය පියවර නොගන්නේ මන්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මම එම කරුණ ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 9 - 606/'18-(1), ගරු වාසුදේව නානායක්කාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## "උදාගම්" ව්‍යාපෘතිය: විස්තර
"உதாகம கருத்திட்டம்: விபரம்
"VILLAGE REAWAKENING PROGRAMME": DETAILS

613/'18

10. ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) යහපාලන රජය ආරම්භ වූ දින සිට 2018 අගෝස්තු මාසය දක්වා උදාගම් ව්‍යාපෘතිය යටතේ,
   (i) ආරම්භ කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව;
   (ii) ඉදිකර ඇති මුළු නිවාස සංඛ්‍යාව;
   (iii) වැය කර ඇති මුළු මුදල;

   කොපමණද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) එම ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාත තුළ,
   (i) ආරම්භ කර ඇති නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව;
   (ii) නිවාස ව්‍යාපෘති ආරම්භ කර ඇති ස්ථාන;
   (iii) වැඩ නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව;
   (iv) වැයකර ඇති මුළු මුදල;

   කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉදිරියේදීඩ උදාගම් නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) நல்லாட்சி அரசாங்கம் தொடங்கிய நாள் முதல் 2018 ஆம் ஆண்டு ஆகஸ்ட் மாதம் வரை "உதாகம" கருத்திட்டத்தின் கீழ்,
   (i) ஆரம்பிக்கப்பட்ட கருத்திட்டங்களின் மொத்த எண்ணிக்கை;
   (ii) நிர்மாணிக்கப்பட்ட வீடுகளின் மொத்த எண்ணிக்கை;
   (iii) செலவிடப்பட்ட முழுத் தொகை;

   எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) அக் கருத்திட்டத்தின் கீழ் மத்திய மாகாணத்தில்,
   (i) ஆரம்பிக்கப்பட்டுள்ள வீடமைப்புத் திட்டங்களின் எண்ணிக்கை;
   (ii) வீடமைப்புத் திட்டங்கள் ஆரம்பிக்கப்பட்டுள்ள பிரதேசங்கள்;
   (iii) நிர்மாணித்து முடிக்கப்பட்டுள்ள திட்டங்களின் எண்ணிக்கை;
   (iv) செலவிடப்பட்டுள்ள முழுத் தொகை;

   எவ்வளவென்பதை அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) கண்டி மாவட்டத்தில் எதிர்காலத்தில் வீடமைப்புத் திட்டங்களை ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும் அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Cultural Affairs:

(a) Will he inform this House-
   (i) the total number of projects commenced;
   (ii) the total number of houses constructed; and
   (iii) the total amount of money spent;

   under the "Village Reawakening Programme" since the Government of Good Governance came to power until August, 2018?

(b) Will he also inform this House-
   (i) the number of housing projects commenced;
   (ii) the locations of the housing projects;
   (iii) the number of projects completed; and
   (iv) the amount of money spent;

   in the Central Province under that programme?

(c) Will he also inform this House whether arrangements will be made in future to initiate Village Reawakening Projects in Kandy District?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ආරම්භ කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 1,124.
   (ii) ඉදිකර ඇති මුළු නිවාස සංඛ්‍යාව 30,411.
   (iii) වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 6,085.812යි.

(ආ) (i) ආරම්භ කර ඇති නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව 15.
   (ii) දෙල්තොට, කුණ්ඩසාලේ, උඩුදුම්බර, යටිනුවර, මැදදුම්බර, දොළුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාස.
   (iii) වැඩ නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව 02.
   (iv) වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 30.365කි.

(ඇ) ඔව්. ඉදිරියේදී ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී.

(ඈ) අදාළ නොවේ.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ නිවාසයක් ඉදිකිරීම සඳහා ලක්ෂ 4ක ණය මුදලක් තමයි එක් අයෙක් සඳහා ලැබෙන්නේ. ඒ සඳහා පොලියක් මාසිකව අය කරනවා. මේ සඳහා රාජ්‍ය සේවකයන් දෙදෙනෙක් ඇපයට තබා ගන්නවා. මේ ණය මුදල අවුරුදු 14ක්, 16ක් අතර කාලයකදී ගෙවා නිම වන බව තමයි මම දන්නේ. ඇත්තටම ඉතිහාසය අරගෙන බැලුවාම, ගෙයක් හදලා යතුර තමයි අදාළ නිවාස හිමියාට එදා ලැබුණේ. මේ රටේ ඉඩමක් නැති, ගෙයක් නැති දුප්පත් ජනතාව ණයකරුවන් බවට පත් කිරීම තමයි මේ නිවාස

ඇමතිවරයා දිගින් දිගටම මේ වනතුරු සිද්ධ කරලා තිබෙන්නේ. නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා මේ කාල පරිච්ඡේදයේම පාර්ලිමේන්තුවේ සිටි බවක් අපි දැක්කේ නැහැ. මම දකින විධියට දේශපාලන උමතුව නැමැති රළ පහරට හසු වූ මේ ඇමතිවරයා අහස පොළොව ගැටලන්න මහා යුද්ධයක යෙදෙන අවස්ථාවක් තමයි මේ අවස්ථාව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය ඇසුවා නම් හොඳයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ඔබතුමා මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරුන්ට එක විධියකට සලකන්නේ, අපට වෙන විධියකට සලකන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, ඒ අයටත් මම ඒ විධියටම තමයි සලකන්නේ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
එහෙම කථා කරන්න එපා. අපටත් අයිතියක් තිබෙනවා. අපි නාවලපිටියේ ඉඳන් මෙතැනට ආවේ මේ ප්‍රශ්නය අහන්නයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම දෙපැත්තටම එක විධියටයි සලකන්නේ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
හැම වෙලාවේම අපි මොනවා හරි කථා කරනකොට ඔබතුමා අපට හරස් කපනවා. තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා කථා කරද්දී එක විධියකට සලකන්නේ. මම කථා කරද්දී තවත් විධියකට සලකන්නේ. මට කාලය අවශ්‍යයි. ඔබතුමා මට කාලය දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කරුණාකරලා ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, පිස්සෙක් ඇමති වුණත් එකයි; රජෙක් පිස්සෙක් වුණත් එකයි. මට ඒක තමයි කියන්න තිබෙන්නේ. ඊයේ අපේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවා. 4වැනි වතාවටත් ඒ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න අදාළ ඇමතිවරයා පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ. මම දැක්කා ඊයේ අර්ජුන රණතුංග ඇමතිතුමා පුවත් පතකට කියලා තිබෙනවා, මේ අවුරුදු හතරට එක ඇමතිවරයෙක් කරපු දෙයක් නැහැ කියලා. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන ඇමතිවරු දිහා බලපුවාම ඒක පේනවා. අදත් ඒ විධියයි සිද්ධ වෙලා තිබෙන්නේ. ගයන්ත කරුණාතිලක ඇමතිතුමා හැම දාම පාර්ලිමේන්තුවේ වාඩි වෙලා ඉන්න එක ගැන මම සතුටු වෙනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාට ජනාධිපති අපේක්ෂකකම දෙන්න, අපේ දිස්ත්‍රිකයෙන් එතුමාට ඡන්දයක් දෙන්න. මොකද, එතුමා හැම දාම පාර්ලිමේන්තුවේ ඉන්නවා. ගයන්ත කරුණාතිලක ඇමතිතුමා ප්‍රශ්නයකට උත්තරයක් හරි දෙනවා. වෙන ඇමතිවරයකුගේ කෙහෙල්මලක් හරි එතුමා කියවනවා. අපි ඒක අහගෙන ඉන්නවා. නමුත් අදාළ ඇමතිවරයා ඇවිල්ලා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕනෑ. මෙකයි ඇත්ත.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ජනාධිපතිකමට ඉල්ලනවා නම් ඔබතුමා මට වැඩ කරනවාද?

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉල්ලනවා නම් මාත්, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාත් දෙදෙනා හෙට උදේ වෙනකොට එනවා. [බාධා කිරීමක්] ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා කියනවා, එතුමාත් එනවා කියලා.

ඔබතුමා අඩු ගණනේ පාර්ලිමේන්තුවේවත් ඉන්නවානේ. සජිත් ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති වෙන්න සිහින මවාගෙන මඟුල් කරනවා. අපි අහන ප්‍රශ්නවලට උත්තර දීලා ඇමතිකමේ වගකීමවත් එතුමා ඉෂ්ට කරන්නේ නැහැ. එතුමා ජනාධිපති වුණොත් මොනවා කරයිද? එතුමාට ඒවා හම්බ වෙන්නේ නැහැ. එතුමාට ඒවා දෙන්න කවදාවත් අපි ඉඩ දෙන්නේත් නැහැ. ඒවා වෙන්නේත් නැහැ.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය.

නිවාස හදන්න පොලියට ණය දීලා අපේ රටේ අහිංසක මිනිසුන් ටික ණයකරුවන් කරලා තිබෙනවා. මම හිතන හැටියට මේ උදා ගම්මාන විවෘත කරන්න දමන බෝර්ඩ් එකට යන වියදමෙන් තව ගෙයක් හදාගන්න පුළුවන්. මම දැක්කේ නැහැ, වෙනත් කිසිම අමාත්‍යාංශයක ඇමතිවරයෙකු බෝර්ඩ් එකකට මෙපමණ වියදම් කරන බවක්. උදාගම තිබෙන්නේ අනුරාධපුරයේ. නමුත්, නාවලපිටියේත් ඒ ගැන පෝස්ටර් ගහනවා. පත්තරවලත් පිටු ගණන් දැන්වීම් දමනවා. මේවාට සල්ලි ගෙවන්නේ කවුද? මේවාට වියදම් වන මුදල්වලින් තව ගෙවල් හදන්න පුළුවන්. අපේ රවුෆ් හකීම් ඇමතිතුමා ඉන්නවා. ඔබතුමා වැඩ කරන ඇමතිවරයෙක්. නමුත්, ඔබතුමා මෙපමණ වියදම් කරලා පත්තරවල දැන්වීම් දමනවා මම දැක්කේ නැහැ. ගයන්ත ඇමතිතුමාගෙනුත් එහෙම දෙයක් වෙලා නැහැ. කිරිඇල්ල ඇමතිතුමා එහෙම දෙයක් කරලාම නැහැ.

ගයන්ත කරුණාතිලක ඇමතිතුමාගෙන් මම මේ අතුරු ප්‍රශ්නය අහනවා. ඔබතුමාට මේකට උත්තරයක් දෙන්න බැරි වෙයි. නමුත්, ඔබතුමා නැඟිටලා මොනවා හරි කියන හින්දා මම මේ ප්‍රශ්නය ඔබතුමාගෙන් අහනවා. ඔබතුමන්ලාගේ පාලන කාලයෙන් දැන් අවුරුදු හතරක් ඉවර වෙලා තිබෙනවා. දැන් ණය ගන්න මිනිස්සු අවුරුදු 14ක් ඒ ණය ගෙවන්න ඕනෑ. එතකොට ඊළඟට එන

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

ආණ්ඩුවත් මේ මිනිස්සු ණයකරුවන් කරගනෙ තමයි මේ ගෙවල් හදා දෙන්නේ. ඔබතුමා මේ කරුණ පිළිගන්නවාද, නැද්ද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කථාවක් පැවැත්වූවා. මට පිළිතුරක් හැටියට කෙටියෙන් කියන්න තිබෙන්නේ මේ වාගේ වැඩසටහන් ජනතාව බොහොම අගය කරනවා කියන එකයි. හිසට සෙවණක් ලැබෙන කොට ඒ මිනිසුන් බොහොම සන්තෝෂයෙන් තම දරු පවුලත් එක්ක අලුත් බලාපොරොත්තුවක් ඇතුව ඒ වැඩසටහනට යනවා.

ඒ වාගේම එතුමාට මම කියන්න ඕනෑ, මේ නිවාසවලට අමතරව කිසිම සද්දයක් නැතුවාට, කිසිම ඇගැයීමක් නැතුවාට, ප්‍රචාරයක් නැතුවාට මේ හැම පවුලකටම නොමිලේ ඉඩම් කැල්ලක් ලැබෙන බව. ඒ ගැන කිසිම කථාවක් වෙන්නේ නැහැ. නමුත්, එන්න එන්න, දවසින් දවස වටිනාකම වැඩිවන පර්චස් 15ක්, 20ක් ඒ මිනිසුන්ට නොමිලේ ලැබෙනවා. ඒකත් අගය කරන්න ඕනෑ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමා කරන දෙයක්. නමුත්, මෙහි පළමුවෙනි ස්තුතිය ලැබෙන්න ඕනෑ, හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාටයි. එතුමා තමයි 1972දී ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ගෙනැල්ලා ඉඩම් පවරා ගත්තේ. එම නිසා ඒ පළමුවෙනි සහතිකය ලැබෙන්න ඕනෑ හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාටයි. ඊට පස්සේ ඉඩම දෙන එකට සම්මානය ඔබතුමාට ලැබිය යුතුයි.

මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය. මා දකින විධියට මේ ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේ සිටින 225දෙනා එක්ක කවදාවත් එකට තේ එකක් බීලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට දැනට ලැබී තිබෙන යටිනුවර ආසනයේ කිරිමැටිය ගම විවෘත කරන්න ගිය අවස්ථාවේදී වයස අවුරුදු 80ක ආච්චි කෙනෙක් එතුමාට තේ එකක් දුන්නා. එදා කිරිඇල්ල ඇමතිතුමාත් සිටියා. එතුමා ඒ තේ එක ආපහු වෙනත් කෙනෙකුට දුන්නා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, මට ඉඩ දෙන්න. මම ප්‍රශ්නය අහන්නයි යන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මෙම විෂයට අදාළව ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ප්‍රශ්නයට අදාළව තමයි මම අතුරු ප්‍රශ්නය අහන්නේ.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

ඔබතුමා කියන ඒවා ප්‍රශ්නයේ නැහැ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

තමුන්නාන්සේ මගෙන් ඉතුරු ටික අහගන්නද ආයෙත් ලෑස්ති වෙන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please!

කරුණාකරලා ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට මොකටද අනවශ්‍ය ප්‍රශ්න? තමුන්නාන්සේ මා කථාවට පටලවාගෙන ඉතුරු ටික අහගන්න එපා.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

මොනවාද කියන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, නිවාස විෂයය භාර ඇමතිතුමා මේ සභාවට එන්නේත් නැහැ. එතුමා වෙන ලෝකවල වැඩ කරන්නේ. මම උදේ පාන්දර හතරට නැගිටලා නාවලපිටියේ ඉඳලා මේ ප්‍රශ්නය අහන්න ආවේ. හැබැයි, අපේ ප්‍රශ්නයට පිළිතුරක් ඇමතිතුමාගෙන් හම්බ වෙන්නේ නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමා මොනවා හෝ කියනවා; කවුරු හෝ ලියා දෙන එකක් කියවනවා. අපි ඒ පිළිතුර හරි පිළිගන්නවා. හැබැයි මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අදාළ ඇමතිවරුන්ම ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න කියලා. අද ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න අදාළ ඇමතිවරු කවුරුත් නැහැ. ඔබතුමා තමයි හැම දාම ඇමතිවරු වෙනුවෙන් පිළිතුරු කියවන්නේ. අගමැතිතුමාත් සමහර ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැහැ. මම හිතන හැටියට තමුන්නාන්සේත් මෙතැනට ඇවිල්ලා උත්තර ටික දෙන්නේ ඉතාම කලකිරීමෙන්.

තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශවලට ලැබෙන මුදල් ප්‍රමාණවත් නැහැ. නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට වෙන් වන මුදල ප්‍රමාණවත් නැහැ. හැබැයි, ලොතරැයි විකිණීමෙන් ජාතික ලොතරැයි මණ්ඩලය හරහා භාණ්ඩාගාරයට ලැබෙන මුදල් එතුමා අනවශ්‍ය විධියට පෝස්ටර්වලටයි, පුවත් පත් දැන්වීම්වලටයි වියදම් කරනවා.

ගරු ඇමතිතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ මෙයයි. නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අමාත්‍යතුමා ණය බර පටවමින් මේ කරන කටයුතු ඊළඟට එන ආණ්ඩුවටත් මහා බරක් වනවා. නිවාස සෑදීම සඳහා එතුමා මේ වියදම් කරන විධිය, මේ ගන්නා ක්‍රියා මාර්ග මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් ඔබතුමාත් පිළිගන්නවාද? මේ අහිංසක මිනිසුන් ණය කිරීම ඔබතුමා පිළිගන්නවාද? ඔබතුමා මෙයට පිළිතුරක් ලබා දෙනවාද, නැත්නම් ඇමතිතුමා මාර්ගයෙන් මට පිළිතුරුක් ලබා දෙනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඇත්ත වශයෙන්ම අපි ඒ චෝදනාව පිළිගන්නේ නැහැ. මේ රටේ ජනතාව බොහොම අගය කරන නිවාස වැඩසටහනක් ඒක. ඔබතුමාට ඇමතිතුමා මාර්ගයෙන් ලිඛිතව උත්තරය ලබා දෙන්නම්.

## ඉංජිනේරු නිශාන්ත ද අල්විස් මහතාට ආරක්ෂාව ලබා නොදීම: හේතු
## பொறியியலாளர் திரு. நிஷாந்த டி. அல்விஸ் என்பவருக்குப் பாதுகாப்பு வழங்கப்படாமை: காரணம்
## NON-PROVISION OF SECURITY FOR ENGINEER NISHANTHA DE ALWIS: REASONS

753/'19

**11.** **ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනට සහාය දීම හේතුවෙන් ආරක්ෂාව සැලසිය යුතු බවට අධිකරණ නියමයක් ලැබී ඇති සත්‍ය ගවේශකයෝ සංවිධානයේ ඉංජිනේරු නිශාන්ත ද අල්විස් මහතාට මෙතෙක් ආරක්ෂාව ලබා නොදීමට හේතුව කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

( அ) பயங்கரவாதத்தைத் தோற்கடிக்கும் போராட்டத்திற்கு உதவியதன் காரணமாக பாதுகாப்பு வழங்க வேண்டுமென நீதிமன்றக் கட்டளையிட்டுள்ள உண்மையைக் கண்டறிவோர் அமைப்பைச் சேர்ந்த பொறியியலாளர் திரு நிஷாந்த டி. அல்விஸ் என்பவருக்கு இதுவரை பாதுகாப்பு வழங்கப்படாமைக்கான காரணம் யாது என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he inform this House the reasons for not providing security up to now for Engineer Nishantha de Alwis of the organization Sathya Gaveshakayo despite the court order to the effect that he should be provided protection as he had assisted the battle against terrorism?

(b) If not, why?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) මෙම පුද්ගලයා විසින් කර ඇති වංචනික ක්‍රියා සම්බන්ධයෙන් ගම්පොල හා මහනුවර විශේෂ අපරාධ විමර්ශන ඒකක මඟින් පවත්වාගෙන යන ලද ගම්පොල ම/ උ 93129, 96729, මහනුවර ම/උ බී 35070/15, 13447/16 දරන නඩු සඳහා වරෙන්තු නිකුත් වී ඇත.මොහු විසින් දක්වා ඇති පරිදි බී 24256/11 දරන නඩුවේ සැකකරුවන්ගෙන් මොහුට ජීවිත තර්ජනයක් ඇති බවට අනාවරණ වී නොමැත. එසේම, ඇතිවන ඕනෑම හදිසි තත්ත්වයකදී මොහු වෙත ආරක්ෂාව ලබා දීමට මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි හා මහනුවර මූලස්ථාන පොලිස් පරීක්ෂක දැනුවත් කර ඇත. මහේස්ත්‍රාත් අධිකරණයේ බී 24256/11 අංක දරන නඩුවට අදාළව මොහු වෙත ආරක්ෂාව ලබා දෙන ලෙස කර තිබූ මහේස්ත්‍රාත් නියෝගය අවලංගු කර දෙන ලෙස, "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය" විසින් කර ඇති ඉල්ලීම අනුව කටයුතු කරන ලෙස ගරු මහේස්ත්‍රාත්තුමා නියෝග කර ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විධියට ඔබතුමාට පොලීසියේ වග කීමත් පැවරී තිබෙනවා. ත්‍රස්තවාදය අතහැරලා, ජාතික දේශපාලනයට, එහෙම නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට පුද්ගලයෙක් ආවාම මේ රටේ අපි ඒක අගය කර තිබෙනවා. එහෙම පැමිණි පුද්ගලයන් පක්ෂ ගණනාවක සිටිනවා.

නැඟෙනහිර පළාතේ හිටපු මහ ඇමති පිල්ලෙයාන් පිළිබඳවයි මම කියන්නේ. එතුමා අවුරුදු හතරහමාරක් තිස්සේ රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා සිටිනවා. එතුමාගේ පක්ෂයේ ආරාධනාවක් අනුව, එතුමාගේ 44වන උපන් දිනයට පසුගිය සතියේ මාත් සහභාගි වුණා. ඒ වෙලාවේ එතුමාගේ දේශපාලන කණ්ඩායම මට ලිපියක් ඉදිරිපත් කළා. එම ලිපියේ තිබුණේ, එදා ඒ අය ත්‍රස්තවාදය වැළඳගෙන ඉඳලා, ඒ ත්‍රස්තවාදී කටයුතු වැරැදියි කියලා තේරුම් ගෙන පසුව ඒ කටයුතුවලින් ඉවත් වෙලා, ප්‍රජාතන්ත්‍රවාදීව දේශපාලනයට පැමිණීම ගැනයි. එතුමා දේශපාලනයට ඇවිල්ලා ඒ පළාතේ මහ ඇමතිවරයා වෙලා කටයුතු තිබෙනවා. ඊට පසුව යම් හේතුවක් මත එතුමා අත් අඩංගුවට ගෙන දැනට අවුරුදු හතරහමාරක් තිස්සේ රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටිනවා. එතුමාගේ කණ්ඩායම කිව්වේ, වරදක් කරලා තිබෙනවා නම් එතුමාට විරුද්ධව චෝදනා ගොනු කරලා ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත්තාට කමක් නැහැ කියන එකයි. එතුමා ඇතුළු තවත් කණ්ඩායමක් රිමාන්ඩ් බන්ධනාගාර ගත කර සිටිනවා. ඒ ගොල්ලන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

පිළිගන්නේ නැතිව නැවත වතාවක් වෙනත් පැත්තකට ඒ අය යොමු කරන්න හදනවාද කියලා ඒ අයට හැඟෙන බව කිව්වා. නමුත් නැවත ඒ ගොල්ලන් එහෙම වෙන්නේ නැහැ කියලාත් කිව්වා. ඒ වාගේම මේ රටේ නිදහස වෙනුවෙන් පසුගිය කාලයේ කැපවෙලා කටයුතු කළ පුද්ගලයන් විශාල පිරිසක් චෝදනා ඔප්පු කරගන්න බැරිව රිමාන්ඩ් බන්ධනාගාර ගත වෙලා ඉන්නවා. ඒ අයට චෝදනා තිබෙනවා නම් අධිකරණයට ඉදිරිපත් කරලා නඩු කියන්න. එහෙම නැත්නම්, ඒ අය රිමාන්ඩ් බන්ධනාගාරවලින් නිදහස් කරලා අනෙකුත් පුරවැසියන්ට වාගේ කටයුතු කරන්නට ඉඩ ප්‍රස්ථාව ලබාදිය නොහැක්කේ මන්ද කියලා පළමුවන අතුරු ප්‍රශ්නය වශයෙන් මා අහන්න කැමැතියි.

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන අපේ නීතිපතිතුමා සමඟත් සාකච්ඡා කරලා, එතුමාගේත් උපදෙස් ලබාගෙන, එවැනි අසාධාරණයක් සිද්ධවෙලා තිබෙනවාද කියලා ආපසු බලන්නම්. නීතිපතිතුමාගෙන් උපදෙස් ලබාගෙන තමයි අපට ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න වෙන්නේ.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. පසුගිය අප්‍රේල් 21 වැනි දා සිදු වුණු බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ වෙඩි බෙහෙත්, ඩයිනමයිට්, සේවා නූල් වැනි දේවල් අවශ්‍ය ප්‍රමාණයට නොලැබීමෙන් අපේ රටේ නිෂ්පාදන අංශයට දැඩි බලපෑමක් වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය ලංකාවේ හැම දිස්ත්‍රික්කයකම තිබෙනවා. මොකද, යම්කිසි සංවර්ධන කටයුත්තක් කරනවා නම් කළු ගල් අවශ්‍යයි. කළු ගල් අතින් කඩලා ඒ කටයුත්ත කරන්න බැහැ. විශාල කළු ගල් කඩන්න නම් ඩයිනමයිට්, නූල් ඇතුළු උපකරණ අවශ්‍යයි. ඒවා නිසි පරිදි නිකුත් වෙන්නේ නැති නිසා අපේ දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය ඇතුළු ලංකාවේ බොහෝ දිස්ත්‍රික්කවල සංවර්ධන කටයුතු ඉතාම මන්දගාමීවයි සිදු වෙන්නේ. මෙය කොයි රජයට වුණත් විශාල වශයෙන් බලපාන දෙයක්. ඒ නිසා නිසි ක්‍රමවේදයක් අනුගමනය කරලා ඒ අයට අවශ්‍ය වෙඩි බෙහෙත් ප්‍රමාණය, අවශ්‍ය අමුද්‍රව්‍ය එක තැනකින් හෝ ලබා දීමට කටයුතු සලස්වා දෙන්න ඔබතුමාට පුළුවන්ද?

**ගරු රුවන් විජේවර්ධන මහතා**
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijewardene)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය නිවැරැදියි. මා හිතන හැටියට මේ හිඟය නිසා අපේ සංවර්ධන කටයුතුවලටත් විශාල බලපෑමක් ඇතිවෙලා තිබෙනවා. මේ ගැන දිගින්-දිගටම ආරක්ෂක ලේකම්තුමාත් දැනුවත් කරලා තිබෙනවා. ආරක්ෂක අමාත්‍යාංශයෙන් දැන් ඒකට යම්කිසි ක්‍රමවේදයක් සකස් කරගෙන යනවා. පුළුවන් තරම් ඉක්මනින් ඒ ගැටලුව නිරාකරණය කරලා, අවශ්‍ය පරිදි ඒ වැඩ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 12 -777/'19- (1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 13 -794/'19- (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 14 -882/'19- (1), ගරු එස්.සී. මුතුකුමාරණ මහතා.

**ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 15 - 965/'19 -(1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත]*

දෙවන වටය. ප්‍රශ්න අංක 9.

## සිලෝන් සෝලා පවර් පුද්ගලික ආයතනය: ලියාපදිංචිය අත්හිටුවීම
### சிலோன் சோலார் பவர் தனியார் நிறுவனம்: பதிவு இடைநிறுத்தம்
### CEYLON SOLAR POWER PRIVATE LIMITED: SUSPENSION OF REGISTRATION

606/’18

**9. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. Vasudeva Nanayakkara)
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අංක 93/2, නුවර පාර, යක්කල ලිපිනයේ පිහිටි සිලෝන් සෝලා පවර් පුද්ගලික ආයතනය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි ආයතනයක්ද; නොඑසේ නම්, අසාධු ලේඛනගත ආයතනයක්ද;

(ii) එම ආයතනයේ ලියාපදිංචිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2017.03.14 වැනි දින අත්හිටුවා තිබේද;

(iii) මෙම අත්හිටුවීමට හේතුව එම සමාගම විසින් සවිකරණ ලද සූර්ය බලශක්ති උපකරණවල තත්ත්වය බාල වීමද; නොඑසේ නම්, ආයතනයේ අභ්‍යන්තර හේතුවක්ද;

(iv) මෙම ආයතනයේ ලියාපදිංචිය අත්හිටුවා ඇත්නම්, ඒ සඳහා නීතිමය පියවරක් නොගෙන අධිකාරිය ඒ සඳහා මැදිහත් වීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ලියාපදිංචිය අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස එම ආයතනයේ ස්ථිරව හා කොන්ත්‍රාත් පදනමින් සේවය කළ 40කට ආසන්න පිරිසකගේ රැකියා අහිමිවී ඇති බව දන්නේද;

(ii) මෙම ආයතනයේ ලියාපදිංචිය අත්හිටුවා ඇත්තේ තාවකාලිකව නම්, ඒ සම්බන්ධයෙන් අදාළ අංශ විසින් පරීක්ෂණ පවත්වා ආයතනය නිවැරදි නම්, නැවතත් ආයතනය පවත්වාගෙන යාමට අවසර ලබා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி மற்றும் தொழில்துறை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) இலக்கம் 93/2, கண்டி வீதி, யக்கல எனும் முகவரியில் அமைந்துள்ள சிலோன் சோலார் பவர் தனியார் நிறுவனமானது இலங்கை புதுப்பிக்கத்தக்க வலு அதிகாரசபையில் பதிவு செய்யப்பட்டுள்ள ஒரு நிறுவனமா அல்லது கறை நிரலில் இடம்பெற்றுள்ள ஒரு நிறுவனமா என்பதையும்;

(ii) மேற்படி நிறுவனத்தின் பதிவானது இலங்கை புதுப்பிக்கத்தக்க வலு அதிகாரசபையினால் 2017.03.14 ஆம் திகதி இடைநிறுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி இடைநிறுத்தத்திற்கான காரணம், குறிப்பிட்ட கம்பனியினால் பொருத்தப்பட்ட சூரிய சக்தி உபகரணங்களின் தரம் குறைவாக இருந்தமையா அல்லது நிறுவனத்தின் உள்வாரியானதொரு காரணமா என்பதையும்;

(iv) மேற்படி நிறுவனத்தின் பதிவு இடைநிறுத்தப்பட்டிருக்குமானால் அது சம்பந்தமாக சட்டரீதியான நடவடிக்கைகளை மேற்கொள்ளாமல் அது தொடர்பில் அதிகாரசபை தலையிடுவதற்கான காரணம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i ) பதிவு இடைநிறுத்தப்பட்டதன் விளைவாக அந்நிறுவனத்தில் நிரந்தர மற்றும் ஒப்பந்த அடிப்படையில் பணியாற்றிய சுமார் 40 பேர் தொழில்களை இழந்துள்ளனர் என்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி நிறுவனத்தின் பதிவானது தற்காலிகமாக இடைநிறுத்தப் பட்டிருக்குமானால் அது தொடர்பாக சம்பந்தப்பட்ட துறைகளினால் விசாரணைகள் நடத்தப்பட்டு நிறுவனம் குற்றமற்றதெனக் காணப்படின் மீண்டும் நிறுவனத்தை நடாத்திச் செல்வதற்கு அனுமதி வழங்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power, Energy and Business Development:

(a) Will he inform this House-

(i) whether Ceylon Solar Power Private Limited located at No.93/2, Kandy Road, Yakkala is an institution registered with the Sri Lanka Sustainable Energy Authority or an institution which has been blacklisted;

(ii) whether the registration of this institution was suspended by the Sri Lanka Sustainable Energy Authority on 14.03.2017;

(iii) whether the reason for the suspension of the registration was due to the poor quality of solar-power equipment installed by the said institution or due to an internal matter of the institution; and

(iv) if the registration of the said institution has been suspended, the reason for the intervention of the Authority without initiating legal action?

(b) Will he also inform this House-

(i) whether he is aware that more than 40 persons who have been employed on contract basis have lost their jobs as a result of the suspension of the registration of the said institution; and

(ii) if the registration of this institution has been suspended temporarily, whether permission will be granted to run the institution again if the institution is found not to be at fault subsequent to investigations by the relevant authorities?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ලියාපදිංචි ආයතනයකි.

(ii) තාවකාලිකව අත්හිටුවන ලදී.

(iii) දෝෂ සහිත සූර්යබල පද්ධති යථා තත්ත්වයට පත් නොකිරීමේ තත්ත්වය සැලකිල්ලට ගෙන මෙම අත්හිටුවීම සිදු කර ඇත. (සූර්ය බලශක්ති උපකරණවල තත්ත්වය බාලවීමක් හෝ ආයතනයේ අභ්‍යන්තර හේතුවක් නිසා මෙම අත්හිටුවීම සිදු නොකරන ලදී.)

(iv) මේ වන විට ලියාපදිංචිය අත්හිටුවා නොමැත.

(ආ) (i) මේ වනතුරු එවැන්නක් වාර්තා වී නොමැත.

(ii) මේ පිළිබඳව පරීක්ෂණයක් කොට, මේ වන විටත් නැවත ආයතනය පවත්වාගෙන යාමට අවසර ලබා දී ඇත.

(ඇ) අදාළ නොවේ.

## එන්ටර්ප්‍රයිස් ශ්‍රීලංකා වැඩසටහන: ගම්පහ දිස්ත්‍රික්කය
## என்றபிரைஸ் ஶ்ரீ லங்கா வேலைத்திட்டம்: கம்பஹா மாவட்டம்
ENTERPRISE SRI LANKA PROGRAMME: GAMPAHA DISTRICT

777/'19

**12.ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා ( ඉන්දික අනුරුද්ධ හේරත් මහතා වෙනුවට)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் சார்பாக)
(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. Indika Anuruddha Herath)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "එන්ටර්ප්‍රයිස් ශ්‍රීලංකා" වැඩසටහන දිවයින තුළ ක්‍රියාත්මක කිරීමේදී ගම්පහ දිස්ත්‍රික්කය සඳහා වෙන් කළ පොලී සහනාධාර මුදල කොපමණද;

(ii) ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී විශේෂ අවධානය යොමු කළ ක්ෂේත්‍ර කවරේද;

(iii) "එන්ටර්ප්‍රයිස් ශ්‍රීලංකා" වැඩසටහන දිවයින තුළ ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගෙන ඇති රාජ්‍ය හා පෞද්ගලික බැංකු කවරේද;

(iv) ඉහත වැඩසටහනට සම්බන්ධවීම සඳහා ණය ඉල්ලුම් කළ ගම්පහ දිස්ත්‍රික්කයේ ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2018 වර්ෂය තුළ ඉහත සඳහන් පුද්ගලයන් වෙනුවෙන් මුදාහරින ලද ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) මෙම ජාතික වැඩසටහනේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "என்றபிரைஸ் ஶ்ரீ லங்கா" வேலைத்திட்டம் நாடளாவிய ரீதியில் செயற்படுத்துகையில் கம்பஹா மாவட்டத்திற்காக ஒதுக்கப்பட்ட வட்டி சலுகை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி வேலைத்திட்டத்தை செயற்படுத்துகையில் விசேட கவனம் செலுத்தப்பட்ட துறைகள் யாவையென்பதையும்;

(iii) "என்றபிரைஸ் ஶ்ரீ லங்கா" வேலைத்திட்டத்தை நாடளாவிய ரீதியில் செயற்படுத்துவதற்காக பயன்படுத்தப்பட்டுள்ள அரச மற்றும் தனியார் வங்கிகள் யாவையென்பதையும்;

(iv) மேற்படி திட்டத்தில் கலந்துக்கொள்வதற்கு கடனுக்காக விண்ணபித்துள்ள கம்பஹா மாவட்டத்தின் விண்ணப்பதாரர்கள் ஆண் பெண் இரு பாலாருக்கும் ஏற்ப தனித்தனியாக எவ்வளவென்பதையும்;

(v) 2018 ஆண்டுக்குள் மேற் குறிப்பிட்டுள்ள நபர்களுக்காக விடுவிக்கப்பட்டுள்ள கடன் தொகை எவ்வளவென்பதையும்;

(vi) மேற்படி தேசிய வேலைத்திட்டத்தின் முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House-

(i) the amount of interest subsidy allocated to the Gampaha District in implementing the "Enterprise Sri Lanka" programme in the Island;

(ii) the fields that were accorded special attention in implementing the above programme;

(iii) the State and private banks that have been enlisted for the implementation of the "Enterprise Sri Lanka" programme in the Island;

(iv) separately by gender, the number of loan applicants from the Gampaha District who applied for loans to join the above programme;

(v) the amount of loans released to the aforementioned persons in the year 2018; and

(vi) the progress of this national programme?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන මුළු දිවයිනම ආවරණය කරමින් ක්‍රියාත්මක වන අතර, ඒ මඟින් එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන් වෙන් වශයෙන් පොලී සහනාධාර වෙන් කර නොමැත. මුළු දිවයින සඳහාම වෙන් කර ඇති පොලී සහනාධාර ප්‍රමාණය පයහත පරිදි වේ.

| වසර | වෙන් කරන ලද ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|
| 2017 | 180 |
| 2018 | 2,417 |
| 2019 | 6,000 |

(ii) එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන රටෙහි ආර්ථික සංවර්ධනය ඇති කරනු වස් පහත ක්ෂේත්‍ර ආවරණය කරමින් ක්‍රියාත්මක වේ.

1. කෘෂිකර්ම
2. ප්‍රවාහන
3. ව්‍යාපාරික
4. අධ්‍යාපන
5. පරිසරය සුරක්ෂණය හා සංචාරක
6. මාධ්‍ය
7. නිවාස
8. බලශක්ති
9. සුරැකුම් මධ්‍යස්ථාන

ඉහත ක්ෂේත්‍ර යටතේ ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම මඟින් ආවරණය වන අංශ පිළිබඳ විස්තර **ඇමුණුම* 01හි** දක්වා ඇත.

(iii) එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන ක්‍රියාත්මක වන බැංකු:

- ලංකා බැංකුව
- මහජන බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
- ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
- නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව
- කොමර්ෂල් බැංකුව
- හැටන් නැෂනල් බැංකුව
- සම්පත් බැංකුව
- ඩීඑෆ්සීසී බැංකුව
- ජාතික සංවර්ධන බැංකුව
- සෙලාන් බැංකුව
- පැන් ඒෂියා බැංකුව
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
- යූනියන් බැංකුව
- අමානා බැංකුව

(iv) එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ණය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා 2019.07.31 දිනට ලියාපදිංචි වී ඇති ණයලාභීන් සංඛ්‍යාව 2,340ක් වන අතර, අපේක්ෂිත මුළු ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 11,709ක් පමණ වේ.

ස්ත්‍රී, පුරුෂ ලෙස වෙන් වෙන්ව තොරතුරු සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත දත්ත පද්ධතියට ඇතුළත් වී නොමැත.

(v) 2018 වර්ෂය තුළ ගම්පහ දිස්ත්‍රික්කය සඳහා ලියාපදිංචි කළ ණයවල වටිනාකම ආසන්න වශයෙන් රුපියල් මිලියන 7,066.5කි. තවද, මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2019.07.31 වන විට ගම්පහ දිස්ත්‍රික්කය සඳහා රුපියල් මිලියන 11,709ක ණය ලියාපදිංචි කර ඇති අතර, එම මුදලින් රුපියල් මිලියන 8,200ක් 2019.07.31 වන විට බැංකු විසින් නිකුත් කර ඇත.

(vi) මෙම වැඩසටහන ඉතා සාර්ථකව දිවයින පුරා ක්‍රියාත්මක වන අතර බැංකු අනුව හා දිස්ත්‍රික්ක අනුව ප්‍රගතිය **ඇමුණුම* 02** හා **ඇමුණුම* 03**හි දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන: විස්තර
## இலங்கை மகாவலி அதிகாரசபைக்குரிய வாகனங்கள்: விபரம்
## VEHICLES BELONGING TO MAHAWELI AUTHORITY OF SRI LANKA: DETAILS

794/'19

**13.ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)**

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)

(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. Jayantha Samaraweera)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

** ඇමුණුම් පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(අ) (i) 2015 වර්ෂය අවසානය වනවිට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වාහන අතරින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සංස්ථා ආදියට පවරා තිබෙන වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම වාහන අතුරින් අනතුරුවලට ලක්වී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අතර අලුත්වැඩියා නොකරන ලද වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) මෙම වාහන නඩත්තු කිරීම සඳහා අධිකාරිය විසින් වැය කළ මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2015 ஆம் ஆண்டு முடிவடையும் போது இலங்கை மகாவலி அதிகார சபைக்கு சொந்தமாக இருந்த வாகனங்களின் எண்ணிக்கை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(ii) மேற்படி வாகனங்களில் அரசாங்க அமைச்சுகளுக்கு, திணைக்களங்களுக்கு மற்றும் கூட்டுத்தாபனங்களுக்கு ஒப்படைக்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி வாகனங்களில் விபத்துக்களுக்குள்ளான வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) அவ்வாகனங்களில் திருத்தப்படாத வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி வாகனங்களைப் பாராமரிக்க அதிகாரசபை செலவு செய்துள்ள பணத்தொகை எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he state-

(i) separately, the number of vehicles belonging to the Mahaweli Authority of Sri Lanka by the end of the year 2015;

(ii) out of the said vehicles, the number of vehicles transferred to the Ministries, departments and corporations of the Government;

(iii) out of the said vehicles, the number of vehicles that have met with accidents; and

(iv) amongst them, the number of vehicles not repaired?

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

(b) Will he inform this House of the amount of money spent by the Authority for maintaining these vehicles?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2015 වර්ෂයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

| ජීප් රථ | කැබ් රථ | කාර් | බස් රථ | ට්‍රැක්ටර් | ට්‍රක් රථ | බවුසර් | මෝටර් සයිකල් | අනෙකුත් වාහන | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 238 | 216 | 15 | 13 | 112 | 42 | 37 | 71 | 180 | 924 |

(ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු කිසිදු වාහනයක් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සංස්ථා ආදියට පවරා නොමැති බව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වාර්තා කර ඇත.

(iii) අනතුරුවලට ලක් වී ඇති වාහන ගණන 26ක් බව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වාර්තා කර ඇත.

(iv) අනතුරුවලට ලක් වී ඇති සියලු වාහන අලුත්වැඩියා කර ඇති බව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වාර්තා කර ඇත.

(ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වාර්තා කර ඇති පරිදි මෙම වාහන නඩත්තු කිරිම සඳහා 2015 වර්ෂයේදී මහවැලි අධිකරිය විසින් රුපියල් මිලියන 71.305ක මුදලක් වැය කර ඇත.

(ඇ) පැන නොනඟී.

## එම්.එම්.ජවුෆර් මහතාගේ බැංකු ගිණුම: වංචනික ගනුදෙනු
## ஜனாப் எம்.எம். ஜவுபரினது வங்கிக் கணக்கு: மோசடியான பணப்பரிமாற்றம்
## ACCOUNT OF MR. M.M. JAUFFER: FRAUDULENT TRANSACTIONS

965/'19

**15.**ගරු නිහාල් ගලප්පත්ති මහතා **(ගරු බිමල් රත්නායක මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு பிமல் ரத்நாயக்க சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. Bimal Rathnayake)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර, රත්මල්ගහවැව, නෙලුගොල්ලාකඩ පදිංචි එම්. එම්. ජවුෆර් මහතා ලංකා බැංකුවේ කහටගස්දිගිලිය ශාඛාවේ අංක 706863 දරන ගිණුම විවෘත කර විදේශ ගතවී 2006.06.01 සිට 2012 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ උපයා ගත් රුපියල් ලක්ෂ 50කට අධික මුදලක් ඉහත ගිණුමට බැර කර ඇති බවත්;

(ii) 2012 දෙසැම්බර් මස ලංකාවට පැමිණ තම ගිණුමේ මුදල් ලබාගැනීමට ජවුෆර් මහතා උත්සාහ කළ අවස්ථාවේ, රුපියල් ලක්ෂ 50කට ආසන්න මුදලක් වංචා සහගතව බැංකුවේ මුදල් කවුන්ටරයෙන් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM) මඟින් ආපසු ලබාගෙන තිබූ බවත්, ඒ පිළිබඳ වහාම ලංකා බැංකුවට දැනුම් දී තම මුදල් ආපසු ගෙවන මෙන් ඉල්ලා සිටියද, මෙතෙක් එම මුදල් ආපසු ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජවුෆර් මහතාට මෙම මුදල් හා ඊට හිමිවිය යුතු පොළිය ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அனுராதபுரம், ரத்மல்கஹவெவ, நெலுகொல்லாகடவில் வதியும் ஜனாப் எம்.எம். ஜவுபர் இலங்கை வங்கியின் கஹட்டகஸ்திகிலிய கிளையில் 706863 ஆம் இலக்கமுடைய கணக்கினைத் திறந்து வெளிநாடு சென்று 2006.06.01 தொடக்கம் 2012 டிசம்பர் வரையிலான காலப்பகுதியில் சம்பாதித்த 50 இலட்சம் ரூபாவுக்கும் அதிகமான தொகையினை மேற்படி கணக்கில் வரவு வைத்துள்ளார் என்பதையும்;

(ii) 2012 டிசம்பர் மாதம் இலங்கைக்கு வருகை தந்து தனது கணக்கிலுள்ள பணத்தினை மீளப் பெற்றுக்கொள்வதற்காக ஜனாப். ஜவுபர் முயற்சித்த வேளையில் சுமார் 50 இலட்சம் ரூபா பணம் மோசடியான வகையில் வங்கியின் நிதி கவுண்டரில் இருந்தும் தன்னியக்க ரெலர் இயந்திரத்தின் (A T M) மூலமாகவும் மீளப்பெறப்பட்டிருந்ததாகவும் அது தொடர்பாக உடனடியாக வங்கிக்கு அறிவித்து தமது பணத்தினை மீளப் பெற்றுத் தருமாறு கோரிய போதிலும் இதுவரை பணம் மீளச் செலுத்தப்படவில்லையென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஜனாப் ஜவுபர் அவர்களுக்கு இப்பணத்தினையும் அதற்கான வட்டியையும் மீளச் செலுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) பணம் செலுத்தப்படுமானால் அது எப்போது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Is he aware that -

(i) Mr. M. M. Jauffer, who is a resident of Nelugollakada, Rathmalgahawewa, Anuradhapura had opened an account numbered 706863 at the Kahatagasdigilya Branch of the Bank of Ceylon before going abroad and had deposited more than 5 million rupees earned during the period from 01.06.2006 to December, 2012; and

(ii) after it was revealed that nearly 5 million rupees had been fraudulently withdrawn over the counter and through the ATM from Mr. Jauffer's account when he had attempted to withdraw money upon his return to the country in December 2012, he had requested the bank to payback his money after the matter was informed to the Bank of Ceylon; although it is yet to be paid?

(b) Will he inform this House-

(i) whether this money and the due interest will be paid to Mr. Jauffer; and

(ii) if it will be paid, when?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) මේ වන විට මෙම මුදල් ජවුෆර් මහතාගේ ගිණුමට බැර කර ඇත.

(ආ) (i) ඔව්.

(ii) රුපියල් 3,890,000.00ක් වන මුදල 2018.10.29 වන දිනද, මෙම මුදලට අදාළ පොලී මුදල වන රුපියල් 1,612,530.54 මුදල 2018.11.29 වන දිනද එම්.එම්. ජවුෆර් මහතාගේ අංක 706863 දරන ගිණුමට බැර කරන ලදී.

(ඇ) පැන නොනඟී.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාවේ කටයුතු කරගෙන යෑමට ගණපූරණයක් නොමැති බව ප්‍රකාශ කර සිටිනවා.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present-*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු සරත් අමුණුගම මැතිතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය.

## වරප්‍රසාද: 2019 අගෝස්තු 22 වන දින "ඩේලි නිවුස්" වාර්තාව
## சிறப்புரிமை: 2019 ஓகஸ்ட் 22ஆம் திகதிய 'டெய்லி நியூஸ்' அறிக்கை
## PRIVILEGE: "DAILY NEWS" REPORT OF 22nd AUGUST, 2019

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Hon Deputy Speaker, I have the Hon. Speaker's permission to raise this matter of Privilege.

As you know, yesterday we had a discussion following a Question on the Colombo-Kandy Expressway. There was an exchange of words. The Hon. Lakshman Kiriella and I are old Friends and we have been in Parliament for a long time. We do not take these things very seriously. We have our different points of view. That is not a big problem at all. But, I was quite perturbed to find in the "Daily News", especially because I was a former Chairman of the Lake House, that this matter has been completely distorted and falsely reported. It finally states after all this - this give and take is perfectly all right; it does not worry me - "….Amunugama who did not respond and maintained silence." This, Sir, as you know, is far from the truth. We had an exchange of words without any malice. I had actually raised an important question, the Hon. Lakshman Kiriella will also accept, regarding the exits on Stage II of the Central Highway because if you are concentrating on opening that, you will have to look at the whole plan. I suggested that you should have an exit to Pinnawala because that is a very visited spot. That is a very positive suggestion. I think the Hon. Minister also took it in that spirit and said he would look at it. So, there is no big problem.

Therefore, Sir, I would like you very much to call the reporter of the "Daily News" who has completely distorted this fact - either he was not present here or he must have been sleeping. Talk to him and ask for decent coverage of what is going on. I think the Hon. Members will remember the time when there were people like Jayantha Padmanabha, Mervyn de Silva and Ajith Samaranayake reporting the proceedings of this House. In those days, there was a special column - a Lobby Column. Now, none of these newspapers even have a Lobby Column.

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹகீம் - நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning, Water Supply and Higher Education)

There is nothing wrong in keeping silent.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Nothing is wrong in that. But, it must be a true reportage of what was happening here.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Silence is golden.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Silence may be golden.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Sometimes, you escape by being silent.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
But, my friends and voters will think that I have kept quiet while all these allegations were made by my good Friend against me. I have no problem with him. But, one would expect a true record of what happens here to be published in the newspapers. I am quite unhappy and as a former Chairman of the Lake House, I should at least take a special interest in seeing that this reportage is correct. I am not saying this with malice to anybody, but it is in the interest of the whole House.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
The Lake House has undergone lots of changes after your chairmanship.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
For the worse.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Every six years, it changes.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Yes, that is right, but for the worse.

But here, I am only raising a bigger issue. Sir, please speak to these newspaper reporters who are here. It will be a good thing if you call them from time to time and express concern that there should be fair and accurate reportage. Of course, it is also incumbent on us as Members of Parliament to point these things out if such things happen so that in the future, even these newspaper reporters will be aware that we are also following these proceedings and will not take things lying down.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will assure, Hon. Member, that appropriate action will be taken on that.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත.

## මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත
## மக்கள் வங்கி (திருத்தம்) சட்டமூலம்
## PEOPLE'S BANK (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance, I move,

"That the Bill be now read a Second time."

Sir, the Hon. Eran Wickramaratne will start the Debate. Before he starts, I would like to mention that විපක්ෂය පෙන්වන ආකාරයට, මේ පනත් කෙටුම්පත තුළින් පෞද්ගලීකරණයක් සිද්ධ වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි; there will be no privatization of the People's Bank. මම මුලින්ම ඒ බව කියන්න ඕනෑ: there will be no privatization of the People's Bank. මෙහිදී සිදු වන්නේ, මහජන බැංකුවේ ප්‍රාග්ධනය මිලියන 10 සිට මිලියන 50,000 දක්වා වැඩි කිරීම පමණයි. ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා ඒ ගැන දීර්ඝ විස්තරයක් කරයි. ඒ කාරණය මම මුලින්ම කිව්වේ, එතකොට මේ විවාදය නියම විධියට කෙරෙන නිසායි. නැත්නම්, පෞද්ගලීකරණයක් අල්ලාගෙන මෙතුමන්ලා කථා කරන්න පටන් ගන්නවා නේ. රජය වෙනුවෙන් මම කියන්නේ, මෙතැන පෞද්ගලීකරණයක් නැහැ, ප්‍රාග්ධනය වැඩි කිරීම විතරයි වෙන්නේ කියන එකයි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[පූ.භා.11.47]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත ගරු සභානායකතුමා මෙම ගරු සභාවට ඉදිරිපත් කළා. මහජන බැංකුවේ වත්කම ට්‍රිලියන 1.57ක් වෙනවා.

ඒ කියන්නේ, බිලියන 1,750ක්. මෙම බැංකුව ලංකාවේ දෙවන විශාලතම බැංකුවයි. දැනට එහි සේවකයන් 7,900ක් ඉන්නවා. බැංකු ශාඛා ප්‍රමාණය 737 ඉක්මවා යනවා. එසේම, මිලියන 10කට වැඩි, ලංකාවේ වැඩිම ගනුදෙනුකරුවන් ඉන්න බැංකුව තමයි මහජන බැංකුව. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව, බැංකු අතර ඉහළම ස්ථානයක් මහජන බැංකුවටත් හිමි වී තිබෙනවා.

පසුගිය වසර දහය තුළදී මහජන බැංකුවෙන් රජයට දායකත්වය -ලාභාංශය- රුපියල් බිලියන 140කට වැඩි ප්‍රමාණයක් වනවා. අද අපි මේ සංශෝධන පනත් කෙටුම්පත ගෙනෙන්නේ, බැංකුවේ අනාගතය දිහා බලලායි. බැංකුවක් වර්ධනය වෙන්න ප්‍රාග්ධනය අවශ්‍යයි. ඒක අලුත් දෙයක් නොවෙයි. විශේෂයෙන්ම ඒක බැංකුවලට අවශ්‍යයි. බැංකුවලින් දෙන්නේ ණය. ඔවුන් තැන්පත්කරුවන්ගෙන් මුදල් ගන්නවා. අරගෙන ඒ මුදල් ණය හැටියට දෙනවා. නමුත්, ප්‍රාග්ධනයක් තිබෙන්න ඕනෑ, බැංකුවක් ශක්තිමත් වෙන්න. ඒක අපේ රටේ මහ බැංකුවේ තිබෙන නීති, රීති සම්පූර්ණ වීමක් විතරක් නොවෙයි. බැංකු අධීක්ෂණය වීම ජාත්‍යන්තර මට්ටමිනුත්, ජාත්‍යන්තර නීතියෙනුත්, Basel නීතියෙනුත් සිදු වෙනවා. ඒ නිසා අවම ප්‍රාග්ධනය තිබිය යුතු ප්‍රතිශත සඳහන් කරනවා. එහිදී Tier 1 capital and Tier 2 capital කියලා තිබෙනවා. ඒවා සම්පූර්ණ කරන්න ඕනෑ. මහජන බැංකුව දිගින් දිගටම, හැම අවුරුද්දේම ඒවා සම්පූර්ණ කරලායි තිබෙන්නේ. මොන ආණ්ඩුව තිබුණත්, ඒ අවම ප්‍රමාණය ඔවුන් සම්පූර්ණ කර තිබෙනවා. නමුත්, අවම ප්‍රමාණය විතරක් තිබිලා මදි. මොකද, බැංකුවක් වර්ධනය වෙන්න බලපාන්නේ එහි තිබෙන ප්‍රාග්ධනය වන නිසා.

1979ට ප්‍රථමයෙන් ලංකාවේ තිබුණේ බොහොම සීමිත බැංකු ප්‍රමාණයක්. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය කාලයේදී ඇති වුණු බැංකු පමණයි, විදේශීය බැංකු ලෙස තිබුණේ. ඊට අමතරව, අපේ රටේ තිබුණු ප්‍රධාන බැංකු දෙකෙන් එකක් තමයි මහජන බැංකුව. නමුත්, එදා -අවුරුදු 40කට, 50කට උඩදී- ඒ බැංකුවලට වෙළෙඳ පොළේ විශාල ප්‍රතිශතයක් තිබුණා. බැංකුකරණය අඩුයි. මුදල් තැන්පත් කරන්නත්, මුදල් ලබා ගන්නත් හුඟක් අය බැංකුවලට ගියේ නැහැ. ඒ සඳහා වෙන වෙන ක්‍රම, විධි තිබුණා. නමුත්, අද බැංකුකරණය වැඩි වෙලා තිබෙනවා. නමුත්, අපේ බැංකුවලට එදා වෙළෙඳ පොළේ තිබුණු ස්ථානය එක්ක බලද්දී, අද අඩුවක් වෙලා තිබෙනවා.

අද අපේ ලංකා බැංකුව, මහජන බැංකුව ඇතුළු රජයේ බැංකුවලට විශේෂයෙන්ම ණය දෙන කොට ඒ ණයවල ප්‍රතිශතය සියයට 45ට වඩා අඩු වෙලා තිබෙනවා. අපි මේ ක්‍රමයටම ඉදිරියට ගියොත්, මම හිතන විධියට ඒ ප්‍රතිශතය වසර 10කින් සියයට 35කටත්, තවත් වසර 10කින් සියයට 25කටත් අඩු වේවි.

අපි බොහෝ වෙලාවට කථා කරන්නේ, බැංකුවේ අයිතිය ගැනයි. බැංකුවේ අයිතිය සියයට සියයක්ම රජයට තබා ගන්න ඕනෑය කියන එකයි අපි කථා කරන්නේ. දැනටත් මහජන බැංකුවේ අයිතිය සියයට සියයක්ම රජයට තිබෙනවා. මේ ගෙනෙන සංශෝධනවලින් ඒක වෙනස් කරන්නම බැහැ. මොකද, මහජන බැංකු පනතේ දහතුන්වැනි කොටසේ - Section 13 - සම්පූර්ණයෙන්ම සඳහන් වෙනවා, බැංකුවේ අයිතිය රජය සතුයි කියන එක. එහි කිසිම සංශෝධනයක්, කිසිම වෙනස් වීමක් නැහැ, අද ඉදිරිපත් කරන මේ කෙටුම්පතින්. නමුත්, අපි මතක තබා ගන්න ඕනෑ, බැංකුවකට වැදගත් වන්නේ අයිතිය විතරක් නොවන බව. වෙළෙඳ පොළේ තිබෙන ප්‍රතිශතයත් බැංකුවකට වැදගත් වෙනවා. අපි retail trade එක ගත්තොත්, අද supermarkets තිබෙනවා වාගේම හන්දියේ පොඩි කඩයත් තිබෙනවා. කඩේ අයිතිය සියයට සියයක් තියා ගන්න පුළුවන්. නමුත්, වෙළෙඳ පොළ ගත්තොත්, එයට වෙළෙඳ පොළේ තිබෙන ප්‍රතිශතය බොහොම කුඩායි. නමුත්, supermarket එකක් ගත්තොත්, වෙළෙඳ පොළ ප්‍රතිශතය විශාලයි.

මා විශ්වාස කරනවා, අපේ රාජ්‍ය බැංකු දෙකට වෙළෙඳ පොළ තුළ තිබෙන ඒ ශක්තිය අපි අඩු නොකළ යුතුයි කියලා. මට මතකයි, මා කුඩා කාලයේ, කොට කලිසම ඇඳගෙන පාසල් යන කාලයේ, මවත් එක්ක ලංකා බැංකුවේ Taprobane Branch එකට ගියාම එහි කටයුතු කෙරුණු හැටි. මුලින්ම token එකක් දෙනවා. ඒක අරගෙන, විනාඩි 45ක් විතර බංකුවේ වාඩි වෙලා ඉන්න ඕනෑ, cheque එකක් මාරු කර ගන්න. අන්න ඒ වාගේ තත්ත්වයක් තමයි තිබුණේ. 1979 වර්ෂයේදී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය ජාත්‍යන්තරයට විවෘත වී තරගකාරීත්වය ඇති වීමෙන්, ලංකාවේ තිබෙන රාජ්‍ය බැංකු - විශේෂයෙන්ම ලංකා බැංකුවයි, මහජන බැංකුවයි - සේවා මට්ටමින් හා තාක්ෂණය භාවිත මට්ටමින් ඉදිරියෙන් ඉන්න බව අද අපට ආඩම්බරයෙන් කියන්නට පුළුවන්. ඒ තත්ත්වයට එන්න හේතුව වූයේ තරගකාරී බැංකු ක්ෂේත්‍රයක් ඇති වීමයි. අද ලංකාවේ ඒ බැංකු දෙකෙන් ලැබෙන සේවාව එංගලන්තයේ බැංකුවකින් ලැබෙන සේවාවටත් වඩා හොඳයි කියන එක මට කියන්නට පුළුවන්. එතකොට අහයි, මට එංගලන්තයේ බැංකු ගිණුම් තිබෙනවාද කියලා. මට එංගලන්තයේ බැංකු ගිණුම් නැහැ. නමුත් දරුවන් දෙදෙනෙක් අධ්‍යාපනය ලබනකොට, ඒ දරුවන් දෙදෙනා අතරේ තිබෙන ගනුදෙනු දෙස බලනවිට, ගනුදෙනු කිරීම සඳහා යන කාලය දෙස බලනවිට, ලංකාවේ බැංකුවලින් -ලංකා බැංකුවෙන් හා මහජන බැංකුවෙන් - ඊට වඩා ශීඝ්‍රයෙන් බැංකු සේවාව ලබා ගන්නට පුළුව කියන එක මම ආඩම්බරයෙන් කියන්න ඕනෑ. නමුත් මට තිබෙන ගැටලුව හා ප්‍රශ්නය මෙයයි.

අපි හරිහැටි ක්‍රියා කළේ නැත්නම් අපේ රාජ්‍ය බැංකු දෙකේ වෙළෙඳ පොළ ප්‍රමාණය අඩු වෙනවා. දැනට ඒ ගණන සියයට 45කට වඩා අඩුවෙන් තිබෙනවා. තව වසර 10කින් සියයට 35කට සහ තව වසර 20 ක් යනවිට එය බොහොම අඩු ප්‍රමාණයකට අඩු වේගෙන යනවා. ලබන වසර පහේදී සමහර විට ලංකාවේ පෞද්ගලික බැංකු අපේ රජයේ බැංකු අභිභවා යන්නට පුළුවන්. එම නිසා අපි යම්කිසි පියවර ගන්නට ඕනෑ. ඒ පියවරවලින් ප්‍රධාන පියවර වන්නේ බැංකුවල ප්‍රාග්ධනය වැඩි කිරීමයි. ප්‍රාග්ධනය වැඩි කළේ නැත්නම් ඒ දේවල් කරන්නට බැහැ.

අපි බැංකු ඉතිහාසය දෙස බැලුවොත්, මොන ආණ්ඩුවක් තිබුණත් රජයකට මේ බැංකුවලට දමන්න පුළුවන් ප්‍රාග්ධනය ඉතා හීනයි; බොහොම අඩුයි. ඒකට එක හේතුවක් මම කියන්නම්. ලංකාවේ ආර්ථිකයේ විශේෂයෙන්ම ඉතිරිය - savings - දිහා බලපුවාම, එය ප්‍රතිශතයක් හැටියට අඩුයි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ලංකාවේ බැංකුවල ඉතිරිය සියයට 15, 16, 17, 18 ක් විතර වෙනවා. නමුත් ඉන්දියාව වාගේ රටක ඉතිරිය සියයට 30ට වඩා වැඩියි; චීනය වාගේ රටක එය සියයට 50කට වඩා වැඩියි. මොන රජය තිබුණත්, රජයකට ආයෝජනය කරන්නට පුළුවන් ප්‍රමාණය අඩුයි. එලෙස අඩු නිසා තමයි බැංකුවලට ඒ මුදල යොදවා ඒ බැංකුවල තිබෙන ඒ වෙළෙඳපොළ ප්‍රතිශතය ආරක්ෂා කරන්නට බැරි වන්නේ.

මේ සඳහා ක්‍රම දෙකක් තිබෙනවා. ඒවා ප්‍රාග්ධනය හා ණයකර - debentures - කියන ක්‍රම දෙක හැටියට ගන්නට පුළුවන්. මහ බැංකුවේ නියාමනය ගත්තත්, බාසල් සම්මුතියේ නියාමනය ගත්තත්, debentures හරහාත් බැංකුවේ ප්‍රාග්ධනය වැඩි කර එය ඉදිරියට ගෙන යන්නට පුළුවන්.

එම නිසා අපි යෝජනා කරනවා, සංශෝධන පනත් කෙටුම්පතක් ගෙන එන්න; 1961 අංක 29 දරන මහජන බැංකු පනතට සංශෝධන හතරක් ගෙනෙන්න. 12 වන වගන්තිය, 20

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා මහතා]

වන වගන්තිය, 21 වන වගන්තිය හා 43 වන වගන්තිය යන වගන්ති හතර සංශෝධනය කරන්න. එයින් 12 වන වගන්තියට අදාළ වන්නේ බලයලත් කොටස් ප්‍රාග්ධන සීමාව - the authorized capital of the bank - රුපියල් බිලියන එකේ සිට රුපියල් බිලියන 50 දක්වා වැඩි කිරීමයි. එක්දහස් නවසිය හැට ගණන්වල බැංකුව පිහිටුවනකොට රුපියල් බිලියනයක් තිබුණාට කමක් නැහැ. අද තිබෙන තත්ත්වයේ හැටියට රුපියල් බිලියනයක capital එකක් කියන්නේ, බොහොම අඩු මුදලක්. බිලියනයයි තිබෙන්නේ. එම නිසා අපි එය රුපියල් බිලියනයේ සිට රුපියල් බිලියන 50කට වැඩි කරනවා. ලංකා බැංකුවටත් බිලියන 50ක් තිබෙනවා. මේ සංශෝධන පනත් කෙටුම්පත හරහා අපි එය වැඩි කරන්නට යෝජනා කරනවා. පාර්ලිමේන්තුවේ අනුමතිය ඉල්ලන්නේ ඒකටයි. බැංකුවේ මූල්‍ය ශක්‍යතාව තවදුරටත් ශක්තිමත් කර ගැනීමට එයින් හැකි වෙනවා. මෙය 2014 වර්ෂයේදී විගණකාධිපති වාර්තාවේත් සඳහන් කළා. මහජන බැංකුවේ බලයලත් කොටස් ප්‍රාග්ධනය බිලියන එකේ පමණක් නොරඳවා, තවදුරටත් ඒ සීමාව ඉහළට දමන්න කියලා 2014 වර්ෂයේදී එතුමා නිර්දේශ කළා. කෙසේ හෝ අවුරුදු 5කට පසුව දැන් අපි ඒ දේ සිදු කරනවා. මේ ප්‍රාග්ධන සීමාව වැඩි කිරීම අත්‍යවශ්‍ය වන්නේ අනෙකුත් රාජ්‍ය බැංකුවලටත් අනුමත ප්‍රාග්ධන කොටස් ප්‍රමාණය වැඩි කර තිබීම නිසායි. අපි 2000 වර්ෂයේදී ලංකා බැංකුවේ ප්‍රාග්ධනය බිලියන 50ට වැඩි කළා. ඒකම තමයි මෙතැනදීත් කරන්නේ. සංශෝධිත පනත් කෙටුම්පතේ යෝජිත 20, 21, 43ට අදාළ වන්නේ ණයකර නිකුතුව - issue of debentures - තමයි. රජයේ ඇපවීමක් නොමැතිව ස්වාධීනව මහජන බැංකුවට කටයුතු කිරීමට අනුමැතිය ඉල්ලා සිටීමයි අප මෙයින් කරන්නේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට කථා කරන්න විනාඩි 21ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කර න්න විනාඩියක කාලයක් දෙනවාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා කියන එක හරි. මේ මුදල බිලියන එකේ සිට බිලියන 50 දක්වා වැඩි කළ යුතුයි. දැනට අවශ්‍ය වෙලා තිබෙන්නේ බිලියන 13යි. නමුත් 2030 විතර වෙන කොට ඔය කියන ගණනට යන්න ඕනෑ. ඔබතුමා මෙතැන සඳහන් කළා නේ, ණයකර නිකුත් කරනවා කියලා. නිකුත් කරන කොට, ඒ කොටස ණයකර කොටසක් බවට පත් නොකරන බවට - කොටස් දෙන කෙනෙකුට මිලදී ගැනීමට හැකියාවක් නොමැති බවට - තිබෙන සහතිකය මොකක්ද? එතකොට ණයකර කොටස් වෙන්නේ බැහැ. ඒකට තිබෙන සහතිකය මොකක්ද?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයත් අහන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට කථා කරන්න විනාඩි 21ක කාලයක් තිබෙනවානේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මට පැහැදිලි කිරීමක් කර ගන්න අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමාට බාධා කරන්නේ නැතුව කථා කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මා බාධා කරනවා නොවෙයි. මේක ඉතාම වැදගත් ජාතික ප්‍රශ්නයක් නේ. ඔබතුමන්ලා මහජන බැංකුවේ අනුදත් ප්‍රාග්ධනය වැඩි කරනවා. මගේ ප්‍රශ්නය මෙයයි. අනුදත් ප්‍රාග්ධනය කොටස් දෙකකට බෙදනවා, නිකුත් කළ ප්‍රාග්ධනය හා නිකුත් නොකළ ප්‍රාග්ධනය කියලා. එතකොට අනුදත් ප්‍රාග්ධනයෙන් නිකුත් කළ ප්‍රමාණය වැඩි කරන්න, කොටස් නිකුතුවක් කරන්න බලාපොරොත්තු වෙනවාද? අනුදත් ප්‍රමාණය පමණක් වැඩි කිරීමද සිදු වෙන්නේ කියන එක පැහැදිලි කළොත් හොඳයි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Authorized capital එක අපි වැඩි කරනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒකෙන් issue කරන ප්‍රමාණය නොවෙයි?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Authorized capital එක වැඩි කරනවා. කලින් කලට පවතින රජය තිබෙන විධියට මුදල් දමන්න වෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒක පෞද්ගලික අංශයට දෙන්නේ නැහැ?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
නැහැ. මේක සම්පූර්ණයෙන්ම රජයට අයිතිය තිබෙනවා. 13වන කොටසට කිසිම සංශෝධනයක් නැහැ.

මම නැවත එන්නම්, debenture issue එකට. මේ ණයකර - debentures - සඳහා රජයේ ඇපවීමක් නොමැතිව ස්වාධීනව මහජන බැංකුවට කටයුතු කිරීමට අනුමැතිය ඉල්ලනවා. ඒ කියන්නේ දැන් මහජන බැංකුව ණයකරයක් - debenture එකක් - දැම්මොත් ඒකට රජයේ guarantee එකක් අවශ්‍යයි. අනෙක් රජයේ බැංකුවලට අවශ්‍ය නැහැ. මහජන බැංකුවට විතරක් අවශ්‍යයි. හරියට ඒ අයගේ අත පස්සට ගැට ගහලා කරන්න හදන වැඩක් වාගේයි මේක. නැහැ, අපි මහජන බැංකුව නිදහස් කරනවා. ඒ අයගේ මූල්‍ය ශක්‍යතාව අනුව, වෙළෙඳ පොළ ප්‍රමාණය අනුව මහජන බැංකුවට තීරණ ගන්න පුළුවන්. ඒ අයට අවශ්‍ය නම් ඒ අයගේ ණයකර - debentures - වැඩි කරන්න පුළුවන්. ඒ අයට වැඩියෙන් ණය දෙන්න ඕනෑ නම් ඒ අයට ඒක කරන්න පුළුවන්. ප්‍රාග්ධනය වැඩි කිරීමෙන්, ණයකර වැඩි කිරීමෙන් කරන්නේ ඇත්ත වශයෙන්ම ණය දීමේ හැකියාව වැඩි කිරීමක් තමයි සිදු වන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා එතුමාට අවස්ථාව දෙනවාද?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, debentures ගැන ඉදිරියේදී කියනවා කියලා. ඔබතුමා නිශ්චිතව කිව්වා, මේ කොටස් විකිණීමක් සිදු වන්නේ නැහැ. මේක පෞද්ගලික අංශයට යන්නේ නැහැ කියලා. නමුත් ඔබතුමා දන්නවා 13 වැනි වගන්තියේ බැංකුවේ කොටස්කරුවන් කියන එක දැනට ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙන බව, රජය සහ සමුපකාර සමිති කියලා. ඔබතුමන්ලා හරියට විග්‍රහ කරලා තිබෙන්නේ ඇත්තටම 13 වගන්තිය නොවෙයි, 12 වෙනි වගන්තියේ 2 සහ 3 කියන උපවගන්තිවලින්. ඔබතුමන්ලා කොටස්කරුවන් කියන එක අයින් කරනවා. "කොටස්කරුවා" කියන නිර්වචනය පනතින් අයින් කරනවා. අන්න එතැන තමයි ගැටලුව එන්නේ. ඔබතුමන්ලා මේ අයින් කිරීම හරහා පෞද්ගලීකරණයට ක්‍රමානුකූලව පාර කැපීමට අවශ්‍ය කරන ඉඩකඩක් බැංකුවට නිර්මාණය කරලා තිබෙනවා.

අනෙක් කාරණය මෙයයි. ඇයි, මුදල් මණ්ඩලයට තිබෙන බලය අයින් කරන්නේ? තමන්ගේ ණය, තමන්ගේ කටයුතු තමන් කර ගන්න කියලා මුදල් මණ්ඩලයෙන් කරන විමසීම අයින් කරලා, සහමුලින්ම ඒ කටයුතු බැංකුවට භාර දෙන්නේ ඇයි?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මගේ කථාවේදී ඒ සමහර දේවල් පැහැදිලි කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි හයක කාලයක් පමණයි තිබෙන්නේ, ගරු රාජ්‍ය ඇමතිතුමා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ටිකක් වැඩිපුර වෙලාවක් අවශ්‍ය වෙයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමාට වෙලාව වැඩි පුර දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මට කියන්න, කාගේ වෙලාවද දෙන්නේ කියලා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු ඇමතිතුමාට ලබා දී තිබෙන වේලාවෙන් ගන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Thank you.

රජයේ ඇපකරයක් නොමැතිව ණයකර නිකුත් කිරීමේ හැකියාව දැනටමත් ලංකා බැංකුවට හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවට තිබෙනවා. මහජන බැංකුවට විතරයි නැත්තේ. අපි මේ කරන දේ අමුතු දෙයක් නොවෙයි. ඒ බැංකුවලට තිබෙන නිදහසම තමයි අපි මේ People's Bank එකටත් ලබා දෙන්නේ. මේ සංශෝධන තුළින් බැංකුවේ අයිතිය පිළිබඳව කිසි වෙනසක් වෙන්නේ නැහැ කියලා මම නැවතත් සඳහන් කරනවා.

12 වන වගන්තිය වෙනස් කිරීමට 2013 වසරේදී බැංකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව මුදල් ඇමතිවරයා ලෙස හිටපු ජනාධිපතිවරයා කැබිනට් පත්‍රයක් දැම්මා. නමුත් ඒ කැබිනට් පත්‍රය ක්‍රියාත්මක වුණේ නැහැ. මේ විවාදය අද ඊයේ ඇති වුණු විවාදයක් නොවෙයි. මේ විවාදය අවුරුදු ගණනාවක් දිගින් දිගටම ගිහින් තිබෙනවා. මහජන බැංකු පනත කාලීනව සංශෝධනය කර ගැනීම අපේ අරමුණයි. මෙහිදී සිදු වන්නේ රජයේ බැංකු සියල්ලක්ම එක හා සමානව ක්‍රියාත්මකවීමයි.

මෙතැන ප්‍රශ්න කිහිපයක් පැන නැඟුණා. මේ බැංකුව අපි සමාන කරනවා, අනෙක් බැංකුවලට. I must mention this again. The

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

proposed Amendment to Section 12 is to increase the authorized capital of the Bank from Rs. 1 billion to Rs. 50 billion to make it similar to its larger peer State bank. That is the intention of this. In 2014/2015 Report, the Auditor-General's Department raised concerns about the inadequacy of the Bank's authorized share capital and it wanted that to capitalize itself. To enable the Bank issue debentures for its regulatory capital purposes similar to other State-owned banks, we are moving this proposal.

රජයේ ඇපකරවලින් සිදුවන එක් කාර්යයක් තමයි guarantee එකක් නැතුව ඒ අයට තීරණය කරන්න හැකි වීම. දෙවැනි එක, මේ අයට දැන් වෙළෙඳ පොළට යෑමට හැකි වීම. Guarantee එකක් සහිතව ණයකරයක් - debenture එකක් - ගන්න ගියොත්, ඒක ඒ අයගේ capital එකට ගණන් ගන්න බැහැ. ඒක තමයි international accounting rule එක. ඒ නිසා ඒ ගොල්ලන්ගේම ශක්තියෙන් debenture එකක් ගන්න පුළුවන් නම්, ඒ ගොල්ලන්ගේ ප්‍රාග්ධනය වැඩි කරලා, ඒ ගොල්ලන්ට ඒ හරහා වැඩියෙන් ණය දෙන්න පුළුවන්.

මෙතැනදී දිගටම අහපු ප්‍රශ්නය තමයි, මේ නීතිය කොහොම හරි වෙනස් කරලා බැංකුව විකුණන්න මාර්ගයක් සලසනවාද, නැද්ද කියන එක. පෞද්ගලීකරණය කරන්න ඕනෑ නම්, මෙවැනි සංශෝධනයක් හරහා කරන්න බැහැ. ඕනෑම රජයකට ඕනෑම සංස්ථාවක් -ලංකා බැංකුව වෙන්න පුළුවන්, මහජන බැංකුව වෙන්න පුළුවන්, ඒ වාගේ ඕනෑ එකක්- පෞද්ගලීකරණය කරන්න ඕනෑ නම්, ඒ සඳහා සංශෝධනය වෙනම පාර්ලිමේන්තුවට ගෙනෙන්න වෙනවා. වෙනම පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඒක ගැන පාර්ලිමේන්තුවේ වෙනම වාද-විවාද කරන්න වෙනවා. පාර්ලිමේන්තුවේ අනුමතිය අනිවාර්යයෙන්ම ඒකට අවශ්‍යයි. එහෙම නැතුව එය කරන්නම බැහැ. මේ සංශෝධනය හරහා ඒක කරන්න බැහැ. [බාධා කිරීමක්] ඔව්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Debentures convert කරගන්න පුළුවන්. එතැනින් තමයි මේ පාර එන්නේ කියලායි මේ බැංකුකරුවන් කියන්නේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම මේක නීතිඥ මහත්වරුන් එක්ක සාකච්ඡා කළා. ඒ convertible debenture එකක් වෙන කාටවත් convert කරන්න බැහැ. රජයට අමතරව කාටවත් convert කරන්න බැහැ, දැන් තිබෙන සංශෝධන අනුව. මේක කළ හැක්කේ රජයට පමණයි. අනාගතයේදී ඒක වෙනස් වෙන්න යනවා නම් - Convertible debenture එකක් convert කරන්න නීතිය අනුව බැහැ; කළ හැක්කේ රජයට විතරයි. ඒක වෙන කාගේ හෝ නමට පවරන්න බැහැ. එතකොට default එකක් වුණොත්, ඒක සාමාන්‍ය default එකක් වාගේම තමයි. ඒක ගෙවනකම් ඉන්න වෙනවා. It is like any other default. If there is a default on any liability or any obligation, because Section 13 will not permit a conversion to a non-government entity, then it will remain in the hands of the Government. That is the way this has been actually designed. This provides for the Bank to actually go into the debt market, which opportunity it otherwise did not have while the other banks did. Now, this Bank has the opportunity of going into the debt market. The decision can be taken by the Bank because all other Sri Lankan State-owned banks have that right. Only the People's Bank does not have it because it is required to get a guarantee from the Government. This releases it from getting that guarantee so that it can go straight into the debt market.

Then, in 2016 and 2018, the Central Bank repeatedly stressed the importance of bolstering its regulatory capital levels. The Monetary Board of the Central Bank reiterated this in a letter in early 2019, and Central Bank requested the People's Bank to expedite amendments to its Act to enable the Bank to issue debentures to meet its regulatory capital.

මේ ඉල්ලීම ආවේ රජයෙන් විතරක් නොවෙයි. මහ බැංකුවෙනුත් 2016, 2017, 2018 වර්ෂවල සිට කියා තිබෙනවා, ණයකර ඉදිරිපත් කරලා, ඒ අයගේ ප්‍රාග්ධනය වැඩි කර ගන්නට දිගින් දිගටම මේ සංශෝධන ගෙනෙන්න බැංකුවට අවසර දෙන්න කියලා. That is basically to increase capital and give it flexibility. මුදල් මණ්ඩලයෙන් - Monetary Board එකෙන් - මේ ඉල්ලීම ඇවිල්ලා තිබෙන්නේ. මේ ඉල්ලීම දිගින් දිගටම ආවත් දැන් තමයි අපි මේ ඉල්ලීම ඉදිරිපත් කරන්නේ.

මේ ඉදිරිපත් කරපු එක මුදල් මණ්ඩලයේ අධීක්ෂණයෙන් පිටට යනවා කියන එක තමයි කියන්නේ. Any argument that the supervision of the Monetary Board is hereby taken out will remain baseless. මෙහෙම හිතන්න. මේ රටේ රජයේ බැංකු ඇතුළත්ව සියලු බැංකු තිබෙන්නේ මුදල් මණ්ඩලයේ අධීක්ෂණය යටතේයි. ඒකේ කිසිම වෙනසක් වෙන්නේ නැහැ. නමුත් බැංකුවේ ක්‍රියාකාරිත්වයේදී -මම හිතන්නේ මේකෙන් හොඳ දෙයක් වනවා- කළමනාකරණ තීරණ ගැනීම අධීක්ෂණය කරන අය යටතේම තිබෙන්නට බැහැ. ඒක conflict of interest එකක්. මේ බැංකුවට අනික් බැංකුවලට වාගේම ඒ අයගේ කළමනාකරණ කටයුතු කරගෙන යන්න නිදහස ලබා දීලා තිබෙනවා. නමුත් අධීක්ෂණයේ කිසිම අඩුවක් වෙන්නේ නැහැ. So, the proposed Amendment to Section 20 (1) is, ".....raise with the approval of the Minister", the Minister being the Minister assigned to the subject of Finance. In other words, the Finance Minister's approval prior to an issuance is requisite. මුදල් මණ්ඩලයට යන්නේ නැහැ. මොකද, බැංකුවේ අයිතිකරු රජය නේ. එතැනදී මුදල් ඇමතිතුමා ඒකට එකඟත්වය පළ කරන්නට ඕනෑ. Further, the proposed repeal of Section 42 2 (c) takes out his authority to determine the form of debentures. The form of the debenture, interest rate එක එහෙම -

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේකේ අවශ්‍යතාව,- විශේෂ අවස්ථාවේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔබතුමා හොඳ ප්‍රශ්නයක් ඇහුවේ. මොකද, ඒකත් ඕනෑ නම් ඉවත් කරන්න පුළුවන්. හැබැයි, මෙතැන එක් division එකයි කරලා තිබෙන්නේ. Management එකයි, ownership එකයි එක පැත්තකට දාලා, regulatorව අනික් පැත්තට දාන තැන තමයි අපි ඉර ඇන්දේ. ඔබතුමාට ඒ කාරණය තේරුණා නේද? අධීක්ෂණය කරන පාර්ශ්වය - Regulator - තීරණය කරන්නේ නැහැ,

debenture එක මොකක්ද, interest rate එක මොකක්ද කියලා. ඒක තීරණය කරන්නේ කළමනාකාරිත්වය විසින්. කළමනාකාරිත්වයට විතරක් තීරණය කරන්න දෙන්නත් පුළුවන්. නැත්නම් අයිතිකරුගේත් අවසරය ලබා ගන්න ඕනෑ. මහ බැංකුවට අධීක්ෂණය කිරීමේ කටයුත්ත තමයි පැවරිලා තිබෙන්නේ. එතැන තමයි අපි මේ වෙන් කිරීමේ ඉර ඇඳලා තිබෙන්නේ. "අයිතිකරුගේ බලතල සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න එපා. අයිතිකරුවාත් මේ අවස්ථාවේදී හිටපුදෙන්" කියලා සමහර අය කියනවා. අපිට එතැනටත් අනාගතයේදී ගමන් කරන්න පුළුවන් කියන මතයේ තමයි මම ඉන්නේ. නමුත් දැනට අයිතිකාරයාගේත් අවසරය ගන්න කියලා තමයි සඳහන් කරලා තිබෙන්නේ.

මම ඊළඟ කාරණයට යන්නම්. Whether this can be converted කියන ප්‍රශ්නය ගරු මන්ත්‍රීතුමා ඇහුවා. No. Until and unless Section 13 is amended, the People's Bank does not have a legal right to issue any share to any other party who is ultimately not the Government of Sri Lanka. මම ඒ ප්‍රශ්නය ඇහුවා. මොකද, ඒ ප්‍රශ්නය මතු වෙයි කියලා මම හිතුවා. Lawyersලාගෙන් අහලා ඇත්තටම මේකේ definitive statement එකක් කරන්න ඕනෑ කියලා මම හිතුවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සැක නැති කර ගැනීමේ පදනමින් ඔබතුමා දැන් ඔය කිව්ව වාක්‍යය amendment එකක් විධියට 03 වැනි දාට ගෙනෙන්න ඔබතුමාට පුළුවන්ද? අපිත් ගෙනෙන්නම්. නමුත් ඔබතුමන්ලා ආණ්ඩුව හැටියට ඒ සංශෝධනය කරන්න එකඟද? විකුණන්නේ නැත්නම් ප්‍රශ්නයක් නැහැනේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඒ ගැන ඇමතිතුමා එක්ක සාකච්ඡා කරමු. Amendment එකක් ඕනෑ නම් ඉදිරිපත් කරන්න. තේරුණා නේද? So, the Attorney-General, by his letter dated 14th June, 2018, has given his concurrence and there is no objection for the proposed Amendments. Finally, I would like to state that.
Thank you again, Sir, for providing me time.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා අතිරේක විනාඩි 4ක් ගත්තා. මා එය ගරු අමාත්‍යතුමාගේ කාලයෙන් අඩු කරනවා. මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 19ක් තිබෙනවා.

[අ.භා.12.13]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයට අප ඉදිරිපත් වන්නේ වග කිව යුතු විපක්ෂයක් ලෙසයි. මක් නිසාද යත්, විශේෂයෙන් ඒකාබද්ධ විපක්ෂයත්, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවත් දිගටම දැරූ මතය තමයි අපේ රටේ රාජ්‍ය බැංකු සුරක්ෂිත කොට පෝෂණය කරනවා විනා ඒවා පෞද්ගලීකරණය සඳහා කිසි විටෙකත් තුන් හිතකින්වත් මැදිහත් වන්නේ නැහැ කියන එක. ඊට හේතුවක් තිබෙනවා. 1815දී අපේ රට බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් බවට පත් වීමෙන් පසුව වැවිලි කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ අවශ්‍යතා සඳහා අපේ රටේ කන්ද උඩරට වාණිජ බැංකු ක්‍රමය ආරම්භ වුණා. නිදහසින් පසුව මේ රටේ ජනතාව වෙතට බැංකු ක්‍රමය ගෙන යෑම සඳහා ආරම්භක පියවරක් ලෙස දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමා සමුපකාර ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් කළා. විවිධ සේවා සමුපකාර ක්‍රමය මඟින් ලංකාවේ පොදු ජන ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලාංකීය සමුපකාර ව්‍යාපාරය ප්‍රචලිත කරන අවස්ථාවේදී ඒ කාලයේ තිබුණා, "සමුපකාර ෆෙඩරල් බැංකුව" නමින් බැංකුවක්. ඒ බැංකුවල තිබෙන සියලු වත්කම් වගකීම් අරගෙන එතුමා පනත් කෙටුම්පතක් සකස් කළා, "මහජන බැංකු පනත් කෙටුම්පත" නමින්. ඒ මහජන බැංකු පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරවා ගැනීමේ කාර්ය භාරය ටී.බී. ඉලංගරත්න මැතිතුමා විසින් කරනු ලැබුවත්, පිලිප් ගුණවර්ධන මැතිතුමා විසින් තමයි එම බැංකුව ජන හද හඳුනන බැංකුව බවට පත් කිරීම සඳහා අවශ්‍ය සංකල්පමය නිර්මාණය කරනු ලැබුවේ. එය කරනු ලැබුවේ එතුමා විසින්ය කියන එක මා ප්‍රථමයෙන් සඳහන් කළ යුතු වෙනවා.

දෙවනුව කිව යුතු කාරණය මේකයි. මේ ආකාරයට වැඩුණු, හැදුණු, ගමට පහසුකම් සැපයූ, සමුපකාර ව්‍යාපාරය සමඟ බද්ධ වූ මේ බැංකුව පෞද්ගලීකරණය කරන්න 1977 වර්ෂයෙන් පසුව එක්සත් ජාතික පක්ෂය ප්‍රතිපත්තියක් ලෙස දිගටම උත්සාහ දැරුවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාටත් මතක ඇති, එතුමාත් අපත් විපක්ෂයේ සිටි ඒ අවධියේදී ඩිංගිරි බණ්ඩා විජේතුංග මුදල් අමාත්‍යතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය තමයි, බැංකු දෙකම බංකොලොත් කියන එක. "ලංකා බැංකුව සහ මහජන බැංකුව කියන දෙකම බංකොලොත්" කියලා එතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා. පසුව දා උදේ වන කොට, ලංකාවේ බැංකුවල -මේ බැංකු දෙකේ- ණයවර ලිපි - LCs, Letters of Credit - බාර ගන්නේ නැහැ කියලා විදේශවලින් කිව්වාම රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාට සිද්ධ වුණා, ඒවායේ ප්‍රාග්ධනය ප්‍රතිසැකසුම්කරණය කරලා 'බැංකු බංකොලොත් නැහැ' කියලා පවත්වාගෙන යන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පසුව මහජන බැංකුව පෞද්ගලීකරණය සඳහා 2001 සිට 2004 කාලය තුළ උත්සාහයක් තිබුණා. ඒ අවස්ථාවේදී මම මුදල් නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් භාණ්ඩාගාරයේ සිටියා. හොඳ වෙලාවට මහජන බැංකුවේ සභාපති ධුරය දැරූ වරලත් ගණකාධිකාරී ලාල් නානායක්කාර මහතා අප සමඟ සිටියා, කිසි විටකත් මේ බැංකුව පෞද්ගලීකරණය කරන්නේ නැහැ කියන මතයේ. එතුමා තමයි මහජන බැංකුවේ එවකට සභාපතිවරයා ලෙස කටයුතු කළේ. මම තමයි මුදල් නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කළේ. 'විදේශ බලපෑම් ආවත්, වෙනත් අය කෙලෙසින් කිව්වත් මහජන බැංකුව පෞද්ගලීකරණය නොකළ යුතුයි' කියලා ඒ අවස්ථාවේදීත් එය බේරාගන්න පුළුවන්කම ලැබුණා. විශේෂයෙන් අපේ රටේ පිහිටි මේ බැංකු තුනම -ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව- පෞද්ගලීකරණයෙන් තොරව රාජ්‍ය බැංකු ලෙස සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව වෙනුවෙන් බැංකු සේවක සංගම් ඉතා දීර්ඝ කාලයක ඉඳන් නිරන්තර නොවෙනස් ස්ථාවරයක පිහිටා කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධනවලින් බලාපොරොත්තු වන සමහර දේවල් සම්බන්ධයෙන් යම්කිසි ආකාරයක සංශෝධන සහිතව එකඟතාව පළ කරන්න අපට පුළුවන්කම තිබෙනවා. ඊට හේතුව මේකයි. බැංකු ක්‍රමය රඳා පවතින්නේ, මහජන විශ්වාසය මතයි. මහජනයා නන්නාඳුනන බැංකුකරුවෙක් වෙතට තමන්ගේ තැන්පතු භාර දෙන්නේ ඉල්ලූ විටක ආපසු ගත හැකිය යන විශ්වාසය මතයි. ඉල්ලූ විටක තමන්ගේ මුදල් ටික ලැබෙයි කියන විශ්වාසය නැත්නම් නන්නාඳුන බැංකුකරුවෙක් වෙත ගිහිල්ලා ලක්ෂ ගණන් මුදල්

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

තැන්පතු වශයෙන් භාර දෙන්නේ නැහැ. ඒ නිසාම මුළු ලෝකයේම බැංකු ක්‍රමය රඳා පවතින්නේ මහජන විශ්වාසය මතයි. මහජන විශ්වාසය පළුදු වෙන්නේ කවදාටද, එදාට ඒ බැංකුව කඩාගෙන වැටෙනවා. කාගේ ආණ්ඩුව තිබුණත්, කාටවත් එය අතින් අල්ලලාවත් නතර කරන්න බැහැ.

2007දී ලෝක මූල්‍ය අර්බුදයක් ඇති වුණා. ඒ ලෝක මූල්‍ය අර්බුදය ඇති වෙන්න හේතු වුණේ මෙන්න මේ කාරණයයි. බැංකුවල ප්‍රාග්ධන ව්‍යුහය තුළ තෝලන තත්ත්ව තුනක් තියෙනවා, අධිතෝලනය, අවතෝලනය සහ සමතෝලනය කියලා. අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනයට සාපේක්ෂව ණය ප්‍රාග්ධනය වැඩි නම් අධිතෝලන ප්‍රාග්ධන ව්‍යුහයක් තියෙන්නේ. බැංකුවේ අයිතිකරුවන්ට වඩා බැංකුව ලබාගෙන තියෙන ණය හා බැරකම් ප්‍රමාණය වැඩි වෙනකොට අධිතෝලන ප්‍රාග්ධන ව්‍යුහයක් යටතේ තමයි 2007දී බටහිර බැංකු කඩා වැටෙන්න පටන් ගත්තේ. Lehman Brothers බංකොලොත් වුණා. MutualBank කඩාගෙන වැටුණා. ලෝක මූල්‍ය අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස සමස්ත ලෝකයේම බැංකු කඩාගෙන වැටෙන විට ලංකාවේත් එහි ඡායාව ඇති වුණා. ඒ අනුව, සෙලාන් බැංකුව හෙල්ලෙන්න පටන් ගත්තා. ඒ අවස්ථාවේදී මුදල් අමාත්‍යවරයා ලෙස කටයුතු කළේ ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා. එතුමා වහාම ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත සෙලාන් බැංකුව රජයට පවරාගෙන බැංකුව කඩාගෙන වැටීම හා බැංකු ක්‍රමයට ඇතිවන අහිතකර බලපෑම නතර කරන්න කටයුතු කළා. ඒ නිසා මහින්ද රාජපක්ෂ ආණ්ඩු මේ රටේ බැංකු කඩා වැටීම හා පෞද්ගලීකරණය නැවැත්වීම සඳහා මැදිහත් වෙච්ච ආණ්ඩු ලෙසින් ඉතිහාසයට එකතු වෙනවා.

ඊට පසුව, මෑත ඉතිහාසය තුළදී ලෝකයේ බැංකු කඩා වැටීමෙන් පසු බාසල් සම්මුතිය යටතේ අන්තර්ජාතිකව බැංකු ක්‍රමය පවත්වාගෙන යා යුතු වෙනවා. අපි කැමති වුණත්, අකැමැති වුණත් ගෝලීය බැංකුකරණය සඳහා, ගනුදෙනු සඳහා, විදේශ විනිමය ගනුදෙනු සඳහා අත්‍යවශ්‍යයෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව බැංකු පවත්වාගෙන යා යුතුම වෙනවා. එයට හේතුව, අන්තර්ජාතික වශයෙන් විදේශ විනිමය මිලදී ගැනීම්, විදේශ විනිමය විකිණීම්, විනිමය ගනුදෙනු සටහන් කිරීම සහ ජාත්‍යන්තර ආනයන, අපනයන වෙළෙඳ ගනුදෙනුවලදී අවශ්‍ය දෑ සඳහා ජාත්‍යන්තර මට්ටම අනුගමනය කළ යුතු වීමයි. බාසල් III සම්මුතියේ ගෝලීය මූල්‍ය අර්බුදයට පෙර නියාමන රාමුව රට තුළ පැවතුණ විවිධ අඩුපාඩු මඟහැරවීම සහ පද්ධතිමය අවදානම් ගොඩනැඟීම වළක්වාලීමට හැකි ඔරොත්තු දිය හැකි බැංකු පද්ධතියකට අඩිතාලමක් සැපයීමේ අරමුණින් ගෝලීය මූල්‍ය අර්බුදයට පසුකාලීනව බැංකු අධීක්ෂණය සඳහා බාසල් කමිටුව - Basel Committee on Banking Supervision - විසින් බාසල් IIIවන රාමුව යටතේ ප්‍රාග්ධනය හා ද්‍රවශීලතා අවශ්‍යතාවන් තවදුරටත් ශක්තිමත් කරලා තිබෙනවා. ඒ අනුව, බාසල් කමිටුව විසින් අවදානම් පාදක කර ගත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය - Capital Adequacy Ratio - සහ අවදානම් පාදක නොවූ තෝලන අනුපාතය - leverage ratio - ලෙස ප්‍රධාන ප්‍රාග්ධන ප්‍රමිති දෙකක් හඳුන්වා දීලා තිබෙනවා. මේ ප්‍රමිති අනුව ප්‍රාග්ධනය වැඩි කිරීම පිළිබඳ මේ බාසල් III වන ජාත්‍යන්තර සම්මුතියේ කොන්දේසි ඉෂ්ට කරන්න තමයි තමුන්නාන්සේලාට මේ සංශෝධන ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ අනුව පනතේ 12වන වගන්තිය සංශෝධනය කරනවා. පනතේ 12වන වගන්තියේ කලින් පැවතුණේ බැංකුවේ බලය ලත් ප්‍රාග්ධනය එක් කොටසකට රුපියල් පනහ බැගින් වූ කොටස් එකසිය විසිදහසකට බෙදන ලද රුපියල් බිලියන 6ක් විය යුතුය කියලා. නව ඡේදය තමුන්නාන්සේලා එකතු කරනවා, "බැංකුවේ බලයලත් ප්‍රාග්ධනය එක් කොටසක් රුපියල් පනහ බැගින් වූ කොටස් බිලියනයකට බෙදන ලද රුපියල් බිලියන පනහක් විය යුතු ය." කියලා. එතකොට රුපියල් බිලියන 6ක් විය යුතුයි කියලා තිබුණ එක පනහක් විය යුතුයි කියා වෙනස් වෙනවා.

ඒ වාගේම කියනවා, "ජාතික ආර්ථිකයේ යහපත පිණිස අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී, බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනය කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ය" කියලා.

ඒ වාගේම කියනවා, "අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක් ම අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය." කියලා.

මේ බලයලත් ප්‍රාග්ධනය වැඩිකිරීම ගැන අපේ කිසි ගැටලුවක් නැහැ. බලයලත් ප්‍රාග්ධනය, අනුදත් ප්‍රාග්ධනය එහෙම නැත්නම් නිකුත් කිරීමට උපරිම ලෙස බලය තියෙන ප්‍රාග්ධනය වැඩි කරන්න මේ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ බලයලත් ප්‍රාග්ධනය කොටස් දෙකකට බෙදනවා. බලයලත් ප්‍රාග්ධනයෙන් කොටසක් නිකුත් කරනවා; කොටසක් නිකුත් කරන්නේ නැහැ. ඒ අනුව නිකුත් කළ ප්‍රාග්ධනය හා නිකුත් නොකළ ප්‍රාග්ධනය කියලා කොටස් දෙකක් තිබෙනවා. බලයලත් ප්‍රාග්ධනය වැඩි කරලා නිකුත් නොකර තිබෙනවා නම් කිසිම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. අමාත්‍යවරයා ගැසට් පත්‍රයක් මඟින් නිකුත් කරන්න තීරණය කළාම, එසේ නිකුත් කරන්නේ කාටද? එතැනදී තමයි ප්‍රශ්නය මතු වෙන්නේ. නිකුත් කරන්නේ රජයට නම්, ඒ අයිතියේ කිසිම වෙනස් වීමක් වෙන්නේ නැහැ. එම නිසා තමයි, බලයලත් ප්‍රාග්ධනය නිකුත් කරන විට පෞද්ගලික අංශයට කොටස් නිකුතුවක් සිද්ධ වෙයිද කියන සැකය ඇතිවෙලා තිබෙන්නේ. එම ප්‍රශ්නය විසඳෙන වගන්තියක් මෙහි තිබෙනවා. අනිවාර්යයෙන්ම එය පාර්ලිමේන්තුවට එන්න ඕනෑ. එම නිසා මේ උත්සාහයේ දී යටි හිතේ පැහැදිලි අරමුණක් තිබුණා, මහජන බැංකුවේ කොටස් පෞද්ගලික අංශයට නිකුත් කරන්න ඕනෑය කියලා. මංගල සමරවීර අමාත්‍යවරයා එම ප්‍රකාශය කළා. ලංකාවේ ඕනෑම රාජ්‍ය බැංකුවක් බොහොම පහසුවෙන් පෞද්ගලීකරණය කිරීම නතර කරන්න පුළුවන් පාර්ශ්ව දෙකක් ඉන්නවා. පළමු පාර්ශ්වය තමයි බැංකු සේවක සංගම් හා බැංකුවේ වැඩ කරන සේවකයන්. ඒ කියන්නේ, සේවා නියුක්තිකයන්. දෙවැනි පාර්ශ්වය තමයි බැංකුවේ තැන්පත්කරුවන් වන මහ ජනතාව. මහ ජනතාවට බැංකුව පිළිබඳව විශ්වාසය නැති වෙලා තැන්පත්කරුවන් හෙට ඉඳලා ඔවුන්ගේ තැන්පතු withdraw කරන්න පටන් ගත්තොත් - ආපසු ගන්න පටන් ගත්තොත්- කවුරු ආණ්ඩු කළත්, බැංකුව ආරක්ෂා කර ගැනීම සඳහා ඒ බැංකුව පෞද්ගලීකරණය කිරීම නතර කරන්න වෙනවා. එම නිසා මංගල සමරවීර මුදල් අමාත්‍යවරයා මහජන බැංකුවේ කොටස් නිකුත් කරනවා කියලා කියපු ගමන්, අපි ආර්ථික පර්යේෂණ ඒකකය වශයෙන් බැංකු ක්ෂේත්‍රය හා අදාළ පුද්ගලයන් සමඟ සාකච්ඡා කරලා හිටපු මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අනුමැතියෙන් ප්‍රසිද්ධ මාධ්‍ය හමුවක් පවත්වලා කිව්වා, "අපි මේ රටේ බැංකු ක්‍රමය මහජන විශ්වාසය මත ආරක්ෂා කර ගැනීම සඳහා බැංකුවල අයිතිය සියයට 100ක් රාජ්‍ය අයිතියේ පැවැතිය යුතුය" කියන ස්ථාවරයේ ඉන්නවා කියලා. ආණ්ඩුව හිතුවක්කාරී ලෙස වෙනත් පනත් සංශෝධනය කරනවා සේම, මෙය පෞද්ගලීකරණය කිරීමේ උත්සාහයක් දැරුවොත් අපි ජනතාවට කියනවා, අපේ ආණ්ඩුවක් එනකල් මහජන බැංකුවේ තැන්පතු අස්කර ගන්න කියලා. ඒ පණිවුඩය තුළ බැංකුවේ තැන්පතු ආපසු ගන්න පටන් ගත්තා. මහජන බැංකුවට සිද්ධ වුණා, දහස් ගණනක් වියදම් කරලා "බැංකුව කෙසේවත් පෞද්ගලීකරණය කරන්නේ නැහැ" කියලා පුවත් පත් දැන්වීම් රාශියක් පළ කරන්න. [බාධා කිරීමක්] ඔව්. ඒ සඳහා වෙනම උද්ඝෝෂණ ව්‍යාපාරයකුත් පටන් ගත්තා. ඒ

කටයුතු දැන් නතරවෙලා තිබෙනවා. ඒ සඳහා යටි අරමුණක් තිබුණත්, මහ ජනතාව -තැන්පත්කරුවන්- සහ බැංකු සේවකයන් සිටින තාක් කල් කවදාවත් ලංකාවේ රාජ්‍ය බැංකු පෞද්ගලීකරණය කරන්න බැහැ. අපි බොහොම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ, තව දවස් 100කින් විතර මහජන විශ්වාසය මත ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපති ධුරය යටතේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ පාර්ලිමේන්තුවක්, ආණ්ඩුවක් ගොඩනඟන බව. එම ආණ්ඩුව යටතේ ලංකාවේ මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇතුළු රාජ්‍ය බැංකු පද්ධතිය මොනම හේතුවක් නිසාවත් පෞද්ගලීකරණය කරන්නේ නැහැයි කියන සහතිකය මම මේ අවස්ථාවේ ගරු සභාවට ලබා දෙනවා.

දෙවැනි කරුණ තමයි, මේ පනතේ 12වැනි වගන්තිය එලෙසින් ආරක්ෂා වන අතර, 20වැනි වගන්තියේ දැනට තිබෙන්නේ, "බැංකුවට දීර්ඝ කාලීන සහ මධ්‍ය කාලීන ණය ප්‍රදානය කිරීම සඳහා ණයකර නිකුත් කිරීම මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතිය නොමැතිව සිදු කළ නොහැකිය" යනුවෙන්. එසේ තිබෙන වගන්තිය තමුන්නාන්සේලා වෙනස් කරනවා, "දීර්ඝ කාලීන සහ මධ්‍ය කාලීන ණය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා 15(1) (ආ) වගන්තිය යටතේ බැංකුව වෙත රජය විසින් ණයට දෙනු ලබන මුදල්වලට අතිරේකව අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව බැංකුව විසින් ඍණ පත්‍ර නිකුත් කිරීම මඟින් මුදල් රැස් කරනු ලැබිය හැකිය" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ප්‍රාග්ධනය රැස් කළ හැකි එකිනෙකට වෙනස් ප්‍රධාන ක්‍රම දෙකක් තිබෙනවා. පළමුවැනි එක තමයි කොටස් නිකුතුව. දෙවැනි එක, ණය කර -ඍණ පත්‍ර- නිකුත් කිරීම. ඍණ පත්‍ර කොටස් බවට පරිවර්තනය කරන්න බැහැ. මොකද, සමාගම් පනතේ තිබෙනවා, මේ ලෝකයේ ණයකර හා කොටස් කියන ඒවා එකිනෙකට වෙනස්. අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනයට තමයි කොටස් කියන එක ඇති වෙන්නේ.

ණයකර කියන එක ඇති වෙන්නේ ණය ප්‍රාග්ධනයට. මේ දෙක, දෙකක්. කොටස්කරුවන්ගේ ප්‍රාග්ධනයට සාපේක්ෂව ණය ප්‍රාග්ධනය කොච්චරද කියලා බලන්න තෝලන අනුපාත හදනවා. කොටස් හා ණයකර කියන්නේ දෙකක්. ඒ දෙක කවදාවත් එකට කලවම් කරන්න බැහැ. එකක් අනෙකට පෙරළන්නත් බැහැ. ඒක තමයි ලෝකයේ තිබෙන නීතිය. ණයකර නිකුත් කළාම වෙන්නේ, යම් නිශ්චිත කාලයක් තුළදී ගිවිසගත් පොලී අනුපාතයක් යටතේ ආපසු ගෙවීමේ එකඟතාව මත වෙනත් පාර්ශ්වවලින් ණයක් ලබා ගැනීමයි. ඒක ශේෂ පත්‍රයේ වගකීමක්, නැත්නම් බැරකමක් ලෙස තමයි සටහන් වෙන්නේ. ණයකර වර්ග දෙකක් තිබෙනවා. එනම්, නිදහස් කළ හැකි ණයකර සහ නිදහස් කළ නොහැකි ණයකර ලෙස. ඒ වාගේම ණයකරවලින් පුළුවන්, කොටස් වෙළෙඳ පොළේ ගනුදෙනු කරන්න. කොටස් වෙළෙඳ පොළේ ගනුදෙනු කළොත් ණය හිමියන් අතර ඔවුන්ගේ ණය ගනුදෙනු හුවමාරු වීමක් තමයි සිදු වන්නේ.

අපට මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. කලින් පනතේ තිබුණා, "ණයකර නිකුත් කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතිය නොමැතිව සිදු කළ නොහැකිය" කියලා. දැන්, තමන්ගේ සිතැඟි පරිදි නිකුත් කරන්න මුදල් ඇමතිවරයාට බලය ලැබෙනවා. අපි විපක්ෂය වශයෙන් ඒකට එකඟ නැහැ. කලින් තිබුණු පරිදි බැංකුවේ තීරණය අනුව ණයකර නිකුත් කරන්න ගත්තොත්, ඒ සඳහා පූර්ව අනුමැතියක් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගත යුතුයි කියලා අපි සද්භාවයෙන් සංශෝධනයක් ගෙනෙනවා. ඒක සාධාරණ එකක්; යුක්ති සහගත එකක්. ඒක පිළිගන්න. මක් නිසාද යත්, තමුන්නාන්සේලා දන්නවා මහ දවල් මහ බැංකුවේ මහා මුදල් මංකොල්ලය වෙනකොට ලංකා බැංකුව එහි කොටස්කාරයෙක් බව. ලංකා බැංකුවට කවදාවත් ප්‍රාථමික වෙළෙන්දෙක් වෙනුවෙන් ලංසු තියන්න බැහැ. ලංසු තියන්න බැරිව තිබියදී ලංකා බැංකුව ලංසු තැබුවා, පර්පෙචුවල් ට්‍රෙෂරීස් වෙනුවෙන්. අද වෙනකම් ලංකා බැංකුව කරපු මේ මහා හොරකම පිළිබඳ පරීක්ෂණයක් කරලාත් නැහැ; දඬුවම් දීලාත් නැහැ. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම වෙනුවෙන් -ප්‍රාථමික වෙළෙන්දෙක් වෙනුවෙන්- තවත් ප්‍රාථමික වෙළෙන්දෙක් වූ රාජ්‍ය බැංකුව ලංසු තිබ්බේ කොහොමද? ඔබතුමාට පිළිතුරක් දෙන්න පුළුවන්ද ඒකට?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම කියන්න ගියේ මේකයි. මෙතැන කරන වෙනස්වීම ගැන, මුදල් මණ්ඩලයේ බලතල ගැන, අධීක්ෂණය ගැන කථා කළා නේ. ඒකේ කිසිම වෙනසක් නැහැ. ලංකා බැංකුවට තිබෙන එකමයි මේ සංශෝධනවලින් මහජන බැංකුවටත් ලබා දෙන්නේ. ලංකා බැංකුවට එක නීතියකුත්, මහජන බැංකුවට තව නීතියකුත් ඇයි කියන ප්‍රශ්නය තමයි මම අහන්නේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
හොඳ ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දැන් කථාව අවසන් කරන්න. දහවල් 12.30ට සභාවේ කටයුතු අත් හිටුවිය යුතුව තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විනාඩි දෙකෙන් අවසන් කරන්නම්.

දැනට ඔබතුමන්ලාගේ ක්‍රමය යටතේ සමස්ත බැංකු ක්‍රමය, ණය ක්‍රමය පාලනය කිරීම සඳහා තිබෙන මහ බැංකුවටත් දේශපාලනික මැදිහත්වීම් සිදු වූ නිසා මහ බැංකුව පිළිබඳව තිබුණු විශ්වාසනීය භාවය පළුදු වුණා. ලංකා බැංකුවත් එසේ කටයුතු කිරීම තුළින් කවදාවත් නොකළ ආකාරයට පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට ලංසු තිබ්බා. එම නිසා ස්වාධීන ක්‍රමයට ඉඩ දුන්නාම අපට තවදුරටත් බලාපොරොත්තු තබා ගන්න බැහැ. වෙන ආණ්ඩු ආවත්, අපේ ආණ්ඩුවක් තිබුණත්, කාගේ ආණ්ඩුවක් තිබුණත් එතැන තීරණ ගන්න සමහර මණ්ඩලවලට පත් වෙන පුද්ගලයන් අත්තනෝමතික ලෙස හැසිරුණොත්, අවදානම් ලෙස හැසිරුණොත් අහිතකර බලපෑමක් වෙන්න පුළුවන්. මහ බැංකුවේ අනුමැතිය ගත්තාම මොකුත් ප්‍රශ්නයක් නැහැ නේ. සමස්ත බැංකු ක්‍රමය, සමස්ත ණය ක්‍රමය පාලනය කරන්න බලය තිබෙන ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුව. ඒ නිසා මේ කටයුතු මහ බැංකුවේ පූර්ව අනුමැතියකට යටත් කිරීම ඉතාම යෝග්‍යයි. එහෙම නැති වුණොත් විශ්වසනීයභාවය පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ සඳහා අවශ්‍ය සංශෝධන අපි විපක්ෂය ලෙස ඉදිරිපත් කළාම, කරුණාකර ඒවා ගැන පළල් ලෙස හිතා මේ ගරු සභාව පිළිගනීවි කියන විශ්වාසයෙන් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා භෝජනය සඳහා ප.ව. 1.30 දක්වා සභාවේ කටයුතු අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා (ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා)* ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා.1.30]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳවයි අද අප කථා කරන්නේ. මීට කලින්, මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගේ කථාවේදී යම් යම් කාරණා සම්බන්ධයෙන් කරුණු කීපයක් මතු වුණා. මහජන බැංකුව මේ රටේ ආරම්භ කළේ උදාර පරමාර්ථ කීපයක් මුල් කරගෙනයි. දීර්ඝ කාලයක් තිස්සේ, ලංකා බැංකුව ඇතුළු පෞද්ගලික බැංකු ගණනාවක් මේ රටේ තිබුණා. ඒ බැංකු මේ රටේ ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කළා. නමුත්, ඊට වඩා පුළුල් පරමාර්ථයක් ඇතිව, ජනතාවට ඉතාම කිට්ටුවෙන් වැඩ කළ හැකි ආයතනයක් ලෙස තමයි 1961දී මහජන බැංකුව ආරම්භ කළේ. ග්‍රාමීය ජනතාව ගැන කල්පනා කරලා, සමුපකාර ක්‍රමය පිළිබඳ කල්පනා කරලා, 1961දී ටී.බී. ඉලංගරත්න මැතිතුමා පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනැත් මහජන බැංකුව ආරම්භ කළා. මෙය ආරම්භ කිරීමට පෙර, ලංකා බැංකුව හා වෙනත් පෞද්ගලික බැංකු මඟින් පොදු මහ ජනතාවට ඉටු විය යුතුව තිබුණු යම් යම් සේවා ඉටු වුණා. නමුත්, ඉටු නොවුණු යම් යම් සේවා සැපයීමට තමයි මහජන බැංකුව ආරම්භ කළේ. මෙම බැංකුව ආරම්භ කිරීමේ පරමාර්ථ බොහොමයක් මේ වනවිට ඉටු කරගන්න පුළුවන් වෙලා තිබෙනවා. සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතා සමහර පෞද්ගලික බැංකුවලින් ඉෂ්ට වුණේ නැහැ. ලංකා බැංකුවට ඒ සියලු දේවල් ඉෂ්ට කරන්න හැකියාවක් තිබුණෙත් නැහැ. මහජන බැංකුවේ එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියලු නිලධාරි මහත්ම මහත්මීන් ඉතාම කැපවීමෙන් ඒ කටයුතු කළා. මෙය, සාමාන්‍ය ජනතාව වෙනුවෙන් විශාල සේවයක් කළ මේ රටේ ඉතාම වැදගත් බැංකුවක්. මේ රටේ රාජ්‍ය බැංකු ජාතික වස්තු හැටියටයි අප සලකන්නේ.

ඇමෙරිකාවේ ආර්ථිකය කඩා වැටිලා, අපටත් ඒ බලපෑම ආපු අවස්ථාවේ මේ රාජ්‍ය බැංකු දෙක -ලංකා බැංකුවත්, මහජන බැංකුවත්- අපේ රටට විශාල සේවාවක් කළා. ඒ නිසා රාජ්‍ය බැංකු හැටියට අපි මේවා ආරක්ෂා කර ගන්න ඕනෑ. මහජන බැංකුවේ කටයුතු සම්බන්ධයෙන් යම් සංශෝධන කරන අවස්ථාවලදී, ඒ ගෙනෙන අණ පනත්වලින් යම්කිසි බලපෑමක් සිද්ධ වෙනවාද, ඒවායින් මේ බැංකුවල රාජ්‍යභාවයට හානියක් වෙනවාද කියලා සොයා බලන එක මහජන නියෝජිතයන් වන අපේ යුතුකමක්. මොකද, අපට විවිධ බලපෑම් ඇතිවූ අවස්ථාවල, රටේ අභ්‍යන්තර අර්බුද තිබුණු අවස්ථාවල, බාහිර බලවේගවලින් රටට යම් බලපෑම් තිබුණු අවස්ථාවල ලංකා බැංකුව සහ මහජන බැංකුව අපේ රටේ ආර්ථිකයට විශාල ශක්තියක් ලබාදුන්නා.

මහජන බැංකුව අපේ රටේ සංවර්ධනයට විශාල දායකත්වයක් ලබාදෙනවා. ඒ ඒ වර්ෂවලදී රටේ ආර්ථිකයට, භාණ්ඩාගාරයට මෙම බැංකුව විසින් දෙන ලද මුදල් ප්‍රමාණ පිළිබඳව ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී සඳහන් කළා. මෙම බැංකුව ලාභ ලබන ප්‍රමාණයෙන් විශාල කොටසක් ජාතික සංවර්ධනය සඳහා වැය කරනවා.

අපි මේ බැංකු දෙක ගැන නිරන්තර අවධානයෙන් ඉන්න ඕනෑ. මොකද, අපි හුඟක් උදාහරණ දැක්කා. DFCC බැංකුව හා NDB බැංකුව කියන බැංකු දෙකම ක්‍රමයෙන් පෞද්ගලීකරණය වුණා. ඒ නිසා තමයි අපට බයක් ඇති වුණේ, යම් යම් අවස්ථාවලදී ගන්නා තීන්දු, තීරණ නිසා සමහර වෙලාවට මේ බැංකුවත් පෞද්ගලීකරණයකට තල්ලු වෙන්න පුළුවන් කියලා. ඒ නිසා තමයි, අපි සංශෝධන කීපයක් ගෙනෙන්න බලාපොරොත්තුවෙන් යම් අදහස් කීපයක් මෙතැනදී ප්‍රකාශ කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට අද සාධාරණ සැකයක් තිබෙනවා. මොකද, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු පැවැති කාල වකවානුවල පෞද්ගලීකරණය පිළිබඳව විශාල උනන්දුවක් දැක්වූවා. පෞද්ගලීකරණය කළ ආයතනවලින් බලාපොරොත්තු වූ ප්‍රතිඵලත් සමහර අවස්ථාවලදී රජයට ලැබුණේ නැහැ. ප්‍රාග්ධනය වැඩි කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒක අපි අවිවාදයෙන් පිළිගන්නවා. මේ රටේ ලංකා බැංකුවත්, ප්‍රාග්ධනය වැඩි කර ගැනීම සඳහා මෙවැනි තීන්දු කීපයක් ගත්තා. ඒ වාගේම මහජන බැංකුවේ තිබෙන බිලියන එකක ප්‍රාග්ධනයක් තිබෙනවා. බිලියන එකක ප්‍රාග්ධනය සම්පූර්ණයෙන් බැංකුවට පරිහරණය කරන්න පුළුවන් වත්කම. අනෙක් ඒවා සාමාන්‍යයෙන් Treasury එකේ තිබෙනවා. මේ ප්‍රාග්ධනය බිලියන 50 දක්වා වැඩි කර ගත යුතුයි කියලා අපි පිළිගන්නවා. මොකද, මේ කාලය ඇතුළත ඊට අවශ්‍ය වන්නේ බිලියන 13යි. නමුත් 2030, 2040 වනකොට මේ ප්‍රාග්ධනය බිලියන 50 දක්වා වැඩි කරන්න ඕනෑ.

මාත් වසර ගණනාවක් බැංකු නිලධාරියකු හැටියට වැඩ කළා. ඒ නිසා මා දන්නවා, මේ ප්‍රාග්ධනයේ ඇති වටිනාකම. විශේෂයෙන්ම බැංකුවක් අනෙක් පෞද්ගලික බැංකු එක්ක තරගකාරි ස්වභාවයකින් ඉදිරියට යනකොට රාජ්‍ය බැංකුවල වත්කම, ප්‍රාග්ධනය වැඩි වෙන්න ඕනෑ. ප්‍රාග්ධනය වැඩි කර ගැනීම අද රටේ අවශ්‍යතාවක් වෙලා තිබෙනවා. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ප්‍රාග්ධනය වැඩි කර ගන්න අපි කරන සමහර සංශෝධන, ගන්නා තීන්දු මේ රටේ ජනතාවට බල නොපාන ආකාරයට විය යුතුයි. විශේෂයෙන්ම, බියක් ඇති නොවන ආකාරයෙන් ඒ දේවල් කිරීමට අපි අවධානය යොමු කරන්න ඕනෑ.

අද බැංකු අතර විශාල තරගයක් තිබෙනවා. අවම වශයෙන් හෝ ඒ තරගයට මුහුණ දෙන්න නම්, ප්‍රාග්ධනය අවශ්‍යයි. ඒ ගැන කිසිම සැකයක් නැහැ. මොකද, කාලයක් යනකොට පෞද්ගලික බැංකු ප්‍රාග්ධනය වැඩි කරගෙන රාජ්‍ය බැංකුත් එක්ක තරගයකට එන ස්වභාවයක් අපට පෙනෙනවා. ඒ නිසා ප්‍රාග්ධනය ශක්තිමත් කරගෙන, අපේ රාජ්‍ය බැංකු ඉතාම ඉහළ මට්ටමකට ගෙන ඒම ගැන අපේ කිසිම ප්‍රශ්නයක් නැහැ.

ණයකර මත මහජන බැංකුවේ අයිතිය දියකර හැරීමට යම් ඉඩකඩක් තිබෙනවා නම් අපට යුතුකමක් තිබෙනවා, ණයකර පිළිබඳව තීන්දු ගන්නේ මොන ආකාරයටද කියන එක පිළිබඳව නිශ්චිත වශයෙන්ම පැහැදිලි කර ගැනීමක් කරන්න. ඒ නිසා විශේෂයෙන්ම මුදල් ඇමතිවරයා මේ පිළිබඳව ගරු සභාව දැනුවත් කළ යුතුයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක් පමණයි තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මට තව සුළු වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගෙන් අපි පැහැදිලි කිරීම් කීපයක් ඉල්ලුවා. එකක් තමයි, ආරම්භයේ සකස් කරන ලද පනතේ කවර වගන්ති සංශෝධනය කරනවාද කියලා. එතුමා පැහැදිලි කළා, සංශෝධනය කරන වගන්ති. එතුමා 12වන වගන්තිය ගැන කිව්වා. 12 වන වගන්තිය වෙනස් නොවීම තුළ විශේෂයෙන්ම අවැඩක් වෙන්නේ නැහැ කිව්වා. නමුත්, පසුකාලීනව ලබාගත් ණය මුදල් වෙනුවෙන් බැංකුවේ කොටස් හිමිකම් ලබා දීමට කල්පනා කරනවාද, මේ කොටස් හිමිකම් කාලයක් යනකොට පෞද්ගලික අයට මිලදී ගැනීමේ හැකියාවක් තිබෙනවාද, එවැනි තත්ත්වයක් මේ හරහා ඇති වනවාද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. නැත්නම්, අපි දන්නා විධියට සමුපකාර බැංකුවලින් අවශ්‍ය මුදල සපයා ගන්න කල්පනා කරනවාද? සමුපකාර බැංකුවලින් මේ මුදල ලබා ගන්නවා නම්, සමුපකාර බැංකු - co-operative banks - කඩා නොවැටෙන්න ඕනෑ.

ඊළඟට, මේ සංශෝධන මඟින් අමාත්‍යවරයාට විශේෂ බලයක් දීලා තිබෙනවා. එක සංශෝධනයක තිබෙනවා, අමාත්‍යවරයාට දීර්ඝ කාලීන හා මධ්‍ය කාලීන ණය ප්‍රදානය කිරීමේ කාර්යය.

15.(1) (ආ) වගන්තිය යටතේ තිබෙනවා, "බැංකුව වෙත රජය විසින් ණයට දෙනු ලබන මුදල්වලට අතිරේකව අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව බැංකුව විසින් ඍණ පත්‍ර නිකුත් කිරීම මඟින් මුදල් රැස්කර ගනු ලැබිය හැකිය" කියලා.

එතකොට අපට තිබෙන ප්‍රශ්නය, ඇමතිවරයාට මෙච්චර බලතල අවශ්‍යද කියන එකයි. Credit Committee එක තිබෙනවා. ඊළඟට, management එක තිබෙනවා. විශේෂයෙන්ම මේ ගැන Central Bank එකේ අධීක්ෂණය තිබෙන්න ඕනෑ. ඒවා අයින් කළ යුතු නැහැ. ඒ අධීක්ෂණය තිබුණාට ප්‍රාග්ධනය වැඩි කර ගන්න කිසි ගැටලුවක් නැහැ. ඒ නිසා මේ සංශෝධනය අමුතු දෙයක්. අමාත්‍යවරයාට මේ බලය අවශ්‍ය ඇයි? අමාත්‍යවරයා වෙනස් වෙන්න පුළුවන්; වෙන රජයක් බලයට එන්න පුළුවන්. ඒ ගොල්ලෝ වෙන තීන්දු ගන්න පුළුවන්. ඒ නිසා එහෙම අවශ්‍යතාවක් මට පෙනෙන්නේ නැහැ. ඒ නිසා ඒකට සංශෝධනයක් කළ යුතුයි කියා මා අදහස් කරනවා.

නිකුත් කරන ණයකර කොටස, කොටස් බවට පත් නොකරන බවට සහතිකයක් මේ ගරු සභාවට අවශ්‍යයි. ඒ නිසා තමයි අපි 4වැනි දා මෙයට සංශෝධනයක් ගෙනෙන්න බලාපොරොත්තු වෙන්නේ. මේ කාරණය පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍යයි. මේ කොටස් තවත් කෙනෙකුට, පෞද්ගලික කෙනෙකුට මිලට ගැනීමේ හැකියාවක් තිබෙන්න බැහැ. දැන් ඔබතුමන්ලා සඳහන් කළා, සේවකයන්ට කොටස් මිලදී ගන්න පුළුවන් බව. හැබැයි, සේවකයන් මිලදී ගත් ඒ හැම අවස්ථාවකදීම ඒ සේවකයන් ඒ කොටස් පෞද්ගලිකව විකුණලා තිබෙනවා. ඒ නිසා පෞද්ගලික අංශයට කොටස් ගැනීමට හැකියාවක් නොවන ආකාරයට ණයකර කොටස් නිකුත් නොකිරීම පිළිබඳ සහතිකයක් දෙනවා නම් ගැටලුවකුත් නැහැ. ඒ ප්‍රශ්න නොවිසඳුවොත් විශාල අර්බුදයක් ඇති වෙන්න පුළුවන්. රටේ කර්මාන්ත බිඳවැටීම, සාමය බිඳ වැටීම වැනි කාරණාවලට එය හේතුවක් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම යෝජනා කරනවා, ණයකර කොටස් බවට පත්කොට නිකුත් නොකරන බවට සහතිකයක් මේ ගරු සභාවට ගරු ඇමතිතුමා විසින් ලබා දිය යුතුයි කියලා. ඒ පිළිබඳ අවධානය යොමු කළ යුතුයි. අපි මේ පනත් කෙටුම්පතට සහයෝගය දෙනවා. අපි ඉදිරිපත් කරන සංශෝධන ඔබතුමන්ලාගේ පැත්තෙන් -ආණ්ඩුව පැත්තෙන්- ගෙනෙන්නේ නැත්නම් අපට ඒ සංශෝධන ගෙනෙන්න සිදුවන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.1.42]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ මේ විවාදයේදී ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. මේ ආණ්ඩුව මේ පනත් කෙටුම්පතට සංශෝධනයක් ගෙන එන්නේ මහජන බැංකුව සතු ප්‍රාග්ධන හැකියාව වැඩි කිරීම කියන අරමුණ ඉදිරිපත් කරමින් වුණත්, 2016 සහ 2017 අවුරුදුවල මුදල් ඇමතිවරයාගේ අය වැය ලේඛනවල පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, රටේ ආර්ථිකය තවත් ලිබරල්කරණය කළ යුතුයි, ඒ අනුව මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ -රාජ්‍ය බැංකුවල- කොටස් නිකුත් කළ යුතුයි කියන කාරණය. එය අය වැය යෝජනාවක්. ඒ අය වැය යෝජනාව අනුව, ලෝකය පුරාම අසාර්ථක වී තිබෙන ඉතාම යල් පැන ගිය නව ලිබරල්වාදී ආර්ථිකය ආණ්ඩුවකර ගහගෙන යනවාය කියන කාරණය අපි පැහැදිලිව දන්නවා. 2008දී මුළු ලෝකයේම ආර්ථිකය බිඳවැටිලා, capitalismවල ප්‍රධානම මධ්‍යස්ථානය වූ ඇමෙරිකාව දණගහන මට්ටමට බිඳවැටී තිබියදීත්, මේ ආකාරයේ ලිබරල්කරණයකට බැංකු ලක් වෙලා මුළුමහත් ඇමෙරිකන් ආර්ථිකය, මුළුමහත් යුරෝපා ආර්ථිකය මාස දෙක, තුනකදී බිඳ වැටුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රාජ්‍ය බැංකු ලිබරල්කරණය කිරීම සමඟ, සහමුලින්ම ධනපති සමාගම් සහ ඉතා ඉහළ වැටුප් ලබන කළමනාකරුවන්ගෙන් කෙරුණු බරපතළ වැරදි ඒ බැංකු බිඳ වැටෙන්න එක හේතුවක් වුණා. ඒ වෙලාවේ ලංකාව ඒ ලෝක ආර්ථික අර්බුදයේ බලපෑමෙන් -මූල්‍ය අර්බුදයෙන්- බේරුණා. ඒ වෙලාවේ අපේ රටේ හිටපු වාමාංශික පමණක් නොව ධනේශ්වර ආර්ථික විද්‍යා උගතුන් පවා කිව්වා, අපේ රාජ්‍ය බැංකු පද්ධතිය, මූල්‍ය පද්ධතිය රජය සතුව තිබුණු නිසා, ඒ ලිබරල්කරණයට උපරිම වශයෙන් ලක් නොවී තිබීම නිසා තමයි අපි ගැලවුණේ කියලා. නමුත් අපි දන්නවා මේ රටේ ජනතාවගේ බදු මුදලින් ගොඩනැඟුණු ව්‍යාපාර, රටේ ජනතාවගේ මහන්සියෙන් ගොඩනැඟුණු මේ දැවැන්ත සංස්ථා දැනටමත් ඉතා ඉහළ, ධනවත් දේශීය සහ විදේශීය පුද්ගලයන්ට, සමාගම්වලට මිලදී ගැනීමට හැකි පරිදි, අපේ රටේ පමණක් නොව ලෝකයේම රාජ්‍ය දේපොළ විවිධ නම් හරහා ඒ ධනවතුන් සඳහා විකිණීමට අවශ්‍ය කරන නීතිරීති සකස් කිරීම තමයි ලෝකය පුරාම සිද්ධ වෙන්නේ කියන කාරණය. අපේ රට ගත්තත්, ඔය investments කියලා එන ඒවායින් වුණත් ඉතාම කලාතුරකින් තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලුතින් සමාගමක් හැදිලා කර්මාන්තයක් හදලා, ඒ කර්මාන්තය දියුණු කරලා රටට රැකියා සහ ආදායම් ගෙනැත් දීලා තිබෙන්නේ. රටේ ජනතාවගේ බදු මුදලින් හදලා, නඩත්තු කරලා, ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන දූෂණය විසින් බිඳවැට්ටුවාට පස්සේ, හොරකම් කරලා වැට්ටුවාට පස්සේ, අන්න ඒවා මිලදී ගන්න තමයි බොහෝ සමාගම් ඇවිල්ලා තිබෙන්නේ.

අද SriLankan Airlines එක මහජන බැංකුවට, ලංකා බැංකුවට සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රුපියල් බිලියන 102ක් ණයයි කියන කාරණය අපි දන්නවා. මේ රුපියල් බිලියන 102න් තුනෙන් පංගුවක් මහජන බැංකුවටයි තිබෙන්නේ කියලා අපි හිතමු. SriLankan Airlines ආයතනය ගුවන් මඟීන් නොමිලේ ගෙන යන්නේ නැහැ, ටිකට් විකුණලා තමයි ගෙන

[ගරු බිමල් රත්නායක මහතා]

යන්නේ. නමුත් දූෂණය නිසාත්, අසාර්ථක කළමනාකරණය නිසාත් ඒ ආයතනය බිඳ වැටුණා. ඒ වන්දි ගෙවන්න සිදුවෙලා තිබෙන්නේ මහජන බැංකුවට හරහා රටේ ජනතාවටයි. දැන් SriLankan Airlines ආයතනය විකුණනවා. SriLankan Airlines ආයතනයට ණය දීලා අනාථ වූ මහජන බැංකුව ඊළඟට විකුණනවා. ඒ විකිණීමට ඔබතුමන්ලා ඉතාම අපූරු නම් පාවිච්චි කරනවා. ඔබතුමන්ලාට බැංකුව ශක්තිමත් කරන්න අවශ්‍ය නම්, බැංකුවේ ප්‍රාග්ධන ශක්තිය වැඩි කරන්න අවශ්‍ය නම් කළ හැකි කරුණු රාශියක් තිබෙනවා. නමුත් නිශ්චිත වශයෙන් මා ඉතා බරපතළ කරුණු දෙකක් දක්වනවා.

අද තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ විවාද කරලා සම්මත කරන්න තිබුණේ. පක්ෂ නායක රැස්වීමේදී ජනතා විමුක්ති පෙරමුණේ අපි ඉල්ලුවා, මෙය ජාතික සම්පතක් සහමුලින් විනාශ කිරීමක්, මෙය නිකම්ම නිකම් වත්තක් විකුණනවා වාගේ නොවෙයි දෙයක් නොවෙයි, මේ දේ කළොත් මුළු රටේ ආර්ථිකයේ හදවත යම්කිසි මොහොතකදී විනාශ කරනවා, ඒ නිසා අඩුම ගණනේ මේ ගැන ජනතාව දැනුවත් කරන්න අවස්ථාවක් ලබා දෙන්න, මේ පනත් කෙටුම්පතට අද ඡන්දය ගන්න එපා කියලා. අපේ ඉල්ලීමට අනුව තමයි අද විවාද කරලා සැප්තැම්බර් මාසයේ මුල සතියේ දිනයක මේ පනත් කෙටුම්පතට ඡන්දය විමසන්න තීරණය වුණේ. ඒ නිසා වෘත්තීය සමිතිවලට හා ජනතාවට අවස්ථාවක් ලැබෙනවා මෙයි අධ්‍යයනය කරන්න. ආණ්ඩුව රුපියල් කෝටි ගණන් වියදම් කරමින් අද පත්‍රවල දැන්වීම් පළ කරලා තිබෙනවා, මහජන බැංකුව විකිණෙන්නේ නැහැයි කියලා. නමුත් අපි ස්ථිරවම කියනවා, මේ පනත් කෙටුම්පත තුළින් අපේ රටේ තිබෙන ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකෙන් එකක් වන මහජන බැංකුව විකිණීමේ ක්‍රියාවලියේ වළ කපලායි තිබෙන්නේ කියලා. වෙන ආණ්ඩුවක් හෝ මේ ආණ්ඩුව තිබුණොත් හෝ ඒ දේ කරයි. ඒ ගැන කිසි සැකයක් නැහැ. මහජන බැංකුව කනත්තට ගෙන යන වැඩේ තමයි අද මේ පනත් කෙටුම්පත තුළින් වෙන්නේ. වළ දැමීම ඊළඟ ආණ්ඩුවකින් සිදු කරයි. අපි කොරහේ කිඹුලන් දකින පිරිසක් නොවෙයි. අපි ලොකු බිල්ලන් මවන පිරිසකුත් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි යම්කිසි දෙයක් ප්‍රවේශමෙන් අධ්‍යයනය කරලා සාධාරණ දෙයක් තමයි කියන්නේ කියලා අපි පැහැදිලිවම මේ රටේ ජනතාවට කියනවා. එහෙම නැතිව අපි එක, දෙක කරලා, දෙක පහ කරලා කියන්නේ නැහැ. ඒ නිසා අපි ස්ථිරවම කියනවා, මෙතැන තිබෙන්නේ නව ලිබරල්කරණය හරහා රාජ්‍ය බැංකු විකිණීමයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත ගැසට් පත්‍රයක් වශයෙන් නිකුත් වූ වෙලාවේම -මීට මාස දෙකකට පමණ කලින්- සමස්ත ලංකා බැංකු සේවා සංගමය, එහි වෘත්තීය සමිති නායකයන් මේ පිළිබඳව අපත් දැනුවත් කරලා, මාධ්‍ය සාකච්ඡා පවත්වලා මේ ගැන දැනුවත් කළා. මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත හරහා බැංකුව පෞද්ගලීකරණය වෙන්නේ කොහොමද කියලා මා කෙටියෙන් කියන්නම්. පියවර හතරකින් තමයි මේ කටයුත්ත සිද්ධ වෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුවන පියවර තමයි, බැංකුවේ බලයලත් ප්‍රාග්ධනය වැඩි කිරීම සහ මහජන බැංකුවේ කොටස් හිමියා යන්න විග්‍රහ කළ නෛතික ප්‍රතිපාදන ඉවත් කිරීම. මුල් පනතේ 12 වන වගන්තිය අනුව මෙහි එක කොටසක් රුපියල් 50 බැගින් වූ කොටස් 1,20,000කට බෙදා තිබෙනවා. මේ ප්‍රමාණය වැඩි කරන්න ඕනෑය කියනවා. මේ ප්‍රාග්ධනය රුපියල් බිලියන 50කට වැඩි කිරීම සම්බන්ධයෙන් අපට විවාදයක් නැහැ. මොකද, කාලානුරූපව එය කළ හැකියි; කළ යුතුයි. නමුත් මුල් පනතේ 12 වන වගන්තියේ මේ කාරණය සම්බන්ධයෙන් සඳහන් කර තිබෙන්නේ මොකක්ද? ඒ තමයි, "රජය සඳහා රජය වෙනුවෙන් ඒ කොටස් දැරිය යුතුයි" කියන එක. මුල් පනතේ 12 (2) වගන්තියේ තිබෙන්නේ මොකක්ද? "රජය සඳහා සහ රජය වෙනුවෙන් කොටස් දැරිය යුතුයි" කියන එක . මුල් පනතේ 12 (3) වගන්තියේ සඳහන් වෙනවා, "සමුපකාර සමිතිවලට දායකවීම සඳහා ඉතිරි කොටස් මණ්ඩලය විසින් විවෘතව තැබිය යුතුය" කියලා. දැන් මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් මොකක්ද කරලා තිබෙන්නේ?

අපේ රටේ Monetary Board එකට විශේෂ බලයක් තිබෙනවා. රටේ මූල්‍ය ස්ථාවරතාව සහ මිල ස්ථායිභාවය සම්බන්ධයෙන් ප්‍රධාන වග කීමක් තිබෙන්නේ මුදල් මණ්ඩලයටයි. එයට දේශපාලන ඇඟිලි ගැසීම් නැතුවා නොවෙයි. නමුත් මුදල් මණ්ඩලය කියන්නේ මුදල් අමාත්‍යාංශය වාගේ දේශපාලනය තුළින්ම මෙහෙයවන ආයතනයක් නොවෙයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකු වංචාවෙන් පස්සේ මුදල් මණ්ඩලය බරපතළ ලෙස ජනතාවගේ අවධානයට යොමුවෙලා තිබෙන නිසා මුදල් මණ්ඩලය දැන් යම්කිසි පරිස්සමකට ලක්වෙලාත් තිබෙනවා.

අපි වගවීම පිළිබඳව, හැම පැත්තෙන්ම checks and balances ඉදිරියට යන විධිය ගැන වැඩිපුර කථා කරනවා. ඒවා වැඩි වෙන්න ඕනෑ කාලයක මොනවාද මේ කරන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? දැන් බාසල් සම්මුතිය අනුව තමයි මේක කරන්නේ. බාසල් සම්මුතියෙන් මොකක්ද කියන්නේ? අනාගතයේදී ඇති විය හැකි ආර්ථික අනතුරු වළක්වා ගන්නට හැම බැංකුවකටම කියනවා, ප්‍රාග්ධනයෙන් සියයට 15ක්, නැත්නම් සියයට 12ක්, -එක එක අදියර අනුව- තබා ගත යුතුයි කියලා. බැංකුවල ආරක්ෂාව වෙනුවෙන් ආපු සමහර යෝජනා බාසල් සම්මුතියේ තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහ බැංකුව මංකොල්ල කෑවා වාගේ හොරකම් නිසාම නොවෙයිනේ බැංකුවල ආරක්ෂාව තහවුරු කළ යුත්තේ. පාලන අධිකාරියෙන් ගන්නා වැරදි තීන්දු නිසා තමයි බැංකු වැටිලා තිබෙන්නේ. ලීමන් බ්‍රදර්ස්ලා වැටුණේ bond scam එකකින් නොවෙයි. අපේ මුදල් මණ්ඩලය තව ශක්තිමත් කළ යුතු වේලාවක තමයි අද අපි ඉන්නේ. ඇත්තටම මහ බැංකු බැඳුම්කර වංචාවෙන් මොකක්ද ඔප්පු වුණේ? ඒ, මහ බැංකුවේ කටයුතු තවත් පාලනය විය යුතුයි, තවත් පරීක්ෂාවට ලක් විය යුතුයි, තවත් විධිමත් විය යුතුයි කියන එකයි. හැබැයි, ආණ්ඩුව මොකක්ද කරන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුව කරන්නේ ඒ මුදල් මණ්ඩලය අයින් කරන එක!. 1961 මහජන බැංකු පනතේ තිබෙන මුදල් මණ්ඩලයේ වගකීම මේ සෑම සංශෝධනයකින්ම සහමුලින්ම අයින් කරලා තිබෙනවා. ඒ සෑම සංශෝධනයකින්ම මුදල් මණ්ඩලයේ වගකීම අයින් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මම මුලින් කිව්වා වාගේ 1961 පනතේ තිබෙනවා, කොටස්කරුවෝ කියලා කියන්නේ රජය සහ සමුපකාර සමිති කියලා. දැන් අලුත් සංශෝධනයෙන් මොකක්ද කරලා තිබෙන්නේ? ඒ කොටස් හිමියන් කවුද කියන එක ආණ්ඩුව අයින් කරලා තිබෙනවා. කෙළින්ම බැංකුව විකුණන්න කලින්, ඒ විකිණීමට අවශ්‍ය කරන පසුබිම මේ පනත් කෙටුම්පත හරහා හදා ගන්න එක තමයි මේ කරන්නේ. ඇමතිතුමා ඒ අර්ථයෙන් කිව්ව එක ඇත්ත. ඒ නිසා ඒ පළමුවෙනි අදියර තමයි මුදල් මණ්ඩලය මේ කටයුතුවලින් අයින් කිරීම. කොටස් හිමියන් කවුද යන්න නීතියෙන් නිශ්චිත කර තිබුණු එක ඉවත් කර තිබෙනවා, මේ සංශෝධනය මඟින්.

ඊට පස්සේ, දෙවැනි පියවර මොකක්ද? දෙවැනි පියවර තමයි, වැඩි කරන ලද බලයලත් ප්‍රාග්ධනය ලබා ගැනීමට, ණයකර නිකුත් කිරීමේ ක්‍රියාවලියෙන් රජයේ මැදිහත් වීම ඉවත් කිරීම.

1961 පනතට අනුව තිබෙනවා, ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මුදල් ඇමතිවරයා විසින් දෙනු ලබන අනුමැතිය ඇතිව මිස කිසිම ණයකරයක් නිකුත් නොකළ යුතුයි කියලා. ඒ කියන විධියට කලිනුත් ණයකර නිකුත් කරන්න මහජන බැංකුවට පුළුවන්කම තිබුණා. ණයකර නිකුත් කරන්න මහජන බැංකුවට බාධාවක් තිබුණේ නැහැ, කලිනුත්. හැබැයි, ඒක කරද්දී යම්කිසි පියවරක් අනුව කළ යුතුව තිබුණා. මුදල් මණ්ඩලයේ අවසරය ඇතිවයි ඒක කළ යුත්තේ. දැන් මුදල් මණ්ඩලය කරපු "පිස්සු" තමයි අපි මහ බැංකු වංචාව ලෙස දකින්නේ. ගිණුමක්වත් නැති අර්ජුන ඇලෝසියස්ගේ පර්පචුවෙල් ට්‍රෙෂරීස් එකට ලංකා බැංකුව කෝටි ගණන් සල්ලි දුන්නේ, ඒ මුදල් මණ්ඩලයේ තිබෙන අඩු පාඩුකම මැද්දේයි. නමුත්, දැන් ඒ මුදල් මණ්ඩලයත් අයින් කරලා මොකක්ද කරන්න හදන්නේ? තමුන්නාන්සේලා තවදුරටත් මේ ණයකර නිකුත් කිරීමේ ක්‍රියාවලියෙන් රජය අයින් කරලා, බැංකුවේ පාලනාධිකාරිය යටතට එය පත් කරනවා. දැන් බැංකුවේ පාලනාධිකාරිය කියන්නේ කවුද? බැංකුවේ පාලනාධිකාරිය කියන්නේ, ආණ්ඩුවේ ඇමතිවරයා පත් කරන සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය. මා ඒකයි කිව්වේ, ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමට නැත්නම් ආණ්ඩුවේ විවිධ දේශපාලන ව්‍යාපෘතිවලට, ආණ්ඩුවේ ණය කපා හැරීමේ ව්‍යාපෘතිවලට මහජන බැංකුව, ලංකා බැංකුව තමයි බිලි වෙන්නේ කියලා. Unsolicited proposalsවලට අදාළ කරන ව්‍යාපාතිවලට මේ බැංකු තමයි බිලි වෙලා තිබෙන්නේ. ඔබතුමා දන්නවා, පසුගිය කාලයේ-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද කථිකයන් වැඩිපුර නැති නිසාත්, මේක ජාතික වශයෙන් වැදගත් කාරණාවක් නිසාත් මට තව විනාඩියක් දෙන්න.

දැන් මම කියා ගෙන ආවේ, මුදල් මණ්ඩලය මේ කටයුත්තෙන් අයින් කර තිබීම ගැනයි. ඒ කියන්නේ, පරීක්ෂාව, අධීක්ෂණය අවශ්‍ය යුගයක එය ඉවත් කර තිබෙනවා. මෙහෙමයි විකිණීම සඳහා අවශ්‍ය පාර හදන්නේ.

ඊළඟට, මුදල් මණ්ඩලය අයින් කරලා ඉතිරි කරලා තිබෙන්නේ මොනවාද? දේශපාලන මැදිහත්වීමට අවශ්‍ය කරන ටික ඉතිරි කර තිබෙනවා. මේ බැංකු ආරක්ෂා කිරීම නම් අවශ්‍ය, ඇත්තටම අයින් කරන්න ඕනෑ මුදල් ඇමතිවරයායි. මුදල් ඇමතිවරු තමයි හැම වෙලාවේම ආණ්ඩුවේ දේශපාලන projectsවලට බැංකු පාවිච්චි කරලා බැංකු විනාශ කරලා තිබෙන්නේ. හැබැයි, දැන් මොකක්ද කරලා තිබෙන්නේ? මුදල් ඇමතිවරයාගේ මැදිහත්වීම ඉතිරි කරලා මොකක් හෝ අධීක්ෂණයක් කරන්න, තාක්ෂණික මට්ටමකින් තීන්දුවක් ගන්න ඉඩක් තිබෙන මුදල් මණ්ඩලයේ වගකීම ඉවත් කර තිබෙනවා. ඒ කියන්නේ මොකක්ද? ආණ්ඩුවට ඕනෑ වෙලාවට දේශපාලන වැඩේත් කර ගන්නවා. ඒ වාගේම, බැංකුව අනාථ වූ වෙලාවට බැංකුවේ කොටස් විකුණා ගන්නත් බැංකුවට අවස්ථාවත් ලැබෙනවා. ඒ නිසා අපි බරපතළ ලෙස විරුද්ධ වෙනවා, මුදල් මණ්ඩලය මේ කටයුත්තෙන් ඉවත් කිරීම පිළිබඳව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තුන්වැනි පියවර මොකක්ද? මේ බැංකුව විකිණීමේ ක්‍රියාවලියේ තුන්වැනි පියවර තමයි, කොළඹ කොටස් වෙළෙඳ පොළ හරහා නිකුත් කිරීමට කටයුතු කරන ණයකර, කොටස් බවට පරිවර්තනය කළ හැකි ණයකර ලෙස නිකුත් කිරීමට අවශ්‍ය නෛතික පසුබිම සකස් කිරීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1961 අංක 29 දරන පනතේ 43වැනි වගන්තියේ තිබෙනවා, ණයකරවල ආකෘතිය, එයට ගෙවිය යුතු පොලී ප්‍රමාණය, ණයකර බේරා ගැනීමට ඇති කාලය හෝ ආකාරය පිළිබඳව. මේවා සියල්ලම තීන්දු කිරීමේ බලය ඒ වෙලාවේ මුදල් ඇමතිවරයාට පවරා තිබුණා. මොකද, මේ කටයුතු යම් කිසි පරීක්ෂාවකට ලක් කරන්න ඕනෑ නිසා. නමුත්, දැන් මේකෙන් මොකක්ද කරලා තිබෙන්නේ? මේකෙන් කරලා තිබෙන්නේ බැංකුවටම ඒ සම්පූර්ණ බලය දීලා තිබීම. බැංකුව විසින් නිකුත් කරපු ණයකරවලට අදාළ කරන දේවල්වලට ගෙවන්න බැරි නම් රජය ඇප වෙන්නෙත් නැහැ කියලා තිබෙනවා. මීට කලින් රජය ඇප වුණා. ණයකර ගෙවීමේදී ගැටලුවක් වුණා නම්, රජය ඇප වුණා. දැන් බැංකු අයිතිකාරයා ආණ්ඩුව කියලා කියනවා. මේක පුදුම ආණ්ඩුවක්. බැංකුවේ අයිතිකාරයා ආණ්ඩුවලු. හැබැයි, ආණ්ඩුව ඇප වෙන්නේ නැහැ, තමන්ගේ බැංකුව ගන්න ණයකරයක ප්‍රශ්නයක් වුණොත් ඒක ගෙවන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට අයිති සමාගමක් තිබෙනවා නම්, සමාගමේ අයිතිකරු ඔබතුමා නම්, ඔබතුමාගේ සමාගම ණයක් ගන්නවා නම් ඔබතුමා කොහොමද කියන්නේ, මම ඒ ණයට වග කියන්නේ නැහැ කියලා? මොකක්ද එතකොට මේ කරන්නේ? ආණ්ඩුව බොරුවට කියනවා, අපි තමයි අයිතිකාරයෝ කියලා. හැබැයි, ඒ ගමන්ම පනත වෙනස් කරනවා, ණයකරයක් අරගෙන ගෙවීම සම්බන්ධ ගැටලු ඇති වුණොත් අපි වග කියන්නේ නැහැ කියලා.

මීට කලින් අවස්ථා 10කදී, 15කදී මහජන බැංකුවට ප්‍රාග්ධනය සම්පාදනය කර තිබෙනවා රටේ ඒකාබද්ධ අරමුදලින්. ඒකට හේතු වෙලා තිබෙන්නේත් බැංකුවේ වංචා, දූෂණවලට වඩා, දේශපාලන වශයෙන් 1960 ගණන්වල, 1970 ගණන්වල සිට සිදු වුණු විවිධ අඩු පාඩුකම්. නමුත් දැන් ඔබතුමන්ලා මොකද කරන්නේ? බැංකුව ණයකර අරගෙන ගෙවා ගන්න බැරි වුණාම, බැංකුවට කියනවා, ඔයගොල්ලන් ඒවා ගෙවා ගත යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දකින දෙය මෙයයි. මෙන්න මෙතැනයි ප්‍රශ්නය එන්නේ. බැංකුවට තමන්ගේ ණයකරය ගෙවා ගන්නට බැරි නම්, ණයකරය දුන්න මිනිහාට බැංකුව කොහෙන් හෝ සල්ලි දෙන්න ඕනෑ. බැංකුවේ සභාපතිතුමා තමන්ගේ ඉඩකඩම් විකුණලා ඒ ණය දෙන්නේ නැහැනේ. එම නිසා අනිවාර්යයෙන්ම බැංකුවට සිද්ධ වෙන දේ තමයි තමන්ගේ ණයකර ගත් කෙනාට බැංකුවේ කොටස් විකුණා හෝ ඒ මුදල් දෙන්න වෙන එක. එහෙමයි පෞද්ගලීකරණය වෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය කොටස් වෙළෙඳපොළට ආවාට පස්සේ මොකද වෙන්නේ? මම මේ අවස්ථාවේදී **හැන්සාඩගත*** කරනවා, "Asiamoney" කියන webpage එකේ තිබෙන "Bank of China aims big in little Sri Lanka" කියන ලිපියේ පිටපතක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොටස් වෙළෙඳපොළේ කොටස් මිලදී ගැනීමේදී ලංකාවේ ලියාපදිංචි බැංකුවලට වැඩි අයිතියක් එනවා. Bank of China 2018 මාර්තු 12 වන දා ලංකාවේ ලියාපදිංචි කර තිබෙනවා; 2018 සැප්තැම්බර්වලදී operations පටන් ගෙන තිබෙනවා. ඔවුන් මාස තුනකදී ලාභ ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ඔවුන්ගේ ප්‍රධාන විධායක නිලධාරියා කියන්නේ මොකක්ද? 2025 වෙනකොට එම බැංකුව ලංකාවේ number one foreign

[ගරු බිමල් රත්නායක මහතා]

bank එක වෙනවා කියලා. අපට චීනයත් එක්ක විශේෂ ප්‍රශ්නයක් නැහැ. නමුත් මොකක්ද වෙන්න පුළුවන්කම තිබෙන්නේ? අද ලංකාවේ ලොකුම lender චීනය. ලෝකය ගත්තත් එහෙමයි. මොකක්ද වෙන්න යන්නේ? මේ ණයකර නිකුත් කර ගෙවා ගන්න බැරි වුණාම, මේවාට කොටස් විකුණන්නට ගියාට පස්සේ, - ඒවා ලංකාවේ කවුරු ගත්තත් එකයි. නමුත්,- වැඩිපුර වෙන්න පුළුවන් දෙය තමයි මේ විදේශීය බැංකුවලටම ඒවා ගන්න පුළුවන් වීම. චීන වෙන්න පුළුවන්, ඇමෙරිකන් වෙන්න පුළුවන් ඒ බැංකුවලට ඒවා ගන්න පුළුවන්ම.

අවසාන වශයෙන් අපි ආණ්ඩුවට කියන්නේ මේකයි. මට මේ සම්බන්ධව වෙනම විශේෂ හැඟීමකුත් තිබෙනවා. මෙයින් සිදු වෙන්නේ රටේ ආර්ථික විනාශය විතරක් නොවෙයි. මේ බැංකුවල අතිවිශාල සේවක පිරිසක් වැඩ කරනවා. මගේ අම්මාත් මහජන බැංකුවේ වැඩ කළ නිලධාරිනියක්. අපි දන්නවා, මෙම බැංකුව හරහා අපට ඉගෙන ගන්න වාගේම අපේ දෙමව්පියන්ට සුරක්ෂිතභාවයකුත් ලැබුණ බව. අද ඔවුන් විශ්‍රාම වශයෙන් සිටියත් ඔවුන්ට ඒ සුරක්ෂිතභාවය තිබෙනවා. නමුත් අපි දන්නවා. ප්‍රමුඛ බැංකුවේ වැඩ කළ සේවක සේවිකාවන්ට, වෙනත් බැංකුවල වැඩ කළ සේවක සේවිකාවන්ට ඒ අයිතිය නැති බව. අදත් අපේ දෙමව්පියන් යම් කිසි සුරක්ෂිතභාවයක ඉන්නවා, ස්ථාවර බැංකුවක වැඩ කළ නිසා. ඒ අයිතිය අද ඒවායේ වැඩ කරන සේවක සේවිකාවන්ගේ දරුවන්ටත්, අනාගතයේ එම සේවයට එන්න ඉන්න අයගේ දරුවන්ටත් ලැබිය යුතුයි. එම නිසා අපි කියන්නේ මෙයයි. Capital එක වැඩි කරන්න, අපි ඒකට උදවු කරන්නම්. නමුත් බැංකුවේ මේ ණයකර නිකුත් කිරීමට, විකිණීමට තිබෙන කොන්දේසි සහමුලින්ම නැති කරන්න. මේ තුළ මුදල් මණ්ඩලය නැවත බලයට පත් කරන්නය කියන ඉල්ලීම කරන අතර, මෙයට සංශෝධන ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙන බව කියමින් මගේ කථාව අවසාන කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට වැඩිපුර කාලය ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

[අ.භා.2.00]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කොපමණ වෙලාවක් තිබෙනවා ද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have ten minutes.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර ඇති අවස්ථාවේ, දිවා ආහාරය සඳහා විවේකය ලැබුණු පැයේදී අපට ආරංචි වූ පරිදි මහජන බැංකු සේවකයන්ගේ විරෝධතාවකුත් සූදානම් වී තිබෙනවා. මම හිතන්නේ ඒ අය ඒක තමයි බලාපොරොත්තු වෙන්නේ. යම් කිසි කාර්යයක් කරන්නට සාධාරණ හේතුවක් මත යම් කිසි අවංක උත්සාහයක් දරන හැම අවස්ථාවකම මේ ආකාරයෙන් තේ කෝප්පයේ කිඹුල්ලු දකින එක, තේ කෝප්පයේ කුණාටු දකින එක ගැන මම විශේෂයෙන් කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ හැම දෙයක්ම කරන්නේ සද්භාවයෙන් මිස, යම් වාසියක් pocket එකේ දාගෙන ගෙදර අරගෙන යන්නටවත්, රජයට වාසිදායක ආකාරයකට පාවිච්චි කරන්නටවත් නොවෙයි. පසුගිය අවස්ථාවල ඒ බැංකු පවත්වා ගෙන ගිය හැටි, ඒවා කළමනාකරණය කළ හැටි අපි හොඳටම දැක්කා. මැණික් ගල් කියා තිරිවානා ගල් බැංකුවල තැන්පත් කර සුරක්ෂිත කර, ලංකා පුත්‍ර බැංකුවේ තිබුණු සල්ලිවලට කළ දෙය අපි දැක්කා. 222222V හැටියට සඳහන් වෙන හැඳුනුම්පත් අංකවලින් මුදල් දාපු හැටි, ඒ අරමුදල් පවත්වා ගෙන ගිය හැටි, සල්ලි සොයපු හැටි, හම්බ කරපු හැටි අපි හොඳටම දැක්කා. එහෙම යුගයක් පසු කරගෙන ඇවිල්ලා රට තුළ මූල්‍ය ස්ථාවරත්වයක් හදලා, රටේ මූල්‍යායතන ශක්තිමත් කරන්න දරන මේ උත්සාහයේදීත් කිඹුල්ලු දකින එක ගැන අපි විශේෂයෙන් කනගාටු වෙනවා. විශේෂයෙන් අපි මහජන බැංකුව-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. K. Thurairetnasingam to the Chair?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
Sir, I propose that the Hon. K. Thurairetnasingam do now take the Chair.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. K. THURAIRETNASINGAM *took the Chair.*

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
1961 අංක 29 දරන මහජන බැංකු පනත මඟින් මහජන බැංකුව ස්ථාපිත කරනු ලැබුවා. 1961දී තිබුණු සමාජ ජීවිතය හෝ ආර්ථික සැලැස්ම හා ආර්ථික වටපිටාව නොවෙයි, අද තිබෙන්නේ. මහජන බැංකුව ගොඩනඟන කොට එදා මූලික

වශයෙන් අරමුණු කර ගත්තේ ග්‍රාමීය බැංකු, කෘෂිකර්මය හා සමුපකාර ව්‍යාපාරය වාගේ දේවල් දියුණු කිරීමයි. හැබැයි, ග්‍රාමීය බැංකු හා සමුපකාර ව්‍යාපාර කියන කාරණාවලට අමතරව අද ව්‍යාපාරික ලෝකයේ, තාක්ෂණික සමාජය තුළ බැංකුවක් ගව් ගණනක් ඊට එහා සිතන්නට සිද්ධ වෙලා තිබෙනවා. ඒ අරමුණු, ක්‍රියාකාරිත්වය සහ කළමනාකාරිත්ව විවිධ වශයෙන් නවීකරණය විය යුතුව තිබෙනවා. මෙහි ප්‍රධාන අරමුණ බැංකුව සතුව තිබෙන ප්‍රාග්ධනය වැඩි කිරීමයි. බැංකුවක් තුළ ප්‍රාග්ධනය වැඩි වෙනවා කියලා කියන්නේ, බැංකුවේ මූල්‍ය ශක්තිය වැඩි වෙනවා කියන්නේ ඒවා ණය මඟින්, ආයෝජන මඟින් මේ රටේ විධිමත් ආර්ථික වර්ධනයක් ඇති කරන්න බලපානවා කියන එකයි. කොහේ හරි මුළු ගැහිලා තිබෙන සල්ලි ටිකක් බැංකුවකට විධිමත් විධියට ඇවිල්ලා, බැංකුවේ ප්‍රාග්ධනය වැඩි වෙලා, ඒවා නැවතත් ණය ක්‍රියාවලිය මඟින් මහජනතාව අතරට ගිහිල්ලා, රටේ ජාතික නිෂ්පාදනය වැඩි වෙලා, ඒවා තුළින් විවිධ ඉපැයීම් ඇති වෙලා, විවිධ ආදායම් ලබන්නන් ඇතිවෙලා මේ රට තුළ දැවැන්ත නිෂ්පාදන ක්‍රියාවලියක් ඇති කිරීම තමයි මෙහි අවසාන හරය වන්නේ. ඒ නිසා මේ පිළිබඳව වැරැදි විධියට දකින එක ගැන අපි විශේෂයෙන් කනගාටු වෙනවා.

අද මහජන බැංකු සේවකයන් දවල් කෑම පැයේ එළියට බස්සලා තිබෙනවා, මෙන්න, මහජන බැංකුව පෞද්ගලීකරණය කරන්න හදනවා. මෙන්න, මේ බැංකුව විනාශ කරන්න හදනවා. මේ ගොඩනඟපු බැංකුවට කරන්න තිබෙන ලොකුම අපරාධය මේ ආණ්ඩුව කරන්න හදනවා කියලා. ඒ විධියට මහජන බැංකුවේ සේවකයන් අතර වැරදි මතයක් හදලා දැන් නැවත කඩාකප්පල්කාරී ක්‍රියාවක් කරන්න හදනවා. මේ හදන්නේ මහජන බැංකුවේ තිබෙන කීර්තිනාමය විනාශ කරන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන බැංකුවේ ඉන්න සේවකයන්ට වැරැදි මතයක් පොම්ප කිරීම තුළ ඔවුන්ගේ මනස අවුල් කරනවා විතරක් නොවෙයි, මහජන බැංකුවේ මුදල් තැන්පත් කරලා ඉන්න ගිණුම් අයිතිකාරයන්, මහජන බැංකුවේ ගනුදෙනුකරුවන් අතර වැරැදි මතයක් ඇති කරලා, වැරැදි සංකල්පයක් ඒ මිනිසුන්ගේ ඔළුවලට ඇතුළු කරනවා. හැම කෙනෙක්ම මහජන බැංකුවේ තිබෙන මුදල් ටික එළියට ගන්න හැදුවොත්, මහජන බැංකුවේ තැන්පත් කරලා තිබෙන සල්ලි ටික ආපසු ඉල්ලුවොත් මොකක්ද වෙන්නේ?

අපි පසු ගිය කාලයේ දැක්කා, සමහර මූල්‍ය ආයතන බරපතළ විධියට එක රැයින් කඩාගෙන වැටෙන හැටි. ඒ වාගේ මහජන බැංකුවේ කීර්ති නාමයට මේ කැළැල ඇති වුණොත් මහජන බැංකුවත් විනාශ වෙනවා. මේ හදන්නේ මහජන බැංකුවත් කන්නයි. අනෙක් හැම දෙයක්ම විනාශ කළා වාගේ මහජන බැංකුවේ තිබෙන කීර්ති නාමය පළුදු කරලා මහජන බැංකුවත් විනාශ කරන කඩාකප්පල්කාරී ක්‍රියාවලියකට තමයි මේ ලෑස්ති වෙන්නේ. මහජන බැංකුවේ කීර්ති නාමය විනාශ කරනවා; සේවකයන් අතර නොසන්සුන්තාවක් ඇති කරනවා. මහජන බැංකුවේ මුදල් තැන්පත් කරපු ගනුදෙනුකරුවන් අතර නොසන්සුන්තාවක් ඇති කරනවා. ඔවුන්ට බැංකුව පිළිබඳව තිබෙන විශ්වාසනීයත්වය නැති කරනවා. එතකොට බැංකුවේ තැන්පත් කරලා තිබෙන මුදල් ආපසු ඉල්ලනවා. ඒ හරහා ඒ බැංකු ක්‍රියාවලිය තුළ ඒ ගලාගෙන යන ක්‍රමානුකූලභාවය විනාශ කරන්න තමයි මේ හදන්නේ කියන එකත් මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කියනවා. මේ ගොල්ලන්ගේ වැඩ මෙහෙමමයි තමයි.

ඉඩම් පනතටත් ඒකම තමයි කළේ. අපේ රටේ අස්සක් මුල්ලක් නෑර මායිම් ගම්මානවල, ගොවි ජනපදවල ඉන්න භූමියක අහලක අයිතියක් නැති අපේ අහිංසක මිනිසුන්ට අපේ ආණ්ඩුව - මේ රජය- මැදිහත් වෙලා ඒ ඉඩම්වලට ඔප්පුවකින් අයිතිය දෙන්න හදන කොට එළියට බැස්සා. ඇමෙරිකාවට, පිට රටට ඉඩම් ටික විකුණන්න මෙන්න ගහන ගැටයක් ගහනවා කියලා කෙබරයක් ඇද බෑවා. සම්පූර්ණයෙන්ම රට ඇවිස්සුවා; අධිකරණයට ගියා. අධිකරණයට ගිහිල්ලා කිව්වේ වෙනත් දෙයක්. පළාත් සභාවලට තිබෙන ඉඩම් අයිතිය පිළිබඳව තීරණය කරන්න මහ ආණ්ඩුවට බැහැ කියලා උසාවියට ගියා. මහජනතාව අතරට ගිහිල්ලා කිව්වා, පුංචි බණ්ඩාගේ, උක්කු බණ්ඩාගේ, කිරි මැණිකාගේ තිබෙන අක්කර කාල ඇමෙරිකාවට දෙන්න, ඇමෙරිකාවට support කරනවා කියලා. ඒ විධියට වැරැදි මතයක් ඉදිරිපත් කළා.

එහෙම කරලා එම ඉඩම් පනත තුළින් අපි මේ රටේ ජනතාවට දෙන්න සූදානම් වෙලා තිබුණු සහන සහ ඔවුන්ගේ ඒ සියලු සාධාරණ ඉල්ලීම් සම්පූර්ණයෙන් කාලා දැම්මා; විනාශ කරලා දැම්මා. ඉඩම් පනතට කළේ ඒකයි.

අද මේ වෙනකොට වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් රෝහල්වල වෛද්‍ය වර්ජනයක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. අද රෝගීන් මේ ගැන කියන්නේ මොකක්ද? හැම දාම මාසයකට සැරයක් මේ ගොල්ලන්ගේ මේ ජවනිකාව කරනවා. රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය කිසිම සාධාරණ හේතුවක් නැතුව අදත් විරෝධතාවක නිරත වෙනවා; වර්ජනයක නිරත වෙනවා. දැන් මේක පුරුද්දකට ගිහිල්ලා. රජයෙන් පළිගන්න අවශ්‍යතාවක් තිබෙනවා නම්, සෞඛ්‍ය ඇමතිතුමාගෙන් පළිගන්න ඕනෑකමක් තිබෙනවා නම්, එවැනි දේශපාලන අවශ්‍යතාවක් තිබෙනවා නම්, දේශපාලනයේ ගැටලුවක් තිබෙනවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අයට පුළුවන් ඒ ගැන රජය සමඟ කථා කරන්න; ජනාධිපතිවරයා සමඟ කථා කරන්න; අගමැතිතුමා සමඟ කථා කරන්න; සෞඛ්‍ය ඇමතිතුමා සමඟ කථා කරන්න. මේ අයට පුළුවන් තමන්ට තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්න. නමුත් මේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ඉතාම අසාධාරණ විධියට රෝහල්වල වර්ජන ක්‍රියාත්මක කරනවා. මොනවාද, මේ ගොල්ලන්ගේ ඉල්ලීම්? වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතිය නීතිගත නොකිරීම සම්බන්ධව ඉල්ලීමක් තිබෙනවා. ඒක, එක ඉල්ලීමක්. වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතිය මෙතෙක් කාලයක් නීතිගත කරලා නැත්නම්, මෙතෙක් පත් වෙච්ච කිසිම ආණ්ඩුවක් ඒ පිළිබඳව අවධානය යොමු කරලාත් නැත්නම්, දැලි පිහිය බෙල්ලට තියලා, "මේක කරාපිය" කියලා මේ ආණ්ඩුවට බල කරනවා. ඒ ගැන බලධාරින් සමඟ සාකච්ඡා කරලාත් නැත්නම්, උදේ පාන්දර ඇහැරලා, කිලෝමීටර් 50, 60 දුර ඉස්පිරිතාලයට එන දුෂ්කර ගම්මානවල සිටින අපේ අහිංසක රෝගීන්ගේ ජන ජීවිතය සහ ඔවුන්ගේ ජීවිත අවදානම හැල්ලුවට තබා මේ නිලධාරින් මොකක්ද මේ කරන්නේ? වෛද්‍ය අධ්‍යාපනයේ මූලික ප්‍රමිතිය තීරණය කරන්න අවශ්‍යයි. ඒකට වෘත්තිකයන් සම්බන්ධ කරගන්න අවශ්‍යයි; විද්වතුන් සම්බන්ධ කරගන්න අවශ්‍යයි; වෛද්‍ය සභාව සම්බන්ධ කරගන්නට අවශ්‍යයි; සෞඛ්‍ය ඇමතිවරයා සහ අමාත්‍යාංශයේ නිලධාරින් සම්බන්ධ කරගන්න අවශ්‍යයි. මේ ප්‍රමිති පිළිබඳව සාකච්ඡා කරලා මතවාදයක් හදාගන්න අවශ්‍යයි. ඒ කරුණු කාරණා සඳහා විධිමත් පියවර රාශියක් ගන්නට තිබියදී, අහිංසක රෝගීන්ගෙන් මේ ආකාරයෙන් පළිගන්න කටයුතු කිරීම පිළිබඳව මම විශේෂයෙන් කනගාටු වෙනවා. වෛද්‍ය නිලධාරින්ගේ සංගමයට මේ රජය එක්ක, සෞඛ්‍ය ඇමතිවරයා එක්ක දේශපාලන ප්‍රශ්නයක් තිබෙනවා නම්, සෞඛ්‍ය ඇමතිවරයා එක්ක හෝ රජයත් එක්ක ඒ ගැන කථා කරගන්න ඕනෑ.

අද මහජන බැංකුව අළෙවි කරනවා; පෞද්ගලීකරණයට ලක් කරනවා කියලා මහජන බැංකුවේ සිටින සේවකයන් නොසන්සුන් කරලා පාරට දමනවා. වෛද්‍ය නිලධාරින්ගේ සංගමය රජයේ රෝහල්වල සිටින වෛද්‍යවරුන් ටික වර්ජනයට යොමු කරවලා අපේ අහිංසක -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්ත්පර 30ක් දෙන්න. මම කථාව අවසන් කරන්නම්.

වෛද්‍යවරු වැඩ වර්ජනය කරලා අපේ අහිංසක රෝගීන්ගේ ජීවිත එක්ක සෙල්ලම් කරනවා. අපට සැකයි, මේවා සේරම එකට කථා කරලා, එකට සැලසුම් කරලා කරන සැලසුම් සහගත ක්‍රියාවලියක්ද කියලා.

අපි රජයක් හැටියට මේ රටේ මූල්‍ය ශක්තිය තහවුරු කළා. ඒ මූල්‍ය ස්ථාවරය අපි තහවුරු කළා. මේ කරන්න හදන්නේ මහජන බැංකුව කාලා විනාශ කර දැමීමක් නොවෙයි; "තිරිවානා ගල්" තියලා බැංකුවල තිබිච්ච සල්ලි පොට්ටනිය එළියට ඇදීමක් නොවෙයි. බැංකුව තුළ තිබෙන මූල්‍ය ස්ථාවරය ශක්තිමත් කරලා ඒ තුළින් ජාතික නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කරලා, මේ රට තවත් සංවර්ධනය කරලා, මහජන බැංකුවත්, ඒ බැංකුව මේ රටේ තබාගෙන යන කීර්ති නාමයත් ආරක්ෂා කරගෙන ඉස්සරහට ගෙන යෑම මිසක්, මහජන බැංකුව විනාශ කිරීමක් නොවෙයි අපි මේ කරන්නේ. ඒ නිසා කඩාකප්පල්කාරීන්ගෙන් එල්ල වන මේ වාගේ අවලාදවලින් පරිස්සම් වෙන්න කියන පණිවුඩය අපි විශේෂයෙන් ජනතාවට දෙන්න ඕනෑ. ඒ බව සිහිපත් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 15ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 2.12]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ කේන්ද්‍රීය වගකීමක් ඉෂ්ට කරන රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුවේ, මහජන බැංකු (සංශෝධන) පනත සංශෝධනය කිරීම සඳහා රජය දරන උත්සාහය අද දින විවාදයට ලක් වන අවස්ථාවයි, මේ.

මහජන බැංකුව විශේෂ පනතකින් පාර්ලිමේන්තුව ඇති කරපු රාජ්‍ය බැංකුවක්. 1956 පළමුවැනි ප්‍රගතිශීලී ආණ්ඩුව -මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව- විසින් මේ රටේ සමුපකාර ෆෙඩරල් බැංකුව ඇති කළා. ඒ වාගේම ආර්ථික පුනර්ජීවනය සඳහා බිහි කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රාග්ධනය හා ණය සහයෝගය අරමුණු කරගෙන මහජන බැංකු පනත සකස් කළා.

ඊට පෙරාතුව මෙහි නම තිබුණේ "සමුපකාර සංවර්ධන බැංකු පනත" හැටියටයි. බන්දුල ගුණවර්ධන මැතිතුමාත් සඳහන් කළා, ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමා මේ පනත කෙටුම්පත් කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාය කියලා. ඕනෑම මූල්‍ය බැංකුවක් ඇති කිරීමේ ක්‍රියාවලියේ දී දේශපාලන අර්බුදයක් ඇති වනවා. එලෙස ඇති වූ දේශපාලන අර්බුදය නිසා එම පනත ඉදිරිපත් කරන්න ඒ ආණ්ඩුවට බැරි වුණා. එතුමා අස්වෙලා ගියා. මම මේ අවස්ථාවේ ගරු ටී.බී. ඉලංගරත්න මැතිතුමා ගෞරවයෙන් සිහිපත් කරනවා. එදා පාර්ලිමේන්තුවට මේ පනතේ නම වෙනස් කරලා ඉදිරිපත් කරලා, එතුමාගේ කථාවේදීම කිව්වා එහි නම පමණයි වෙනස් කළේ කියලා. රාජ්‍ය බැංකු ඇති කිරීමේ ස්ථාවරය, හුදෙක් පෞද්ගලික අංශයට එම ක්ෂේත්‍රයට ඇතුළු වීම සඳහා ඉඩ නොදීම නොවෙයි. අද වනකොට පෞද්ගලික හා වාණිජ බැංකු 23ක් අපේ රටේ කටයුතු කරනවා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමයේ ගරු ෆීලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක මැතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට ලංකා බැංකුව ජනසතු කළා. ඒකටත් පනතක් ගෙනාවා. එලෙස පනතකින් ඇති කරපු ශක්තිය තමයි, මේ බැංකුවල අරමුණු, පරමාර්ථ හැටියට තිබෙන්නේ. ඒ වාගේම ආචාර්ය එන්.එම්. පෙරේරා මුදල් අමාත්‍යතුමා තැපැල් දෙපාර්තමේන්තුවේ තිබුණු තැන්පත් ගිණුම් එකතු කරලා ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇති කළා. මේ බැංකු තුන තමයි අපේ රටේ මූල්‍ය ක්‍රමයේ ශක්තිමත්ම ආයතන තුන හැටියට අපේ ආර්ථිකයට පණ දෙන්නේ. යූඑන්පී පාලන සමය තුළ හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, සමගි පෙරමුණ වැනි අපේ පාලන කාලය තුළ ආර්ථිකයට ශක්තිය ලබා දී තිබෙන්නේ, ආර්ථික සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය ණය සහයෝගය දීලා තිබෙන්නේ, ඒ වාගේම විවිධ ජාත්‍යන්තර ව්‍යාපෘති හා දේශීය ව්‍යාපෘතිවලට දායක වී තිබෙන්නේ මේ බැංකු තුන තමයි. ඒ නිසා අපි මේ රාජ්‍ය බැංකු තුන ආරක්ෂා කර ගත යුතුයි. ධනවාදී ආර්ථිකය තුළ රාජ්‍ය බැංකු පවතින්න පුළුවන්. එම ප්‍රතිපත්තිය තුළ තමයි මහජන බැංකුව ආරක්ෂා කර ගැනීම සඳහා වූ ක්‍රියාවලිය වෙනුවෙන් අපි අද විශේෂයෙන්ම කරුණු කියන්න සූදානම් වෙන්නේ. ආණ්ඩුව වෙනුවෙන් මේ ගැන කරුණු කිව්වා, මෙයින් අද සිදු වෙන්නේ ප්‍රාග්ධනය වැඩි කිරීම පමණයි, අද සිදු වෙන්නේ ණයකර නිකුත් කිරීම පමණයි කියලා. මේ කොටස් ණයකර අවසන් වන්නේ කොටස් වෙළෙඳ පොළෙන් බව අපි කවුරුත් දන්නවා. යුගයේ අවශ්‍යතා ඉෂ්ට කරන, ජාත්‍යන්තර ගනුදෙනු කළ හැකි ප්‍රධාන බැංකුවක් බවට මහජන බැංකුව මේ වනකොට පත් වෙලා අවසානයි. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. රාජ්‍යයේ සංවර්ධනයට, පෞද්ගලික අංශයේ සංවර්ධනයට, ජාත්‍යන්තරව ශ්‍රී ලංකාවේ ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කරන කේන්ද්‍රීය බැංකුවක් හැටියට මහජන බැංකුව පත් වෙලා තිබෙනවා. ඒ ගැන නොවෙයි මේ වාදය තිබෙන්නේ. මෙතැනින් එහාට බැංකුවේ අනාගතයට සිදු වෙන්නේ මොකක්ද කියන කාරණය ගැනයි අද වාදය තිබෙන්නේ.

මේ ආණ්ඩුවට ආර්ථික සංවර්ධනයක් ඇති කර ගැනීමට බැරි වුණා. එය ප්‍රසිද්ධ රහසක් බවට පත් වෙලා තිබෙනවා. අපේ පාලන කාලයේ සියයට 6.7ක වේගයෙන් වර්ධනය වූ ආර්ථිකය අද වනකොට සියයට 2.5ට බැහැලා තිබෙන බව මහ බැංකු අධිපතිවරයා හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා.

දෙවැනි කාරණය මෙයයි. ජාත්‍යන්තරව ලෝක ආර්ථිකය පසුබෑමකට ලක් වෙමින් තිබෙනවා. ආර්ථිකය පසුබෑමකට පත් වන හැම අවස්ථාවකදීම රාජ්‍ය බැංකුවලට තමයි ආර්ථිකයේ ආරක්ෂකයා හැටියට මැදිහත් වී කටයුතු කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මම දීර්ඝව ඒ ගැන කථා කරන්න උත්සාහ දරන්නේ නැහැ. ප්‍රාග්ධනය වැඩි කිරීම පිළිබඳව හා ණයකර නිකුත් කිරීම පිළිබඳව තිබුණු බැංකුවේ ආරක්ෂක වගන්ති ඉවත් කිරීමට ආණ්ඩුව යෝජනා කරලා තිබෙනවා. අපි දන්නවා, the Monetary Board is the sole custodian of the monetary system of Sri Lanka. It has the right to direct and advise, and to advise Central Bank for intervention, which the Minister cannot say,"No". Now, those clauses are being removed. Now, the power is being taken to the Ministry of Finance only and the Board will have unlimited power, unlimited autonomy to act in any way. My Hon. Friend, the State Minister of Finance, is here.

Yesterday and during the last few days, he has been lamenting about the failure of the SriLankan Airlines, UL. The massive drain of our earned foreign exchange. The same situation will happen if you open in this manner the debenture form, which can end up in the share market and finally go into the hands of the private sector. That is why we are pressing and asking the Government to bring the necessary protection. If you fail, we will move the Amendments in order to protect the State Banks from this type of transfer, which is a hidden way of reaching the situation of privatization.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ බැංකුවල පොලී ආදායම විතරක් අරගෙන බලන්න. වටිනාකමින් බිලියන 1,108ක් පොලී ආදායම ලබනවා. පොලිය සඳහා වියදම බිලියන 711යි. මෙය, ඉතාම විශාල පරතරයක්. පොලී නොවන වියදම් ආදිය අඩු කරනකොට විශාල පරතරයක් පවතිනවා. ඒ නිසා, අපේ රටට අවශ්‍ය වන්නේ පොලියෙන් පමණක් ජීවත් වන බැංකු ක්‍රමයක් නොවෙයි. පොලිය වාගේම, ඵලදායක ලෙස ආයෝජනය කරන බැංකු ක්‍රමයක් අපේ රටට අවශ්‍යයි. කොටස් වෙළෙඳ පොළ නිසා, ණයකර නිසා රජයේ ආයෝජන මඟින් ඇති කරපු බැංකු දෙකක් ක්‍රමානුකූලව පෞද්ගලික අංශයට යනවා අපි දැක්කා. ඒ නිසා එවැනි දේවල් යළි සිදු නොවීම සඳහා වන ආරක්ෂක වගන්ති ඉවත් නොකරන වැදගත්කම අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ අවධානය පිණිස මම මේ කාරණය විශේෂයෙන් කියන්න කැමැතියි. "Why did the Coffee King commit suicide?" That was the news of India two weeks ago. So, why did the Coffee King commit suicide? The billionaire businessman was a success story in South India and he committed suicide because of the chase of the Income Tax Department and today, there is an inquiry going on. So, do not try to kill the national industry. Do not try to kill our established national banks. Finally, it will only push our economy into foreign hands.

ඉතාම ඕනෑකමින්, මම මේ කාරණයත් සඳහන් කරනවා. With regard to Clause 2, Clause 3, Clause 4 and Clause 5, which are being debated today in the open, I would like to refer to an article published today in the "Daily FT" by a former Chairman as well as the President of the Bank Employees' Union, Mr. T. Rusiripala. He sends alarming signals, which have not been answered by the Government. That is why this Debate is very important and I hope that, before 04th September, the Government will come back again and agree with the Opposition to make the necessary safeguards in amendments. ඔහු වැදගත් කරුණු කීපයක් සඳහන් කරනවා. දැනට Monetary Board එකට තිබෙන බලතල සම්පූර්ණයෙන් ඉවත් කිරීමෙන් බැංකුව දේශපාලනීකරණය වී කටයුතු කරන්න පුළුවන්කම ඇති වෙනවා. මූල්‍යමය කටයුතු සම්බන්ධයෙන් වැරැදි තීරණ ගත්තොත්, ඒවා පාලනය කර ගන්න බැරි තත්ත්වයකට පත් වෙනවා. මේ කිසිම අවස්ථාවක, මහජන බැංකුවේ ප්‍රධානියා ලෙස පත් වන්නේ දේශපාලනීකරණය නොවූ කෙනකු වන බවට අද සහතිකයක් නැහැ, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි. ඔබතුමන්ලාගේ යහ පාලන ප්‍රතිපත්තියෙන් මුළුමහත් රාජ්‍ය සේවය, පෞද්ගලික අංශය ඉල්ලා සිටි යහපත් කාරණා අද වනතුරු ඉටු කරන්න බැරි වී තිබෙනවා. එවැනි අසාර්ථක තත්ත්වයක් තුළ බැංකුවේ අද තිබෙන ආරක්ෂක වගන්ති, මූල්‍ය ක්‍රමය ඉවත් කිරීමට ගන්නා පියවර ඉතාම භයානක ඒවා ලෙසයි මා දකින්නේ.

Sir, in his article in today's "DailyFT", Mr. T. Rusiripala states, I quote:

> "The determination of the paid up capital under this enhanced authorized limit will be done by an order published in the Gazette and every Order made by the Minister shall be brought before Parliament for approval."

Parliament has to have control over the activities according to the Act. මේ වගන්ති ඉවත් කිරීම සඳහා උත්සාහ කිරීම ඉතාම භයානකයි. මේ වගන්ති ඉවත් කිරීමට පනත් කෙටුම්පතින් ගෙනෙන නිර්දේශ ඉතාම භයානකයි. එහෙම නම් සිදු වන්නට පුළුවන් කුමක්ද? He further states, I quote:

> "But under the amendment proposed banks can with the approval of the Ministry of Finance issue debentures without any reference to the Monetary Board".

It can end up in the stock market; it can finally be bought up by anyone dealing in the stock market. He also states,

> "Parliament will have to address these issues and introduce suitable checks and controls unless they favour the issue of shares to public and dilute the State ownership in the bank".

මේ බරපතළ කරුණු අතර,- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද තිබෙන තත්ත්වය අනුව අපට මුහුණ පෑමට සිද්ධ වෙන අභියෝග ජය ගන්න නම්, අප කල්පනාකාරීව කටයුතු කරන්න ඕනෑ. අපේ රටේ සංවර්ධනය සඳහා ඉතාම බරපතළ වගකීම් ඉෂ්ට කරන්න පුළුවන්කම තිබෙන රාජ්‍ය බැංකු තුනෙහි ශක්තිය අඩු නොකිරීම පිණිස වන ආරක්ෂක වගන්ති ඇතුළත් කිරීම සඳහා අප කලින් සඳහන් කළ පරිදි කටයුතු කළ යුතුයි. Mr. Rusiripala further goes on to state, I quote:

> "The removal of the requirement to obtain the prior approval of the Monetary Board and the determination of the methodology of a debenture issue through the intervention of the Ministry appear to be a licence to be granted to the Bank Authorities to freely decide the supplementing of any sum of funds through debentures. Judging from their performance over the years and the failure to put the bank on a real commercial footing sounds an alarm bell which should receive the attention of all."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රාජ්‍ය බැංකු තුන ආරක්ෂා කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂය කියන කරුණු ඉතා වැදගත් වෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මීට කලින් -1980 ගණන්වල- මේ ආකාරයේම උත්සාහයක් දැරුවා. විපක්ෂය හැටියට අපි එදා ඉදිරිපත් වෙලා එය ව්‍යර්ථ කළා. බැංකුවේ ආරක්ෂකයන් කියන්නේ, එම බැංකුවේ වැඩ කරන අය පමණක් නොවෙයි. එහි තැන්පත්කරුවන්ද ආරක්ෂකයන් වනවා. ඒ අය තමයි අද මේ වෙනුවෙන් හඬ නඟන්නේ. ආණ්ඩුව කියනවා, ඒ හඬ නඟන එක වැරැදියි කියලා. එසේ හඬ නැඟූ නිසායි මේ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

විධියටම කළ යෝජනාව ඉල්ලා අස් කර ගන්න 1986 වර්ෂයේදී ඩී.බී. විජේතුංග මුදල් ඇමතිතුමාට සිද්ධ වුණේ. රජය මහජන හඬට සවන් දීම, තැන්පත්කරුවන්ට සවන් දීම කළ යුතුයි. ඒ තුළින් බැංකු ක්‍රමය විතරක් නොව බැංකුවත් ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාදාමයත් සිදු වෙනවා. ඒ මඟින් තමයි තවත් වර්ධනය විය හැකි විශාල ක්‍රියාකාරී බැංකුවක් බවට පරිවර්තනය විය හැකි වන්නේ. ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග සඳහා වන සංශෝධන විරුද්ධ පක්ෂය හැටියට අපි ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලා ඒ සංශෝධනවලට ඉඩ දෙන්නේ නැත්නම් මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න අපට සිද්ධ වන බව මම ඉතාම වගකීමෙන් ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි කාරණාවක් පැහැදිලි කිරීම සඳහා මට විනාඩියක් දෙන්න.

One point I would like to make is that there is no question about the ownership of the Bank going to anybody apart from the Government of Sri Lanka. The Government is the ultimate beneficial owner and it is enshrined in Section 13 of the People's Bank Act. For avoidance of any doubt, I would like to say that Section 13 will not be amended.

The next point I would like to make is about the Monetary Board.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Minister, debentures can eventually end up in the stock market, if the provisions are not protective. You agree, do you not?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

Yes.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

There in the stock market, it can go into the hands of the private sector.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

No, it cannot because it would be illegal. I have checked with the lawyers.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Have protective laws.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

It cannot go into their hands because it will be contrary to the People's Bank Act.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

What happened to the DFCC? It went to the private sector. What happened to the NDB?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

Hon. Member, the DFCC and the NDB went into their hands after definite decisions taken by the Government to take them to the stock market. If a future Government, maybe your Government, decides to take the Bank of Ceylon or the People's Bank to the stock market, that will be a future decision. But, under these Amendments, it is not possible; it cannot be done.

Just to clarify the last point, the Monetary Board's approval is not necessary for the nature of the debenture or for the interest rates. Not for any other Sri Lankan State-owned bank, is it there. Only the People's Bank has been constrained. So, we are making the People's Bank equal to the other banks, but the supervision of the Central Bank will not change in any way. මහ බැංකුවේ අධීක්ෂණයේ කිසිම වෙනසක් නැහැ. මෙතැන, මුදල් මණ්ඩලයේයි වෙනස වෙලා තිබෙන්නේ. මේ බැංකුවට විතරයි ඒ තහංචිය දමලා තියෙන්නේ. ඒ කියන්නේ, debentures ප්‍රමාණය, පොලිය කීයද කියන එක අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනවා. ඔබතුමන්ලා මේ ගැන කිසිම සැකයක් තියාගන්න එපා. මේ සංශෝධනවලින් රජයේ අයිතිය නැති කරන්න බැහැ. Section 13 එකට කිසිම amendment එකක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ආරක්ෂක වගන්ති දෙක තුනක් සංශෝධනවලදී අපි ගේනවා. ඔබතුමන්ලා ඒවාට එකඟ වෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[අ.භා. 2.28]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - State Minister of Mahaweli Development and Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ස්තුතිවන්ත වෙනවා, මහජන බැංකු පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පැවැත්වෙන මේ විවාදයට සහභාගිවීමට අවස්ථාවක් ලබාදීම ගැන. මෙය, අපි රැකගත යුතු බැංකුවක්. අපේ ජාතිය වෙනුවෙන් විශාල මෙහෙවරක් කළ බැංකුවක් රැක ගන්න, ශක්තිමත් කරන්න

මෙවැනි තීන්දුවක් ගැනීම ගැන විශේෂයෙන්ම මම සතුටු වෙනවා. රටේ ආර්ථික සංවර්ධනය කඩා වැටිලා කියලා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ණය අරගෙන වරායන් හදන එක, චීනයට රට උගස් තියලා ණය අරගෙන පාරවල් හදන එක, රට උගස් තියලා ණය අරගෙන ගුවන් තොටුපළවල් හදන එක තමයි ආර්ථික සංවර්ධනය කියන්නේ කියලා එතුමා හිතනවා ඇති. කඩා වැටුණු ආර්ථිකයක් තිබුණු රටක් තමයි අපි භාර ගත්තේ. තුඹසක් වාගේ පුම්බපු ආර්ථිකයක් තිබුණු රටක් මේක. ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් තුළින්, විවිධ රටවල් හා ඒකාබද්ධව, ධනාත්මක සිතුවිලි ඔස්සේ අපි දැන් මේ රට ගොඩ නඟමින් යනවා. ජනතාවට ප්‍රතිලාභ ලැබෙන ආකාරයෙන් අප දැන් මේ රටේ ආර්ථිකය සංවර්ධනය කරගෙන යනවා. ණය අරගෙන නොවෙයි අපි ඒ කටයුතු කරන්නේ. මේ අවුරුද්ද තුළ, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම සංවර්ධන කටයුතු සඳහා ලක්ෂ තුන්දහසක් ලබාදෙන්න අපට පුළුවන්කම තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන දුප්පත් ගෙවල් 1,500කට වහලය සාදා ගැනීම සඳහා අපි රුපියල් ලක්ෂය ගණනේ නිකම් දුන්නා, මේ වර්ෂය තුළ. ඒ විධියට, රටේ ආර්ථිකය සංවර්ධනය කරමින්, එම සංවර්ධනයේ ප්‍රතිලාභ දුප්පත්, අහිංසක ජනතාවට ලැබෙන ආකාරයෙන් තමයි අපි කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බැංකුව පෞද්ගලීකරණය කරන්න යනවා කියලා විපක්ෂය චෝදනා කරනවා. මේක, එතුමන්ලා කරුණු කාරණා නොදැන කියන කථාවක් නොවෙයි. තමුන්නාන්සේලා මෙහි ඇත්ත දන්නවා. එහෙම දැන ගෙනත්, තමුන්නාන්සේලා ජනතාව තවත් ඇන්දවීමට කටයුතු කරනවා. මොකද, ඕනෑ දෙයක් කියන්න, කරන්න අප වර්තමානයේ නිදහස දීලා තිබෙන නිසා. මාධ්‍ය නිදහස, උද්ඝෝෂණය කිරීමේ නිදහස, රජය විවේචනය කිරීමේ නිදහස, ජනාධිපතිවරයා විවේචනය කිරීමේ නිදහස කියන සියල්ලම අපි දීලා තියෙනවා. මේ නිදහස ප්‍රයෝජනයට අරගෙන [බාධා කිරීමක්] මොකක්ද? ඔබතුමා මැරිලා උපන්නාද ගරු මන්ත්‍රීතුමනි? අපේ හමුදා මූලස්ථානය තිබුණු ගෝල්ෆේස් එක ඉස්සරහා ඉඩම චීන කොම්පැනියකට සින්නක්කරව විකුණනකොට ඔබතුමා කොහේද හිටියේ? දැන් මතක් වුණා නේද ජාත්‍යාලය! මම වගකීමෙන් කියනවා, අපේ රජය බලයට පත් වුණාට පස්සේ රාජ්‍ය දේපළ කිසිවක් විකුණා නැති බව. නමුත් අපේ ගරු මන්ත්‍රීතුමා -මගේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා- කියනවා,- [බාධා කිරීමක්] ඔබතුමන්ලා කොහොමද, රෙද්දක් ඇඳගෙන ඔය දේවල් කියන්නේ? කොහොමද අනික් අයට ඇඟිල්ල දිගු කරන්නේ? ඕනෑම කෙනෙක් දන්නවා, ඔබතුමන්ලා ගෝල්ෆේස් එක ඉස්සරහා අපේ හමුදා මූලස්ථානය පිහිටා තිබුණු ඉඩම සින්නක්කරව චීන කොම්පැනියකට විකුණූ බව. ඊළඟට, Port City එකට ඉඩම් හෙක්ටයාර 600ක්, 700ක් සින්නක්කරව, රුපියල් ශතවලින් දෙනකොට ඔබතුමන්ලා කොහේද හිටියේ? ඇමෙරිකාවේ Dole සමාගමට අක්කර දස දහස් ගණනක් සින්නක්කරව විකුණනකොට ඔබතුමන්ලා කොහේද හිටියේ? මම තමුන්නාන්සේලාට අභියෝග කරනවා, පුළුවන් නම් මේ රජයට ඇඟිල්ල දිගු කරලා කියන්න, මෙන්න මේ ඉඩම සින්නක්කරව පිටරට කොම්පැනියකට වික්කා කියලා.

මේ රජය අර පෞද්ගලික කොම්පැනියට මෙන්න මේ ඉඩම සින්නක්කරව විකුණුවා කියලා පුළුවන් නම් කියන්න කියලා මම අභියෝග කරනවා. තමුන්ගේ අතේ වැරැදි තියාගෙන එහෙම කියන්නේ කොහොමද? මම ඒකයි කියන්නේ, මැරිලා ඉපදුනා වාගේ කථා කරන්න එපා කියලා. ඔබතුමන්ලා, -

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
Sir, I rise to a point of Order.

අපි එහෙම දුන්නාය කියන ලියකියවිලි ටික පුළුවන් නම් ඉදිරිපත් කරන්නකෝ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු මන්ත්‍රීතුමනි, Galle Face එක ළඟ ඉඩම දීපු එක ජනතාවට ඇස් පනා පිටම පෙනෙනවානේ. ඒකට ලියකියවිලි ඕනෑද? ඒ ඉඩමේ තමයි හමුදා මූලස්ථානය තිබුණේ. ඒ ඉඩමේ ෂැංග්‍රි-ලා හෝටලය හදලා තිබෙනවා. ජනතාව ඇස් පියාගෙනද Galle Face එක ඉස්සරහින් යන්නේ? මේ රටේ ජනතාව Galle Face එකට යනවානේ. Galle Face එකට ගිහිල්ලා එහා පැත්ත බැලුවාම පෙනෙනවා Port City එකට ඉඩම් සින්නක්කරව විකුණපු බව. මෙහා පැත්ත බැලුවාම හමුදා මූලස්ථානය, - [බාධා කිරීමක්] ඔව්, ඒක හමුදා මූලස්ථානය. හමුදා මූලස්ථානයත් සින්නක්කරව වික්කානේ. කුලියට දුන්නාද, බද්දට දුන්නාද? [බාධා කිරීමක්] නැහැ. සින්නක්කරව වික්කා. දෙයියනේ! එහෙම කරලා තමුන්නාන්සේ අපෙන් ලියකියවිලි ඉල්ලනවා. සමහර විට ඒවා හංගලා කොහේ හෝ දමලා ඇති. සමහර විට ඒ ලියකියවිලි ටික කැලණි ගඟට හෝ මුහුදට හෝ දමලා ඇති. ඔබතුමන්ලා සින්නක්කරව දීපු ඉඩම තමයි ඒ විධියට පාවිච්චි කරන්නේ. ඒ වාගේම මට මතකයි එක දවසක් විවාදයකට ගිහිල්ලා බන්දුල ගුණවර්ධන මැතිතුමාගෙන් ඒ ලියකියවිලි ඉල්ලුවා. එතකොට එතුමාත් ඔය විධියටම කිව්වා. එතැන හිටපු මාධ්‍යවේදියා දුන්නා, "මෙන්න ලියකියවිලි" කියලා. එතකොට එතුමා කිව්වා, "ආ, මේක ගැන හොයලා බලන්න ඕනෑ" කියලා. ඒ වාගේ විහිළු කතා කරලා ජනතාව රවට්ටන වැඩ පිළිවෙළකට තමුන්නාන්සේලා යන්න එපා. මේවා විහිළු. මුල් කාලයේ ඔය වාගේ කථා මිනිස්සු පිළිගත්තා. වර්තමානය වන විට ඒවා මිනිස්සු පිළිගන්නේ නැහැ. මිනිස්සු ඇත්ත දන්නවා. හමුදා මූලස්ථානය සින්නක්කරව වික්කාය කියන එක Galle Face එකට යන මිනිස්සු දන්නේ නැද්ද? [බාධා කිරීම්]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්] ගරු රාජ්‍ය ඇමතිතුමා, පොඩ්ඩක් අහගන්නකෝ. තමුන්නාන්සේ දන්නවාද, ටාජ් සමුද්‍රා හෝටලය තිබෙන ඉඩමත් හමුදාවට අයත් ඉඩමක්. එම ඉඩම ජේ.ආර්. ජයවර්ධන මහත්මයා දුන්නේත් ඒ විධියටම තමයි. ආර්ථික උපාය මාර්ගයක් විධියට සංචාරක ව්‍යාපාරය සඳහා තමයි එම ඉඩම සම්පූර්ණයෙන්ම පාවිච්චි කළේ. ෂැංග්‍රි-ලා හෝටලය තිබෙන ඉඩම ඒ විධියට සින්නක්කරව දීපු නිසා තමයි, පිට රටවල තිබෙනවා වාගේ අද කොළඹත් chain hotels,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂත් ගියේ ජේ.ආර්. ජයවර්ධන ගිය මාර්ගයේ කියලා ඔබතුමා පිළිගත්ත එක ගැන මම සතුටු වෙනවා. පොහොට්ටුවේ මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එදා ආණ්ඩුව කාලයේ ගියේ ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ගිය මාර්ගයේ. හැබැයි, ජේආර් විවේචනය කරලා තමයි එතුමන්ලා ආණ්ඩු බලය ගත්තේ. ජේආර්ගේ පාරේ අපිත් ගියා කියලා එතුමන්ලා අද කයිවාරු ගහනවා. ජේආර් ගිය පාර හොඳයි කියලා අද කියනවා. ජේ.ආර්. ජයවර්ධන ඉඩමක් දුන්න නිසා ඔබතුමන්ලාත් ෂැංග්‍රි-ලා එකට ඉඩමක් වික්කා. මහින්ද රාජපක්ෂ

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ෂැංග්‍රි-ලා එකට ඉඩම දුන්නා, Port City එකට ඉඩම දුන්නා, ඩෝල් සමාගමට ඉඩම දුන්නා කියලා, එහෙම නම් අපිත් ඉඩම් විකුණන්න එපායැ. පුළුවන් නම් මේ ආණ්ඩුව විදේශිකයෙකුට විකුණපු එක දේපළක්, පෞද්ගලික අංශයට විකුණපු එක රාජ්‍ය දේපළක් පෙන්වන්න කියලා මම වග කීමෙන් ප්‍රශ්න කරනවා. ඔබතුමන්ලා බොරුවට ජනතාව රවට්ටලා කුලප්පු කරනවා. ඔබතුමන්ලා දන්නවා, අපි ඒවා විකුණන්නේ නැහැ කියලා. ඔබතුමන්ලා දන්නවා මේ ආණ්ඩුව ඒවා විකුණන්න දෙන්නේ නැහැ, මේ ආණ්ඩුව කොළේ වහලා ගහන්නේ නැහැ කියලා. ඒක ඔබතුමන්ලා දන්නවා. මේ ආණ්ඩුව කෑ ගහන මිනිස්සු තුවක්කුවෙන් පාවිච්චි කරලා මරන්නේ නැහැ කියලා ඔබතුමන්ලා දන්නවා. ඔබතුමන්ලා දන්නවා මේ ආණ්ඩුව මාධ්‍යවේදීන් මරන්නේ නැහැ, මාධ්‍ය ආයතන ගිනි තියන්නේ නැහැ කියලා. ඒ නිසා ඔබතුමන්ලා ගිහිල්ලා, බොරු කියමින් භය නැතුව මේ රටේ ජනතාව කුලප්පු කරනවා. ඔබතුමන්ලා දැන දැනම බොරු කියලා මේ රටේ ජනතාව කුලප්පු කරනවා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතේ පැහැදිලිව තිබෙනවා, [බාධා කිරීමක්]- මෙම පනත් කෙටුම්පත මඟින් මහජන බැංකුව විකුණනවා, පෞද්ගලික ආයතනයකට දෙනවා කිය-කියා මේ ගොල්ලෝ කියනවා. මහජන බැංකුවේ කොටස් ගන්න පුළුවන් සමුපකාර සමිතියකට හෝ රජයට පමණයි කියලා මේ පනතේ 13වැනි වගන්තියේ පැහැදිලිව තිබෙනවා. 13වැනි වගන්තියට අපි අත තියලා නැතිව තියෙද්දී ඔබතුමන්ලා කොහොමද කියන්නේ බැංකුව පෞද්ගලීකරණය කරනවා කියලා. මේ ගැන දන්නේ නැතිකම නොවෙයි. අහිංසක මිනිසුන් ගොනාට අන්දන්න, බූරුවාට අන්දන්න, ඒ මිනිස්සු මෝඩයන් කියලා හිතාගෙන කටයුතු කරනවා මිස, ඔබතුමන්ලා දන්නේ නැතිව නොවෙයි මේ කටයුතු කරන්නේ.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

Sir, I rise to a point of Order. මේ ගරු සභාවේ ගණපූරණය නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ seat එකට එන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ඔබතුමන්ලා දවසින් දවස seat වෙනස් කරනවා. ආරක්ෂක ලේකම්ලා වෙනස් කරනවා වාගේ දවසින් දවස seat වෙනස් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාවේ ගණපූරණය නැහැ. පාළු ගෙවල්වල වළං බිඳිනවා වාගේ.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present-*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, please continue.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන බැංකුව පෞද්ගලීකරණය කරනවා නම්, ඒකට විරුද්ධව සටන් කරන්න ඕනෑ නම්, විපක්ෂයෙන් ගණපූරණය ඉල්ලන්නේ නැහැ. ජනතාව ඇන්දුවා වාගේ මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීතුමන්ලාත් අන්දන්නයි හදන්නේ. ගණපූරණය නැහැ කියලා මූලාසනාරූඪව සිටින ඔබතුමාත් අන්දවන්න හදනවා. මේ ගොල්ලන්ට මේ පනත ගැන කථා කරන්න සැබෑ ඕනෑකමක් තිබුණා නම්, මහජන බැංකුව පෞද්ගලීකරණය කරනවාය කියලා ඇත්තටම ඒක බේරා ගන්න දැඟලනවා නම්, ඒ ගැන විවාදයට යන්නේ නැතිව ගණපූරණය නැහැ කියලා විවාදය මඟදී නවත්වා ගන්න හදන්නේ ඇයි දෙයියනේ! මේ රටේ ජනතාවත් මේක දැන ගන්න ඕනෑ. ඔන්න විපක්ෂයේ හැටි!. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වාද විවාද කරලා මේ පනත වෙනස් කර ගන්න ඕනෑ නම්, ඒ සඳහා සත්‍ය වුවමනාවක් තිබෙනවා නම්, ගණපූරණය නැහැ කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු ටික දොරෙන් එළියට දුවන්න ඕනෑ නැහැනේ. දොරෙන් එළියට දිව්වේ ඇයි? මේ පනත ගැන සාකච්ඡා කරලා පනත [බාධා කිරීමක්] වෙනස් කර ගැනීමේ සැබෑ වුවමනාවක් තිබෙනවා නම් ඔබතුමන්ලා ගණපූරණය නැහැ කියලා පාර්ලිමේන්තු දොරෙන් එළියට දුවන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

එහෙම ඕනෑකමත් තිබෙනවා නම්, එළියේ ඉන්න අයත් එක්කගෙන ඇවිත් විවාදයට එකතු කර ගන්නවා; ගණපූරණය හදා ගන්නවා. පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරු ටික හැසිරෙන්නේ කොහොමද කියන එක රටේ ජනතාව දැන ගන්න ඕනෑ. මේ රටේ ජනතාව ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට එව්වේ වැදගත් විවාදයක් කරන වේලාවේ ගණපූරණය නැහැ කියලා විවාදය කඩාකප්පල් කරන්න නොවෙයි, ඒ ජනතාවගේ අදහස් මේ විවාදයට එකතු කරලා, වෙනසක් කරන්න තිබෙනවා නම් වෙනසක් කර ගන්නයි. නමුත් ඔබතුමන්ලා කරන්නේ ඒකද? අපි හොඳ දෙයක් කරද්දී, මහජන බැංකුවත් ලංකා බැංකුව වාගේ ශක්තිමත් කරන්න යද්දී, මහජන බැංකුව NSB එක වාගේ ශක්තිමත් කරන්න යද්දී, අපි විවාදයේදී ගෙනෙන කරුණු, මේ පනතට ගෙනෙන සංශෝධන විවේචනය කරලා, වාද කරලා අඩු පාඩු පෙන්වලා අප නිවැරදි මාර්ගයට යවන්න ඔබතුමන්ලාට තිබුණා. ඒකයි විපක්ෂයට තිබෙන කාර්ය භාරය. විපක්ෂය බොර දියේ මාළු අල්ලනවා වාගේ හැම තිස්සේම "ගණපූරණය නැහැ" කියලා ඉන්න ටික දෙනාත් පැනලා දුවනවා; ඉන්න ටික දෙනාත් පාර්ලිමේන්තුවෙන් පැනලා දුවනවා. ගණපූරණය නැත්නම් ඒ කට්ටිය අරගෙන එන්න එපායැ. මෙතැන කෑගහලා පැනලා දුවන්න ඕනෑද? ඒ නිසා වගකීමෙන් කියනවා, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. [බාධා කිරීම]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා නේ කථානායකතුමා වෙන්න යන්නේ. ගණපූරණය නැහැ කියලා එළියට දුවලා කථානායකතුමා වෙන්නත් හදනවා. කරුණාකරලා අපට සවන් දීලා මෙහි අඩු පාඩු තිබෙනවා නම්, අපට කියලා දෙන්න. අපි ඒ අඩු පාඩු හදනවා. [බාධා කිරීමක්] වාගේ අපි වෙඩි තියන කට්ටිය නොවෙයි නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. අපි මේ වන විට "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" යටතේ දැවැන්ත පෙරළියක් කරනවා. අපි එමඟින් පුද්ගලයන් 22,957කට සහන පොලියට මුදල් දීලා තිබෙනවා. සමහර ණය වර්ගවල රුපියල් ලක්ෂයක් දුන්නාම දවසකට පොලිය රුපියල් 10යි. රුපියල් 10යි පොලිය! අපි අහිංසක දුප්පත් මිනිසුන්ගේ ව්‍යාපාර නඟා සිටුවීමට, අධ්‍යාපන කටයුතුවලට, දුප්පත් මිනිසුන්ගේ ගෙවල් හදන්න, රුපියල් 10 පොලියට ණය දෙනවා. දවසට රුපියල් 10 පොලියට ලක්ෂයක මුදලක් දීලා තිබෙනවා. අන්න ඒවා කඩා කප්පල් කරන්නයි මේ හදන්නේ. මේ සඳහා ලංකා බැංකුව දායක වෙලා තිබෙනවා.

මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලංකා බැංකුව දායක වෙලා තිබෙනවා, ණය 11,000ක් දෙන්න. නමුත් මහජන බැංකුවට ණය දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ 1,402යි. ලංකා බැංකුව Enterprise Sri Lanka, ගම් පෙරළිය වැඩසටහන සඳහා 11,000කට සහන පොලියට ණය දෙනකොට, මහජන බැංකුව ණය දුන්නේ 1,400කටයි. එහෙම නම් මහජන බැංකුවත්, ලංකා බැංකුව එක්ක තරග කරන්න පුළුවන් ආයතනයක් බවට පත් කරන්න තමයි අපි මේ ප්‍රාග්ධනය වැඩි කරන්නේ. එක බිලියනයයි ප්‍රාග්ධනය හැටියට මහජන බැංකුවට තිබෙන්නේ. එක බිලියනයයි තිබෙන්නේ! ඒක බිලියන 50 දක්වා වැඩි කරන්න කොටස් දෙන්නේ නැතිව පාලනය කරන වැඩ පිළිවෙළක් තමයි හදලා තිබෙන්නේ. කරුණාකරලා මේ වැදගත් විවාදයේදී ගණපූරණය නැහැ කියලා පස්සා දොරෙන් දුවන්නේ නැතිව, අපි එක්ක එකතුවෙලා විවාද කරලා අවශ්‍ය උපදෙස් අපට ලබා දෙන්න කියලා අපි ඉල්ලනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. ඊළඟට, ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

ඉරාන් වික්‍රමරත්න ඇමතිතුමනි, දැන් ඔබතුමා සහ අජිත් මාන්නප්පෙරුම මැතිතුමා කිව්වා, Act එකේ Section 13 එකේ "(1) No shareholder of the Bank shall sell his shares to any person other than a co-operative society or the Secretary to the Treasury in his official capacity" කියලා තිබෙන බව. එහෙම 13 වන වගන්තියේ තිබෙනවා. මෙහි "No shareholder of the Bank" කියන එකෙන්, "shareholder" කියන වචනයේ නිර්වචනය ඔබතුමන්ලා සංශෝධනයෙන් අයින් කරනවා. "Shareholder" කියන එකේ නිර්වචනය තිබෙන්නේ පනතේ 12වන වගන්තියේ නේ. එතකොට "shareholder" කියන එකේ නිර්වචනය අයින් කළාට පසුව 13වන වගන්තියේ තේරුම මොකක්ද? Then, who is the "shareholder"? මෙකේ තිබෙනවා, "No shareholder of the Bank" කියලා. Now, who is the "shareholder" after this Amendment? අන්න ඒක පැහැදිලි කරන්න කියලා ගරු ඉරාන් වික්‍රමරත්න ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම ඒක පරීක්ෂා කර බලා පැහැදිලි කරන්නම්.

[අ.භා.2.47]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි අද විවාදය පැවැත්වෙන්නේ. පක්ෂ නායක රැස්වීමේදීත් එකඟ වූ පරිදි අද විවාදයෙන් අනතුරුව ඡන්දය විමසන්නේ නැතිව ඊළඟ පාර්ලිමේන්තු දවසට මේ විවාදය ගෙනයන්න කියන ඉල්ලීම ප්‍රථමයෙන්ම කරනවා. මොකද, මේක හදිසියේ, කඩිමුඩියේ ආපු කාරණයක් නිසා මීට වැඩිය අධ්‍යයනය කළ යුතුව තිබෙනවා.

ඉරාන් වික්‍රමරත්න මැතිතුමාට උත්තරයක් දී ගන්න බැරි වුණා, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් අහපු ප්‍රශ්නයට. මේ අමාත්‍යාංශය භාර රාජ්‍ය අමාත්‍යවරයාටත් අසන ප්‍රශ්නවලට පැහැදිලිව පිළිතුරක් දෙන්න බැරි නම්, ඔබතුමන්ලාට වැටහෙනවා ඇති මේ පනත් කෙටුම්පත පිළිබඳව මීට වැඩිය කල් අරගෙන අධ්‍යයනය කරලා විවාද කරන්න ඕනෑය කියන කාරණය. එය එසේ සිදු විය යුතුයි කියලා තමයි අපි විශ්වාස කරන්නේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අපි ඒක තීරණය කරලා තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත පිළිබඳව ඡන්දය විමසන්න අපි හදිස්සි කරන්නේ නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පක්ෂ නායක රැස්වීමේදී තීන්දුව ගත්තේ ලබන මස 04වැනි දා මේ පනත පිළිබඳව ඡන්දය විමසන්නයි. නමුත්, එය සටහන් වෙලා තිබෙන්නේ 03වැනි දා කියලා. ඒක වෙනස් කරන්න කියන ඉල්ලීමත් මා මේ අවස්ථාවේ කරන්න කැමතියි. 04වැනි දා හෝ ඊට පසු දිනක මේ පනත් කෙටුම්පත පිළිබඳ ඡන්ද විමසීම කරන්න පුළුවන් නම් හොඳයි.

ඒ වාගේම, මේ සංශෝධන සම්බන්ධව පුළුල්ව කරුණු ඉදිරිපත් වුණු නිසා මම ඒ වගන්ති පිළිබඳව කථා කරන්න යන්නේ නැහැ. නමුත් මම කියන්න කැමතියි, මේ බැංකු සංශෝධන පනත් කෙටුම්පත හරහා ප්‍රාග්ධනය එකතු කිරීමට අපේ විරුද්ධත්වයක් නැති බව. බැංකුවක ප්‍රාග්ධනය වැඩි කරන්න ඕනෑ. කාලයක් තිස්සේ ඒක වැඩි කිරීමක් කරලා නැති නිසා වැඩි කළාට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ කාරණයේදී අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්නේ, රජයේ ප්‍රතිපත්ති පිළිබඳව අපට තිබෙන ගැටලු නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන බැංකුව සහ ලංකා බැංකුව සතු ගිණුම්වලට තමයි සාමාන්‍යයෙන් රජයේ ගිණුම් පවත්වාගෙන යෑමේ අයිතිය ලබා දීලා තිබෙන්නේ. රාජ්‍ය ආයතන සියල්ලම ගනු දෙනු කරන්න ඕනෑ රාජ්‍ය බැංකුත් එක්කයි. නමුත්

[ගරු මහින්ද අමරවීර මහතා]

ඒක වෙනස් කරලා, කැමති බැංකුවක් එක්ක ගනුදෙනු කරන්න කියන යෝජනාව කැබිනට් මණ්ඩලයට අවස්ථා ගණනාවකදී ඉදිරිපත් වුණා. ඒ වෙලාවේ අපි කැබිනට් මණ්ඩලයේ සිටියා. ජනාධිපතිතුමාත්, අපිත් දැඩි ලෙස විරුද්ධවීම මත තමයි ඒ වෙලාවේ මේ බැංකුවල ගිණුම් ඉවත් කර ගැනීමට තිබුණු අවස්ථාව අහිමි කළේ. අපි ඇයි එහෙම යෝජනාවක් ගෙනාවේ? අපි ඒ යෝජනාව ගේන්න ප්‍රධාන හේතුව වුණේ, රජයේ ගිණුම් මේ බැංකු දෙකෙන් ඉවත් කර ගත්තාට පස්සේ අනිවාර්යෙන්ම මේ බැංකු බංකොලොත් වන මට්ටමකට එන නිසායි.

ඊට පස්සේ කරන්න තිබුණු දේ තමයි, මේ බැංකු ටික පෞද්ගලීකරණය කරන්න කටයුතු කිරීම. ඒ නිසා තමයි අපි ඒ කටයුත්තට විරුද්ධ වුණේ. එක්සත් ජාතික පක්ෂය නිරන්තරයෙන්ම බලන්නේ රාජ්‍ය අංශය අක්‍රිය කරලා පෞද්ගලික අංශය ශක්තිමත් කරන්නයි. නමුත්, අද පවතින ක්‍රියාවලිය අනුව පෙනෙන්න තිබෙන දේ තමයි, රාජ්‍ය අංශය ශක්තිමත් නොවීමත්, පෞද්ගලික අංශය ශක්තිමත් වන්න ඉඩ නොදීමත්. බැංකුවලින් ණය දෙන ආකාරය දිහා බැලුවාම එය අපට පැහැදිලියි. බැංකුවලින් ණය දෙන පොලිය බැලුවාම, මේ පොලියට ණය අරගෙන කිසිම ආයෝජකයෙකුට ආයෝජනයක් කරලා ලාභයක් ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමයි අපේ ශ්‍රී ලාංකිකයන් බොහෝ පිරිසක් තමන්ගේ ආයෝජන වෙනත් රටවලට ගෙන ගොස් තිබෙන්නේ.

දැන් බලන්න, මේ ආණ්ඩුව කාලයේ රැකියා දස ලක්ෂයක් නිර්මාණය කරනවා කිව්වා. නමුත් රැකියා දස ලක්ෂයක් තියා රැකියා ලක්ෂ දෙකක්වත් නිර්මාණය කර ගන්න පුළුවන් වුණාය කියලා මම හිතන්නේ නැහැ. රජයේ ආයතනවල පුරප්පාඩු ටිකක් පිරවූ බව ඇත්ත. නමුත්, පෞද්ගලික අංශයේ සිද්ධ වුණේ මොකක්ද? පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු වූ අයටත් රැකියා අහිමි වුණා; ඒ ආයතන වැහිලා ගියා; ඒ ආයතන ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණේ නැහැ; මූල්‍ය ශක්තිය අඩු වුණා. ඒ වාගේම ඒ නීති - රීති පිළිබඳව ප්‍රශ්න ඇති වුණා; වැඩ වර්ජන ඇති වුණා. ඒ කිසි දේකට මුහුණ දෙන්න බැරි වූ නිසා අද පෞද්ගලික අංශය සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය වෙමින් යන බව අපට ඉතාම පැහැදිලිව සඳහන් කරන්න පුළුවන්.

අද අපේ රටේ සිටින ප්‍රධාන ආයෝජකයෝ, ප්‍රධාන කර්මාන්තකරුවෝ වෙනත් රටවලට තමන්ගේ කර්මාන්ත ගෙන යන බව අපට පැහැදිලිව සඳහන් කරන්න පුළුවන්. ඒ සඳහා උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. එවැනි දේ නිසා රටේ අනාගතය සම්බන්ධයෙන් බරපතළ අර්බුදයකට අපි මුහුණදෙනවා. විශේෂයෙන් රැකියා අවස්ථා පිළිබඳවත්, අපේ ආර්ථික ශක්තිය පිළිබඳවත් අනාගතයේදී අපට බරපතළ අභියෝගයකට මුහුණ දෙන්න සිද්ධ වනවාය කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

මේ වනකොට තවත් කාර්යයක් සිද්ධවනවා. ඒ තමයි, මහජන බැංකුවේත්, ලංකා බැංකුවේත්, ඒ වාගේම රාජ්‍ය ආයතනවලත් දේශපාලන පළිගැනීම් මුවාවෙන් උසස්වීම් ලබා දෙන්න යෑම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන බැංකුවවත්, ලංකා බැංකුවවත් දේශපාලනය සම්බන්ධ කරගෙන නිලධාරින්ට හිරිහැර කරන ආයතන නොවෙයි. ඒවා අවුරුදු ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වුණේ ඒ ආකාරයෙන්. ඒ ආයතනවල මාරුවීම්වලට හෝ උසස්වීම්වලට කිසිදු ආකාරයෙන් දේශපාලන බලපෑමක් පසුගිය ආණ්ඩුව කාලයේදී සිද්ධවුණේත් නැහැ; මේ ආණ්ඩුව කාලයේදීත් සිද්ධවන එකක් නැහැ. ඒ කටයුතු ස්වාධීනව සිද්ධවෙනවා. මාරුවීම් ක්‍රියා පටිපාටියත් ඒ ආකාරයෙන්ම තමයි තිබෙන්නේ; උසස් වීම් ක්‍රියා පටිපාටියත් පිළිගත් ක්‍රමවේදයකටයි තිබෙන්නේ. දේශපාලන හේතු මත ඒවා සිදුවෙන්නේ නැහැ. නමුත්, දැන් මේ ආණ්ඩුව කරන ඉතාම නරක කාර්යය තමයි, මහජන බැංකුවේත්, ලංකා බැංකුවේත් අයට දේශපාලන පළිගැනීම් සිදුවුණාය කියලා උසස්වීම් දෙන්න යෑම. ඒ වාගේම විවිධ වරප්‍රසාදත් ඒ අය වෙනුවෙන් දෙන්න යනවා. ඒ තුළින් බැංකු පද්ධතියටම විශාල බලපෑමක් ඇතිවනවා වාගේම මහජන බැංකුවේ කඩා වැටීම ඒකෙන් ආරම්භ වනවාය කියන එකත් මම ඉතාම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. අද රජයේ අනෙකුත් ආයතනත් එක්ක බැලුවාම මහජන බැංකුව, ලංකා බැංකුව සහ රජයේ අනෙක් බැංකු සාමාන්‍යයෙන් පෞද්ගලික අංශයත් එක්ක තරගකාරීව කටයුතු කරනවා. ඒ සේවකයන් බොහෝ මහන්සි වෙලා ඒ කටයුතු කරනවා. හැබැයි, මේ විධියට අනවශ්‍ය ආකාරයෙන් දේශපාලන වශයෙන් වරප්‍රසාද, උසස්වීම් නැත්නම් වෙනත් දේවල් දෙන්න ගියාම මොකක්ද වෙන්නේ? අනික් සේවකයන් අධෛර්ය වනවා. ඒ අය වැඩ කරන්නේ නැති වුණොත් මේ බැංකු කඩා වැටීම අනිවාර්යයි. එම නිසා ඒ වගකීම මේ රජයට භාර ගන්න වෙනවාය කියන එකත් මම සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම ණය ලබා දීමේදී අපේ රටේ ප්‍රධාන බැංකු දෙකක් වන, මහජන බැංකුවටත්, ලංකා බැංකුවටත් කාලාන්තරයක් තිස්සේ ප්‍රධාන අභියෝගයක් තිබෙනවා. මේ රජය යටතේ පමණක් නොවෙයි, පසුගිය රජයන් පැවැති කාල පරිච්ඡේදවලත් මේක සිදුවුණා. මේ තත්ත්වය යටතේ පොඩි මනුස්සයෙකුට ණයක් ගන්න ඉතාම අපහසු වෙනවා; සාමාන්‍ය ආයෝජකයෙකුට ණයක් ගන්න ගියාම ඉතාම අපහසු වෙනවා. මේ බැංකුවලින් ණයක් ගන්න ගියාම බැඳුම්කර විධියට -ඇප විධියට- වත්කම් විශාල ප්‍රමාණයක් ඉල්ලනවා. මේ නිසා සාමාන්‍ය මනුස්සයෙක් ණයක් ගන්න ගියාම ඒ මනුස්සයාට ණය එපා වෙනවා. නමුත්, තෝරා ගත් කණ්ඩායම්වලට -විශේෂයෙන්ම දේශපාලන වශයෙන් යම් හයියක් තිබෙන, වුවමනාවක් තිබෙන, මැදිහත්වීමක් තිබෙන කණ්ඩායම්වලට- මහා පරිමාණ වශයෙන් ණය ලබා දෙන්න කියලා රජය පැත්තෙන් බලපෑම් එල්ලවනවා. ඒ බලපෑම් මත ලබා දුන් ණය, තවමත් අය කර ගන්න බැරි වෙලා තිබෙනවා. මහජන බැංකුවේ අසාධු ලේඛනය -අය නොවෙච්ච ණය ලේඛනය - බලන්න. ලංකා බැංකුවේ අසාධු ලේඛනය බලන්න. ඒ ලේඛනවල කාගේ නම්ද තිබෙන්නේ කියලා බලන්න. ඒ ණය අය කර ගැනීම සම්බන්ධව ගත්ත ක්‍රියා මාර්ග බලන්න. ඒ ක්‍රියා මාර්ග ගැනීමේදීත් රජය ඒවාට යම් යම් බලපෑම් කරනවා. ඒක හැම දාම ඇති වන තත්ත්වයක්. ඒක ඉතාම නරක තත්ත්වයක්. ඒ නිසා මේ බැංකු ටික කඩා වැටීමේ අවදානමක් ඒ හරහා තිබෙනවා කියන එකත් අපි පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. මොකද, මේ බැංකු දෙකෙන් තමයි රාජ්‍ය ආයතන බොහොමයක් නඩත්තු වෙන්නේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට විශාල ණය මුදලක් දෙන්නේ මේ බැංකුවලින්. ඒ වාගේම ලංකා විදුලිබල මණ්ඩලයට මුදල් අවශ්‍ය වුණාම මේ බැංකුවලින් තමයි ණය ගන්නේ. මෙම බැංකු රජයේ බලපෑම් මත SriLankan Airlines, Mihin Lanka වාගේ සමහර ආයතනවලට ණය දීලා තිබෙනවා. ඒ ණය අය කර ගන්න බැරිව අද විශාල අර්බුදයකට පත් වෙලා තිබෙනවා. ඒ බැංකුත් අර්බුදයකට පත් වෙලා තිබෙනවා, SriLankan Airlines ආයතනයත් අර්බුදයකට පත් වෙලා තිබෙනවාය කියන එක අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. මේවා පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා, රජය සතු මේ බැංකු ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළක් දියත් වෙන්න ඕනෑ කියන එක තමයි මම සඳහන් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට තව කණ්ඩායම් ඉන්නවා. ඒ අය ආයෝජකයෝ විධියට ව්‍යාජව පෙනී ඉන්න කණ්ඩායම්. ඒ අය ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරනවා. ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරලා, රජයේම ඉඩම්, රජයේම දේපළ

සංවර්ධනය කරන්න ගන්නවා. ඒ ගත් රජයේ දේපළම ඇපයට තියලා බැංකුවෙන් ණය ගන්නවා. ඒ අය ශත පහක්වත් ආයෝජනය කරන්නේ නැහැ. එහෙම ණය අරගෙන, තිබෙන සම්පත් ටිකත් අරගෙන රටින් ගිය අය ඉන්නවා. ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාවට වුණේ ඒකයි. බැංකුවෙන් ණය අරගෙන තමයි ඒක ගත්තේ. අරගෙන අන්තිමට මොකක්ද කළේ? ඒකේ තිබුණු ගස් ටිකත් කපා ගත්තා; යකඩ ටිකත් ගත්තා; ඒකේ තිබුණු සම්පත් ටිකත් අරගෙන ඒ මිනිසුන් රටින් ගියා. අද ඒ කඩදාසි කර්මාන්තශාලාවත් නැහැ; ඒ ඉඩමේ අයිතිය තිබෙන්නේ බැංකුවට; බැංකුවටත් පාඩුයි; කර්මාන්තශාලාවෙන් වැඩක් වුණෙත් නැහැ. රජයටත් විශාල පාඩුවක් වීම තමයි සිද්ධ වුණේ. ඒ වාගේ දේවල් පිළිබඳව රජය ඉතා විමසිලිමත්ව බලන්න කියන එක තමයි අපට සඳහන් කරන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි රට ගැන හිතලා, රට ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළට දායක වෙන්න රජයට වුවමනාවක් නැතිවීම. කොහොමද ජාතික නිෂ්පාදනය වැඩි කරන්නේ, කොහොමද ආර්ථිකය දියුණු කරන්නේ, කොහොමද ආර්ථික වර්ධන වේගය වැඩි කරන්නේ කියලා මේ රජයට පැහැදිලි වැඩ පිළිවෙළක් සහ පැහැදිලි දර්ශනයක් නැහැ. ඒ පිළිබඳව කල්පනා කරන්නේ නැතුව, "එදාවේල ටුවර්ස්" වැඩසටහනක් තමයි ගෙන යන්නේ; දවස ගෙවා ගන්න වැඩ පිළිවෙළක් තමයි ගෙන යන්නේ.

ඉදිරියේදී මැතිවරණයක් තිබෙනවා. ඒ මැතිවරණය වෙලාවේ කටයුතු කරන ආකාරය ඔබතුමාටත් පැහැදිලිව පෙනෙනවා ඇති. මැතිවරණය ඉලක්ක කරලා කටයුතු කරනවා මිසක්, ආර්ථික සංවර්ධනයක් ඇති වන විධියේ, රට දියුණු වන විධියේ වැඩ පිළිවෙළකට යන්නේ නැහැ කියන එක පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. ඒ නිසා තමයි දැන් ලක්ෂ 6කට අලුතින් සමෘද්ධි සහනාධාරය දුන්නේ. මම කැමැතියි ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගෙන් අහන්න, මේ වාගේ සහනාධාර දීලා දියුණු වෙච්ච රටක් තිබෙනවාද කියලා. ඔබතුමා ආර්ථිකය පිළිබඳව දන්නවා, වැටහීමක් තිබෙනවා. මේ දේවල් දීමෙන් රටක් දියුණු කරන්න පුළුවන්ද? 1994දී තමයි සමෘද්ධි සහනාධාරය ලබා දීම ආරම්භ කළේ. එදා ලක්ෂ 14කට දුන්නා. දැන් ලක්ෂ 6කට සමෘද්ධි සහනාධාරය ආපහු දෙනකොට ආපස්සට හැරිලා බැලුවාම දුප්පත්කම තව වැඩි වෙලා කියන එක තමයි පෙනෙන්නේ. තව ලක්ෂ 2කට දෙන්න ඕනෑ ලු. ඒක මේ අවුරුද්දේ විතරක් දීලා හරියන්නේ නැහැ, ලබන අවුරුද්දෙත් දෙන්න ඕනෑ, ඊළඟ අවුරුද්දෙත් දෙන්න ඕනෑ. දිගටම සමෘද්ධි සහනාධාරය දීලා රටක් ගොඩනඟන්න පුළුවන්ද? ආධාර දෙන්න ඕනෑ කණ්ඩායම් ඉන්න බව ඇත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් දියුණු කරන්න නම් පැහැදිලි දැක්මක් සහ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. මේ වනකොට ප්‍රචාරක වියදම්වලට රුපියල් මිලියන 3,000කට අධික මුදලක් රජය වියදම් කරනවා. මේ වාගේ නාස්තිකාර වියදම් නතර කරලා, ඵලදායි නොවන දේවල්වලට කරන වියදම් නතර කරලා, රට දියුණු කරන්න පුළුවන්, ආර්ථිකය දියුණු කරන්න පුළුවන්, නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර දෙන්න කියන ඉල්ලීම කරමින්, ඒ සඳහා රජය කටයුතු කරයි කියන විශ්වාසය පළ කරමින්, මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු, සහනාධාර දීමෙන් පමණක් රටක් දියුණු කරන්න බැහැ කියන කාරණයට මම එකඟ වනවා. මෙතැන වෙලා තිබෙන්නේ මේකයි. ලැබෙන්න ඕනෑ මිනිස්සු ඉන්නවා. නමුත් ඒ අයට ලැබුණේ නැහැ. ඒ අය එකතු කරන එකයි කරන්න ඕනෑ. නොලැබිය යුතු විශාල ප්‍රමාණයකුත් ඔය ලැයිස්තුවේ ඉන්නවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ඒ අය අයින් කරන්න ඕනෑ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඒ අය අයින් කරන්න ඕනෑ. ඒක අපි අනාගතයේ දී කරනවා.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 13 (1) කොටස ඉංග්‍රීසියෙන් සඳහන් කළා. මම ඒක සිංහලෙන් කියවන්නම්. 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 13 (1) හි සඳහන් වෙනවා, "සමුපකාර සමිතියක් හෝ නිල තත්ත්වය අනුව භාණ්ඩාගාරයේ ලේකම් නොවන තැනැත්තෙකුට බැංකුවේ කිසිම කොටස්කරුවෙකු විසින් තම කොටස් නොවිකිණිය යුතු ය" කියලා. මෙහි සම්පූර්ණයෙන්ම පැහැදිලියි, කොටස් වෙන කාටවත් විකුණන්නට බැහැ කියන කාරණය. නැවතත් මා එය කියවන්නම්. "සමුපකාර සමිතියක් හෝ නිල තත්ත්වය අනුව භාණ්ඩාගාරයේ ලේකම් නොවන තැනැත්තෙකුට බැංකුවේ කිසිම කොටස්කරුවෙකු විසින් තම කොටස් නොවිකිණිය යුතුය." මම ඊට වැඩිය කියවන්න ඕනෑ නැහැ, ඒක තමයි පනතේ ලියලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි. ඊළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා.3.00]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அபிவிருத்தி உபாயமுறைகள் மற்றும் சர்வதேச வர்த்தக பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Development Strategies and International Trade)

බොහොම ස්තුතියි. මගේ මිත්‍ර ඔබතුමා මූලසුන දරන වෙලාවේ කථා කරන්නට ලැබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම මහින්ද අමරවීර මැතිතුමාට අපේ ඉරාන් රාජ්‍ය ඇමතිතුමා ලබා දුන් පිළිතුරට තවත් යමක් එකතු කරලා මම කියන්නම්. එතුමා සමෘද්ධිය ගැන කිව්වා. 1994 දී ලක්ෂ 14කට සමෘද්ධිය ලබා දුන්නා කියලා එතුමා බොහොම ආඩම්බරයෙන් කිව්වා. හැබැයි, 1994 ඉඳලා අවුරුදු විස්සක් ගිහිල්ලා, 2014 වෙනකොටත් ඒ ලක්ෂ 14 ඒ තත්ත්වයේම හිටියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අවුරුදු විස්සෙන් අවුරුදු 18ක් රට පාලනය කළේ එතුමන්ලායි. අවුරුදු 18ක් එතුමන්ලා රට පාලනය කළ කාලයේ සමෘද්ධි ව්‍යාපාරයේ හිටපු ලක්ෂ 14න් කවුරුවත් එතැනින් උඩට ආවේ නැහැ; ඇති-හැකි මිනිහෙක් වුණේ නැහැ. ඒ නැති-බැරි මට්ටමේම ඔවුන් රඳවාගෙන, ඔවුන් දේශපාලන වහලුන් බවට පාවිච්චි කරපු කාලයක් තිබුණු බව අපට මතකයි. දේශපාලනඥයන් කියන කියන පදයට නටන, දේශපාලන වහලුන් බවට තමයි ඒ අය පාවිච්චි කළේ. හැබැයි, ඒ හා සමාන සුදුසුකම තිබුණත් වෙනත් හේතු මත හෝ දේශපාලන හේතු මත සමෘද්ධි ප්‍රතිලාභය නොලැබුණු පිරිසක් ඒ අතර හිටියා. අන්න ඒ අයට සාධාරණය

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ඉෂ්ට කරන්න තමයි අපි ඊයේ-පෙරේදා කටයුතු කළේ. ඒ නිසා, අපි කළේ සමාජ සාධාරණය ඉෂ්ට කිරීමක් කියලා අපි විශ්වාස කරනවා. සමාන ප්‍රතිලාභ, එහෙම නැත්නම් සමාන වත්කම් හිමි එකම පන්තියේ පිරිසක් අතර සමෘද්ධිය ලබන කොටසක් හිටියා, සමෘද්ධිය නොලබන කොටසක් හිටියා. ඒ නිසා අපි කළේ, ඒ අයට සාධාරණය ඉෂ්ට කිරීමක්.

ගරු මහින්ද අමරවීර මැතිතුමනි, අවුරුදු 20ක් ගතවනකොට 2014දීත් ඔබතුමන්ලා ඒ ආණ්ඩුවේ සිටියා. 2015 වෙනකොටත් අවුරුදු 21ක් ඔබතුමන්ලා ආණ්ඩුවේ හිටියා. ඒකෙන් අවුරුදු 19ක්ම ඔබතුමන්ලාගේ ආණ්ඩුව. හැබැයි, සමෘද්ධිය ලබා ගත් එම ලක්ෂ 14න් ඇති-හැකි පවුලක් බවට පත් වෙලා එළියට ගියේ කවුද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. අපි කළේ සමාජ සාධාරණය ඉෂ්ට කිරීමක්. අපේ රජයක් යටතේ එය කිරීමට ලැබීම ගැන අපි සතුටු වෙනවා. විශේෂයෙන් "දවස් 52 කුමන්ත්‍රණයෙන්" පස්සේ. ඔබතුමන්ලා යහ පාලන ආණ්ඩුවේ ඉන්නකල් මේ සමෘද්ධි ප්‍රතිලාභය සාධාරණීකරණය කරන්න අපට අවස්ථාව උදාකර දුන්නේ නැහැ. ඔබතුමන්ලා පසුගිය අවුරුද්දේ අග වෙනකල් යහ පාලන ආණ්ඩුවේ හිටියා. එතෙක් ඔබතුමන්ලා අපට අවස්ථාව දුන්නේ නැහැ, සමෘද්ධි ප්‍රතිලාභය ඒ අහිංසක මිනිසුන්ට දෙන්න. ඒ කාලයේ සමෘද්ධි අමාත්‍යාංශය භාරව හිටිය එස්.බී. දිසානායක මහත්මයලා ඒකට ඉඩ දුන්නේ නැහැ. ඔබතුමන්ලා ඒ කැබිනෙට්ටුවේ හිටියා. ඒත් ඉඩ දුන්නේ නැහැ. හැබැයි, ඒ දවස් 52න් පස්සේ මේ රටේ දුප්පත් මිනිසුන්ගේ වාසනාවට එක්සත් ජාතික පක්ෂයට බහුතරයක් තිබෙන ආණ්ඩුවක් හදලා අපට පුළුවන් වුණා ඒ සාධාරණය ඉෂ්ට කරන්න. ඒ නිසා මම ඒ ගැන සතුටු වෙනවා.

ආර්ථිකය ගැන කථා කරන මේ අවස්ථාවේ මම මේ කාරණය කියන්නට ඕනෑ. අද පුවත් පතක මුල පිටුවේ තිබෙනවා මම දැක්කා, "ඇමෙරිකන් ඩොලරයට සාපේක්ෂව තවත් සියයට තුනකින් රුපියල ශක්තිමත් වුණා" කියලා. වෙනදාට රුපියල පොඩ්ඩක් පහළට යනකොට; රුපියල බාල්දු වෙනකොට ලොකුවට පත්තරවල දානවා. ඒ වාගේම අපේ දුරකථනයට alert එකක් එනවා; ඒකට විශාල ප්‍රචාරයක් දෙනවා. හැබැයි, රුපියල ශක්තිමත් වෙනකොට ඒ ගැන කථා කරන්න කවුරුවත් නැහැ. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා, මේ ආර්ථිකය හරි දිශානතියට යොමු කරන්න අද අපට පුළුවන් වෙලා තිබෙනවාය කියන කාරණය.

ඒ වාගේම මේ පනත් කෙටුම්පත තුළින් උත්සාහ කරන්නේ, මහජන බැංකුව තවත් ශක්තිමත් කරන්න මිස දුර්වල කරන්න නොවෙයි. අපේ ප්‍රධාන රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුවට ඒ ශක්තිය ලබා දීම තමයි අපේ අරමුණ. ඒ නිසා අපි කෙසේවත් උත්සාහ කරන්නේ නැහැ, මේ රාජ්‍ය බැංකුව අපේ රටේ ජනතාවට ලබා දෙන සේවයෙන් ඈත් කරන්න. විශේෂයෙන්ම, අද මේ රාජ්‍ය බැංකුවලට ශක්තිය ලබා දෙන්නේ ග්‍රාමීය, දුප්පත් මිනිස්සු බව අපි දන්නවා. අපේ ග්‍රාමීය, දුප්පත් මිනිස්සු බැංකුවෙන් ණයක් ගත්තොත් ඒක කොහොම හරි ගෙවා දමනවා. රාජ්‍ය ආයතනවලට, විශාල ව්‍යාපාරිකයන්ට තමයි අද ගොඩක් ඒ වෙලාවට ණය ගෙවන්න බැරි වෙලා තිබෙන්නේ. දුප්පත් මිනිස්සු කවදාවත් මේ බැංකු කඩා වැටෙන්න ඉඩ තබන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. අද සමාජය වෙනස් වෙමින් යනවාය කියන එක මා කියන්න ඕනෑ. පසුගිය කාලයේ සමාජය තුළ විශාල කථිකාවතක් ඇතිවෙලා තිබෙන බව අපි දැක්කා. අපි බලන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225දෙනාගේ මතය නොවෙයි. අපි බලන්න ඕනෑ, පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225දෙනාගේ මතයට එහා ගිහින් රට තුළ සිටින මිලියන 21කට වැඩි ජනතාවගේ මතය මොකක්ද කියලායි. ඒ අනුව තීන්දු තීරණ ගෙන අපි වෙනස් වුණේ නැත්නම් අපට ඉදිරියට යන්න බැරි වෙනවා.

අද අපි දකිනවා, ප්‍රභූ රථයක් පාරේ යනකොට වැරැදි මං තීරුවල ගියොත් ජනතාව එයට විරුද්ධව කථා කරන බව. දරුවකු පාසලට ඇතුළත් කරගන්න බැරි වුණොත් දෙමවුපියන් පාසල ළඟට ගිහින් සටන් කරන බව අද අපට පෙනෙනවා. ඒ විතරක් නොවෙයි, අද ජනතාව ඒ තත්ත්වයට පැමිණ තිබෙනවා. අපි විශ්වාස කරනවා, සමාජය නිවැරැදි මාර්ගයට ගමන් කරද්දී අපිත් ඒ මාර්ගයේ ගමන් නොකළොත්, ඉදිරියේ දී මොකක්ද කරන්නේ කියන එක ගැන අපි සියලු දෙනාටම තීන්දු කරන්න සිදු වෙන බව.

අපි එක් එක් අවධි ගැන කථා කළා. මේ රටේ පෘතුගීසීන්ගේ පාලන කාලයක් තිබුණා. ඊට පස්සේ ලන්දේසිගේ පාලන කාලය තිබුණා. ඊළඟට ඉංග්‍රීසින්ගේ පාලන කාලය තිබුණා. ඊට පස්සේ සේනානායක යුගය තිබුණා, බණ්ඩාරනායක යුගය තිබුණා, ජෝන් කොතලාවල යුගය තිබුණා, ඩඩ්ලි යුගය තිබුණා, සිරිමාවෝ බණ්ඩාරනායක යුගය තිබුණා, ජේ.ආර්.ගේ යුගය තිබුණා, ප්‍රේමදාස මහත්මයාගේ යුගය තිබුණා, රාජපක්ෂ මහත්මයාගේ යුගය තිබුණා, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ යුගය තිබුණා. අපි එවැනි එක් එක් කාල පසුකරගෙන පැමිණ තිබෙනවා. හැබැයි ජනතාවගේ කාලය උදා වුණාද, ගොවියාගේ කාලය උදා වුණාද, කම්කරුවාගේ කාලය උදා වුණාද කියලා අපි අහනවා. ජනතාවගේ කාලය උදා කරන්න ඕනෑ කරන කාලයක් තමයි දැන් ඇවිල්ලා තිබෙන්නේ. ගොවියාගේ කාලය උදා කරන්න ඕනෑ කරන කාලය තමයි දැන් ඇවිල්ලා තිබෙන්නේ. කම්කරුවාගේ කාලය උදා කරන්න ඕනෑ කරන කාලය තමයි දැන් ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි සියලුදෙනාම මේ එක් එක් නායකයන්ගේ කාලය නොවෙයි, එක් එක් පුද්ගලයන්ගේ කාලය නොවෙයි, ජනතාවගේ කාලය උදා කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සඳහා යන්න ඕනෑ. මිනිසුන්ගේ කාලය උදා කරන්න තමයි අපි උදවු කරන්න ඕනෑ. අපි විශ්වාස කරනවා, අපට ඒ සඳහා හොඳ අවස්ථාවක් උදා වෙනවාය කියලා.

2019 අග භාගය වනකොට ජනාධිපතිවරණයක් එනවා. එම මැතිවරණයේ දී ජනතාවගේ කාලය උදා කරන්නේ කොහොමද, මිනිසුන්ගේ කාලය උදා කරන්නේ කොහොමද, ගොවියාගේ කාලය උදා කරන්නේ කොහොමද, තරුණයාගේ කාලය උදා කරන්නේ කොහොමද, කම්කරුවාගේ කාලය උදා කරන්නේ කොහොමද, ශ්‍රමිකයාගේ කාලය උදා කරන්නේ කොහොමද, සුළු ව්‍යාපාරිකයාගේ කාලය උදා කරන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළට අපි යන්න ඕනෑ. මා හිතන හැටියට ඒකයි විය යුත්තේ.

ජනතාවගේ කාලය කිව්වාම, දැන් ජනතාව අතරත් නොයෙක් නොයෙක් ජනතා විරෝධී කල්ලි කණ්ඩායම් ඉන්නවා. ජනතාව අතර ඉන්නවා, ජනතා විරෝධී වැඩ කරන අයත්. ඒ අයගේ කාලය උදා කරලා වැඩක් නැහැ. අපි බලන්න ඕනෑ, පොදු කුලකය නොවෙයි. වඩාත් සුදුසු කුලකය මෙයට ඇතුළත් කරන්නේ කොහොමද කියලායි අපි බලන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ජනතාවගේ වඩා හොඳ කුලකය, ශුභවාදී කුලකය තමයි අපි උදා කරන්න ඕනෑ. මා විශ්වාස කරනවා, අපට ඒක ඇති කරන්න පුළුවන් වෙයි කියලා. මොකද, රටේ දුප්පත් ජනතාවගේ බලාපොරොත්තුවක් තිබෙනවා. අද සමස්ත රට තුළ විශේෂයෙන් දුගී දුප්පත් පන්තියේ, වැඩ කරන පන්තියේ, කම්කරු පන්තියේ හා ගොවි ජනතාවගේ බලාපොරොත්තුවක් තිබෙනවා, මේ රට සම්බන්ධව. ඒ අයගේ කාලය උදා කරන්න පුළුවන් නායකයකු බිහි කිරීමේ අවශ්‍යතාවක් දැන් ඇතිවෙලා තිබෙනවා. ඒ අය වෙනුවෙන් වැඩ කරන්න පුළුවන් නායකයකු බිහි කිරීමේ අවශ්‍යතාව දැන් තිබෙනවා. එය වෙනදාටත් වඩා තදින් අද සමාජගතවෙලා තිබෙන බව අපට පෙනෙනවා. අද එය සමාජ කතිකාවතක් බවට පත්වෙලා තිබෙනවා.

සමහරු එක් එක් නිර්ණායක මත කටයුතු කරමින් ඉන්නවා. මේ දවස්වල පොහොට්ටුවේ අපේක්ෂකයා වශයෙන් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා නම් කරලා තිබෙනවා. ඒ ගොල්ලෝ කථා කරන්නේ ආරක්ෂාව සම්බන්ධව විතරයි. රටක ආරක්ෂාව ප්‍රමුඛ වෙන්න ඕනෑ. හැබැයි රටේ ආරක්ෂාව ගැන හිතලා නායකයන් පත්කරලා වැඩක් නැහැ. එහෙම නම් හමුදා පාලනයකට රට යොමු කළා නම් ඉවරයි නේ. එහෙම නම් රටක ආරක්ෂාව හමුදාව බලා ගනියි, වෙන මොනවත් කරන්න ඕනෑ නැහැ. නමුත් රටේ ජනතාවගේ පැත්තෙන් හිතලා අපි කටයුතු කළේ නැත්නම්, රටේ ජනතාවගේ අවශ්‍යතා හඳුනාගෙන අපි කටයුතු කළේ නැත්නම් අද සමාජයේ වෙනස්වන ක්‍රියාකාරකම් එක්ක අපි සියලුදෙනාටම වළපල්ලට යන්න වෙනවා. අපි අලුත් යුගයක් ආරම්භ කිරීමේ අවශ්‍යතාව අවබෝධ කරගෙන තිබෙනවා. ඒ සඳහා අපි සූදානම්. එක්සත් ජාතික පක්ෂය විධියට, එක්සත් ජාතික පෙරමුණ විධියට අලුත් යුගයක් නිර්මාණය කරන්න අපි සූදානම්. අද අපි පැහැදිලිවම ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයේ සියලුදෙනාම ඒ සඳහා සූදානමින් ඉන්නවා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු පක්ෂ නායකත්වය සූදානමින් ඉන්නවා, මේ රටේ දැවැන්ත වෙනසක් ඇති කරන්න. ඒ සඳහා සුදුසු තීන්දු තීරණ ගනිමින් ඉන්නවා. ඒ නිසා අපි පැහැදිලිවම විශ්වාස කරනවා, ජනතාවගේ කාලය, එහෙම නැත්නම් සද්ජනතාවගේ කාලය උදා කරන්න පුළුවන් සද්ජන යුගයක් ඉතාම කෙටි කාලයකින් නිර්මාණය කරන්න අපට පුළුවන් වෙයි කියලා. ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපි නිර්මාණය කරනවා. ඒ "සද්ජන යුගය" තුළින් මේ රටේ වැඩ කරන පන්තියේ, කම්කරු පන්තියේ, ගොවි - කම්කරු ජනතාවගේ බලාපොරොත්තු අපි ඉටු කරනවා.

විශේෂයෙන්ම අපේ රටේ දුප්පත් ජනතාව තමයි අද බලාපොරොත්තු ගොන්නක් කරපින්නාගෙන ඉන්නේ. ඒ දුප්පත් ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්නට පුළුවන් සද්ජන යුගයක් අපි ආරම්භ කරන්නට ඕනෑ. ඒ බලාපොරොත්තු තුළින් තමයි රට ඉස්සරහට ගෙන යන්නට පුළුවන් වෙන්නේ. දුප්පත් මිනිස්සු බලාපොරොත්තු වෙනවා, මේ රට ඉස්සරහට ගෙන යන්නට පුළුවන්, දුප්පත් ජනතාවට ආදරය කරන, දුප්පත් ජනතාවගේ පැත්තේ ඉඳන් කටයුතු කරන නායකයකුට මේ රට භාර දෙන්න. ඒ කටයුත්ත කොළ පාට, නිල් පාට, රතු පාට වාගේ එක එක පාට අනුව බෙදෙන්නේ නැහැ; ජාති අනුව බෙදෙන්නේ නැහැ; ආගම් අනුව බෙදෙන්නේ නැහැ. මිනිසුන්ගේ විශ්වාසය, මිනිසුන්ගේ සිහිනය සැබෑ කිරීම තමයි අපේ අරමුණ විය යුත්තේ. ඒ, සද්ජන යුගය අපට මේ අවුරුද්දේ අග ඉඳන් නිර්මාණය කරන්නට පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்ததாக, கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்கள். உங்களுக்கு 12 நிமிடங்கள்!

[பி.ப. 3.10]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் மக்கள் வங்கி (திருத்தம்) சட்டமூலம் தொடர்பில் நடைபெறுகின்ற விவாதத்தில் கலந்துகொண்டு, எனது கருத்துக்களையும் பதிவு செய்வதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். தேசியப் பாதுகாப்பிற்குப் பாதகம் வருகின்ற நிலையில், முப்படைகளையும் பொலிசாரையும் கொண்டு தேசியப் பாதுகாப்பினை உறுதி செய்வதற்கு ஏற்பாடுகளை மேற்கொள்வதுபோன்று -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிருவாக, அனர்த்த முகாமைத்துவம் மற்றும் கால்நடை வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration, Disaster Management and Livestock Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. K. THURAIRETNASINGAM *left the Chair, and* THE HON. ANURA SIDNEY JAYARATHNE *took the Chair.*

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ஒரு நாட்டில் பொருளாதாரக் கட்டமைப்பிற்குப் பாதகம் வருகின்ற நிலையில், அதனைப் பேணிப் பாதுகாப்பதற்கு அரச நிதி நிறுவனங்களைக் கொண்டே அந்த ஏற்பாடுகளை மேற்கொள்ள வேண்டியுள்ளது. மக்கள் வங்கி (திருத்தம்) சட்டமூலம் கொண்டுவரப்படுகின்ற நிலையில், "மக்கள் வங்கியையும் இந்த அரசு விற்கப்போகிறது" என்ற குரலே இன்று நாடளாவிய ரீதியில் ஓங்கி ஒலித்து நிற்கின்றது. ஆனால், மக்கள் வங்கியின் மூலதனத்தை விருத்தி

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

செய்வதற்காகவே இந்தத் திருத்தச் சட்டமூலம் கொண்டுவரப்படுவதாக அரச தரப்புக் கூறுகின்றது. அரச தரப்பு இப்படிக் கூறினாலும், எப்படிக் கூறினாலும் அதை நம்புகின்ற அளவிற்கு இந்த நாட்டு மக்கள் இல்லை. ஏனென்றால், ஒன்றைக் கூறி, இன்னொன்றைச் செய்வதே இந்த அரசின் செயற்பாடுகளாக இருப்பதாகவே எமது மக்கள் நம்புகின்றனர்.

1961ஆம் ஆண்டு அப்போதைய வாணிப, வர்த்தக, உணவு மற்றும் கப்பற்துறை அமைச்சராக இருந்த அமரர் டீ.பீ. இலங்கரத்ன அவர்களால் சமர்ப்பிக்கப்பட்டிருந்த 29ஆம் இலக்கச் சட்டத்தின் ஊடாக, கூட்டுறவுச் சமஷ்டி வங்கியானது மக்கள் வங்கியாக மாற்றப்பட்டு, 50 ரூபாயினைக் கொண்டதான 120,000 பங்குகளைக் கொண்ட ஆரம்ப நிதியான 60 இலட்சம் ரூபாயினைப் பயன்படுத்தி அவ்வங்கி பலப்படுத்தப்பட்டது. இந்தப் பங்குகளின் பாதியை அரசு பெற்றுக்கொண்டதுடன், ஏனைய பங்குகளை நாடளாவிய ரீதியில் செயற்பட்டிருந்த கூட்டுறவுச் சங்கங்கள் பெற்றிருந்தன. இந்த வங்கியானது கூட்டுறவுச் சங்கங்களால் ஏற்பாடு செய்யப்பட்ட மக்களும் அரசும் இணைந்து மேற்கொள்கின்ற நிறுவனம் என்பதால், ஆரம்ப நிதி என்ற வகையில் தனிப்பட்டவர்களது நிதியினைப் பயன்படுத்துவதற்கான வாய்ப்பு வழங்கப்பட்டிருக்கவில்லை என்பது குறிப்பிடத்தக்கது.

தற்போதைய நிலையில், இந்த மக்கள் வங்கி 738 கிளைகளுடன் அதனது சேவைகளை மிகவும் சிறந்த முறையில் மேற்கொண்டு வெற்றிகரமாகச் செயற்பட்டு வருகின்றதாகவே அறிய முடிகின்றது. அத்துடன், அரசின் கூட்டிணைந்த நிதியத்திற்கு வருடந்தோறும் மக்கள் வங்கியானது 5 பில்லியன் அளவான பாரியதொரு தொகையினை வழங்கி வருவதாகவும், இதற்கு மேலதிகமாக வரி என்ற வகையிலும் பாரியதொரு தொகையை வழங்கி வருவதாகவும் தெரிய வருகின்றது. கடந்த வருடத்தில் மாத்திரம் மக்கள் வங்கி, இலங்கை வங்கி உள்ளிட்ட அரச வங்கிகளின் மூலமாக 50 பில்லியனுக்கும் அதிகமான நிதி அரசுக்கு வழங்கப்பட்டுள்ளதாகவும் இதில் மக்கள் வங்கி மாத்திரம் 19.8 பில்லியன் ரூபாயினை வழங்கியுள்ளதாகவும் தகவல்கள் கூறுகின்றன.

இத்தகைய இலாபத்தினை இந்த வங்கி ஈட்டி வருகின்ற நிலையில், மக்கள் வங்கியிடமுள்ள சொத்துக்களை அதிகரிக்கின்ற வகையில் பங்கு நிதியினை ஒன்று திரட்டுவதற்கும் தொகுதிக் கடன்களை வழங்குகின்ற வரையறையை மேலும் அதிகரிப்பதற்குமாக இந்தத் திருத்தச் சட்டமூலம் கொண்டுவரப்படுவதாகக் கூறப்படுகின்றது.

ஆரம்பத்தில் இந்த நாட்டில் இலாபம் தராத அரச நிறுவனங்களே விற்கப்பட்டு வந்தன. இப்போது அரசுக்கு நிறையவே இலாபம் தருகின்ற நிறுவனங்களும் விற்கப்பட்டு வருகின்றனவா? என்ற கேள்வி அரச காப்புறுதிக் கூட்டுத்தாபனத்திலிருந்து எழுகின்றது. இந்தத் திருத்தச் சட்டமூலத்தின் மூலமாக இரண்டாந்தர மூலதனத்தைப் பெற்றுக்கொள்வதற்கெனத் தொகுதிக்கடன் பத்திரங்களை விநியோகிப்பதே எதிர்பார்ப்பு என்றும், எவ்வகையிலேனும் பங்கு விற்பனைகள் நடைபெறமாட்டாது என்றும் மக்கள் வங்கியின் நிர்வாகத் தரப்புக் கூறுவதாகவும் அதேநேரம், பணியாளர்களுக்கும் கொடுக்கல்வாங்கலில் ஈடுபடுவோருக்கும் பங்குகள் விநியோகிக்கப்படும் என நிதி அமைச்சின் செயலாளர் தெரிவித்துள்ளதாகவும் இலங்கை வங்கி ஊழியர் சங்கத்தினர் தெரிவிக்கின்றனர்.

மக்கள் வங்கிச் சட்டத்தின் 13வது சரத்தில், "கூட்டுறவுச் சங்கமோ அன்றி உத்தியோகபூர்வ நிலைமையின் பிரகாரம் திறைசேரியின் செயலாளர் அல்லாத நபருக்கு வங்கியின் எந்தவொரு பங்குதாரர்களாலும் தமது பங்குகள் விற்பனை செய்யக்கூடாது" எனக் குறிப்பிடப்பட்டுள்ளமையையும் இங்கு சுட்டிக்காட்ட வேண்டியுள்ளது.

அடுத்ததாக, வங்கியின் மூலதனச் சிக்கல்கள் இருப்பின் அதனைத் தீர்த்துவைக்க வேண்டியது அரசாங்கத்தின் பொறுப்பாகவே இருத்தல் வேண்டும். அந்தவகையில், கடந்த வருடம் இலங்கை வங்கிக்கு அரசாங்கம் 5 பில்லியன் நிதியை வழங்கியுள்ளதாகவும் கூறப்படுகின்றது. எனவே, அத்தகையதோர் ஏற்பாட்டினை மக்கள் வங்கி தொடர்பிலும் மேற்கொள்ள இயலும். அத்தகையதொருநிலை இருந்தும் தொகுதிக் கடன்களை விநியோகிப்பது, பங்குகளை விநியோகிப்பது போன்ற ஏற்பாடுகளை மக்கள் வங்கி தொடர்பில் மாத்திரம் மேற்கொள்ளத் துடிப்பதே இங்கு சந்தேகத்தை ஏற்படுத்துகின்றது.

மேலும், இந்தத் திருத்தச் சட்டத்தின் 20(1)ஆம் சரத்தின் பிரகாரம் மத்திய வங்கிக்கு இருந்த தலையீட்டு உரிமம் இல்லாது செய்யப்பட்டும் 21(1)(ஆ), 21(3)(1)(ஆ) மற்றும் 43 (2)(இ) போன்ற சரத்துகள் நீக்கப்பட்டும் உள்ளன. அந்தவகையில், மத்திய வங்கிக்கு உரிய தலையீட்டு அதிகாரங்களை நீக்குவதற்கு முயல்வது ஏன்? என்பது பலத்த சந்தேகத்திற்குரிய விடயமாகவே இருக்கின்றது.

1961ஆம் ஆண்டின் 29ஆம் இலக்க மக்கள் வங்கிச் சட்டத்தின் 12(1) சரத்தின் பிரகாரம், "வங்கியின் பங்கு மூலதனமானது, ஒரு பங்கு ஐம்பது ரூபாய் வீதமான ஓர் இலட்சத்து இருபதாயிரம் பங்குகளாகப் பிரிக்கப்பட்ட அறுபது இலட்சம் ரூபாயாக இருத்தல் வேண்டும். எனினும், அதற்கென பிரதிநிதித்துவ மந்திரி சபையின் மூலமாக நிறைவேற்றப்பட்ட ஆலோசனைக்கமைவாக பங்கு நிதியானது காலத்திற்குக்காலம் அதிகரிக்கப்பட இயலும்" எனக் குறிப்பிடப்பட்டுள்ளது. இந்தச் சரத்து மேற்படி திருத்தச் சட்டத்தில், "வங்கியின் அதிகாரமளிக்கப்பட்ட மூலதனம், ஒவ்வொன்றும் ஐம்பது ரூபாய் கொண்ட ஒரு பில்லியன் பங்குகளாகப் பிரிக்கப்பட்ட ஐம்பது பில்லியன் ரூபாய் ஆதல் வேண்டும்" எனத் திருத்தப்பட்டுள்ளது. இவற்றைப் பார்க்கின்றபோது, இவ்வாறு மக்கள் வங்கியின் பணியாளர்களுக்கும் கொடுக்கல்வாங் கல்களை மேற்கொள்வோருக்கும் பங்குகளை விநியோகிப்பது என்ற பெயரில் மக்கள் வங்கிப் பணியாளர்களது எதிர்ப்பினைச் சமாளித்துக்கொண்டு, மக்கள் வங்கியை விற்பதற்கான ஓர் ஏற்பாட்டையே மேற்படி திருத்தச் சட்டம் உணர்த்துவதாக மக்களிடையே ஒரு சந்தேகம் நிலவி வருகின்றது.

நாட்டில் பாரிய நட்டங்களுடன் செயற்படுத்தப்பட்டு வருகின்ற பல அரச நிறுவனங்களுக்குத் திறைசேரி இன்னமும் நிதியினை வழங்கி வருகின்ற நிலையில், இலாபம் ஈட்டுகின்ற ஓர் அரச வங்கியின் மூலதன விருத்திக்கென இத்தகைய ஏற்பாடுகளை மேற்கொள்வதற்கு முயல்வதே மக்களிடையே பலத்த சந்தேகம் ஏற்படுவதற்குக் காரணமாக இருக்கின்றது என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இத்தகைய நிலையில், சில நியாயமான கேள்விகளை இலங்கை வங்கி ஊழியர் சங்கத்தினர் எழுப்புகின்றனர். அந்த வகையில், உத்தேச மக்கள் வங்கித் திருத்தச் சட்டத்தின் உண்மையான தேவை என்ன? என்பது பற்றிய கேள்வி எழுகின்றது. இந்தத் திருத்தச் சட்டத்தின் ஊடாக மக்கள்

வங்கியின் அரச உரிமத்திற்கு எவ்விதமான பாதிப்புக்களும் அழுத்தங்களும் ஏற்படாது என்பதை உரிய வகையில் அரசாங்கம் உறுதிப்படுத்த வேண்டும்.

மேற்படிச் சட்டத் திருத்தத்தின் ஊடாக விநியோகம் செய்வதற்கு எதிர்பார்ப்புக் கொண்டுள்ள தொகுதிக் கடன்கள், ஒப்படைக்கத்தக்க தொகைக் கடன்கள் ஆகுமெனில், அவை ஏதேனுமொரு சந்தர்ப்பத்தில் பங்குகளாக மாறக்கூடிய வாய்ப்புகள் உண்டா? என்பது குறித்து முன்கூட்டியே தெளிவுகளை அரசு தரவேண்டும். ஏதேனும் ஒரு வகையில் அவ்வாறு பங்குகளாக மாற்றம் பெறுகின்ற நிலையில் மக்கள் வங்கியின் அரசு உரிமத்திற்குப் பாதிப்புகள் ஏற்படுமா? என்பது தொடர்பிலும் அரசு மக்கள் வங்கி தொடர்பிலான பொறுப்புகளிலிருந்து விலக்கிக்கொள்வதற்கு எதிர்பார்க் கின்றதா? என்பது தொடர்பிலும் தெளிவுகள் தேவை.

2018 வரவு செலவுத் திட்டத்தின் மூலமாகக் குறிப்பிடப்பட்டிருந்ததன் பிரகாரம், அரச வங்கிகளின் அரச பங்குகளைத் தனியாருக்கு விற்கின்ற திட்டமானது, மக்கள் வங்கியிலிருந்து ஆரம்பிக்கப்படுகின்றதா? என்கின்ற வங்கி ஊழியர்களது கேள்விக்கு அரசு பதில் வழங்க வேண்டும்.

அதேநேரம், இந்த "Enterprise Sri Lanka" என்கின்ற திட்டம் தொடர்பிலும் பாரியளவில் நிதி விடுவிக்கப்பட்டு வருவதாகவும் இது எதுவரையில் போய் நிற்குமோ தெரியாது என்றும் இதன் காரணமாக வங்கிக் கட்டமைப்புகள் சிதைவுறும் நிலை உள்ளதாகவும் கூறப்படுகின்றது. ஆனால், எங்களது பகுதிகளைப் பொறுத்தவரையில், மேற்படி திட்டத்தின்கீழ் உதவிபெறவென வங்கிக்குப் போனால், அங்கே எமது மக்களை இழுத்தடிக்கின்ற நடவடிக்கைகளே தொடர்ந்தும் மேற்கொள்ளப்பட்டு வருகின்றன. எனவே, மேற்படி பாரியளவிலான நிதி யாருக்கு விடுவிக்கப்படுகின்றது? என்ற கேள்வி எழுகின்றது. இது தேர்தல் நடவடிக்கைக்கான முதலீடா? அல்லது பொறுப்பானவர்களது உற்றார், உறவினர்கள், நண்பர்களுக்கானதா? என்ற சந்தேகமே எமது மக்கள் மத்தியில் எழுந்திருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நீங்கள் என்னென்ன திட்டங்களைக் கொண்டுவந்தாலும் அவற்றில் எமது மக்களுக்கு மாற்றாந்தாய் மனப்பான்மையே இன்னும் தொடர்ந்து காட்டப்பட்டு வருகின்றது. எமது பிரச்சினைகளை நாம்தான் தீர்க்க வேண்டும், எமது மக்களது பிரச்சினைகளை அரசுதான் தீர்க்க வேண்டும். அதைவிடுத்து, சர்வதேச சமூகம் தீர்க்க வேண்டும் என இடித்துரைத்துக்கொண்டும் பொய் சொல்லிக்கொண்டும் இருக்க முடியாது. அது சாத்தியமும் இல்லை.

இதுவரையில் கிடைத்திருந்த நல்ல சந்தர்ப்பங்களை எல்லாம் கைநழுவ விட்டுவிட்டு, தாமே இந்த அரசாங்கத்தைக் கொண்டுவந்ததாகக் கூறிக்கொண்டு, இந்த அரசாங்கத்திற்கு முட்டுக்கொடுத்துக்கொண்டு, இந்த அரசே எல்லாவற்றையும் தமிழ் மக்களுக்குச் செய்து கொடுக்கும் எனக் கூறிக்கொண்டு, இந்த அரசைக் கொண்டு தங்களது சுயநலன்களை மாத்திரம் நிறைவேற்றிக்கொள்ளும் இந்தப் பணப்பெட்டி தமிழ் அரசியல் வாதிகள், தேர்தலென வருகின்றபோது, அரசாங்கத்தை நம்ப முடியாது என்றும் சர்வதேச சமூகமே அழுத்தங்கொடுக்க வேண்டும் எனவும் இன்று மீண்டும் கூறத் தொடங்கிவிட்டார்கள்.

பல்வேறு இக்கட்டான நிலைமைகளில்கூட, வெறும் பார்வையாளர்களாகவே சர்வதேச சமூகம் இருந்துள்ளதை எமது மக்கள் மறந்துவிடவில்லை. அரசியல் என்பது தமிழ் தரப்புப் பணப்பெட்டி அரசியல்வாதிகளுக்கு வாழ்வாதாரமாகவும் எமது மக்களுக்குச் சாவாதாரமாகவும் இருக்கின்றது. சர்வதேசச் சமூகத்திற்கு இடித்துரைக்கின்ற இந்தப் பணப்பெட்டித் தமிழ்த் தரப்பு அரசியல்வாதிகள், இவர்கள் பங்கெடுத்திருக்கின்ற இந்த அரசை முதலில் பிடித்துரைத்திருக்க வேண்டும். அரசிடம் போய் தங்களுக்கென நிதி பெற்றுக்கொண்டு, அரசு தமிழ் மக்களுக்கு நீதி வழங்கவில்லை எனக் கூறிக்கொண்டிருப்பதில் எவ்விதமான பயனும் இல்லை என்பதைத் தெரிவித்து, சந்தர்ப்பத்திற்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.23]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ ආර්ථිකය සම්බන්ධව කථා කරන්න ප්‍රවේශ වීමට තිබෙන ලොකුම මාතෘකාව තමයි මහජන බැංකුවේ සම්බන්ධ කාරණය. අපේ රටේ හැම එක්කෙනාගේම හදවත් තුළ තිබෙන බැංකුව තමයි මහජන බැංකුව කියන්නේ. ඒ බැංකුව 1961 වසරේ තමයි පටන් ගත්තේ. දැනට ලංකාව පුරා ශාඛා 737ක් තිබෙනවා. ATM මධ්‍යස්ථාන 730ක් තිබෙනවා. අපේ රටේ මුළු ජනගහනය මිලියන 25යි. ඒකෙන් ඒ බැංකුව එක්ක මිලියන 19ක් ගනු දෙනු කරනවා. ඒ බැංකුව 2018 වසරේ මේ රජය වෙනුවෙන් බිලියන 1,908ක ණයක් දීලා තිබෙනවා. ඒ වාගේම 2019 ජනවාරි සිට මාර්තු 31 වැනි දා දක්වා වූ මුල් කාර්තුවේදී බිලියන 4.2ක ලාභයක් ලබා ගත්ත බැංකුවක්. ඒ විතරක් නොවෙයි, Rs.1.4 trillion ප්‍රමාණයක තැන්පතු වටිනාකමක් තිබෙන සම්පතක් තමයි මහජන බැංකුව කියන්නේ. ලංකාවේ රජයට අයත් බැංකුවලින් වැඩිම සම්පත් ප්‍රමාණයක් තිබෙන, දුප්පත් ගොවි ජනතාවට ලොකු සහනයක් දෙන බැංකුව තමයි අපේ රටේ තිබෙන මහජන බැංකුව කියලා අපි හැම එක්කෙනාම කථා කරනවා; දන්නවා. නමුත්, මේ බැංකුව උපයා ගත්තු මුදල් අනවශ්‍ය විධියට පාවිච්චි කරපු යුගයකුත් අපට දකින්න තිබුණා. මම ඒ හැම එකක්ම කියන්න යන්නේ නැහැ. මම දන්නා විධියට ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමට මහජන බැංකුව බිලියන 50කට වැඩි ණයක් දීලා තිබෙනවා. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගම අපේ රටට ආදායමක් උපයන සමාගමක් කියලා අපට කියන්න බැහැ. මම ඒ සමාගමට අයත් ගුවන් යානාවකින් ළඟදී පිට රට ඉඳලා ආවා. පසුගිය 16වැනි දා UL 202 කියන flight එකෙන් ආවේ. ඒ හිටපු නිලධාරින්ගේ, සේවකයන්ගේ ක්‍රියාකලාපය බැලුවාම, එය flight එකක් නොවෙයි, මාළු කඩයක් වාගෙයි. එහෙම නිලධාරින් සිටියදී රටේ සංවර්ධනයක් සිදු වෙන්නේ කොහොමද, රටේ දියුණුවක් වෙන්නේ කොහොමද? මේ ගුවන් සමාගම පාඩු ලබන එක අහන්න දෙයක්ද? බිලියන 102ක් නැහැ. එවැනි නිලධාරින් එම

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

ගුවන් සමාගමේ සිටිනවා නම් බිලියන, ට්‍රිලියන ගණනක ණය තබාගෙනයි අපට කටයුතු කරන්න වෙන්නේ.

අපේ ආණ්ඩුවේ ඉන්න අය පසුගිය ආණ්ඩුවේ හිටපු අයට ඇඟිල්ල දික් කළා. හොරකම් කළා කිව්වා. බිලියන 102ක් හොරකම් කරලා, අල්ලස් දීලා, කොමිෂන් දීලා මේ ණය වැඩි කළා කිව්වා. නමුත්, මා කනගාටුවෙන් අහනවා, දැන් ඉන්නේ කවුද කියලා. අපේම රජයක්, අපේම සභාපතිවරයෙක් තමයි දැන් ඉන්නේ. අපේම රජය යටතේ පත් කළ නිලධාරින් තමයි ඉන්නේ. ඒ ආයතනය මාළු කඩයක් කරගෙන ඉන්න නිලධාරින් හදන්න බැරිද? මෙහෙම ගියොත් අපි ලෝකයත් එක්ක එකට ගමන් කරලා දියුණු වෙන්නේ කොහොමද? මේ මුදල් කාගෙද? මහජන බැංකුව අපේ මුදල් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමට ණය දීම තුළ අනවශ්‍ය විධියට තව තවත් රටේ දුප්පත්කම වැඩි වන එකයි සිද්ධ වන්නේ කියන එක අපට හිතා ගන්න පුළුවන්.

අපේ රට කෘෂිකාර්මික රටක්. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ගොවි මහත්වරු වෙනුවෙන් තමයි මේ බැංකුව හදලා තිබෙන්නේ. නමුත්, කනගාටුවෙන් කියන්න දෙයක් තිබෙනවා. අපට පස්සේ නිදහස ලබාගත් රටවල් අද අපට වඩා ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. ඒකට හේතුව තමයි අවශ්‍ය තැනට අවශ්‍ය විධියට ඒ ණය ලබා දීමට කටයුතු කිරීම. ලංකාවේ ආර්ථිකය පහළට වැටිලා කියලා හැම එක්කෙනාම කියනවා. ආර්ථිකය පහළට වැටීම සම්බන්ධයෙන් අපි පත් කරපු හැම පාලකයාම වග කියන්න ඕනෑ. කාටවත් ඒක මඟ හරින්න බැහැ.

ලෝකයේ අනෙක් රටවල් ගැනත් අපි කථා කරන්න ඕනෑ, ලංකාව ගැන විතරක් කථා කරලා වැඩක් නැහැ. ලෝකය සමඟ අපි දියුණුව කරා යන්නට ඕනෑ. ඒකට අපි අපේ අතීතයත් බලන්න ඕනෑ.

1961 වසරේ පටන් ගත්ත මහජන බැංකුව පාඩුවක් නැතිව, ලාභ ලබන ආයතනයක් විධියට අදත් ඉදිරියට යනවා. නමුත් අපි පත් කරන පාලකයෝ අපේම කියන නිලධාරින් කණ්ඩායමක් එතැනට යොදවනවා. නමුත්, ඒ කණ්ඩායමෙන් නියම ප්‍රයෝජනයක් වෙන්නේ නැති එක තමයි අපට තිබෙන කනගාටුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද ව්‍යාපාර ලෝකයේ ගනුදෙනු දිහා බලන්න.

අපේ රට කෘෂිකාර්මික රටක්. මේ රට දියුණු කරනවා නම් එකම මාර්ගය කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීමයි. නමුත්, අද වෙනකම් අපට කිසිම නිෂ්පාදනයක් කරන්නට බැරිවෙලා තිබෙනවා. අය වැය ප්‍රතිපාදන හරි විධියට අමාත්‍යාංශවලට වෙන් කරලා නියම විධියට ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. අපේ රට කෘෂිකාර්මික රටක් කියලා නමට කියනවා.

දැන් අපිට යල - මහ කන්න දෙක වැඩ කර ගන්න බැරිවෙලා තිබෙනවා. ඒකට හේතුව අපේ වාරි පද්ධතිය හරියට කළමනාකරණය කරන්න අපට බැරිවෙලා තිබීමයි. ඒ වාරි පද්ධතිය වෙනුවෙන් වෙන් කරන මුදල්වලින් වැව් හදනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, වතුර යන ඇළවල් හදන්නේ නැහැ. එතකොට වතුර යන්නේ කොහේටද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? පත් වෙන කුමන පාලකයා වුණත් කරන්නේ මොනවාද? පස් ටිකක් හාරනවා, වැව් බන්ට් එක හදනවා. නමුත් එතැනින් එහාට කටයුතු කළොත් තමයි අපට වැඩිම ලාභයක් ගන්නට පුළුවන් වන්නේ. වතුර පහළට ගලාගෙන යන ඇළ හැදුවොත් තමයි අපට වැඩිම ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වෙන්නේ.

අපි හාල් නිෂ්පාදනය කරලා ලෝකයට යවපු රටක්; ලෝකයට සහල් යවපු රටක්. නමුත් බැංකුවල මෙච්චර සම්පත් තිබියදීත් අපට අද එක කන්නයක්වත් වැඩ කර ගන්නට බැරි විධියේ තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. මේ සංශෝධනය මඟින් බැංකුවේ ප්‍රාග්ධනය වැඩි කරනවා.

ගරු ඇමතිතුමනි, 1948 ඩී.එස්. සේනානායක මහත්මයාගේ කාලයේ ඉඳලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා දක්වා අපේ රට කෘෂිකාර්මික රටක් කියලා කියනවා. එදා ඉඳලා අද වෙනකම්ම කථාවලින් විතරක් ඒක කියලා වැඩක් නැහැ. මේ කෘෂිකාර්මික රට දියුණු කරනවා නම් අපි ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළක් දියත් කරන්නට ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම දන්නා විධියට මහ කන්නයේ වගා කළත් යල කන්නය වගා කරන්න බැරි වුණා. වතුර නැති නිසා ගොවි මහත්වරුන්ගේ වගාව විනාශ වුණා. අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අනෙක් පළාත්වලට වඩා පොළොන්නරුවට ඕනෑවටත් වඩා වැඩියෙන් වතුර තිබෙනවා කියලා. මුළු ලංකාවටම සමාන විධියට වතුර දුන්නොත් යල සහ - මහ කන්න දෙකම හොඳින් වගා කර ගන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
හොඳයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙම පනත් කෙටුම්පතෙන් මහජන බැංකුවේ බලයලත් කොටස් ප්‍රාග්ධන සීමාව වැඩි කරනවා. ආණ්ඩුවට පමණයි මේ දෙන guarantee එක දෙන්න පුළුවන්. ණය දීම සඳහා private ආයතනවලටත් අවස්ථාව දීලා, පොලී අඩුවීමක් කරලා, ණය ලබා දීමෙන් ජනතාව ශක්තිමත් කරන්න පුළුවන් පනත් කෙටුම්පතක් තමයි අද මේ ඉදිරිපත් කර තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත කරගෙන කඩදාසි කොළවලට පමණක් සීමා කරන්නේ නැතිව, එක පක්ෂයකට, එක කණ්ඩායමකට, එක කුලයකට, එක වර්ණයකට ණය දෙන්නේ නැතුව, මුළු රටේම ඉන්න කෝටි දෙකහමාරක ජනතාවට ප්‍රයෝජනවත් වන විධියට ණය සහන දීමට කටයුතු කරන්න ඕනෑ. මේ ණය දෙනකොට එකම කණ්ඩායමකට දෙන්නේ නැතුව, නියම ගොවි මහතුන් කවුරුන් ද, හරියටම ව්‍යාපාරයක් පුළුවන් ව්‍යාපාරිකයා කවුද කියලා තෝරා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මහජන බැංකු (සංශෝධන) පනත ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පත අවශ්‍ය විධියට සංශෝධනය කරලා සම්මත කර ගෙන බැංකු පොලී අඩු වීමක් කළොත් කෝටි දෙකහමාරක් පමණ වූ මේ රටේ ඉන්න ජනතාවට ණය ලබා දීමේදී සහනයක් දෙන්නට කටයුතු කළොත් ලොකු පිනක්. මේ රටේ ජනතාවට තිබෙන වටිනා වත්කමක් තමයි මහජන බැංකුව කියන්නේ. මේ බැංකුව අපි හැම දෙනාටම ශක්තියක්. අපි හැම දෙනාටම සම්පතක්. ඒ සම්පත රැක ගැනීම මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225 දෙනාගේ පළමුවන වගකීමයි. මේ රටේ කෝටි දෙකහමාරක ජනතාව පාර්ලිමේන්තුවේ ඉන්න අපි 225 දෙනා කෙරෙහි විශ්වාසය තබලායි මේ කටයුතු අපට භාර දීලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක පමණ කාලයක් දෙන්න. අපි මේ වගකීමට පයින් ගහලා, අපේ දෙසිය විසිපස් දෙනා කොළ පාට, නිල් පාට, රතු පාට, කළු පාට කියලා බෙදෙන්නේ නැතිව සමස්ත රටේ ජනතාවගේ යහපත සඳහා වැඩ කරන්න උත්සාහ ගන්න ඕනෑ. මේ රට උතුම් රජවරු රජ කළ රටක්. අපේ රටට නිදහස ලැබුණාම ඩී. එස්. සේනානායක මැතිතුමා මේ රට කෘෂි කාර්මික රටක් හැටියට නම් කළා. නමුත් අද වෙනතුරු නමින් පමණයි අපේ රට කෘෂිකර්ම රටක් වෙලා තිබෙන්නේ.

මේ මහජන බැංකුව වාගේම අනෙක් බැංකු හරහාත් අපේ රට දියුණු කරන්න පුළුවන්. ලෝකයේ රටවල් දියුණු වෙලා තිබෙන්නේ බැංකු හරියට වැඩ කරන නිසායි. මුළු ලෝකයේම අනෙක් රටවල් බැංකු ක්‍රමය කෙරෙහි විශ්වාසය තියලා රටේ සංවර්ධන කටයුතු කරන්නට ඉදිරිපත් වෙනවා. මේ රටේ රජයන් බැංකු කෙරෙහි විශ්වාසයක් තියලා නැති නිසා අපේ ආර්ථිකය දවසෙන් දවස පහළට යෑම ගැන කනගාටුවෙමින් මගේ කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.34]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පතෙන් මහජන බැංකු පනතේ වගන්ති කිහිපයක් සංශෝධනය කිරීම පිළිබඳව ඉතා වටිනා අදහස් ඉදිරිපත් වුණා. 1961 අංක 29 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීම ගැනයි මේ අවස්ථාවේ විවාද කරන්නේ. මෙම පනත සංශෝධනය කිරීමේ අරමුණ ලෙස ප්‍රකාශ කරන්නේ, බාසල් III සම්මුතිය අනුව අන්තර්ජාතික වෙළඳාම් කිරීම සඳහා රුපියල් බිලියනයක ප්‍රාග්ධන සීමාව රුපියල් බිලියන 50 දක්වා වැඩි කිරීමයි. කෙසේ නමුත් අද ගෙන එන සංශෝධන සහ පසුගිය කාලීමාව තුළ ආණ්ඩුව විසින් කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සැලකීමේදී මේ සංශෝධන පිළිබඳව බරපතළ අවිශ්වාසයක් මේ රටේ ජනතාව තුළ තිබෙනවා. අද වෙනකොට බැංකු සේවකයන් මේ පිළිබඳව විරෝධතාව පළ කර තිබෙනවා. මහජන බැංකුව වාගේම, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ලංකා පුත්‍ර බැංකුව වාගේ බැංකු ආරක්ෂා කර ගන්නට ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. මේ රටේ ආර්ථිකය වෙනුවෙන්, මේ රටේ සමාජ ප්‍රගමනය වෙනුවෙන්, මේ රටේ සමස්ත ජනතාව වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කරන බැංකු පද්ධතියක් තමයි මේ. ලඟිලඟියේ ආණ්ඩුව මේ සංශෝධන ගෙන ඒම පිළිබඳව අපට බරපතළ සැකයක් තිබෙනවා. ආණ්ඩුව මෙතෙක් ගත්තු ක්‍රියාමාර්ග අනුව මේ වසර හතරහමාර තුළ ආණ්ඩුව පිළිබඳව ජනතාවගේ විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා; පිළිගැනීම අඩු වෙලා තිබෙනවා. ඒක නිසා ආණ්ඩුව ගෙන එන පනත් පිළිබඳව, පනත් සංශෝධන පිළිබඳව බරපතළ සැකයක් ඇති වෙනවා.

අද පුවත් පත් දිහා බලන කොටත් අපි දැක්කා, ප්‍රධාන පුවත්පත්වල පළ වෙලා තිබුණු කාරණා කිහිපයක්. එක් පුවත් පතක මෙසේ තිබුණා:

"පොරොන්දු වූ රුපියල් 50 ඉල්ලා වතු සේවකයන් උපවාසයට"

මේ ආණ්ඩුව වතු සේවකයන්ට රුපියල් 50ක් ලබා දෙන්න පොරොන්දු වෙලා තිබෙනවා. නමුත් ඒක ලබා දෙන්න අපොහොසත් වෙලා තිබෙනවා. ඒක නිසා වතු සේවකයන් උපවාසයකට සැරසෙනවා. මීට කලින් කිහිප වතාවක්ම ඒ උපවාසය කළා. මේ කම්කරුවන්ටත් රටේ සමස්ත ජනතාවට දැනෙන ප්‍රශ්න දැනෙනවා.

තවත් පුවත් පතක පළ වී තිබෙනවා, "2015 සිට සතොස මිලියන 10,637ක් පාඩු ලබලා තිබෙනවා"

කියලා. ඒ වාගේම තව පුවත්පතක මෙසේ සඳහන්ව තිබෙනවා:

"එයාර් බස් 4ක් ගැනීමේ ගිවිසුම අවලංගු කිරීමෙන් කෝටි 1,706ක පාඩුවක්"

කෝප් වාර්තාවෙන් තමයි එය හෙළිවන්නේ කියාත් සඳහන්ව තිබෙනවා.

මේ විධියට ආණ්ඩුව ගත්තු තීන්දු - තීරණ නිසා, ආණ්ඩුව ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ නිසා රජයට විශාල පාඩුවක් සිදු වෙලා තිබෙනවා. රාජ්‍ය ආයතන බරපතළ කඩා වැටීමේ තර්ජනයකට මුහුණ දීලා තිබෙනවා. දූෂණය, වංචාව, අක්‍රමිකතා ඉහවහා ගිහිල්ලා තිබෙනවා. මේ ප්‍රශ්නත් එක්ක බැලුවාම ජනතාවගේ ජීවන තත්ත්වය පහත වැටිලා, ජීවන වියදම ඉහළ ගිහිල්ලා, ජීවන ගැටලු බරපතළ කරලා තිබෙනවා. එවැනි අවස්ථාවක මහජන බැංකු පනත සංශෝධනය කිරීමට ආණ්ඩුව සැරසීම පිළිබඳව බරපතළ සැකයක් රටේ ජනතාවට, බැංකු සේවකයන්ට, බැංකුවේ ගනුදෙනුකරුවන්ට සහ මේ ජාතික සම්පත් ආරක්ෂා කිරීම වෙනුවෙන් කටයුතු කරන විවිධ සංවිධානවලට ඇති වෙලා තිබෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක් විධියට අපි දකිනවා.

මහජන බැංකුවෙන් මේ රටේ ජනතාවට විශාල සේවාවක් සිදු වෙනවා. මහජන බැංකුවේ ප්‍රධාන අරමුණ වන්නේ කුඩා පරිමාණ සංවර්ධන කටයුතු සහ බැංකු කටයුතු වැඩි දියුණු කිරීම, වාණිජ බැංකු කටයුතු ප්‍රවර්ධනය කිරීම, විදේශ පාරිභෝගික කටයුතු පහසු කිරීම සහ විදේශ විනිමය සේවා කටයුතු කිරීමයි. මීට අමතරව ගනුදෙනුකරුවන් සඳහා උකස් අත්තිකාරම් ලබා දීම, සෑම අංශයකම ආවරණය වෙන විධියට ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම කරනවා. විශේෂයෙන් අපි දන්නවා, ගුරුවරුන්ට "ගුරුසෙත" ණය යෝජනා ක්‍රමය, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අයට "සුවසෙවණ" ණය යෝජනා ක්‍රමය හා විවිධ රාජ්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වෙන බව. සුළු සහ මධ්‍ය පරිමාණ ණය, නිවාස සහ වාණිජ ණය, විදුලිය සඳහා ණය ආදී බහු කාර්යයන් සඳහා විශාල ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වෙනවා.

ඊට අමතරව සමාජ සත්කාරක වැඩසටහන් වෙනුවෙනුත් මහජන බැංකුව සුවිශාල කාර්යභාරයක් කරනවා. විශේෂයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා නේවාසිකාගාරයක් පවා පරිත්‍යාග කරලා තිබෙනවා. ඒ වාගේම, මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න දරුවන් වෙනුවෙන්, විශේෂයෙන් පහේ ශිෂ්‍යත්වය සමත් වෙන දරුවන්, සාමාන්‍ය පෙළ උසස් විධියට සමත් වෙන දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වාගේ බොහෝ සමාජ ප්‍රගමනයට සහ සමාජ මෙහෙවරට

[ගරු විජිත බේරුගොඩ මහතා]

මහජන බැංකුව දායකත්වය දක්වනවා. ඒක නිසා තමයි "ජනහද හඳුනන මහජන බැංකුව" කියලා ජනතාව තුළ විශ්වාසයක් ගොඩනැඟිලා තිබෙන්නේ.

මේ බැංකුව 2018 වසරේදී රජයට ලබා දුන් දායකත්වය බිලියන 19.8ක්. පසු ගිය වසර 12 තුළ බදු වශයෙන් රුපියල් බිලියන 147.6ක් ලබා දීලා තිබෙනවා. ලාභාංශ වශයෙන් බිලියන 43.5ක් ලබා දීලා සෞඛ්‍ය, අධ්‍යාපන සේවා පවත්වාගෙන යෑමට ආණ්ඩුවට උදවු කරලා තිබෙනවා. රාජ්‍ය ව්‍යාපාර සහ සමාගම් සඳහා 2018 වසරේදී රුපියල් බිලියන 540ක ණය ලබා දීලා තිබෙනවා. ඌන සංවර්ධිත ප්‍රදේශ ඉලක්ක කරගෙන 2018 වසරේදී මිලියන 105,037ක මුදලක් ලබා දීලා තිබෙනවා. 2017 වසරේ රුපියල් මිලියන 94,184ක් ව්‍යාපෘති ණය ලෙස මුදා හැරලා තිබෙනවා. මේ විධියට බැලුවාම ආණ්ඩුවට විශාල ශක්තියක් වූ, ජනතාවට විශාල ශක්තියක් වූ, ගනුදෙනුකරුවන්ට, ව්‍යාපාරකයන්ට, විවිධ සමාජ තල නියෝජනය කරන සමාජයේ විවිධ ස්ථරවලට විශාල ශක්තියක් වූ මහජන බැංකුව පෞද්ගලීකරණය කිරීමේ පළමු අදියර විධියට මේ රටේ ජනතාව මේ සංශෝධන දකිනවා.

බැංකු සේවක පිරිස් විශාල ප්‍රමාණයක් ඉන්නවා. මේ සියලුදෙනා බොහොම බරපතළ සැකයකින්, බරපතළ අවිශ්වාසයකින් මේ ප්‍රශ්නය දිහා බලන බව අපි දකිනවා. කොහොම වුණත්, මේ ආණ්ඩුව සැරසෙන වැඩ පිළිවෙළ දිහා බැලුවාම, එවැනි ප්‍රශ්නයක් තිබෙනවාය කියන එක අපටත් විශ්වාස කරන්න පුළුවන්කම තිබෙනවා. මේ රටේ මූල්‍ය පද්ධතියේ, මූල්‍ය ස්ථාවරත්වයේ මර්මස්ථානය තමයි මහ බැංකුව. මහ බැංකුවට කරපු හානිය, මහ බැංකුවට කරපු විනාශය දිහා බැලුවාම, අනෙක් බැංකුවලට කරන්න සූදානම් වෙන විනාශය පිළිබඳව අපට සැකයක් තිබෙනවා.

කොහොම වුණත්, මහජන බැංකුව ප්‍රාග්ධනය වැඩි කරගන්න එක හොඳයි කියලා අපි විශ්වාස කරනවා. ප්‍රාග්ධනය වැඩි වෙන තරමට ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්නට, ආයෝජනය ශක්තිමත් කරන්නට, මේ රටේ කර්මාන්ත, කෘෂිකර්මාන්ත සංවර්ධනය සඳහා ආයෝජකයන් දිරිගන්වන්නට බැංකුවට කටයුතු කරගන්න පුළුවන්. ඒ වාගේම, මහජනතාවට විවිධ වූ සේවා සලසන්න පුළුවන්. ණයකර නිකුත් කිරීම මඟින් මෙම ප්‍රාග්ධනය උපයා ගැනීමටයි උත්සාහ කරලා තිබෙන්නේ; සැලසුම් කරලා තිබෙන්නේ. ණයකර නිකුත් කිරීමේදී මෙතෙක් මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කරපු අධීක්ෂණය, සොයා බැලීම, ඒ පිළිබඳව තිබෙන ආරක්ෂණ රැකවරණය මේ සංශෝධනවලින් ලිහිල් කරන්න කටයුතු කරගෙන යනවා.

ණයකර නිකුත් කිරීම මඟින් මෙම ප්‍රාග්ධනය උපයා ගැනීමට සැලසුම් කළත්, මේ ණයකර කල් පිරුණාට පසුව කොටස් බවට පරිවර්තනය කිරීමේ හැකියාවක් තිබෙන බව අපි දන්නවා. අවසානයේ මේ කොටස් විවිධ පෞද්ගලික බැංකු, විදේශීය සමාගම් නතු කර ගත්තොත්, මේ බැංකුව ඉබේම පෞද්ගලීකරණයට මඟ පෑදෙනවා. ආර්ථික විශේෂඥයන්, මූල්‍ය විශේෂඥයන් මේ රටේ ආර්ථික ස්ථාවරභාවය පිළිබඳව, ආර්ථික ස්වාධීනත්වය පිළිබඳව, මූල්‍ය ක්‍රමයේ ස්වාධීනත්වය පිළිබඳව අනතුරු අඟවා තිබෙනවා, මේ ක්‍රියා පිළිවෙළ නිසා. විශේෂයෙන්ම මුදල් අමාත්‍යවරයා, ඒ වාගේම මේ ආණ්ඩුව සූදානම් වන්නේ මහජන බැංකුව වාගේ ජාතිය සතු මහා සම්පතක් පෞද්ගලීකරණයට අවශ්‍ය පළමු පියවරට පිඹුරු පත් සකස් කිරීමටයි කියන එක තමයි අපි මේ සංශෝධන තුළින් දකින්නේ. අපි විශ්වාස කරනවා, මහජන බැංකුව විතරක් නොවෙයි, මේ රටේ රාජ්‍ය බැංකුවල සියලු නිලධාරින්, සේවකයන්, ගනුදෙනුකරුවන් දහස් ගණනින්, ලක්ෂ ගණනින් පාරට බැහැලා මේකට විරෝධය පළ කරයි කියලා. ඒ නිසා මේ වාගේ රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීමට විශේෂ හැකියාවක් තිබෙන, පෞද්ගලීකරණය කරලා විශේෂ අත්දැකීම් තිබෙන මේ ආණ්ඩුවට අපි අනතුරු අඟවනවා, මේ බැංකු පද්ධතිය විනාශ කරන්නට කටයුතු කරන්න එපා කියලා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා අමාත්‍යතුමා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි දහයක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා.3.44]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - பொருளாதார மறுசீரமைப்பு மற்றும் பொதுவழங்கல் அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva – Non-Cabinet Minister of Economic Reforms and Public Distribution)
බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ විජිත බේරුගොඩ ගරු මන්ත්‍රීතුමා දැන් කිව්වා, මහජන බැංකුවේ කොටස් විකුණන්න, මහජන බැංකුව පෞද්ගලීකරණය කරන්න පිඹුරු පත් සකස් කරනවා කියලා. එතුමාගේ ඒ කථාව සම්පූර්ණයෙන්ම සාවද්‍යයි. එතුමා අහගෙන සිටිනවා නම්, මම එතුමාට කියන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් අහන ප්‍රශ්න දහයක් තිබෙන බවත්, ඒ ප්‍රශ්න දහයට පිළිතුරු දෙන්න මා බලාපොරොත්තු වන බවත්.

I will speak in English, Hon. Presiding Member. The first question is, when did the process of amending the People's Bank Act originally commence? මේ සංශෝධන කරන්න පටන් ගත්තේ 2013දීයි. මේක අද ඊයේ කරපු දෙයක් නොවෙයි. The second question is, what is the objective of the Amendments? මොනවාද, මේ සංශෝධනවල මූලික අරමුණ? To increase the current authorized share capital from Rs. 1 billion to Rs. 50 billion. බැංකුවේ ප්‍රාග්ධනය රුපියල් බිලියන එකේ ඉඳලා රුපියල් බිලියන 50ට වැඩි කිරීම තමයි මේ සංශෝධනයේ මූලික බලාපොරොත්තුව. එතකොට මේ බැංකුවත්, Bank of Ceylon එක වාගේ, අනෙක් බැංකු වාගේ ශක්තිමත් වෙනවා. එතුමා කියපු දේ හරි. ඒ ප්‍රාග්ධනය වැඩි වුණාම, දෙන්න පුළුවන් ණය ප්‍රමාණය වැඩි වෙනවා. ඒ හරහා රටේ ආර්ථිකයට ධනාත්මක සංශෝධනයක් බවට මෙය පරිවර්තනය වෙනවා.

ඊළඟට, තුන්වැනි ප්‍රශ්නය තමයි මොනවාද මේ Amendments කියන එක; what are the proposed Amendments? මම මුලින් කිව්වා වාගේ මූලික අරමුණ තමයි, authorized share capital එක රුපියල් බිලියන එකේ ඉඳලා රුපියල් බිලියන 50 දක්වා වැඩි කිරීම. That is in Section 12.

Then, Sections 20, 21 and 43 deal with the Bank's capacity to issue debentures for its medium and long-term funding purposes, where previously a Treasury guarantee was requisite at every instance the Bank so issued a

debenture. The Amendments proposed aim to essentially enable the Bank to issue debentures without a Government of Sri Lanka Guarantee, being similar to other State banks, thus enabling the Bank to tap debt markets for its regulatory purposes in order to facilitate further growth.

මෙතැන කියන්නේ, දැන් තිබෙන තත්ත්වය අනුව මේ අයට බැඳුම්කර - debentures - ඉදිරිපත් කරන්න Treasury guarantee එකක් ඕනෑ. ඒ Treasury guarantee එකත් එක්ක debentures issue කළාම ඒක Baselවල තිබෙන capital adequacy එකට අදාළ වෙන්නේ නැහැ. So, this only gives the People's Bank the ability to go to the market and raise its required financing through issuing debentures or a long-term paper without getting a Treasury guarantee of the Government of Sri Lanka. ඕනෑම තරගකාරී බැංකුවකට මේ අවස්ථාව තිබෙන්න ඕනෑ. Treasury Guarantee එකක් හැම වෙලාවේම අවශ්‍ය වෙන්නේ නැහැ. Treasury Guarantee එකක් නැතිව ඒ අයට දෙන්න පුළුවන් නම්, ඒක තමයි බැංකුවේ ශක්තිමත් භාවය.

ඊළඟට අහන මූලිකම ප්‍රශ්නය මෙකයි. Do the proposed Amendments have any impact or consequence whatsoever on the Bank's ultimate Government of Sri Lanka share ownership? මෙකනේ කියන්නේ. මේක ශ්‍රී ලංකා රජයට අයිති බැංකුවක්. මේ කරන සංශෝධනවලින් රජයේ අයිතිය නැති වනවාද, ඒකට පිඹුරු පත් සකස් කිරීමක්ද වෙන්නේ? ඒකට උත්තරය තමයි, "නැත" කියන එක. මම නැවතත් කියනවා, "නැත" කියලා. ඒ කියන එක අමූලික අසත්‍යයක්. සමහරු මේ රටේ සමාජගත කරන්න යනවා, මේ රජය මහජන බැංකුව විකුණන්න යනවා කියලා. ඒක අමූලික අසත්‍යයක්. The Government's ultimate beneficial ownership in People's Bank remains enshrined in Section 13 of the People's Bank Act. For the avoidance of any doubt, this Section 13 is not amongst the proposed Amendments. 13වැනි වගන්තියෙන් තමයි රජයේ සම්පූර්ණ අයිතිය බැංකුවට දීලා තිබෙන්නේ. මේ 13 වැනි වගන්තිය කිසිසේත්ම මේ සංශෝධනයට අඩංගු වෙන්නේ නැහැ. 13 (1)වැනි වගන්තියෙන් මොකක්ද කියන්නේ? It states, I quote:

> "No shareholder of the Bank shall sell his shares to any person other than a co-operative society or the Secretary to the Treasury in his official capacity."

මහජන බැංකුව හදන කොට මූලිකවම සමුපකාර එක්ක එකතු වෙලා හදපු නිසා තමයි co-operative society කියන එක මෙතැන තිබෙන්නේ. මේ co-operative societiesවලට හෝ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ official capacity එකට විතරයි මේ බැංකුවේ කොටස් අයිති වෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, මම රාජ්‍ය මුදල් ඇමතිතුමාගෙනුත් මේ ප්‍රශ්නය ඇසුවා. ඔබතුමාගෙනුත් ඒ ප්‍රශ්නය අහන්න මම කැමතියි. ඔබතුමා කියපු කාරණය හරි. Section 13(1)වල clearly තිබෙනවා "No shareholder of the Bank shall sell his shares to any person other than a co-operative society or the Secretary to the Treasury...." කියලා. ඔබතුමන්ලා ඒක වෙනස් කරන්නේ නැහැ. නමුත් ඔබතුමන්ලා 12වැනි වගන්තිය වෙනස් කරනවා. 12වැනි වගන්තියේ තමයි "shareholder" කියන එක නිර්වචනය කරලා තිබෙන්නේ. "Shareholder" කියන එක 12වැනි වගන්තියේ හරි පැහැදිලිව තිබෙනවානේ, "රජයේ සහ සමුපකාර" කියලා. ඒක ඉවත් කළාට පස්සේ "shareholder" කියන එකට නිර්වචනයක් නැහැ. ඒ නිසා තමයි අපි කියන්නේ, eventually, මේක privatization එකට පාර කපනවාය කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔබතුමා අහන ප්‍රශ්නය සාධාරණයි. ඔබතුමාට ඒ තර්කය ගෙනෙන්න පුළුවන්. ඔබතුමා අහන්නේ මෙකයි. 12වැනි වගන්තියේ තිබෙනවා, authorized share capital එක වැඩි කරන්න පුළුවන්, එතකොට ඒක debentures හරහා ඕනෑම කෙනෙකුට ගන්න පුළුවන් කියලා. මෙතැනදී ලොකු දෙයක් තේරුම් ගන්න ඕනෑ. මේ debentures කියන්නේ equity shares නොවෙයි.

ඊළඟට අහන ප්‍රශ්නය තමයි, මේ debentures කවදා හෝ equity sharesවලට පරිවර්තනය කර ගන්න පුළුවන්ද කියන කාරණය. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, ඒකට උත්තරය තමයි "බැහැ" කියන එක. මම ඒ කරුණු ඉදිරිපත් කරන්නම්. මගේ උත්තර 10ට ඒක ඇතුළත්. ඔබතුමා නඟන තර්කය සාධාරණයි. නමුත් ඒකට පිළිතුර මෙයයි. සෘජුවම බැංකුවේ අයිතිය රජයෙන් හැර වෙන කිසි කෙනෙකුට ලබා ගන්න හැකි වන විධියේ සංශෝධනයක් අපි ඉදිරිපත් කරලා නැහැ. මම ඒ කාරණය ගැන නැවත පසුව කථා කරන්නම්.

මා කියමින් සිටි කාරණයට දැන් එන්නම්. Secretary to the Treasuryට විතරයි බලය තිබෙන්නේ. මා දැන් කියවන්නේ මහජන බැංකු පනතේ 13 (2) වන වගන්තියයි. ඒ, අපි වෙනස් කරන්නේ නැති වගන්තිය. එහි මෙසේ සඳහන් වෙනවා:

> "The Secretary to the Treasury on being authorized in that behalf by the Minister in charge of the subject of Finance may sell to any co-operative society any shares held by him for and on behalf of the State at not less than the par value of those shares, and the proceeds of the sale shall be paid to the Consolidated Fund."

මෙහි සඳහන්ව තිබෙනවා, සමුපකාර සමිතිවලට මේවා දෙන්නේ කොහොමද කියලා. මෙය මේ බැංකුව පටන් ගත් දවසේ ඉඳලා තිබුණු දෙයක්. නමුත්, ඒක කිසි විටෙකත් රජයේ අයිතියෙන් එහාට ගිහිල්ලා නැහැ. අපි ඒක වෙනස් කරන්නේත් නැහැ.

ඊළඟට, පස්වනුව අහන ප්‍රශ්නය තමයි, as it currently stands, that is, being without any changes to its Act, can the Bank issue debentures to meet its regulatory capital requirements? කියන එක. දැන් තිබෙන විධියට ඇයි මේ සංශෝධනය කරන්න අවශ්‍ය? සංශෝධනය කරන්නේ නැතිව මේ debentures, එහෙම නැත්නම් බැඳුම්කර විකුණා අවශ්‍ය ප්‍රාග්ධනය සොයා ගන්න අපට පුළුවන්ද? ඒකට උත්තරය තමයි, no. As it stands, Section 21 (1) (b) requires the Bank to obtain a Treasury Guarantee at every instance a debenture is issued. In this context, it must be pointed out that the Government of Sri Lanka does not have adequate capacity or capability to issue guarantees and debentures backed by a guarantee do not qualify for regulatory capital. මේ පිළිබඳ තවත් කරුණු තිබෙනවා. නමුත්, මේ කරුණු දෙක තමයි වැදගත් වෙන්නේ. දැන් තිබෙන විධියට රජයේ භාණ්ඩාගාරයේ guarantee එකක් නැතිව මේ debentures ඉදිරිපත් කරන්න බැහැ; මේ debentures වෙළඳ පොළට ගෙනෙන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි 4ක් දෙන්න. විනාඩි දෙකක් තිබෙනවා නේ.

රජයේ භාණ්ඩාගාරයේ guarantee එකක් නැතිව debentures ඉදිරිපත් කරන්න හැකියාවක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මෙහි වැදගත්ම කාරණය තමයි, අපේ බැංකු ඇතුළු ලෝකයේ හැම බැංකුවක්ම Basel regulatory requirementsවලට යටත් වෙන්න ඕනෑය කියන කාරණය. එහෙම නැත්නම් අනෙක් බැංකු එක්ක LCs open කරන්න අපට බැහැ; ලෝකයේ අනෙක් බැංකු එක්ක ගනු දෙනු කරන්න අපට බැහැ. Treasury Guarantee එකක් එක්ක issue කරලා තිබෙන debenturesවලින් ඒක Basel එකේ අවශ්‍ය regulatory capitalවලට අයිතියි කියලා පෙන්වන්න බැහැ. බැංකුවේ ශක්තිමත්භාවය පෙන්වන්න නම් බැංකුවට පුළුවන් වෙන්න ඕනෑ, Treasury Guarantee එකක් නැතිව තනියම debentures issue කරන්න.

හයවන ප්‍රශ්නය මෙයයි. There is a view that the proposed Amendment to Section 20 seeks to remove the supervision of the Monetary Board of the Central Bank of Sri Lanka over the Bank's affairs, particularly in relation to the issuance of debentures. Is there any truth to these views? ඒක තමයි අපේ විජිත බේරුගොඩ මන්ත්‍රීතුමාත් ඇහුවේ. ඒකට උත්තරය, no. In this context, it is not. ඒ කියන්නේ මොකක්ද? මහ බැංකුවේ නියාමන රාමුවෙන් මේ බැංකුව එළියට අරගෙන යනවා කියලා සමාජය තුළ සමහර අය අදහසක් ඉදිරිපත් කළාට ඒක කිසි විටෙකත් එහෙම වෙන්නේ නැහැ. As it currently stands, Section 20 (1) reads as follows:

> "........request the Monetary Board of the Central Bank of Ceylon to raise on its behalf, any sums by the issue of debentures."

The Monetary Board does not and will not issue debentures on behalf of the People's Bank. It does not do so for other fully State-owned financial institutions. මුදල් මණ්ඩලයට පුළුවන්ද, මහජන බැංකුව වෙනුවෙන් බැඳුම්කර - debentures - issue කරන්න? මුදල් මණ්ඩලයට එහෙම issue කරන්න බැහැ. මුදල් මණ්ඩලය එහෙම issue කරලාත් නැහැ. මුදල් මණ්ඩලය විසින් වෙනත් කිසිම බැංකුවකට debentures issue කරලා නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමා, ඔබතුමා කියවන, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 20 වගන්තිය හරිම clear. එහි තිබෙන්නේ, "ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මුදල් ඇමතිවරයා විසින් දෙනු ලබන අනුමැතිය යටතේ කිසිම ණයකරයක් නිකුත් නොකළ යුතුය" කියලා. ඇත්තටම බැංකුවට ණයකර නිකුත් කරන්න පුළුවන්. බැංකුව තමයි ණයකර නිකුත් කරන්නේ. නමුත්, ඒකට කලින් Monetary Board එකත් එක්ක consultation එකක් අවශ්‍යයි. ගරු ඇමතිතුමා, මුදල් මණ්ඩලය අයින් කරලා නැහැ කියලා ඔබතුමා කිව්වාට දැන් ඔබතුමා කතා කරන හැම සංශෝධනයකම - මේ සංශෝධන 4න්ම - මුදල් මණ්ඩලය තමයි අයින් කරලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පොඩ්ඩක් ඉන්න, මා කියන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Basel කියන්නේ regulate කරන්න කියලා නේ. Regulate කරන්න තිබෙන ප්‍රධාන body එකක් නේ, Monetary Board එක?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඉතින්, Monetary Board එක අයින් කරන්නේ ඇයි?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූල්‍ය ආයතන නියාමනය කිරීම Monetary Board එකේ එක කාර්යයක්. සියලු බැංකු නියාමනය වන්නේ Monetary Board එක හරහා. ලංකා බැංකුව යම්කිසි විධියකට නියාමනය කරනවා නේ. ඒ විධියටම තමයි මහජන බැංකුවත් නියාමනය වෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, කිසිම විධියකට මහජන බැංකුව Monetary Board - [බාධා කිරීමක්] මොකක්ද? ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක් බලාගෙනද කියවන්නේ? [බාධා කිරීමක්] ඔබතුමා මොකක්ද ඔය කියවන්නේ?

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
කියවන්නේ, සේවකයන් දීලා තිබෙන ප්‍රශ්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා කියෙව්වාද, මේ පනත් කෙටුම්පත?

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
කියෙව්වා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මොකක්ද මෙහි තිබෙන්නේ?

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ඒක තමයි ඔබතුමාට- [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
රණවීර මන්ත්‍රීතුමා, නිකම් බොරුවට කෑ ගහන්නේ නැතිව කරුණාකර මුදල් මණ්ඩලය අයින් කරලා තිබෙන්නේ කොහේද කියලා පෙන්වන්න.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
වහලා ගහන්න ලෑස්ති වෙන්න එපා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මොකක්ද?

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
වහලා, ගහන්න ලෑස්ති වෙන්න එපා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
වහලා ගහන්න ඕනෑ නැහැ. Openly මේ කතා කරන්නේ.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
වහලා, ගහන්න ලෑස්ති වෙන්න එපා.'

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
වහලා ගහන්නේ නැහැ. ඔබතුමා කරුණාකර මේක කියවන්න. නිකම් කෑ කෝ ගහන්න එපා. මේක ප්‍රාදේශීය සභාව නොවෙයි.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
අපොයි ඔව්!

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Therefore, any debenture issued for its regulatory capital purposes will be in accordance with the direction of the Monetary Board of the Central Bank of Sri Lanka. Central Bank එකෙන් කොහොමත් capital adequacy එක regulate වෙනවා; නියාමනය වෙනවා. Capital adequacy එක අඩු නම් Central Bank එක බැංකුවලට කියනවා, කරුණාකර capital adequacy එක වැඩි කර ගන්න කියලා. ඇත්ත වශයෙන්ම මේ රජය විසින් මීට කලින් වාර කිහිපයකදීම මේකට authorized capital බිලියන 12.5ක් දීලා තිබෙනවා. අපි කරන්න යන්නේ මහජන බැංකුව ශක්තිමත් කිරීමයි. [බාධා කිරීමක්] රණවීර මන්ත්‍රීතුමා, ඔබතුමා අහගෙන ඉන්න. ඔබතුමාත් එක්ක තරහට නොවෙයි මා මේ කියන්නේ. මා මේ කරුණු පැහැදිලි කරනවා. [බාධා කිරීමක්] ඔය කියන කතා මේ Amendment එකත් එක්ක කියවා බලන්න. ඊට පසුවත් ඔබතුමාට ප්‍රශ්න තිබෙනවා නම් අහන්න. අවසාන ප්‍රශ්න තුන- [බාධා කිරීමක්]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු අමාත්‍යතුමනි, -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු ඇමතිතුමනි, 1961 පනතේ 20. (1) උපවගන්තියේ සඳහන් වෙන්නේ මෙහෙමයි:

"දීර්ඝ කාලීන සහ මධ්‍ය කාලීන ණය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, 15 (1) (ආ) වගන්තිය යටතේ රජය විසින් බැංකුවට ණයට දෙනු ලැබූ මුදල්වලට අතිරේකව, (2) වැනි උපවගන්තියේ හා මේ පනත යටතේ කලින් කල පැනවිය හැකි නියෝගවල විධිවිධානවලට යටත්ව ණයකර නිකුත් කිරීමෙන් මුදල් රැස් රැස් කළ හැකි ය. නැතහොත් බැංකුව වෙනුවෙන් එබඳු මුදලක් එසේ රැස් කිරීමට මුදල් ඇමතිවරයාගේ එකඟත්වය සමඟ ඇමතිවරයාගේ අනුමතිය ඇති ව ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙන් ඉල්වා සිටිය හැකි ය."

ගරු ඇමතිතුමනි, මේ වගන්තිය අනුව ඉතා පැහැදිලියි නේ. මුදල් මණ්ඩලයේ අනුමැතිය තමයි මේකට අවශ්‍ය වන්නේ, "....ඉල්වා සිටිය හැකියි." කියලා. හැබැයි, තමුන්නාසේලා 'මුදල් මණ්ඩලය' කියන එක මෙතැනින් ගලවනවා. ඒකට උත්තරයක් දෙන්න. එම වගන්තිය සංශෝධනය වෙලා තිබෙනවා. එතකොට 'මුදල් මණ්ඩලය' කියන එක නැහැ. ඒක තමයි, ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමාත් කිව්වේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඕනෑම බැංකුවක් මේ වාගේ capital raising එකකට යනවා නම්, එහෙම නැත්නම් share capital එක තව වැඩි කරනවා නම්, ඒ සියලු දේවල් මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරන් ඕනෑ. මුදල් මණ්ඩලය තමයි සියලු බැංකු නියාමනය කරන්නේ. එතකොට [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මම ඔබතුමාට අවස්ථාව දුන්නා නේ. ඊළඟට, මේ වගන්තියේ තිබෙනවා නේ, "මුදල් ඇමතිවරයාගේ අනුමතිය සහිතව" කියලා. නමුත් මෙතැන උත්සාහයක් තියෙනවා, "මුදල් ඇමතිවරයාගේ අනුමැතියත් අවශ්‍ය නැහැ, මහ බැංකුවේ අනුමැතියත් අවශ්‍ය නැහැ" කියලා කියන්න. ඕනෑම බැංකුවක් මෙවැනි ක්‍රියාවලියකට ඉදිරිපත් වෙනකොට, එය නියාමනය කරන මහ බැංකුවේ අනුමැතිය ලබා ගන්න ඕනෑ. නිකම් දෙකයි පනහේ තේ කඩයක් වාගේ එකක් නොවෙයි, මේක නියාමනය කළ බැංකුවක්. නියාමනය කළ බැංකුවක් යම්කිසි විධියකට කොටස් නිකුත් කරනවා නම්, පෞද්ගලික බැංකුවක්, debentures issue කරනවා නම්, ඒකට මහ බැංකුවේ අනුමැතිය ලබා ගන්න ඕනෑ. එච්චරයි මම කියන්නේ. එතැනින් එහාට මේ ගැන සාකච්ඡා කරන්න ඕනෑ නැහැ.

ඊළඟ කාරණය මේකයි. It is also viewed that the proposed repeal of Section 43. (2) (c) removes the authority of the Minister of Finance in any say whatsoever -

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
ගරු ඇමතිතුමනි, මේ සභාව නොමඟ යවන්න එපා. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා දෙපළම අහන්නේ එකම ප්‍රශ්නය නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාට කථා කරන්න අවස්ථාවක් තිබෙනවා. එතකොට පැහැදිලි කරන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
මම කියන්නේ මේ සභාව නොමඟ යවන්න එපා කියන කාරණයයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම සභාව නොමඟ යවන්නේ නැහැ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, නියාමනයකට යටත් ඕනෑම ආයතනයක්, යම්කිසි ප්‍රධාන තීරණයක්, වැදගත් තීරණයක් ගන්නකොට ඒ දේවල් තමන් නියාමනය කරන ආයතනයට ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම නැතිව, ඒ අයට නිකම් තේ කඩයක්, filling station එකක් වාගේ කටයුතු කරන්න බැහැ. මහ බැංකුවේ නියාමනයට යටත්ව තමයි මේ සියලු දේවල් කරන්නේ. මහ බැංකුවේ නියාමනය කියන එක මේ සංශෝධන නිසා අයින් වෙන්නේ නැහැ.

අනික් කාරණය මේකයි. [බාධා කිරීමක්] වාඩි වෙලා මම කියන දේ පොඩ්ඩක් අහගන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලාට ඊළඟට කථා කරන්න අවස්ථාව තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමනි, ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා කථා කරනකොට ඔය කාරණා කියන්න.

ඊළඟ කාරණය තමයි, ඇමතිතුමාගේ බලය මෙයින් අයින් වෙනවාද කියන එක. That is, the authority of the Minister of Finance. ඒකටත් උත්තරය, no. The proposed Amendment to Section 20 (1) includes the following.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේ කාරණයත් කියලා කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

That is, "Raise with the approval of the Minister". එතකොට, ඇමතිවරයාගේ අනුමැතිය නැතිව මේක කරන්න බැහැ. නමුත් "ඇමතිවරයාගේ අනුමැතිය නැහැ, මහ බැංකුවේ අනුමැතිය නැහැ" කියලා කවුරු හෝ කියනවා නම්, ඒක විශ්වාස කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඇත්තටම ඒ කථා සාවද්‍යයි. [බාධා කිරීමක්] අනේ, බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, මගේ වෙලාවත් ඉවරයි නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Can the Bank issue convertible debentures?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
It is a good question: can the Bank issue convertible debentures? The answer to that is, no. Hon. Member, I will come to that after taking up the last two questions.

The next question is, is there a possibility that these debentures intended to be issued for regulatory capital purposes could convert to equity at some point? ඔබතුමා හරියටම ඒ ප්‍රශ්නය ඇහුවා. Can they be converted to equity at some point? ඔබතුමා අහන්නේ වැදගත් ප්‍රශ්නයක්. ඒ කියන්නේ, අපි ණයකර නිකුත් කරනවා. යම්කිසි කාලයකට පස්සේ, ඒ ණයකර ගෙවන්න සිදුවුණු අවස්ථාවකදී ඒක කොටස් බවට පරිවර්තනය කරන්න පුළුවන්ද? එහෙම ජාතියකුත් තියෙනවා. හැබැයි, මෙතැන එහෙම එකක් නැහැ, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි. ඉතාම ඕනෑකමින්, මම මෙන්න මේ කාරණය කියන්න කැමැතියි. So, the answer is, no. Until and unless Section 13 is amended, the People's Bank does not have a legal right to issue any share to any other party who is not ultimately the Government of Sri Lanka.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි. අතිරේක කාලයක් මේ දීලා තිබෙන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

13වන වගන්තිය සංශෝධන කළේ නැත්නම්, ඉදිරිපත් කරන ණයකර, කාලය ගෙවුණාට පස්සේ කොටස්වලට පරිවර්තනය කරගන්න කිසිසේත්ම හැකියාවක් නැති බව ඉතාම පැහැදිලියි. 13වන වගන්තිය මෙතැනදී සංශෝධනය වෙන්නේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමා, ඔබතුමන්ලා "shareholder" කියන එකේ definition එක අයින් කරනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, නැහැ. "Shareholder" කියන එකේ definition එක අයින් වෙන්නේ නැහැ. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, මම

සද්භාවයෙන් මේක කියන්නේ. මම ඔබතුමා මුළා කරන්න හදන්නේ නැහැ. මම තොරතුරු ඉල්ලා ගත්තේ මහජන බැංකුවෙන්. ඔවුන් දීලා තිබෙන විස්තර සම්පූර්ණයෙන් සත්‍යයයි කියලා මා විශ්වාස කරනවා.

The last question is, did the Attorney-General provide his concurrence, make no objection for the proposed Amendments? නීතිපතිතුමා මේකට අනුමැතිය දීලා තිබෙනවාද කියන එක තමයි ඊළඟ ප්‍රශ්නය. ඒකට උත්තරයත් "ඔව්" කියන එක තමයි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.05]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු හර්ෂ ද සිල්වා අමාත්‍යතුමාගේ කථාවෙන් පසුව, මෙම පනත් කෙටුම්පත පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට මට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත කියන්නේ, සැක කටයුතු පනත් කෙටුම්පතක්ය කියන එක දැන් ගරු හර්ෂ ද සිල්වා අමාත්‍යතුමාගේ කථාවෙනුත් පැහැදිලිව ඔප්පු වෙලා හමාරයි. මේක සැක කටයුතු සංශෝධනයක් බවට පත් වෙන්නේ සහ මේ සංශෝධනය ගෙන එන්නේ කුමන කරුණක් අරභයාද කියන එක පිළිබඳව මුළු මහත් බැංකු ප්‍රජාවත් මේ රටේ සබුද්ධික ජනතාවත් සැකයෙන් බලන්නේ ඇයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

අපි දන්නවා, නව ලිබරල්වාදී කොල්ලකාරී ආර්ථික ප්‍රතිපත්තිය මේ රටට හඳුන්වා දුන් දවසේ ඉඳලා රාජ්‍ය බැංකු විකුණාගෙන කෑමේ වුවමනාව විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය බලයට පත් වූ හැම අවස්ථාවකම තිබුණු බව. මෙතුමන්ලා හැම අවස්ථාවකම, රාජ්‍ය බැංකු ටික විකුණා ගැනීමේ වුවමනාවෙන් වැඩ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා බැංකු සේවක සංගමය සහ ප්‍රධාන බැංකුවල වෘත්තීය සමිති, ඒ වාගේම මේ රටේ බහුජන ව්‍යාපාර ඒ හැම අවස්ථාවකම ඊට එදිරිව කටයුතු කළ නිසා මේ බැංකු ටික විකුණන්න බැරි වුණා. දැන් මේ සැරසෙන්නේ වෙන මොකටවත් නොවෙයි. කියමනක් තිබෙනවා නේ, "යන යකා කොරහත් බිඳගෙන යනවා" කියලා. මේ යහ පාලන ආණ්ඩුව ගෙදර යන්න හදන්නේ මහජන බැංකුවත් විකුණාගෙන කාලා බව තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. ගරු හර්ෂ ද සිල්වා අමාත්‍යතුමා දැන් අසරණ වුණා නේ.

ටී.බී. ඉලංගරත්න මැතිතුමා, ඒ ශ්‍රේෂ්ඨ අමාත්‍යවරයා මේ බැංකුවේ ආරක්ෂාව වෙනුවෙන් 1961දී මහජන බැංකු පනතට තැබූ මුර ගල් ටිකක් තිබෙනවා. 1961 පනතේ 12වන වගන්තිය සහ 13වන වගන්තිය කියන්නේ ඒ මුර ගල්. 1961 පනතේ 20වැනි වගන්තිය කියන්නේත් මුර ගලක්. දැන් ඒ මුර ගල්වලින් 13වන වගන්තිය කියන මුර ගල ගලවනවා; වෙනස් කරනවා. 20වන වගන්තිය කියන මුර ගලත් ගලවනවා. කොහොමද ගලවන්නේ? අපි එහෙම කිව්වාම අපේ ගරු ඇමතිතුමා කියනවා, "නැහැ" කියලා. ඔබතුමා හරියට කිව්වේ නැහැ, ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමනි. එම වගන්තිය මම නැවත උපුටා දක්වන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කවදා පනතක් ගැනද ඔබතුමා කිව්වේ, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
1961 පනත ගැනයි මම කිව්වේ. මෙන්න, එම වගන්තිය. මම කියවන්නම්.

> "දීර්ඝ කාලීන සහ මධ්‍ය කාලීන ණය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, 15 (1) (ආ) වගන්තිය යටතේ රජය විසින් බැංකුවට ණයට දෙනු ලැබූ මුදල්වලට අතිරේකව, (2) වැනි උපවගන්තියේ හා මේ පනත යටතේ කලින් කල පැනවිය හැකි නියෝගවල විධිවිධානවලට යටත්ව ණයකර නිකුත් කිරීමෙන් මුදල් රැස් රැස් කළ හැකි ය. නැතහොත් බැංකුව වෙනුවෙන් එබඳු මුදලක් එසේ රැස් කිරීමට මුදල් ඇමතිවරයාගේ එකඟත්වය සමඟ ඇමතිවරයාගේ අනුමතිය ඇති ව ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙන් ඉල්වා සිටිය හැකි ය."

ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමනි, ඒ තමයි 1961 පනතේ 20වැනි වගන්තිය. දැන් තමුන්නාන්සේලා ඒක සංශෝධනය කරනවා. සංශෝධනය කරන්නේ කොහොමද? මෙහෙමයි සංශෝධනය කරන්නේ. මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පතේ 20 (1) උප වගන්තිය යටතේ මෙහෙම සඳහන් වෙනවා:

> "දීර්ඝ කාලීන සහ මධ්‍ය කාලීන ණය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා 15 (1) (ආ) වගන්තිය යටතේ බැංකුව වෙත රජය විසින් ණයට දෙනු ලබන මුදල්වලට අතිරේකව, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව බැංකුව විසින් ඍණපත්‍ර නිකුත් කිරීම මඟින් මුදල් රැස්කරනු ලැබිය හැකි ය."

මෙතැන මුදල් මණ්ඩලය කෝ? මුදල් මණ්ඩලය හලන්නේ ඇයි? 13වැනි වගන්තියේ කොටස් අර්ථ නිරූපණය කරලා තිබෙනවා. ඒකත් හැලුවා, ඒකත් ඉතා සියුම් ලෙස ගලවා දැම්මා. 20වැනි වගන්තියේ තිබෙන මුදල් මණ්ඩලයත් සියුම් ලෙස ගලවලා දමනවා. තමුන්නාන්සේලා මේ එන්නේ මොකටද? තමුන්නාන්සේ කිව්වා, issue කරන්නේ convertible debentures නොවෙයි කියලා. Convertible debentures නොවෙයි කියලා තමුන්නාන්සේට තිබෙන සහතිකය මොකක්ද? ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ ගැන පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි මට මේ තිබෙන්නේ. ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමනි, 1961 පනතේ 20වැනි වගන්තියේ තිබෙන මුදල් මණ්ඩලයේ බලය පිහිටුවන සංශෝධනයක් අපි ගෙනෙනවා. ඔබතුමා කරුණු කිව්වේ සද්භාවයෙන් නම්, කරුණාකර අපේ සංශෝධනය ඇතුළත් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මට තත්පරයක් දෙන්න, ගරු මන්ත්‍රීතුමනි. මෙතැන මූලික ප්‍රශ්නය තිබෙන්නේ අයිතිකරු සම්බන්ධයෙන් නේ. Shareholdersලා කවුද කියන එක නේ. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයත් ඒකයි. ඔබතුමන්ලා කථා කරන්නේ 1961 පනත ගැනයි. එතකොට 1980 සංශෝධනය ගැන ඔබතුමන්ලා කථා කරන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, 1980දී මේ පනත සංශෝධනය කරනකොට, මේ "shareholder" කියන එක අයින් වෙලා තිබෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු ඇමතිතුමනි, කෙටි පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන්න. මගේ වේලාව යනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක අයින් වෙන්න හේතුව තමයි, මෙහි අයිතිකරු වෙන්නේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා කියන එක 13වැනි වගන්තියේ ඉතා පැහැදිලිව සඳහන් වීම. මහා භාණ්ඩාගාරය කියන එක. එතකොට මෙය රජයේ ආයතනයක් බව, රජයට සම්පූර්ණ කොටස් හිමි බව 1980 සංශෝධනයේ සඳහන් කරලා තිබෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවට හුඟක් වේලාව තිබුණා නේ. ඔබතුමා 20 වගන්තිය සම්බන්ධයෙන් පිළිතුරක් දුන්නේ නැහැ නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 13වැනි වගන්තියත්, 20වැනි වගන්තියත් එකට කියවන්න ඕනෑ. මෙහි අරමුණ වෙන මොකක්වත් නොවෙයි. බාසල් සම්මුතිය කියන්නේ දේව භාෂිතයක් නොවෙයි. හර්ෂ ද සිල්වා ඇමතිතුමා කියනවා, "බාසල් සම්මුතියේ රෙගුලාසිවලට පිටින් අපට වැඩ කරන්න බැහැ" කියලා. බාසල් සම්මුතිය නොපිළිගන්න බැංකු ලෝකයේ තිබෙනවා. බාසල් සම්මුතියට පයින් ගහපු බැංකු ලෝකයේ තිබෙනවා. බාසල් සම්මුතිය කියන විධියටම වැඩ කරන්න ඕනෑ කියලා එකක් නැහැ. ඒක දේව භාෂිතයක් නොවෙයි. නමුත් ඒක දේව භාෂිතයක් කියලා මෙතුමන්ලා පිළිගන්නවා නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන බැංකුව අවුරුද්දකට රුපියල් බිලියන 18ක ලාභයක් ලබනවා. ඒ ලාභයෙන් සියයට 65ක්, 70ක් ගන්නේ ආණ්ඩුව. රජයේ මැදිහත්වීම තව තවත් මේ ආයතනයට ලබා දෙනවා නම්, ප්‍රාග්ධනය රැස් කර ගන්න පුළුවන්. එහෙම කරන්න පුළුවන්කම තිබෙනවා. නමුත් ඒක කරන්නේ නැහැ. තව ඕනෑ තරම් විකල්පවලට යෑමේ හැකියාවත් තිබෙනවා. එහෙම විකල්පවලට නොගිහින්, ණයකර නිකුත් කරලා මේ කරන්න හදන්නේ මොකක්ද? මේ බැංකුව ටික ටික මරන්න, මේ බැංකුවේ රාජ්‍ය භාරය ටික ටික මරන්න තමයි මේ ලැහැස්ති වෙන්නේ. මේ කරන්න හදන්නේ වෙන මොකක්වත් නොව මහජන බැංකුව නැමැති ජාතියේ මහා ආරක්ෂකයා, ආර්ථිකයේ ආරක්ෂකයා විකුණන්න තමයි මේ ලැහැස්ති වෙන්නේ. එහෙම නොවෙයි නම්, අපි හර්ෂ ද සිල්වා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා 20වැනි වගන්තිය සංශෝධනය කරන්න එපා කියලා. එසේ නොවනවා නම්, නැවතත් 1961 පනත ප්‍රකාරව 20වැනි වගන්තිය නැවත තියන්න කියන ඉල්ලීම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බැංකුවල මුදල් මොන තරම් ප්‍රමාණයක් නාස්ති කරනවාද කියලා අපි දන්නවා. දැන්, "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" නමින් රට පුරා ප්‍රදර්ශනයක් කරනවා. ඊයේ පෙරේදා කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රදර්ශන තිබුණා. මහ විශාල ක්‍රීඩා පිට්ටනි මැද්දේ සවි කරන හැම tent එකකටම, තාවකාලිකව සකස් කරන කුඩාරම්වලට AC සවි කරනවා. ඒ සඳහා බැංකුවලින් රුපියල් මිලියන 30, 40 ගන්නවා. මෙහෙම තමයි මහජන බැංකුවේ, ලංකා බැංකුවේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සහ රාජ්‍ය බැංකුවල මුදල් ටික මෙතුමන්ලා කාබාසිනියා කරන්නේ. මුදල් කාබාසිනියා කර කර, ඒ බැංකුව පෞද්ගලික අංශයට විකිණීමට හෙමින් හෙමින් පාර කපනවා. ප්‍රාග්ධනය වැඩි කර ගැනීම සඳහා බාසල් සම්මුතිය අනුව ණයකර නිකුත් කරන බව කියනවා. මේ මොහොත වන විට මහජන බැංකුවේ ප්‍රාග්ධන ඌනතාවක් නැහැ, ප්‍රාග්ධන අවශ්‍යතාවක් නැහැ. ඉදිරියේදී අවශ්‍ය වෙයි. හැබැයි ඉදිරියේදී අවශ්‍ය වෙනවා නම්, 1961 පනත මඟින් ණයකර නිකුත් කිරීමේ හැකියාව ඕනෑ තරම් දීලා තිබෙනවා. එහෙම දීලා තිබෙන්නේ මහ බැංකුවේ අධීක්ෂණය, මහ බැංකුවේ නියාමනය, මුදල් මණ්ඩලයේ නියාමනය පරිදියි. මුදල් මණ්ඩලයේ ඒ නියාමනය ගලවන්නේ වෙන මොකකටවත් නොවෙයි, මුදල් අමාත්‍යවරයාට ඒ බලය පවරන්නේ වෙන මොකකටවත් නොවෙයි. ඔය අගමැතිවරයාම නේ මහ බැංකුව බින්දේත්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන ප්‍රශ්නය සාධාරණයි. එය අසාධාරණයි කියලා මම කියන්නේ නැහැ. ඔබතුමා හිතන්නේ අපි මේ ගෙනෙන සංශෝධනයෙන් මහ බැංකුවට තිබෙන අයිතිය ඉවත් කරනවා කියලායි. මම කියවන්නම්, මහ බැංකුව නිකුත් කරන Banking Act Directionsවල බැංකු සම්බන්ධයෙන් තිබෙන්නේ මොකක්ද කියලා. ඔබතුමා ඒක පොඩ්ඩක් අහගන්න. එහි මෙසේ සඳහන් වනවා:

"Prior approval of the Monetary Board is required for inclusion of capital instruments/term debt in Tier 2 capital."

ඒ කියන්නේ, කිසිම බැංකුවකට මහ බැංකුවේ අනුමැතිය නැතිව මෙවැනි ණයකර නිකුත් කරන්න, සුරැකුම්පත් නිකුත් කරන්න, shares නිකුත් කරන්න බැහැයි කියලා.

ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම ඕනෑකමින් ඔබතුමාට නැවතත් මෙය කියනවා. මම ඉස්සෙල්ලාත් ඇත්ත තමයි කථා කළේ. දැනුත් ඒක තමයි කියන්නේ. එහි සඳහන්ව තිබෙනවා, නියාමනය වන ඕනෑම බැංකුවක් ණයකර නිකුත් කරනවා නම්, මහ බැංකුවේ අනුමැතිය ගත යුතුයි කියලා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමනි, මේ කරුණ හරි සරලයි. එම නිසා ඔබතුමන්ලා මේ කොටස ඇතුළත් කරන්න. මේ කොටස පනතින් ගලවන්න එපා. අපි කියන්නේ මේ කොටස ගලවන්න එපා කියලායි. මේක ගලවන්නේ ඇයි? [බාධා කිරීමක්] මගේ වෙලාව තමයි ඔබතුමා ගන්නේ. එහෙම නම්, කරුණාකරලා මට වෙලාව දෙන්න. මගේ වෙලාව මෙච්චර හුඟක් ගන්න එපා. ඔබතුමන්ලා මේක සද්භාවයෙන් කරන්න ඇති.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා ඇමතිතුමනි, ඔබතුමා කෙටි පැහැදිලි කිරීමක් කරන්න. ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාගේ වෙලාව අවසන් වනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමනි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීමක් හැටියට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ ඇයි කියලා බිමල් රත්නායක මන්ත්‍රීතුමාත් ඇහුවා. මම දැන් මහජන බැංකුවේ legal officersලාගෙන් මේ ගැන ඇහුවාම ඔවුන් මට කිව්වා, 1961 පනත තමයි original පනත කියලා. 1961, 1963, 1965, 1969, 1973, 1978, 1980, 1986 වර්ෂවලදී ඒ පනතට සංශෝධන ගෙනැල්ලා තිබෙනවා. මේ සියලු සංශෝධන අඩංගු වුණාට මේ මුල් පනත ගෙනාවේ 1961දී. 1961දී ගෙනා පනත අපි කියවිය යුත්තේ මම කලින් සඳහන් කළ 1980 සහ 1986 සංශෝධනත් එක්ක. මේ ගැටලුව දැන් සංකීර්ණ නැහැ, හරිම සරලයි.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව දෙන්න. මට විනාඩි 10යි දීලා තිබෙන්නේ. මෙහෙම කළොත් මට ඒකත් නැතිවනවා. [බාධා කිරීමක්] මෙය හරි සරලයි. අපිත් කියන්නේ ඒක. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව දෙන්න. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, ඔබතුමා දැන් එක එක උපුටා ගැනීම් සහිතව කියනවා නම්, මේක හරි සරලයි. මේ පනත් කෙටුම්පතෙන් මුදල් මණ්ඩලයට තිබෙන වගකීම ගලවන්න එපා. අපි කියන්නේ එච්චරයි. අපිත් මේක කියන්නේ සද්භාවයෙන්. මුදල් මණ්ඩලයේ වගකීම ගලවන්න එපා. ඒ වගකීම ගැලවූ හැටියේ මේක සැක කටයුතු සංශෝධනයක් බවට පත්වනවා. ඒකයි අපි කියන්නේ.

ඊ ළඟ එක, මේවා පැවරිය නොහැකි ණයකර කියලා, convertible debentures නොවෙයි කියලා කොහේවත් සඳහන් වන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරි පැහැදිලියි. මේ යන්නේ වෙන මොකකටවත් නොවෙයි. 1977දී කොල්ලකාරී ආර්ථික ගමන පටන් ගත් දවසේ සිට මේ බැංකු ටිකට කෙළ හළ හළා සිටියා. මේවා විකුණාගෙන කෑමේ වුවමනාව නොසන්සිඳෙන ආකාරයට මේ පරගැති පාලකයන්ට තිබුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉස්සරහ දණින් වැටෙන මේ පාලකයෝ බාසල් සම්මුතිය, අර සම්මුතිය, මේ සම්මුතිය කියලා මේ බැංකු ටික විකුණා ගන්න එදා සිටම උත්සාහ කළා. ලංකා බැංකු සේවක සංගමය ඇතුළු වෘත්තීය සමිති ව්‍යාපාරවල හයිය නිසා, ඒ වාගේම මේ රටේ බහුජන සංවිධානවල මැදිහත්වීම නිසා, මේ රටට ආදරය කරන මිනිසුන්ගේ මැදිහත්වීම නිසා, ව්‍යාපාරවල මැදිහත්වීම නිසා තමයි ඒක නැවතුණේ. මේ යන්න හදන්නේ මේක විකුණා ගෙන කන්න මිසක් වෙන මොකකටවත් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පුංචි මිනිසුන්ගේ බැංකුව බව අපි මතක තබා ගන්න ඕනෑ. 1961දී ඉලංගරත්න මහතා මේක හැදුවේ, පුංචි මිනිසුන් වෙනුවෙන්. රුපියල, රුපියල එකතු කරලා තමයි මේ බැංකුව හැදුවේ. මේ බැංකුවේ තිබෙන්නේ ඒ දහඩිය කඳුළු. ඒ නිසා මේවා විකුණාගෙන කන්න අපට කිසිම අයිතියක් නැහැ. ප්‍රාග්ධනය ශක්තිමත් කර ගැනීම සඳහා, ප්‍රාග්ධනය වැඩි කර ගැනීම සඳහා වෙන විකල්ප නැද්ද? විකල්ප ඕනෑ තරම් තිබෙනවා. විකල්ප තිබියදී ණයකර නිකුත් කිරීම කියලා මේ ලැස්ති වෙන්නේ වෙන මොකටවත් නොවෙයි. මේ ලැස්ති වෙන්නේ, මේ බැංකුවට අත තියන්නයි. මහ බැංකුව කඩපු මහත්වරු! ඇමතිවරයා තමයි මහ බැංකුව කැඩුවේ. අයුතු ලෙස, නීති විරෝධී ලෙස බැඳුම්කර නිකුත් කරන්න කියලා මහ බැංකුවට බිලියන ගණනක පාඩුවක් කරලා, මේ රටේ ජාතිය දණ ගැස්සුවේත් ඇමතිවරයා. ඇමතිවරයාට බලය දීම හරහා සිද්ධ වෙන්නේ මහජන බැංකුව විකුණා කෑම මිස වෙන කිසිවක් නොවන බව අපි අවධාරණය කරනවා. අපි ඉදිරිපත් කරනවා අවශ්‍ය සංශෝධනය. 1961 වර්ෂයේ ගෙනා පනතේ තිබෙන 20 වගන්තිය ඒ ආකාරයෙන්ම මේ සංශෝධනයට ඇතුළත් කළොත් මිසක් මේ ගෙනෙන සැක කටයුතු සංශෝධනයට, මහජන බැංකුව විකුණා කන සැලැස්මට පක්ෂ වෙන්න එපා කියලා මා කියනවා. මහජනයාගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ආපු, මහජනයාට වග කිවයුතු හැම මන්ත්‍රීවරයෙකුගෙන්ම අපි ඉල්ලා සිටිනවා, මේ අපරාධයට දායක වෙන්න එපා කියලා. ජාතියේ ආරක්ෂකයා වෙච්ච මහජන බැංකුව විකුණාගෙන කෑම නැවැත්වීම සඳහා සියලු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. එම සහයෝගය ලැබෙත්වා කියා අපි ප්‍රාර්ථනා කරනවා. ඒ සංශෝධනය ඇතුළත් කිරීමෙන් මෙපිට මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න අපි ඉඩ දෙන්නේ නැහැ කියන එකත් අවධාරණය කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මියගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ANURA SIDNEY JAYARATHNE *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්නට අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "shareholder" කියන වචනය නිර්වචනය වෙන්නේ නැහැ කියලා 1980දී 20 වන වගන්තිය සංශෝධනය කළාම, "shareholder" කියන වචනය අයින් වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම දැන් මම නැවතත් බැංකුවේ නීතිඥවරුන්ගෙන් ඇහුවාම ඔවුන් කියා සිටින්නේ, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේවත්, ලංකා බැංකුවේවත් එහෙම නිර්වචනය කිරීමක් සිද්ධ වෙන්නේ නැහැ කියලායි. අනෙක් එක තමයි, මෙතැන චෝදනාවක්- [බාධා කිරීමක්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ බැංකුවෙන් නොවෙයි, නීතිපතිතුමාගෙන් ඒ ගැන පැහැදිලි කිරීමක් අරගන්න කියලායි. මොකද, 1961 පනතේ 12 වන වගන්තියේ තමයි "shareholder" කියන වචනය නිර්වචනය කරලා තිබෙන්නේ. වෙන බැංකුවල පනත් ගැන නොවෙයි නේ අපි මේ කථා කරන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒ 1961 පනතේ නේ. 1980 දී ඒක අයින් වෙලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
1980දී අයින් වෙලා නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
1980දී "shareholder" කියලා එකක් නැහැ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දැන් Amendment එක මම ඔබතුමාට පෙන්නුවා නේ. මම screenshot එකක් ඔබතුමාට එව්වේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක හරි. 1980දී වුණේ, ඒ තිබුණු ඡේදය සම්පූර්ණයෙන්ම අයින් කරලා අලුත් ඡේදයක් එතැනට ගෙනෙන එක. 1980දී ඒ අලුත් ඡේදය එනකොට "shareholder" කියන එක නිර්වචනය වෙන්නේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, එහෙම නම් ඔබතුමන්ලා ඉදිරිපත් කරන Bill එක වැරදියි නේ. Bill එක බලන්න. Bill එකේ මොකක්ද තිබෙන්නේ? Bill එකේ තිබෙන්නේ මෙහෙමයි:

"1961 අංක 29 දරන පනතේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම."

එහෙම නම් ඔබතුමන්ලා පනත් කෙටුම්පතට ඇතුළු කරන්න ඕනෑ, "1980" කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
1980දී සංශෝධිත.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම කරන්න බැහැ නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
1980දී සංශෝධිත.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
1980 සංශෝධනය මම ඔබතුමාට screenshot එකක් ගහලා එව්වා නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා කියන එක මම ඉදිරිපත් කරන්නම්. 1961 පනත- [බාධා කිරීමක්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම කියන්නේ, බැංකුවේ නීතිඥයින්ගෙන් නොවෙයි. ඔබතුමා නීතිපතිගෙන් මේ ගැන පැහැදිලි කරගෙන ඒක ඉදිරිපත් කරන්න. අදම නොවෙයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේකට නීතිපතිගේ concurrence එක දීලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඇමතිතුමනි, ඔබතුමා ආණ්ඩු පක්ෂයෙන් වෙලාව අරගෙන පසුව පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තත්පර 15ක් දෙන්න.

ගරු ඇමතිතුමනි, අපේ ප්‍රධාන තර්කය මේකයි. ඔබතුමන්ලා මේ බැංකුව විකුණන්නේ නැත්නම්, මේ අපැහැදිලි තැන් clear කරන එක හොඳයි නේ. අපි කියන්නේ මේ නිසා "shareholder" කියන නිර්වචනය මේ පනතෙන් අයින් වනවා කියන එක.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම නම් 12 වන වගන්තිය තියන්න. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
12 වන වගන්තිය සංශෝධන-[බාධා කිරීමක්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හරි, "shareholder" කියන එකේ නිර්වචනය අයින් වුණාම "shareholder" කවුද? ඔබතුමා නීතිපතිගෙන් ඒක පැහැදිලි කරගෙන අපට කියන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම හොඳයි. ඡන්දයට කලින්, තව දවසක අපි මේ ගැන විවාද කරනවා නේ. ඒ නිර්වචනය අපි අරගෙන දෙන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හැබැයි, බැංකුවෙන් නොවෙයි, නීතිපති දෙපාර්තමේන්තුවෙන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිර්වචනය අරගෙන දෙන්න කටයුතු කරන්න, ගරු ඇමතිතුමනි.

මීළඟට, ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමා.

[අ.භා.4.24]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
ඔබතුමියට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ආණ්ඩු පක්ෂය විසින් මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ කිසිම සූදානමක් නැතිව කියලා අපට පෙනෙනවා. අපි දැක්කා, අපේ ගරු ඇමතිතුමා විටින් විට අර Officials' Booth එකේ ඉන්න නිලධාරින් හම්බ වෙන්න ගිහිල්ලා ඇවිල්ලා, ඒ අය කියන ඒවා මේ සභාවේ කියන බව. මීට වැඩිය වගකීමකින් ඔබතුමන්ලා කටයුතු කරන්න ඕනෑ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා අතැනට යනවා, මෙතැනට යනවා. එතැනින් අහගෙන මේ සභාවේ කියනවා. එහෙම නොවෙයි විය යුත්තේ. වග කිවයුතු ආණ්ඩුවක් හැටියට කටයුතු කරන්න ඕනෑ කියලායි මම මේ ඔබතුමාට කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1961 අවුරුද්දේ මේ පනත ඉදිරිපත් කළේ බොහොම බලාපොරොත්තු ඇතිවයි. එදා හිටපු ටී.බී. ඉලංගරත්න ඇමතිතුමා මේ රටේ ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව මේ පනතෙන් මේ බැංකුව පිහිටුවලා, වින්සන්ට් සුබසිංහ මහත්මයා මෙහි සභාපතිවරයා කරලා, හම්බන්තොට, පොළොන්නරුව වැනි ග්‍රාමීය පළාත්වල මෙහි ශාඛා පිහිටුවලා, ඉතාම ශක්තිමත් ආකාරයට තමයි මේ බැංකුව පවත්වා ගෙන ආවේ. අපි කියන්න ඕනෑ, මේ වෙනකොට මේ බැංකුව ඉතාම ශක්තිමත් තැනක තිබෙනවාය කියලා. මේකේ ශාඛා 738ක් තිබෙනවා. ඒ වාගේම, මේ බැංකුව අපේ රට ජාත්‍යන්තරයට අරගෙන ගිය බැංකුවක්. ද්විභාෂාවෙන් - සිංහල සහ දෙමළ භාෂාවෙන්- බැංකු කටයුතු ආරම්භ කළේ මේ බැංකුවෙන්. ඒ වාගේම චෙක්පත් සම්බන්ධව සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම වැඩ කටයුතු පටන් ගත්තා. ඒ වාගේම අපි දන්නවා, මේ වෙනකොට -2017 වෙනකොට- "The Banker" කියන UK magazine එකේ, ලෝකයේ තිබෙන බැංකු 14ට මහජන බැංකුව නම් කර තිබෙන බව. ඒ වාගේම, Fitch Ratings Lanka ආයතනයෙන් AA plus ලබා දීලා තිබෙන බැංකුවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2018 අවුරුද්දේ ගරු මුදල් අමාත්‍යවරයා අය වැය කථාව ඉදිරිපත් කරනකොට, ප්‍රාග්ධන වෙළෙඳ පොළ ශක්තිමත් කරන්නය කියලා, 2019 වසර වනවිට බාසල් III සම්මුතියෙහි අවශ්‍යතා අනුව බැංකු ක්ෂේත්‍රයේ සපුරා ගත යුතු ඉලක්ක සපුරා ගන්න මේ කටයුත්ත කරනවාය කියලා කිව්වා.

අද ආණ්ඩුව ඉදිරිපත් කරනවා, "1961 අංක 29 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පත" කියලා එකක්. මේ පනත් කෙටුම්පතේ 12 වන වගන්තිය "ප්‍රාග්ධනය" සංශෝධනය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් මේ ප්‍රධාන පනතේ 20 වන වගන්තිය සංශෝධනය කරනවා. මූලික පනතේ 20 වන වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

"බැංකුවට දීර්ඝ කාලීන සහ මධ්‍ය කාලීන ණය ප්‍රදානය කිරීම සඳහා ණයකර නිකුත් කිරීම මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතිය නොමැතිව සිදු කළ නොහැකිය."

හැබැයි, දැන් මේ අලුතින් ගෙනෙන සංශෝධන පනත් කෙටුම්පතින්, "ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතිය නොමැතිව සිදු කළ නොහැකිය" කියන එක හලලා තිබෙනවා. ඇයි ඒ කොටස මේ පනත් කෙටුම්පතින් ඉවත් කළේ කියලායි අපි මේ පුන පුනා මේ ආණ්ඩු පක්ෂයෙන් අහන්නේ.

අපේ මුදල් ඇමතිතුමා නිලධාරින් හම්බ වෙලා ඇවිල්ලා කිව්වා, මේ සියලු කාරණා මහ බැංකු පනතින් ආවරණය වෙනවා කියලා. එහෙම තත්ත්වයක් තිබුණත් අපි සරලව අහන්නේ, ඇයි මේ මුල් පනතේ තිබෙන, "ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතිය නොමැතිව සිදු කළ නොහැකිය" කියන එක ඉවත් කරලා තිබෙන්නේ කියලා. ඒ නිසා අපි පැහැදිලිව ආණ්ඩුවට යෝජනා කරනවා, කරුණාකරලා මේ කටයුත්ත කරන්න එපා කියලා.

இந்த நிலையில், கடந்த மாதம் சனாதிபதி அவர்கள் ஊவா மாகாணத்துக்குச் சென்று, ஹப்புத்தளையில் ஒரு பாடசாலைக் கட்டடத்தைத் திறந்துவைத்த சந்தர்ப்பத்தில், ஊவா மாகாண கல்வி அமைச்சர் இந்தக் கோரிக்கையை சனாதிபதியிடம் முன்வைத்துத் தீர்த்துவைப்பதாக ஊவா மாகாணத்தில் நியமனம் பெற்றவர்களுக்குச் சொல்லியிருக்கக்கூடிய சந்தர்ப் பத்தில், அவரின் வேண்டுகோளுக்கு இணங்க, ஊவா மாகாண முதலமைச்சர் சனாதிபதியின் அறிவுறுத்தலின் பேரில் ஒரு கடிதத்தை எழுதியிருக்கிறார். அந்தக் கடிதம் என் வசம் இருக்கின்றது. இந்தக் கடிதம் எந்த வகையில் ஏற்புடையதாக இருக்கின்றது என்பது தொடர்பில் கல்வி அமைச்சு உரிய நடவடிக்கை எடுக்கவேண்டும் என்ற காரணத்துக்காக, நான்

இந்த உயரிய சபையிலே அதைச் சமர்ப்பிக்கின்றேன். அந்தக் கடிதம் இவ்வாறுதான் சொல்கிறது:

> "The Teacher Assistants have completed degree course and are waiting for the last 02 years for their degree to be verified. In relation to this, Uva Provincial Road Development and Tamil Education Hon. Minister Senthil Thondaman has submitted a request to the President.
>
> His Excellency Maithripala Sirisena has instructed me to speed up the process. Presently, these Teacher Assistants are facing huge difficulties in getting appointment to Grade 3-1 of the Teachers' Service. I kindly request you to take necessary steps to verify their degree at the earliest."

அதாவது, அவர்கள் பெற்றிருக்கின்ற பட்டத்தை உறுதிப் படுத்துமாறு கோரி, "Director General, Examinations Department of Sri Lanka, Pelawatta, Battaramulla" என்ற முகவரிக்கு கடிதம் அனுப்பப்பட்டிருக்கிறது. அவர்கள் பட்டமொன்றைப் பெற்றிருக்கிறார்கள். அதை உறுதிப் படுத்துமாறு பரீட்சை ஆணையாளருக்கு வேண்டுகோளை விடுக்கும் கடிதத்தை ஊவா மாகாண முதலமைச்சர் எழுதியிருக்கிறார். இது தொடர்பில் ஊவா மாகாண தமிழ் கல்வி அமைச்சர் செந்தில் தொண்டமான் சனாதிபதியிடம் வேண்டுகோள் விடுத்திருக்கின்றார். சனாதிபதியின் அறிவுறுத்தலின் பேரிலே இந்தக் கடிதம் எழுதப்பட்டதாகச் சொல்லப்பட்டிருக்கிறது. அங்கே இருக்கின்ற பிரச்சினை, பயிற்சியை முடித்துக்கொண்ட ஆசிரிய உதவியாளர்களுக்கு அந்தப் பயிற்சிச் சான்றிதழ் கிடைக்கப்பெற்றும் அது கல்வித் திணைக்களத்திற்குச் சமர்ப்பிக்கப்பட்டும் அவர்களுக்கு உரிய சம்பளமும் உரிய ஆசிரியர் சேவைத் தரமும் வழங்கப் படவில்லை என்பதுதான். இந்தக் கடிதத்தைப் பார்க்கும்போது பெரும் நகைச்சுவையாக இருக்கின்றது. அதில் ஊவா மாகாண முதலமைச்சர் பரீட்சை ஆணையாளரிடம் கேட்கிறார், அவர்கள் பெற்றிருக்கின்ற பட்டத்தை உறுதிப்படுத்தித் தருமாறு. இந்தக் கடித்தில் உள்ள விடயமும் அந்த ஆசிரிய உதவியாளர்கள் எதிர்நோக்கியிருக்கின்ற பிரச்சினையும் வேறுபட்டதாக இருக்கின்றது. இந்தக் கடிதத்தை எங்களால் புரிந்துகொள்ள முடியவில்லை.

இந்த ஆசிரிய உதவியாளர் சம்பள விடயம் சம்பந்தமாக நான் ஏற்கனவே கலந்தாய்வுக் கூட்டத்திலே அமைச்சர் அவர்களுடன் கலந்துரையாடியிருக்கின்றேன். அதுதொடர் பாக ஏற்பட்டிருக்கக்கூடிய பிரச்சினையை கல்வி அமைச்சர் அவர்கள் நன்றாகப் புரிந்துகொண்டிருக்கின்றார். மத்திய அரசாங்கத்தினால் வழங்கப்பட்ட இந்த வேலைவாய்ப்பு எல்லா மாகாணங்களுக்கும் பகிரப்பட்டபோது, ஒவ்வொரு மாகாணமும் ஒவ்வொரு விதமான தீர்மானத்தை எடுத்திருக்கின்றன. சப்ரகமுவா மாகாணத்திலே அவர்கள் முறையாக உள்வாங்கப்பட்டபோதும் ஊவா, மத்திய மாகாணங்களில் அவர்கள் முறையாக உள்வாங்கப்படாததன் காரணமாக அவர்கள் உரிய தரத்திற்குச் சேர்க்கப்படாமலும் உரிய சம்பளம் பெறாமலும் இருக்கின்றார்கள் என்கின்ற விபரம் தெரிந்து, கல்வி அமைச்சர் அவர்கள் அதற்கான ஒரு முறையான அமைச்சரவைப் பத்திரத்தை மீளவும் சமர்ப்பித்து இவ்வாறு ஆசிரிய உதவியாளர்களாக நியமனம் பெற்ற அத்தனைபேருக்கும் ஒரேயடியான ஒரு தீர்மானத்தைப் பெற்றுக்கொடுக்கின்ற நடவடிக்கையை அந்த அமைச்சரவைப் பத்திரத்தினூடாகப் பெற்றுக்கொடுப்பதாக என்னிடம் உறுதியளித்திருக்கின்றார். அப்படியொரு நிலைமை இருக்கும்போது இந்த நகைச்சுவைக் கடிதம் சம்பந்தமாக கல்வி அமைச்சு உரிய பதிலைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்கின்ற கோரிக்கையை முன்வைக்கின்றேன்.

மேலும், நான் எனது பிரேரணையில் முன்வைத்தவாறு, எல்லாப் பெருந்தோட்டப் பாடசாலைகளையும் அடையாளம் கண்டு, நுவரெலியா மாவட்டத்தை நோக்கி மாணவர்கள் வருவதனால் ஏற்படக்கூடிய சிக்கல்களையும் புரிந்துகொண்டு, பெருந்தோட்ட மாவட்டங்களாக அடையாளம் காணப்பட்ட மாவட்டங்களில் உயர்தரத்தில் கணித, விஞ்ஞான பாடங்களைக் கற்கக்கூடியதாக குறைந்தபட்சம் ஒரு பாடசாலையையேனும் அபிவிருத்தி செய்யவேண்டிய தார்மீகப் பொறுப்பினை - கடமையை கல்வி அமைச்சு ஏற்றுக்கொண்டு செயற்பட வேண்டுமென்ற கோரிக்கையையும் முன்வைக் கின்றேன்.

கண்டி மாவட்டத்தை எடுத்துகொண்டால், இரஜவல தமிழ் வித்தியாலயம் தேசியப் பாடசாலையாக இருக்கின்றபோதும் கூட அங்கே உயர்தர கணித, விஞ்ஞான பிரிவுகள் இயங்குவதில்லை என்கின்ற குற்றச்சாட்டு இருக்கின்றது. பேராதனை இந்துக் கல்லூரியில் ஏற்கனவே விஞ்ஞானப் பிரிவிற்கு ஆசிரியர்கள் இருந்தபோதும்கூட மாணவர்கள் குறைவாக இருக்கிறார்கள் என்ற காரணத்திற்காக அங்கேயிருந்த விஞ்ஞான பாடத்திற்கான ஆசிரியர்கள் வேறு பெரிய பாடசாலைகளுக்கு மாற்றப்பட்டு, அங்கு விஞ்ஞானத் துறையே இல்லாமலாக்கப்பட்டிருக்கின்றது. கல்வியில் திட்டமிட்டுப் புறக்கணிக்கப்பட்ட இந்த சமூகம் இப்போது தாங்களாகக் கஷ்டப்பட்டு முன்வந்து கணித, விஞ்ஞானத் துறைகளில் தங்களின் கல்வியைத் தொடர்வதற்கான வாய்ப்பை நிறைவேற்றிக்கொள்ளக்கூடிய சந்தர்ப்பத்தை அடைகின்றவேளையில், அரசாங்கம் என்கின்ற வகையில் பொறுப்பாக அத்தகைய பாடசாலைகளை அபிவிருத்தி செய்து அவர்களுக்கு உதவ வேண்டுமே தவிர, இருக்கின்ற, கிடைக்கக்கூடிய வளங்களையும் இல்லாமலாக்கி, பாடசாலைகளில் இருக்கின்ற ஆசிரியர்களையும் இடம் மாற்றுகின்ற வேலைகளைச் செய்ய முடியாது என்ற அடிப்படையில், ஒவ்வொரு மாவட்டத்திலும் குறைந்தபட்சம் ஒரு பாடசாலையையேனும் உயர்தரத்தில் விஞ்ஞான, கணித பாடங்களைக் கற்பதற்கான பாடசாலையாகத் தரமுயர்த்துவதற்கோ அல்லது புதிதாக உருவாக்குவதற்கோ நடவடிக்கையெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொண்டு, வாய்ப்புக்கு நன்றி கூறி விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. යෝජනාව ස්ථිර කිරීම, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා.

[பி.ப. 5.34]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சக உறுப்பினர் கௌரவ திலகராஜா அவர்களால் முன்வைக்கப் பட்டிருக்கின்ற இன்றைய இந்தச் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையை வழிமொழிந்து என்னுடைய கருத்துக்களையும் முன்வைக்க விரும்புகின்றேன். குறிப்பாக பெருந்தோட்டப் பிரதேசங்களை மையப்படுத்தி அந்தப் பிரதேசங்களில் உள்ள மாணவர்களுக்கு உயர்தரத்தில் கணித, விஞ்ஞான பாடங்களைக் கற்பதற்கான கல்லூரிகள், பாடசாலைகள் கட்டியெழுப்பப்பட வேண்டுமென்ற இந்தப் பிரேரணை காலத்தின் ஒரு தேவையாக இருக்கின்றது. இந்த இடத்திலே நான் ஒரு விடயத்தை ஞாபகப்படுத்த வேண்டும். எங்களுடைய நல்லாட்சி அரசாங்கம் ஏற்படுத்தப்பட்டு, அதிலே கல்வி இராஜாங்க அமைச்சராக எங்களுடைய கௌரவ

[ගරු වේලු කුමාර් මහතා]

இராதாகிருஷ்ணன் அவர்கள் செயற்பட்டபோது, மலையகப் பெருந்தோட்டங்களை மையப்படுத்தி உயர்தரத்திலே கணித, விஞ்ஞான கற்றல் தொடர்பாக அவரினால் முன்மொழியப் பட்டு, பெருந்தோட்ட மாணவர்கள் இருக்கின்ற பிரதேசங்களில் 25 பாடசாலைகள் தெரிவுசெய்யப்பட்டு, கணித, விஞ்ஞான பிரிவுகளைக் கொண்ட பாடசாலைகளாக அவற்றைத் தரமுயர்த்துவதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டன.

ஒரு வகையில் இந்தப் பிரேரணையின் உள்ளடக்கத்தில் இருக்கக்கூடிய ஒரு பகுதி கொள்கையளவில் கல்வி அமைச் சினால் ஏற்றுக்கொள்ளப்பட்டு, ஓர் ஆரம்பம் ஏற்படுத்தப் பட்டிருந்தாலும்கூட, இன்று மீண்டும் இத்தகைய ஒரு பிரேரணையைக் கொண்டு வந்திருப்பதற்கான காரணம், அந்த ஆரம்பமானது தொடர்ந்து முன்னெடுக்கப்படாமல் செயலிழந்த நிலையில் காணப்படுவதை எடுத்துக்காட்டுவதாக இருக்கின்றது. பெருந்தோட்டப் பிரதேசங்களிலுள்ள 25 பாடசாலைகளைத் தெரிவுசெய்து, அவற்றுக்கு கணித, விஞ்ஞான பாடப்பரப்புகளை மேற்கொள்வதற்கு, குறிப்பாக 10 மில்லியன் பெறுமதியான அவசியமான வளங்களைப் பெற்றுக்கொடுப்பதற்கான ஆயத்தங்களை மேற்கொள்ள கொள்கை அடிப்படையில் இணங்கினாலும்கூட, இந்தப் பாடசாலைகள் உருவாக்கி நடத்தப்படவேண்டுமென்ற அந்தச் செயற்பாடு முழு முயற்சியோடு முழுமையாக முன்னெடுக்கப் படாது, ஒரு பெயரளவிலானதாக மட்டுமே நடைபெற்றதாக இருக்கின்றது.

பெருந்தோட்டப் பகுதியில், குறிப்பாக நுவரெலியாப் பகுதியில் இருக்கக்கூடிய குறிப்பிட்ட பாடசாலைகளில் கணித, விஞ்ஞான கற்கைகளின் பெறுபேறுகள் சிறப்பாக இருக்கின்றமையும், கற்றல் தரம் உயர்வாகக் காணப்படுகின்ற மையும், அதனை அண்டி இருக்கின்ற இரத்தினபுரி மாவட்டமாக இருக்கலாம், கேகாலை மாவட்டமாக இருக்கலாம், கண்டி, மாத்தளை மாவட்டங்களாக இருக்கலாம், இவற்றிலே குறிப்பிட்ட மாவட்டங்களில் கணிதம், விஞ்ஞானம் கற்பதற்கான பாடசாலைகளே இல்லாத நிலையில், கண்டி மாவட்டத்திலே குறித்த பாடசாலைகள் இருந்தாலும்கூட, அவற்றினது தரம் மிக மோசமான நிலையில் இருப்பதனால், இந்த எல்லாப் பகுதிகளிலுள்ள மாணவர்களும் நுவரெலியாவை நோக்கிப் படையெடுத்துச் செல்கின்ற ஒரு நிலைமையைப் பற்றித்தான் என்னுடைய சக உறுப்பினரால் எடுத்துக்காட்டப்பட்டது. கடந்த நான்கரை வருட காலத்தினுள் ஓர் ஆரம்ப முயற்சி மேற்கொள்ளப்பட்டாலும், அதனைத் தொடர்ந்து உறுதியாக நின்று, அந்த நிலைமையை உருவாக்கு வதற்குரிய நடவடிக்கையை கல்வி அமைச்சு மேற்கொள்ள வில்லை என்பதனை இந்த இடத்திலே சுட்டிக்காட்ட வேண்டியிருக்கின்றது.

ஏற்கெனவே கௌரவ உறுப்பினர் திலகராஜா அவர்களது உரையில் குறிப்பிட்டதுபோல, இன்று மலையகத்தின் கல்வியிலே மறுமலர்ச்சி ஏற்பட்டு விஞ்ஞான, கணித ரீதியிலான கற்கைகளை நோக்கி மாணவர்கள் நகர்ந்து வருகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. அதிலே அந்த மாணவர்களுக்கு மிக முக்கியமாகத் தேவையானது அவர்களுக்கான வளங்கள். குறிப்பாக, ஆளணி வளம் - ஆசிரியர்கள். அங்கு இந்த ஆசிரியர் பற்றாக்குறை பாரிய ஒரு சிக்கலான, பாரிய ஒரு சவாலான பிரச்சினையாகக் காணப்படுகின்றது. குறிப்பாக, கண்டியிலே பேராதனை இந்துக் கல்லூரி ஒரு 1AB தர பாடசாலையாக அல்லது விஞ்ஞான, கணித பாடசாலையாக இருந்தாலும்கூட, அங்கு அந்த ஆசிரியர் பற்றாக்குறையானது அந்தப் பாடசாலையை தரம் குறைக்க வேண்டிய நிலைமைக்குள் தள்ளியிருக்கின்றது. அதுபோல புஸல்லாவ சரஸ்வதி மகா வித்தியாலயத்திலே விஞ்ஞானக் கற்கை இருந்தாலும்கூட, அங்கு ஆசிரியர்கள் இல்லாது அந்தப் பாடசாலை அரைகுறையாக நடைபெறுவதாகக் காணப்படுகின்றது. ரஜவல இந்து தேசிய கல்லூரியை எடுக்கின்றபோதும் அங்கேயும் அதே நிலைமைதான் காணப்படுகின்றது. கடந்த ஒரு 10 வருட காலத்தை நாங்கள் திரும்பிப் பார்க்கின்றபோது, தொடர்ச்சியாக எங்களுக்குக் கிடைக்கின்ற விடை ஒன்றாகவே இருக்கின்றது. எந்த ஆண்டை எடுத்தாலும், குறிப்பிட்ட விஞ்ஞானப் பகுதி, கணிதப் பகுதி சார்ந்த பாடப் பரப்புக்களுக்கான ஆசிரியர்கள் இல்லை, இல்லை என்பது தொடர்ந்திருக்கின்ற பிரச்சினை. ஆகவே, கல்வி அமைச்சு இதற்கு ஓர் ஆக்கபூர்வமான நடவடிக்கையை எடுத்து, திட்டமிட்ட அடிப்படையிலே பெருந்தோட்டப் பகுதிகளிலுள்ள இந்த மாணவர்களுக்கு அந்த வசதியை ஏற்படுத்துவதற்குரிய நடவடிக்கையைச் சரியான முறையிலே மேற்கொள்ள வேண்டுமென்பதுதான் எங்களுடைய வலியுறுத்தலாகக் காணப்படுகின்றது.

அதேபோல, தலைநகருக்கு அண்மையிலுள்ள மேல் மாகாணத்தினுடைய களுத்துறை, மத்துகம பகுதிகளிலே இருக்கின்ற மாணவர்களுக்கு உயர்தரம் கற்பதற்கான ஒரு பாடசாலை இல்லாத நிலைமை இருந்தது என்பதும் ஆச்சிரியப் படக்கூடிய ஒன்று. ஆனாலும், இன்று கௌரவ அமைச்சர் மனோ கணேசன் அவர்களின் முயற்சியின் காரணமாக, அங்கே அத்தகைய ஒரு பாடசாலையை ஏற்படுத்துவதற்குரிய ஆரம்ப நடவடிக்கை மேற்கொள்ளப்பட்டிருக்கின்றதையும் இந்த இடத்திலே நான் ஞாபகப்படுத்த வேண்டும்.

அதேபோல, நாங்கள் பார்ப்போமாக இருந்தால், இந்தப் புதிய கல்வித்திட்டத்தின்கீழ் "மொழி ரீதியாகவோ அல்லது இன ரீதியாகவோ மையப்படுத்திப் பாடசாலைகளை ஏற்படுத்துவதில்லை" என்ற ஒரு கூற்றை முன்வைத்துக் கொண்டு செல்கின்ற நிலைமையிருக்கின்றது. சமத்துவத்தை ஏற்படுத்துவதற்கு அது வரவேற்கத்தக்கது. ஆனால், அதற்கு முன் தற்போதிருக்கக்கூடிய இத்தகைய பாடசாலைகளில் அந்தச் சமத்துவ நிலையை ஏற்படுத்தவேண்டும். தற்போதிருக் கின்ற மும்மொழிப் பாடசாலைகளில் - தமிழ் மொழியில், சிங்கள மொழியில், ஆங்கில மொழியில் கற்கைகள் நடைபெறுகின்ற பாடசாலைகளிலே இந்தச் சமத்துவ நிலையை ஏற்படுத்தி, அதனை முன்மாதிரியாகக் காட்டினால்தான், நாங்கள் தொடர்ந்து வருகின்ற காலங்களிலே இவ்வாறு குறிப்பிடக்கூடிய இந்த நிலைமையை ஏற்படுத்த முடியும். ஆனால், தற்போதிருக்கின்ற மும்மொழிப் பாடசாலைகள் மத்தியில் நாங்கள் ஓர் இடைவெளியைக் காண்கின்றோம்; அவற்றுக்கிடையிலே ஒரு சமமின்மையைக் காண்கின்றோம்; அந்த மாணவர்களுக்கிடையிலே பாகுபாடு ஏற்படுத்தப்படுவதைக் காண்கின்றோம். இவ்வாறான ஒரு நிலை இருக்கத்தக்கதாக குறித்த கொள்கையைப் புகுத்த முயற்சிப்பது பொருத்தமற்றது. அதனால், இருக்கின்ற பாடசாலைகளில் அத்தகைய சமத்துவ நிலை கட்டியெழுப்பப் பட வேண்டும் என்பதையும் இந்த இடத்தில் ஞாபகப்படுத்த வேண்டியிருக்கின்றது.

இறுதியாக, மலையக மாணவர்களுடைய கணித, விஞ்ஞானக் கற்கையைக் கட்டியெழுப்பக்கூடிய அடிப் படையில் ஒரு கொள்கை ரீதியாக இந்தக் கல்வி அமைச்சு - அரசு செயற்படவேண்டும் என்று கேட்டு, விடைபெறு கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.42]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු එම්. තිලකරාජා මන්ත්‍රීතුමා ඉදිරිපත් කර ඇති මේ යෝජනාවට මගේත්, අපේ පක්ෂයේත් කැමැත්ත ඉතාම වගකීමෙන් යුතුව පළ කරනවා. ඒ වාගේම, මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් එතුමාට මගේත්, අපේ පක්ෂයේත් කෘතවේදීභාවයද පළ කරනවා. මේ සම්බන්ධයෙන් මා කනගාටු වන කාරණාවක්ද තිබෙනවා. එතුමාට පාර්ලිමේන්තුවට මුලින්ම එන්න පුළුවන් වුණේ මේ වතාවේ වෙන්න ඕනෑ. මේ යෝජනාවේ වටිනාකම තහවුරු කරන හොඳම උදාහරණය, වතුකරයේ ඉඳලා විශ්වවිද්‍යාලයට ගිය තිලකරාජා මන්ත්‍රීතුමාම තමයි. එතුමා මීට ඉස්සර වෙලා පාර්ලිමේන්තුවට ආවා නම්, මේ යෝජනාව එතුමා මීට කලින් ගෙන එන බව මම සියයට සියයක්ම විශ්වාස කරනවා. පහු වෙලා හෝ, එතුමා පාර්ලිමේන්තුවට පැමිණි පළමුවැනි වතාවේම මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් මගේ කෘතවේදීභාවය විශේෂයෙන්ම එතුමාට පළ කරනවා.

ගරු තිලකරාජා මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට මම මේ ගැටලුව සම්බන්ධයෙන් කථා කළේ 2004 වර්ෂයටත් එහා කාලයේ ඉඳන්. අපේ රටේ වතුකරයේ සහ තවත් දිස්ත්‍රික්ක ගණනාවක, දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන මුස්ලිම් දරුවන් සහ දෙමළ දරුවන් විවිධ ප්‍රමාණවලින් පැතිරී ඉන්නවා. නමුත්, මා දන්නා විධියට ඒ දෙමළ මාධ්‍ය දරුවන්ට ගණිත සහ විද්‍යා විෂය ධාරාවලින් අපොස උසස් පෙළ හදාරන්න උතුර සහ නැඟෙනහිර හැරුණු විට ලංකාවේ අනෙකුත් සියලු ප්‍රදේශවල තිබුණේ පාසල් දෙකක් හෝ තුනක් පමණයි. මාතර, ගාල්ල, හම්බන්තොට, කළුතර, පුත්තලම, කුරුණෑගල, කෑගල්ල, නුවර කියන කිසිම ප්‍රදේශයක අපොස උසස් පෙළ විද්‍යා, ගණිත විෂය ධාරා දෙමළ මාධ්‍යයෙන් ඉගෙන ගන්නා පාසල් තිබුණේ නැහැ. මේ කාරණය සම්බන්ධයෙන් අපි දිගින් දිගටම තර්ක කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අහිංසක දූ දරුවන් නියෝජනය කරමින් 1947 වර්ෂයේ ඉඳලා මේ දක්වාම දෙමළ ජාතික මන්ත්‍රීවරු, මුස්ලිම් ජාතික මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට එනවා. ඒ වකවානුවේම දෙමළ ජාතික නියෝජිතයන්, මුස්ලිම් ජාතික නියෝජිතයන් රාජ්‍ය මන්ත්‍රණ සභාව පවා නියෝජනය කළා. නමුත්, ඒ කිසිම කෙනකුට බැරි වුණා, 2006 වසර වනතුරුම ඒ අය නියෝජනය කළ ආණ්ඩු ලවා දෙමළ සහ මුස්ලිම් දරුවන් සිටින ප්‍රදේශවල අපොස උසස් පෙළ ගණිත සහ විද්‍යා විෂය ධාරා දෙමළ මාධ්‍යයෙන් හදාරන්න ඒ දරුවන්ට අවස්ථාවක් සලසා දෙන්න. පැවැති ආණ්ඩුවල එතුමන්ලාත් මැති ඇමතිවරු වුණා; නියෝජ්‍ය ඇමතිවරු වුණා; ඇමතිවරියන් වුණා. නමුත්, ඒ අය මේ කාරණයට අදාළව ඒ දරුවන් දෙස කිසිම ආකාරයකින් ඇල්මක්, බැල්මක් යොමු කළේ නැහැ. මට මතකයි, මා ඒ කාලයේ මේ ගැන කථා කරන්න ගොස් සිදුවුණු දේ. මට මතක හැටියට, 2002-2004 කාලයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තියෙද්දී කරුණාසේන කොඩිතුවක්කු මහත්මයායි අධ්‍යාපන ඇමතිවරයා හැටියට සිටියේ. ඒ කාලයේ මම මෙවැනි යෝජනාව ගෙන ආවා. එදා උපදේශක කාරක සභාවේදී - Consultative Committee එකේදී - එතුමා හිනා වෙලා මට කිව්වා, "ඔබතුමා පාඩුවේ ඉන්න, එහෙම නම්, ඔබතුමා ඒ දෙමළ ජාතික, මුස්ලිම් ජාතික දූ දරුවන් නියෝජනය කරන ප්‍රදේශවලින් ඡන්දය අරගෙන පාර්ලිමේන්තුවට එන්න" කියලා. ඒ ආකාරයට, එදා ඒ යෝජනාව හෑල්ලු කළා. එය ගණන් ගත්තේ නැහැ. ඉන් පසුව 2004 වසරේ අපේ කණ්ඩායම පාර්ලිමේන්තුවට ආවාට පසුව අපි අපේ පැත්තෙන් මෙවැනි යෝජනාවක් අරගෙන ආවා. එවකට සුසිල් ප්‍රේමජයන්ත මහත්මයා තමයි අධ්‍යාපන ඇමතිවරයා හැටියට සිටියේ. මෙවැනි යෝජනාවක් අරගෙන ඇවිල්ලා අපි දිගින් දිගටම ඒ ගැන කථා කළා. අපි ඉල්ලීමක් කළා. මේ රටේ දිස්ත්‍රික්ක දෙකක් තුනක් හැරුණාම, කිසිම තැනක දෙමළ සහ මුස්ලිම් දරුවන්ට මේ අවස්ථාව සලසා දීලා තිබුණේ නැහැ. දෙමළ අම්මලා තාත්තලා කැමැතියි, තමන්ගේ දරුවා වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවෙක්, ගණකාධිකාරිවරයෙක්, කාර්මික ශිල්පියෙක් වෙනවාට. මුස්ලිම් අම්මලා තාත්තලාත් එහෙම තමයි. නමුත්, ඒකට අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ නිසා, අපි ඒ අමාත්‍යවරයාට කිව්වා, වහාම ක්‍රියාත්මක වන පරිදි අඩුම ගණනේ එක දිස්ත්‍රික්කයකට හෝ උසස් පෙළ විද්‍යා ගණිත විෂය ධාරාව දෙමළ මාධ්‍යයෙන් තිබෙන පාසලක් ලබා දෙන්න කියලා. උසස් පෙළ තිබෙනවා, Artsවලින්. හම්බන්තොට සහිරා ජාතික පාසලේ උසස් පෙළට Arts තිබෙනවා, Commerce තිබෙනවා. නමුත්, ඒ විද්‍යාලයේ උසස් පෙළට විද්‍යා ගණිත අංශ නැහැ. දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ විද්‍යා ගණිත විෂය ධාරා මාතරත් නැහැ, ගාල්ලේත් නැහැ, කළුතරත් නැහැ.

කිසිම තැනක එවැනි පාසල් තිබුණේ නැහැ. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කළා. එසේ ඉල්ලීමක් කළ නිසා තමයි, 2006දී පළමුවැනි වතාවට, දිස්ත්‍රික්කයක් පාසා දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ ගණිත විද්‍යා විෂය ධාරාව ඉගැන්වීමේ කටයුතු ආරම්භ කරන්න වැඩ පිළිවෙළ සකස් කළේ. නමුත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඒ කටයුත්ත අදත් සිද්ධ වෙලා නැහැ. හම්බන්තොට සහිරා ජාතික පාසලට කල්මුණෛන්, මඩකලපුවෙන් ගුරුවරියන් දෙදෙනෙක් ගෙන්වූවා. ඒ ගොල්ලන් ආපසු ගියා. මේ විෂය ධාරා වෙනුවෙන් ගුරුවරු තුන්දෙනෙකු යොදවන්න තවම බැරි වෙලා තිබෙනවා. දිගින් දිගටම මේ අසාධාරණය සිද්ධ වුණා. ඒ නිසා අපි මේ මොහොතේ ඉල්ලීමක් කරනවා, මේ යහපාලන ආණ්ඩුව හෝ මැදිහත් වෙලා සිදු වූ මේ වැරැද්ද හදන්න කියලා. 2006දී ආරම්භ කළ ඒ වැඩ පිළිවෙළ අනුව, ඒ පාසල්වල දෙමළ මාධ්‍ය විෂය ධාරාවට තවත් ගුරුවරුන් යොදවා, උසස් පෙළ ගණිත විද්‍යා විෂය ධාරා දෙමළ මාධ්‍යයෙන් හදාරන්න අවස්ථාව සලසලා, ඒ අහිංසක දරුවන්ට ඉංජිනේරුවෙක්, වෛද්‍යවරයෙක්, ගණකාධිකාරි වරයෙක්, කාර්මික ශිල්පියෙක් වෙන්න අවස්ථාව උදා කරදෙන්න. ඒ වගකීම දැඩිව ග්‍රහණය කරගෙන ඔබතුමන්ලා ඒ කටයුත්ත ඉෂ්ට කරාවි කියලා මා විශ්වාස කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.5.49]

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில் பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු තිලකරාජා මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ, වේලු කුමාර් මන්ත්‍රීතුමා ස්ථිර කළ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ගැන කථා කරන මේ වෙලාවේ, හරි නම් වතුකරය නියෝජනය කරන දිස්ත්‍රික්කවල සියලු මන්ත්‍රීවරුන්

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව මේ ගරු සභාවේ සිටිය යුතුයි. කෙසේ වෙතත්, පැමිණ සිටින මන්ත්‍රීවරුන්ට ගරු කරමින්, සභාවේ නැති මන්ත්‍රීතුමන්ලාත් වෙනුවෙන් මේ යෝජනාව ගැන කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි.

මෙය, ඉතාම කාලෝචිත යෝජනාවක්. ඉතාම වැදගත් ප්‍රශ්නයක් තමයි තිලකරාජා මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන්නේ. වහ වහා උත්තර හොයන්න ඕනෑ කාරණයක් තමයි, වතුකරය නියෝජනය කරන දිස්ත්‍රික්කවල උසස් පෙළට විශේෂයෙන් විද්‍යා ගණිත විෂයයන් සහිත පාසල් නොමැති වීමේ ගැටලුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රත්නපුර, කෑගල්ල, ගාල්ල, මාතර, මාතලේ වැනි දිස්ත්‍රික්කවල සිටින, අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් "ඒ" සාමර්ථ නවය ගත් වතුකරයේ දරුවෝ උසස් පෙළ හදාරන්න පාසලක් නැතිවීම නිසා, අධ්‍යාපනය එතෙකින් අවසන් කරනවා. එයින් දෙමළ භාෂාව කථා කරන වතුකරයේ දරුවන්ගේ අනාගතය කාලකණ්ණි වෙනවා. එම නිසා, එවැනි පාසල් ලබා නොදීම, [බාධා කිරීමක්] ඒක තමයි ජාතිවාදය කියන්නේ. ජාතිවාදය හැංගිලා තිබෙන්නේ මේ ව්‍යුහය ඇතුළේ තමයි. මේක, අපේ අධ්‍යාපන ව්‍යුහය ඇතුළේ තිබෙන බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා මේ ගැන වහා උනන්දු වෙලා කටයුතු කරන්න ඕනෑ.

මේ කාරණය ගැන වතුකරය නියෝජනය කරන දිස්ත්‍රික්කවල සිටින දේශපාලනඥයන්ගේත්, නිලධාරින්ගේත් උනන්දුව ඉතාම අඩු බව මම කනගාටුවෙන් වුණත් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. මගේ අත්දැකීමෙන් මම මේ කථා කරන්නේ. රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් පාසලක් හැදීමට ඉඩමක් හොයා ගන්න මම අවුරුදු හතරක් තිස්සේ උත්සාහ කළා. බොහෝ දෙනා මේ කටයුත්ත කර අරිනවා. අපට දැන් ඒ සඳහා රත්නපුර නව නගරයෙන් ඉඩමක් ලැබිලා තිබෙනවා. පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් වෙන් කරලා තිබෙනවා. පෞද්ගලික අංශයේ දායකත්වය සහිතව එතැන පාසලක් හදන්න දැන් අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. නමුත් ඒ ඉඩම ලබා ගැනීමට අපට අවුරුදු හතරක් ගත වුණා. විවිධ යෝජනා ගෙනැල්ලා, ඒවා කඩාකප්පල් කරන්න හුඟක් අය වැඩ කළා. එහෙම දේවල් අනික් තැන්වලත් සිදු වෙලා තිබෙනවා ඇති. අපි මේ කටයුත්ත රත්නපුර දිස්ත්‍රික්කයෙන් නතර කරන්න නොවෙයි බලාපොරොත්තු වන්නේ. සෑම වතුකර දිස්ත්‍රික්කයකටම අඩුම තරමින් උසස් පෙළට විද්‍යා, ගණිත උගන්වන පාසලක් ලබා දෙන්න කියන එකයි අපි ඉල්ලා සිටින්නේ. සාමාන්‍ය පෙළ ඉහළින් සමත් වෙලා, විද්‍යා, ගණිත විෂය හදාරන්න බලාපොරොත්තු වන සියලු දරුවන්ගේ ප්‍රශ්න නුවරඑළිය දිස්ත්‍රික්කය තුළදී විසඳන්න බැහැ. ඒක අසාධාරණයි. එම නිසා හැම දිස්ත්‍රික්කයකම ඒ පාසල් පිහිටුවන්න ඕනෑ. අද ප්‍රවාහනය දියුණු වනවා, අනිකුත් පහසුකම් දියුණු වනවා. එහෙනම් මේ පාසල් හදා ගන්න බැරිකමක් නැහැ. අපට නැත්තේ කැපවීම විතරයි. ඒ කැපවීම දැන්වත් ඇති කර ගන්න කියන කාරණය අවධාරණය කරන්න තමයි අපි මේ විවාදය කරගෙන යන්නේ. එම නිසා අපි බලාපොරොත්තු වනවා,-

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

2006 අවුරුද්දේ සුසිල් ප්‍රේමජයන්ත මහත්මයා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටියදී අපි විශේෂ Motion එකක් අරගෙන ඇවිල්ලා, මේ ගැන කථා කළා. එතුමා මේ කටයුත්ත ආරම්භ කළා. මේක ක්‍රියාත්මක වනවාද කියලා ඔබතුමා බලන්න.

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)

ඒ සම්බන්ධයෙන් ඔබතුමා දක්වන උනන්දුව බොහොම හොඳයි. මම ඔබතුමාගේ කථාවටත් සවන් දුන්නා. මේ සම්බන්ධයෙන් දක්වන උනන්දුව හා කැපවීම ඉතා අඩුයි කියන එකයි මම කියන්නේ. මගේ අත් දැකීමෙන් මම කථා කළේ. වතුකරයේ ජීවත් වන්නේ දෙමළ භාෂාව කථා කරන ඉතාම දක්ෂ දරුවන්. ඔවුන් බොහොම දුප්පත් දෙමව්පියන්ගේ දරුවන්. ඒ අයට අධ්‍යාපනයෙන් ඉහළ මට්ටමට යන්න අවස්ථාව ලබා දෙන්න නම් අපි සියලුදෙනාම එකතු වෙලා මේ පාසල් පද්ධතිය පිහිටුවන්නටම අවශ්‍යයි. ආණ්ඩුව විතරක් නොව, විවිධ ව්‍යාපාරිකයන්, මේ ගැන උනන්දුවක් දක්වන අය මේ වෙනුවෙන් උදවු කරන්න සූදානම්. පාසල් ගොඩනැඟිලි හදා දෙන්න ව්‍යාපාරික ප්‍රජාව ඉදිරිපත් වෙලා සිටිනවා. නමුත් ඉඩමක් හොයා ගන්න ගියාම ගැටලු මතු වනවා; ගුරුවරු නැහැ කියනවා. ගුරුවරු නැත්නම් ගුරුවරු පුහුණු කරන්න ඕනෑ. ඒකටයි ගුරු විද්‍යාල හදලා තිබෙන්නේ. ඒ නිසා මේ කටයුත්ත වෙනුවෙන් අපි පියවර ගන්න ඕනෑ.

අවුරුදු සිය ගණනක් තිබුණු වතු දැන් පාළු වනවාය කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. ඒ වතුවලින් පාඩු වනවා. වතුකරයේ ඉන්න දරුවන්ට අනාගතයේදී මේ වතුවලම වැඩ කරන්න හැකියාවක් නැහැ, ඉඩකඩකුත් නැහැ, රැකියා අවස්ථා නැහැ. එම නිසා මේ සියලුදෙනාටම වෙනත් වෘත්තීන් සඳහා යෑමට අවශ්‍ය වන වෘත්තීය පුහුණුව ලබා දෙන්න දැන් අවශ්‍ය වෙලා තිබෙනවා. වෘත්තීය පුහුණු පාසල් වුණත් අවාසනාවකට දැන් වතුකරය කේන්ද්‍රව තිබෙනවා ඉතාම අඩුයි. උසස් පෙළ හදාරන්න 13 වසරක් සකස් කරලා තිබෙනවා වාගේ ඊට සමාන්තරව වෘත්තීය පුහුණු පාසලුත් දැන් ආරම්භ කරන්න ඕනෑ වෙලා තිබෙනවා. දැන් සැලකිය යුතු විද්‍යා, ගණිත පාසල් ප්‍රමාණයක් යාපනයේ තිබෙනවා; නුවරඑළියේ තිබෙනවා; කොළඹ තිබෙනවා. ඉතා ඉහළින් සාමාන්‍ය පෙළ සමත් වෙලා වෛද්‍ය පීඨවලට, ඉංජිනේරු පීඨවලට, විද්‍යා පීඨවලට, පරිගණක හදාරන්න දෙමළ භාෂාව කථා කරන දරුවන් ඇතුළත් වෙලා තිබෙනවා. මේ පාසල් පහසුකම් ලබා දුන්නාට පස්සේ මේ වාගේම තත්ත්වයක් වතුකරයේ දරුවන්ට උදා කරලා දෙන්න පුළුවන්.

දක්ෂ දරුවන් වැඩි දෙනෙක් අද උසස් පෙළ අධ්‍යාපනය අතරමඟ අත්හැර දමා යන්නේ පාසල් නොමැති වීම නිසායි. මේක වතුකරයේ දරුවන්ගේ මානව හිමිකම් කඩවීමක්. ඒ නිසා අපි මේ කාරණය ගැන බලන්න ඕනෑ. නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ සෑහෙන කාලයක් තිස්සේ මේ යෝජනාව ගැන කථා කරලා තිබෙනවා. මේ ගරු සභාවේ මෙම යෝජනාව ගැන කථා කරලා තිබෙනවා. දැන් මේ මන්ත්‍රීවරු මෙම යෝජනාව නැවතත් ගෙනැල්ලා තිබෙනවා. මේ ගැන උනන්දුවෙන් සලකා බලලා, මුදල් වෙන් කරලා, ව්‍යාපාරික ප්‍රජාවගේ වාගේම, මීට සුබ පතන්නන්ගෙන් සහයෝගය ලබා ගෙන උසස් පෙළ විද්‍යා, ගණිත විෂය උගන්වන දෙමළ මාධ්‍ය පාසලක් සෑම දිස්ත්‍රික්කයකම ආරම්භ කරන්න කියලා අපි අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒක ජාතික පාසලක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ මට්ටමට උසස් කරපු පාසලක් වෙන්න පුළුවන්. ඒකට පාසල් 25ක් තෝරාගෙන තිබෙනවා කියලා කිව්වා. නමුත් එක පාසලක්වත් ක්‍රියාත්මක කරලා නැහැ. ඒ තමයි, අපේ කැපවීම පිළිබඳව අපි පෙන්වලා තිබෙන සාතිශය ශෝක ජනක ස්වභාවය. ලබන අවුරුද්දේ මේ සත් ක්‍රියාව අපිට ආරම්භ කරන්න පුළුවන්. ප්‍රාදේශීය සභා පනතේ 33 වැනි වගන්තිය වෙනස් කරන්න කියලා මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමාත්, වේලු කුමාර් මන්ත්‍රීතුමාත් මේ වාගේම යෝජනාවක් ගෙනාවා. එතුමන්ලාට වතුකරයේ ඡන්ද ගන්න පුළුවන්. නමුත් වතුකරයට වැඩ කරන්න බැහැ. එවැනි වර්ගවාදී නීතියක් තමයි

අපේ ප්‍රාදේශීය සභා ආඥාපනතේ තිබුණේ. එතුමා ඒ යෝජනාව ගෙනාවා. අපිත් ඒකට සහයෝගය දීලා කථා කළා. ඒ කාලයේ අපි පළාත් පාලන අමාත්‍යාංශයේ වැඩ කළේ. මම ඒ නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියටයි කටයුතු කළේ. අපි ඒ නීතිය වෙනස් කළා. අද වතුකරයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ඒ ප්‍රාදේශීය සභාවේ සම්පත් අරගෙන ගිහිල්ලා වතුකරය දියුණු කරන්න පුළුවන්. මේකත් ඒ වාගේ ඵලදායී යෝජනාවක්. අපි මේ යෝජනාව ලබන අවුරුද්දේ සිට ක්‍රියාත්මක කළොත් ඇත්තෙන්ම දෙවැනි පන්තියේ පුරවැසියන් හැටියට සලකන වතුකරයේ දරුවන් වෙනුවෙන් මේ අධ්‍යාපන ව්‍යුහයේ බරපතළ වෙනස්කමක් ඇති කරන්න අපට පුළුවන්. ඒ සඳහා නැත්තේ උනන්දුව සහ කැපවීම පමණයි. වතුකරයේ දරුවනුත් ඉගෙන ගන්න ඕනෑ කියන හැඟීම අවංකවම හෘදය සාක්ෂියට එකතු ගත්තොත් මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙනයන්න පුළුවන්. ඉඩම් නැති ප්‍රශ්නයක් නැහැ. ඉඩම් තියෙනවා. වතු සමාගම්වලට වුණත් පුළුවන් මේ ඉඩම් ලබා දෙන්න. වතුකරයේ දිස්ත්‍රික්කවල ප්‍රධාන නගර ආශ්‍රිතව ඉඩම් තිබෙනවා. එම නිසා අනෙකුත් සම්පත් එකතු කර ගන්න පුළුවන්. මේ පාසල් 25 ලබන අවුරුද්දේ ඉඳලා ආරම්භ කරන්න කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් ලැබී ඇති කාලය අවසාන නිසා මගේ කථාව අවසාන කරනවා.

ඒ වාගේම මේ යෝජනාව ගෙන ආ මන්ත්‍රීවරු දෙදෙනාටත්, ඒ සඳහා සහයෝගය දෙන සියලු මන්ත්‍රීවරුන්ටත් මේ වේලාවේ අපේ ස්තුතිය පුද කරන්නට කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.57]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලකරාජා මැතිතුමා විසින් ගෙන එන ලද ඉතාම කාලෝචිත යෝජනාව පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මා ඉතාම සතුටු වෙනවා.

රටක් හැටියට ගත්තාම අපි හැම කෙනෙක්ම කියන්නේ සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් කියන සියලු ජන කොටස්, සියලු ජාතීන්, සියලු ආගමිකයන් සංහිඳියාවෙන් යුතුව කටයුතු කළ යුතු බවයි. නමුත් ක්‍රියාත්මක කිරීමේදී අපි බොහෝදුරට ඒ සංකල්පය අමතක කරලා තිබෙනවා. නමුත් වර්තමාන රජය හැම විටකම අධ්‍යාපනයේ තිබෙන අඩුලුහුඬුකම් සියල්ල නිවැරදි කරගෙන එනවා. ඉතිහාසය දෙස බලනකොට එක්සත් ජාතික පක්ෂ රජයක් තමයි මේ රටේ නිදහස් අධ්‍යාපනය පරිසමාප්ත අර්ථයෙන්ම ක්‍රියාත්මක කරන්න පුළුවන් වැඩ පිළිවෙළක්, ප්‍රතිපත්තියක් අනුව කටයුතු කළේ. බොහෝ දෙනෙක් කියනවා, අධ්‍යාපනයට ජාතික ප්‍රතිපත්තියක් නැහැ කියලා. නමුත් අපි ජාතික ප්‍රතිපත්තියක් හැදුවා. ඒ ජාතික ප්‍රතිපත්තියේ වරින් වර වෙනස්කම් ඇති කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට කිව්වොත් ජේ.ආර්. ජයවර්ධන යුගයේ අපි නොමිලයේ පොත්පත් ලබා දුන්නා.

ගාල්ල ප්‍රදේශයෙන් බිහිවුණු සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර කියන ඒ අධ්‍යාපන අමාත්‍යවරයා එදා කටයුතු කරද්දී අපි දැක්කා ඉතාම පැහැදිලිව නිදහස් අධ්‍යාපන වැඩ පිළිවෙළ ඉදිරියට ගිය බව. ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා පාසල් නිල ඇඳුම් ලබා දුන්නා. ඒ වාගේම ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය ඇති කළා. අද මේ ආණ්ඩුව ඒ ශිෂ්‍යත්ව ක්‍රමය වැඩිදියුණු කරලා කටයුතු කරනවා. වර්තමාන අධ්‍යාපන අමාත්‍යතුමා සුරක්ෂා රක්ෂණ ක්‍රමය ඇති කළා. දරුවන්ට ටැබ් පරිගණකය ලබාදීම වාගේ කටයුතු කළා. අපේ අලුත්ම වැඩ පිළිවෙළ තමයි දහතුන්වන වසර දක්වා සහතික කරන ලද අඛණ්ඩ අධ්‍යාපනයක් දරුවන්ට ලබාදීම. මේක ඉතාම සාර්ථක ක්‍රමයක්. මේ ක්‍රම පසුගිය කාලයේ තිබුණේ නැහැ. සාමාන්‍ය පෙළ වැඩ නවයම අසමත් වූ දරුවාට, ගණිතය විෂය අසමත් වූ දරුවාට, සිංහල විෂය, බුද්ධ ධර්මය විෂය පවා අසමත් වූ දරුවාට අද විශ්වවිද්‍යාලයට යෑම දක්වා අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. අපි අද ගෙන ආ මේ යෝජනාවත් එහෙම එකක්. අපේ ආණ්ඩුව අභියෝගාත්මක යෝජනා ක්‍රියාත්මක කරන්න හයියක් තිබෙන ආණ්ඩුවක්. අපි ඒ ප්‍රතිඵල දැක්කා. අද වැඩ නවය අසමත් වූ සහ යම් යම් විෂයයන් හරියට සමත් වුණේ නැති ළමුන් 12,000ක් වැඩිදුර ඉගෙන ගන්නවා. අද කාණ්ඩ 7ක් යටතේ විෂයයන් 26ක් තුළින්, එනම් සංගීතය, නැටුම්, චිත්‍ර කලාව, කෘෂිකර්මය, පරිගණක තාක්ෂණය, ක්‍රීඩා ආදී සෑම අංශයක් තුළින්ම ඉස්සරහට යන්න ඒ දරුවන්ට පුළුවන්.

ඒ අතරේ ගරු තිලකරාජා මන්ත්‍රීතුමා ගෙනෙන මේ යෝජනාවත් වැදගත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය නියෝජනය කරන දිස්ත්‍රික්කය, ඒ වාගේම ගාල්ල, මාතර, කළුතර, රත්නපුර වාගේ දිස්ත්‍රික්කවල විශාල වශයෙන් දමිළ දරුවන් අධ්‍යාපනය ලබනවා. ඒ නිසා මා යෝජනා කරනවා මේ කටයුත්ත ආරම්භ කරන්න කියලා. අද රටේ ජාත්‍යන්තර පාසල් - international schools - තිබෙනවා. ඒවායේ ඉංග්‍රීසි උගන්වනවා. සිංහල පාසල් තිබෙනවා, ඒවායේ සිංහල උගන්වනවා. ඒ වාගේම දරුවන් විවිධ පෞද්ගලික උපකාරක පන්තිවලට යනවා. ඒ වුණාට පාසලක දමිළ භාෂා මාධ්‍යයෙන් පන්තියක් ආරම්භ කරන්න අපට බැරි ඇයි?

ගරු කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කළා, ඇත්ත වශයෙන්ම වෘත්තීය පුහුණු අංශය තුළත් මේ සඳහා යම් ඉඩ කඩක් ලබාදෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා කියලා. ඒ අනුව මේ යෝජනාවට සංශෝධනයක් හැටියට මා යෝජනා කරනවා, එක වරම මේ පාසල් පටන් ගන්න බැරි නම්, ඉංග්‍රීසි මාධ්‍ය පන්ති තිබෙනවා වගේ දමිළ භාෂා පන්ති පවත්වන්නත් පුළුවන් කියලා.

අවශ්‍ය නම් අ.පො.ස. උසස් පෙළ පන්ති පවත්වන්න පුළුවන්. අද උසස් පෙළ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනවා නම්, උසස් පෙළ සිංහල මාධ්‍යයෙන් උගන්වනවා නම්, උසස් පෙළ පන්තියක් දමිළ මාධ්‍යයෙන් ලබා දෙන්න බැරි ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. සාමාන්‍යයෙන් විදුහල්පති තනතුර සඳහා උසස්වීම් ගන්නකොට, විශේෂයෙන්ම ඒ සහතිකයට තැනක් දිය යුතුයි කියලා තිබෙනවා. නමුත්, ඒක අද ක්‍රියාත්මක කරන්න බැරිවෙලා තිබනෙවා. එම නිසා ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍ය ගරු මනෝ ගනේසන් මහතාගෙන් මම ඉල්ලීමක් කරනවා, මට්ටමක් තියලා, ඒ අනුව කටයුතු කරන්න කියලා. එතුමා ඊයේ පෙරේදා මට දුරකථනයෙන් කථා කළාම කිව්වා, ඒ සඳහා Cabinet Paper එකක් දානවා කියලා. ඇත්ත වශයෙන්ම දමිළ භාෂාව පිළිබඳව ගැටලු සහගත තත්ත්වයක් තිබෙනවා. එම නිසා ඒ අවස්ථාව උදා කළොත්, එම ගුරුවරුන්ට ඉදිරියට යන්න, විශේෂයෙන්ම විදුහල්පති සේවයට සහ වෙනත් තැන්වලට යන්නට, ඒ වාගේම පරිපාලන සේවයට යන්නට අවස්ථාවක් ලැබෙනවා. එම නිසා ඉතාම වැදගත් යෝජනාවක් ගෙනැවිත් තිබෙන මේ වෙලාවේ අපි ඉල්ලීමක් කරනවා, මෙවර අය වැය ක්‍රියාත්මක නොවුණත්, ඊළඟට අතුරු අය වැයෙන් හෝ යම් කිසි මුදලක් වැය කරලා, -අධ්‍යාපනය සඳහා අපි මිලියන 62ක් වියදම්

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

කරනවා වාගේ- සර්ව සාධාරණ විධියට එම දිස්ත්‍රික්කවල සිටින අහිංසක දමිළ දරුවන්ටත් උසස් අධ්‍යාපනය ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මම දන්නවා වාගේම ගාල්ල දිස්ත්‍රික්කයේ ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමාත් දන්නවා, ගිංතොට ප්‍රදේශය තුළ ජාතික පාසලක් තිබුණා, නමුත් පහසුකම් තිබුණේ නැහැ කියන එක. එම නිසා උසස් පෙළ අධ්‍යාපනය සඳහා මාවනැල්ලට යනවා. දැන් අපි ඒ තත්ත්වය නතර කරලා තිබෙනවා. රුපියල් කෝටි 12ක වියදම් කරලා අද ඒ පාසලට අවශ්‍ය සියලු පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒ අනුව දැන් මාවනැල්ලට යන පිරිස අඩුවෙලා තිබෙනවා. දමිළ අධ්‍යාපනය සඳහා නුවරඑළියට වෙන්න පුළුවන්, මුස්ලිම් අධ්‍යාපනය සඳහා මාවනැල්ලට යන්න පුළුවන්. මෙන්න මේ වාගේ වෙනත් ප්‍රදේශවලට යන පිරිස අඩු කරන්නට, ඒ තත්ත්වය නැති කරන්නට අවශ්‍ය නම්, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත්.

එම නිසා මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව ගරු මයිල්වාගනම් තිලකරාජා මැතිතුමාටත්, ඒ වාගේම ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. මේ වැදගත් කර්තව්‍යයට අත තියලා මේක ඉදිරියටම ඇදගෙන යන්න. ගරු මහාචාර්ය ආශු මාරසිංහ මැතිතුමා සභාපතිවරයා හැටියට කටයුතු කරන Sectoral Oversight Committee එකේ, ඔබතුමන්ලා සාමාජිකයන් හැටියට ඉන්නවා. මේ යෝජනාව ආංශික අධීක්ෂණ කාරක සභාවට ගෙනැල්ලා ප්‍රතිපාදන තිබෙන ප්‍රමාණයෙන් හෝ මේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම විශේෂයෙන් කරනවා. ඒ සඳහා එක්සත් ජාතික පක්ෂයේ වැඩ පිළිවෙළත්, පෙරමුණු ආණ්ඩුවේ වැඩ පිළිවෙළත් එකතු කරලා මේ සඳහා සාධනීය ක්‍රියාමාර්ගයක් ගැනීම වැදගත්ය කියන කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු මහාචාර්ය අශු මාරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා.6.04]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන ඉතාම කාලෝචිත යෝජනාව ගැන වචන කිහිපයක් කථා කරන්න කැමැතියි.

විශේෂයෙන් දෙමළ මාධ්‍ය පාසල්වල අ.පො.ස. උසස් පෙළ විද්‍යා ගණිත පාඨමාලා ඉගැන්වීමේදී තිබෙන ගුරු හිඟය සම්බන්ධයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපි මීට කලිනුත් සාකච්ඡා කළා. ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව අපි නුදුරු අනාගතයේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කරන්නත් දැන් සැලසුම් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම අපි මේ පිළිබඳව සලකා බලනකොට තිබුණු ප්‍රධානම ප්‍රශ්නයක් තමයි, අ.පො.ස. උසස් පෙළ දෙමළ මාධ්‍ය සඳහා විද්‍යා ගණිත ගුරුවරුන්ගේ හිඟකම. ඒ සඳහා විසඳුමක් හැටියට අපි යෝජනා කළා, උසස් පෙළ විද්‍යා ගණිත විෂයයන් හදාරා දැනට විද්‍යාපීඨවලින් බිහිවෙලා සිටින සාමාන්‍ය පෙළ දක්වා උගන්වන දෙමළ මාධ්‍ය විද්‍යා ගණිත ගුරුවරුන්ට ඒ විද්‍යාපීඨ අවුරුදු 3 පාඨමාලාවට අමතරව උපාධියට සමාන පාඨමාලාවක් හඳුන්වා දීලා, එම පාඨමාලාව තවත් අවුරුදු දෙකක් හැදෑරීමෙන් පසු උපාධි සහතිකය ලබා දීලා උසස් පෙළට ඉගැන්වීම සඳහා අවස්ථාවක් ලබා දෙන්න. විශේෂයෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උප කුලපතිතුමා ඒකට එකඟ වෙලා ඒ සඳහා වන පාඨමාලාවත් දැන් නිර්මාණය වෙලා තිබෙනවා. එම නිසා ඉතාම කාලෝචිත වෙලාවක තමයි ඔබතුමා මේ යෝජනාව ගෙනාවේ. එම නිසා ඒ සඳහා අවශ්‍ය ගුරුවරුන් පුහුණු කිරීම සහ ඔවුන්ට අවශ්‍ය දැනුම ලබා දීම අපට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙන් පටන් ගන්න පුළුවන්. ඒ අනුව අවුරුදු දෙකක කාලයක් තුළ නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කවල-ඌව පළාතේ- එම ගුරු හිඟය නැති කර අවශ්‍ය පහසුකම් හා දැනුම ලබා ගන්න අපට පුළුවන්.

නමුත් එතැනින් එහාට ගිහින් මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා කරන මේ යෝජනාව ඉතාම කාලෝචිත සහ බොහොම ආකර්ෂණීය යෝජනාවක්. ඒ වාගේම කළ යුතු දෙයක්. විශේෂයෙන් ද්‍රවිඩ මාධ්‍ය පාසල් සිසුන් සඳහා හරිම creative විධියට මේ යෝජනාව සකස් කරලා තිබෙනවා. දෙමළ මාධ්‍ය සිසු දරුවන් සිටින දිස්ත්‍රික්කවල එක පාසලක් තෝරා ගෙන, එම පාසලට ද්‍රවිඩ මාධ්‍ය විද්‍යා, ගණිත දැනුම තිබෙන ගුරුවරුන් සහ සම්පත් ඇතුළත් කිරීම හරහා හොඳ විසඳුමක් ලබා දෙනවා. මම හිතන විධියට මේ පිළිබඳ කරුණු ගරු ඇමතිතුමාගේ පිළිතුරේත් සඳහන් වෙයි. අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේත් මේ ගැන සාකච්ඡා කළා. එහිදී කොපමණ ගුරු හිඟයක් තිබෙනවාද, ඒ පාසල්වල අධ්‍යාපන අවස්ථා වැඩි දියුණු කරන්නේ කොහොමද කියලා දත්ත ලබා ගෙන, අවශ්‍ය නම් සම්පත් ලබා දීලා කටයුතු කිරීමට ඒ නිලධාරි මහත්ම මහත්මීන් අපට පොරොන්දු වුණා.

අපේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කේ.කේ. පියදාස මන්ත්‍රීතුමාත් මේ ගරු සභාවේ මේ අවස්ථාවේ ඉන්නවා. මේ ප්‍රශ්නය පියදාස මන්ත්‍රීතුමාටත් බලපාන ප්‍රශ්නයක්. ඒ නිසා නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිටින සියලු මන්ත්‍රීවරුන් එකතු කරගෙන මේ ප්‍රශ්නයට විසඳුම නුවරඑළිය දිස්ත්‍රික්කයේ pilot project එකක විධියට පටන් ගන්න පුළුවන් කියලා මම හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාට, පක්ෂ භේදයකින් තොරව මේ ප්‍රශ්නය විසඳිය යුතු වෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලාත් මෙවැනි යෝජනා කළා. මේ ප්‍රශ්න විසඳුවොත් විතරයි දරුවන්ට ඕනෑම මාධ්‍යයකින් තමන්ගේ අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව ඇති වෙන්නේ. විශේෂයෙන් 13 වසර දක්වා අධ්‍යාපනය ලැබීම අනිවාර්ය කිරීම තුළ මේ ගැන අවධානය යොමු කළ යුතු වෙනවා. අනාගතයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන සිසුන්ටත් අපි අවස්ථාව ලබා දිය යුතුයි. සිංහල මාධ්‍යයෙන්, දෙමළ මාධ්‍යයෙන් සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් කියන මාධ්‍ය තුනෙන්ම සම අවස්ථා හැදුණොත් තමයි, අපි බලාපොරොත්තු වෙන විධියට ලෝකයේ දියුණු රටවල් එක්ක තරග කිරීමට අවශ්‍ය දැනුම අපට ලබාගත හැකි වන්නේ. දරුවන් උත්පත්තියේ සිට කථා කරන භාෂාවෙන් ඉගෙන ගත්තොත් විතරයි, නිර්මාණශීලී මනසක් හැදෙන්නේ; creative මනසක් බිහි වෙන්නේ. ලෝකයේ අධ්‍යාපන විශාරදයන් පිළිගත්ත දෙයක් තමයි, තමන්ගේ භාෂාවෙන් ඉගෙන ගත්ත පුද්ගලයාට විතරයි රටවල් දියුණු කිරීමට, එහෙම නැත්නම් තමන්ගේ අනාගත සැලසුම් ගැන සිතීමට, creative දේවල් කිරීමට හැකියාව ලැබෙන්නේ කියන එක. අපි ලෝකයේ දියුණු රටවල් දෙස බැලුවොත්, චීනයේ චීන භාෂාවෙන්, ජපානයේ ජපන් භාෂාවෙන්, කොරියාවේ කොරියන් භාෂාවෙන්, ප්‍රංශයේ ප්‍රංශ භාෂාවෙන් තමයි අධ්‍යාපන කටයුතු කරන්නේ. මේ සෑම රටක්ම තමන්ගේ භාෂාවත් සමඟ අධ්‍යාපනය දියුණු කරලා තිබෙනවා. ඒක තමයි වැදගත් වෙන්නේ. අපේ රටේ විශේෂයෙන් ද්‍රවිඩ සහ සිංහල මාධ්‍ය දෙක එක හා සමානව දියුණු කළ යුතු වෙනවා.

උතුරු නැඟෙනහිර ප්‍රශ්නය ගැන බලනකොට, සම අවස්ථා නැතිවීම තුළ මෙම ප්‍රශ්න වැඩිදුර ඉදිරියට ගිහින් තිබෙනවා. ඒ නිසා වතුකරයේ පාසල්වල දරුවන්ගේ ප්‍රශ්නත් අපි සාවධානව හරියට තේරුම් ගත යුතු වෙනවා. අධ්‍යාපන ඇමතිතුමාත් මේ ප්‍රශ්නය තේරුම් ගෙන තිබෙනවා. ඒ වාගේම මීට සම්බන්ධ අනෙකුත් ආයතනවල සියලුදෙනාත් මේ ප්‍රශ්නය තේරුම් අරගෙන තිබෙනවා කියලා මා විශ්වාස කරනවා. එම නිසා තිලකරාජා මන්ත්‍රීතුමා සහ මේ දිස්ත්‍රික්කයේ සිටින සියලු මන්ත්‍රීවරු එකතු වෙලා මේ ප්‍රශ්නයට නිසි පිළිතුරු ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව හැටියට අපි මේ සම්බන්ධයෙන් අවශ්‍ය සම්පූර්ණ කැප කිරීම සිදු කර, අවශ්‍ය සාකච්ඡා සිදු කර සහයෝගය ලබා දීමට කටයුතු කරනවාය කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.6.10]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ තිලකරාජා මන්ත්‍රීතුමා විසින් ඉතාම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළේ. එය විශේෂයෙන් වතුකරයේ දිස්ත්‍රික්කවල දරුවන් සම්බන්ධයෙන් වටිනා යෝජනාවක්. තිලකරාජා මන්ත්‍රීතුමා වතුකරයේ පාසලක අධ්‍යාපනය ලබලා, වතුකරයෙන් විශ්වවිද්‍යාලයට ගිහින්, පාර්ලිමේන්තුවට ඇවිත්, තමන්ගේ අත්දැකීම් එක්ක ඉතාම හොඳ අවබෝධයකින් ඒ දරුවන්ගේ අධ්‍යාපන ප්‍රශ්න ගැන කථා කරන මන්ත්‍රීවරයෙක්. ඒ නිසා අද සභාව කල් තබන අවස්ථාවේ එතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. ඊට පිළිතුරු සැපයීම සඳහා අධ්‍යාපන ඇමතිතුමාට අවශ්‍යතාව තිබුණත්, හදිසියේ නොවැළැක්විය හැකි කරුණක් යෙදුණු නිසා එතුමාට මේ අවස්ථාවට සහභාගි වන්න බැරි බවව දන්වා එතුමාගේ පිළිතුර මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා මා වෙත ලබා දුන්නා. ඒ අනුව, මම ඒ පිළිතුර සභාවට ඉදිරිපත් කරනවා.

අද මේ විවාදයේදී ඉතාම වටිනා අලුත් අදහස් කිහිපයකුත් ඒ යෝජනාවට එකතු කරමින් අපේ මන්ත්‍රීවරු කිහිපදෙනෙකුම අදහස් ප්‍රකාශ කළා. ඒ අදහස්වල තිබුණු කාරණාත් අධ්‍යාපන ඇමතිතුමාගේ විශේෂ අවධානය පිණිස යොමු කරන බවත් මම කියන්න කැමැතියි.

ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් වනවා, ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පයක් අනුව 2016 අවුරුද්දේ අපොස උසස් පෙළ විද්‍යා, ගණිත විෂයධාරා සහිත වතු පාසල් ආරම්භ කිරීමට යෝජනා කළ බව. වතු පාසල් අතරින් පාසල් 25ක් මේ වනවිටත් ඒ සඳහා හඳුනා ගෙන ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමටත්, ඒ සඳහා අවශ්‍ය සුදුසු ගුරුවරුන් සැපයීමටත් කටයුතු කර තිබෙන බව මේ සභාවට දැනුම් දෙන්න කියලා විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමා මා වෙත දැනුම් දුන්නා.

ඒ අනුව දැනටමත් දිස්ත්‍රික්ක කිහිපයක වතු පාසල් කිහිපයක් තෝරා ගෙන විද්‍යා, ගණිත විෂයධාරා ආරම්භ කරන්න කටයුතු කළා. බදුල්ල දිස්ත්‍රික්කයේ සරස්වතී ජාතික පාසලේත්, බණ්ඩාරවෙල දෙමළ මහා විද්‍යාලයේත්, ලුණුගල රාමක්‍රිෂ්ණා දෙමළ විද්‍යාලය වාගේ විද්‍යාලවලත් විද්‍යා, ගණිත විෂයධාරා ආරම්භ කරලා දැන් වැඩ කටයුතු කරනවා. මොනරාගල වාගේ දිස්ත්‍රික්කයක විපුලානන්ද විද්‍යාලයේත් විද්‍යා විෂයධාරාව ආරම්භ කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මහනුවර දිස්ත්‍රික්කයේ උසස් පෙළ හදාරන වතුකරයේ දරුවන්ට රජවෙල හින්දු විද්‍යාලයේත්, නාවලපිටිය කදිරේසන් දෙමළ විද්‍යාලයේත් විද්‍යා, ගණිත විෂයධාරා දෙකම ආරම්භ කරලා තිබෙනවා. මාතලේ දිස්ත්‍රික්කය කියන්නේත් විශාල වතුකර ප්‍රදේශයක්. මාතලේ දිස්ත්‍රික්කයේ පාක්‍යම් ජාතික පාසල සහ හින්දු ජාතික පාසලේ මේ වනකොට උසස් පෙළ විද්‍යා, ගණිත විෂයධාරා ආරම්භ කරන්න කටයුතු කරලා තිබෙනවා.

අපේ කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමාත් කථා කළා, රත්නපුරය දිස්ත්‍රික්කය ගැන. රත්නපුරය දිස්ත්‍රික්කයේ ශාන්ත ජෝන් දෙමළ මහා විද්‍යාලය, බලන්ගොඩ කනගනායගම් විද්‍යාලය වැනි විද්‍යාලවලත් විද්‍යා විෂයධාරාව මේ වනකොට ආරම්භ කරලා තිබෙනවා.

ඊට අමතරව ඉදිරියේදී විද්‍යා, ගණිත විෂයධාරා ආරම්භ කිරීමට තවත් පාසල් කිහිපයක කටයුතු කරමින් තිබෙනවා. දැනටමත් ඒ වැඩ කටයුතු සිදුවෙමින් පවතිනවා. විශේෂයෙන් කෑගල්ලේ, යටියන්තොට ශාන්ත මේරි දෙමළ විද්‍යාලයේත් විද්‍යා, ගණිත විෂයධාරා ඇරඹීමට පළාත් අධ්‍යාපන කාර්යාලය මේ වනකොට පියවර ගනිමින් සිටිනවා. ඒ වාගේම, විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාත් කථා කළා, මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කය ගැන. ඒ වාගේම දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාත් මේ ගැන කථා කළා. ගාල්ල, මාතර දිස්ත්‍රික්කවල ආසන්නතම දෙමළ මාධ්‍ය මුස්ලිම් පාසල්වලින් අවශ්‍ය ඉඩකඩ ලබාගෙන මේ විෂයධාරා ඉගැන්වීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු දැන් සිදු කරමින් පවතිනවා. මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රදේශය කියන්නේත් වතු බහුල ප්‍රදේශයක්. මේ විෂයධාරා ඉගැන්වීම ආරම්භ කිරීම සඳහා දෙනියාය ප්‍රදේශයෙනුත් සුදුසු පාසලක් ඉදිරියේදී තෝරා ගැනීමට බලාපොරොත්තු වන බව ඇමතිතුමා දන්වා තිබෙනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමනි, වැලිගම මුස්ලිම් විද්‍යාලයක උසස් පෙළ විද්‍යා, ගණිත විෂයධාරා ආරම්භ කළා. ඒ ගැනත් ඔබතුමා පොඩ්ඩක් බලන්න. ඒ වාගේම ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ කරුණ අධ්‍යාපන ඇමතිතුමාට කියන්න කියලා. මම මේ කරුණ මීට ඉස්සෙල්ලාත් කිව්වා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන එකම දෙමළ මාධ්‍ය සහිත පාසල තමයි සහිරා විද්‍යාලය. මේක ජාතික පාසලක්. මේ පාසලට උසස් පෙළට Arts, Commerce තිබෙනවා. 2006දී මේ පාසලට ගුරුවරියන් දෙදෙනෙකු කල්මුණෙන් ආවා. හැබැයි, ඒ සඳහා ගුරුවරියන් දෙදෙනෙකු මදි. විද්‍යා, ගණිත විෂයධාරාවලට අඩු ගණනේ ගුරුවරු තුන්දෙනෙකුවත් ඉන්න ඕනෑ නේ. එම ගුරුවරියන් දෙදෙනාත් ඇවිල්ලා මාස දෙකක් පමණ ඉඳලා යන්න ගියා.

හම්බන්තොට දිස්ත්‍රික්කයෙන්, ජනාධිපතිවරුන් පවා බිහි වුණා; අගමැතිවරුක් බිහි වුණා; විපක්ෂ නායකවරුත් බිහි වුණා. ඒ අය දෙමළ ජනතාවගේ ඡන්දෙත් ගන්නවා. නමුත්, ඒ කාටවත් බැරි වුණා හම්බන්තොට සහිරා විද්‍යාලයේ උසස් පෙළ පන්තිවලට දෙමළ මාධ්‍ය ගුරුවරු හතර දෙනෙක් ලබාදෙන්න. ඇත්ත කථාව ඒකයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා විශේෂයෙන් මැදිහත් වෙලා අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අද ඉදිරිපත් වුණු වැදගත් අදහස් සියල්ලම ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට මා යොමු කරන්නම්. විශේෂයෙන්ම හම්බන්තොට සහිරා විද්‍යාලය ගැනත් අපි එතුමා දැනුවත් කරන්නම්. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේත් සුදුසු දෙමළ මාධ්‍ය පාසලක් තෝරාගෙන විද්‍යා, ගණිත විෂය ධාරා ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් අධ්‍යාපන අමාත්‍යතුමා විශේෂයෙන්ම සඳහන් කරන්න කිව්වා. ඊටත් අමතරව පාසල්වලට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමට "හොඳම පාසල - ළඟම පාසල" ව්‍යාපෘතිය යටතේ ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක් රට පුරා ක්‍රියාත්මක වනවා. ඒ අනුවත් අවශ්‍ය කටයුතු කරන්න සැලසුම් කරලා තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඒ වෙනුවෙන් විශේෂ අවධානය යොමු කරන බවත් සඳහන් කරන්න කියලා මා වෙත දැනුම් දුන්නා. ඒ සියලු කටයුතු ඒ අන්දමින් සිදු කළත්, දැන් බොහෝ කථාවලදී කියැවුණා වාගේ අධ්‍යාපන ඇමතිතුමාත් විශේෂයෙන්ම සඳහන් කරන්න කියලා තිබෙනවා, උසස් පෙළ විද්‍යා, ගණිත ගුරුවරුන් ප්‍රමාණවත් පරිදි බඳවා ගන්න අධ්‍යාපන අමාත්‍යාංශය කොච්චර උත්සාහ කළත් ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති ගුරු භවතුන් අයදුම්කර නොමැති බව. කනගාටුවෙන් වුවත් එය දැනුම් දෙන්න සිදුවී තිබෙන බව අධ්‍යාපන ඇමතිතුමා වැඩිදුරටත් කියා තිබෙනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ඇත්තටම විද්‍යා, ගණිත ගුරුවර, ගුරුවරියන් එන්නේ නැද්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ සඳහා සුදුසුකම් තිබෙන අය ඉල්ලුම් කරනවා අඩුයි කියලා තමයි සඳහන් කරලා තිබෙන්නේ. මේ ගැටලුව විසඳීමේදී එය අමාත්‍යාංශයට බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ඒ කියන්නේ ඒ අය වෙන වෙන රැකියාවලට යනවා?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒක මම දන්නේ නැහැ. මේ විෂයයන් ඉගැන්වීම සඳහා ද්‍රවිඩ මාධ්‍ය ගුරුවරු හොයා ගැනීමේ ප්‍රශ්නයකුත් තිබෙනවා ලු. මම අහගෙන හිටියා තිලකරාජා මන්ත්‍රීතුමා සහ අනෙක් මන්ත්‍රීවරු කළ කථා. එතුමන්ලාගේ කථාවලින් කියවුණා, ඒ සඳහාත් විකල්ප වැඩසටහනක්. ඒක ඉතාම වටිනවා.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
ගරු ඇමතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් පිළිතුරු ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

ඇත්තටම මම බලාපොරොත්තු වුණා අධ්‍යාපන අමාත්‍යතුමා ගරු සභාවට ඇවිල්ලා, මේ විවාදයට ඇහුම් කන් දීලා, අපට පිළිතුරක් ලබා දෙයි කියලා. ඔබතුමාගේ කාර්යය, කටයුතු අපි ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. ගරු ඇමතිතුමනි, අපි වතුකරයේ පාසල්වල ඉගෙන ගෙන, විශ්වවිද්‍යාල දක්වා ගිහිල්ලා, දැන් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් අපේ ප්‍රශ්න ඉදිරිපත් කරනකොට අපේ ළඟ තිබෙනවා යම්කිසි යෝජනා. මම උසස් පෙළ අවසන් වුණ ගමන්ම ගුරුවරයකු හැටියට කටයුතු කරමින්, හැටන්වල හඳපු පාසල් ක්‍රමය තුළින් තමයි හැටන් දියුණු කර ගත්තේ. ඒ අත්දැකීම මට තිබෙනවා. ඒ කියන්නේ, එකම කලාපයේ එක ඉස්කෝලයක science subject එක උගන්වන ටීචර් කෙනෙක් ඉන්නවා. තවත් පාසලක එක් කෙනෙක් ඉන්නවා. අපි කරන්න ඕනෑ ඒ එක එක පාසල්වල ඉන්න ගුරුවරු එකතු කරලා එක පාසලකට ගෙන්වාගෙන එම පාසලට ඒ දිස්ත්‍රික්කයේම ළමයින් ගෙන්වා ගන්න එක. එතකොට එම දිස්ත්‍රික්කයට අඩුම ගානේ එවැනි එක පාසලක්වත් තිබෙනවා. අපට ඒක දියුණු කර ගන්න පුළුවන්. මේ වැඩ පිළිවෙළ අපේ අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා කරන්න ඕනෑ වැඩක්.

අද පක්ෂ භේදයෙන් තොරව මේ විවාදයට සහභාගි වෙච්ච හැම මන්ත්‍රීවරයෙකුටම යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා හැටියට මම ස්තුතිවන්ත වනවා. නමුත් දෙවැනි වරටත් මගේ කනගාටුව පළ කරනවා, මම ඉදිරිපත් කරපු යෝජනාවට පිළිතුරු කථාව කිරීමට අධ්‍යාපන ඇමතිතුමා මෙම ගරු සභාවට නොපැමිණීම ගැන.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමාගේ වැදගත් යෝජනා සියල්ලම ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. අපට පුළුවන් මේ ගරු සභාවේ ඉදිරිපත් වෙච්ච හැම කාරණයක් ගැනම ඇමතිතුමාත් එක්ක පෞද්ගලිකව කථා කරලා, විසඳුම් ලබා දෙන්න. මම හිතනවා මේ ප්‍රශ්නය විසඳන්න හොඳම අවස්ථාව මේකයි කියලා. විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයට බලය තිබෙන අවස්ථාව තමයි වතුකරයේ ජනතාවට සුදුසුම වෙලාව. දැන් වතුකරයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට පියවර රාශියකුත් අරගෙන තිබෙනවා. ඒ අයට පර්චස් 7ක අයිතිය, සින්නක්කර අයිතිය දෙනවා. ගෙවල් හදලා දෙනවා. පේළි ගෙවල්වල, ලයිම් කාමරවල හිටපු යුගය අවසන් කරලා ඒ අයටත් පූර්ණ පුරවැසිභාවය සැබෑ ලෙසම ලැබෙන විධියට භූමියේ අයිතිය, නිවසක අයිතිය කියන ඒ සියල්ල දෙන ගමන් අධ්‍යාපනයේ අඩු පාඩුත් සම්පූර්ණ කරනවා. විශේෂයෙන්ම අපි දකිනවා, වතුකරයේ දරුවන් බොහොම දක්ෂ බව. හොඳට අධ්‍යාපනය ලබලා, අද ඒ දරුවන් ඉදිරියට එනවා. ඉස්සර වාගේ, වතු කම්කරුවාගේ දරුවා වතු කම්කරුවෙක්ම විය යුතුය කියන සංකල්පය අපි නැති කර තිබෙනවා. අපි මේ සියලු කාරණා අමාත්‍යතුමාගේ අවධානයට යොමු කර, හැකිතාක් ඉක්මනින් වතුකරයේ දිස්ත්‍රික්කවල පාසල්වලට උසස් පෙළ විද්‍යා හා ගණිත විෂය ධාරාව දෙමළ මාධ්‍යයෙන් ලබා දීමට අවශ්‍ය පියවර ගන්න කියලා අපි ඇමතිතුමා දැනුවත් කරනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු ඇමතිතුමනි, ඒ දරුවනුත් ඉංජිනේරුවෙක්, කාර්මික ශිල්පියෙක් වෙන්න හරි කැමැතියි. සිංහල මාධ්‍යයෙන් අපට ඕනෑතරම් උසස් පෙළ ගණිත, විද්‍යා, Arts, Commerce තිබෙනවා. නමුත්, මේ දරුවන්ට දිගින් දිගටම මේ අසාධාරණය 1947 ඉඳලා සිදු වුණු දෙයක්. ඒ නිසා ඔබතුමන්ලා මේ ගැන විශේෂයෙන්ම සැලකිලිමත් වෙන්න. විශේෂයෙන් ඔබතුමා ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිවරයෙක් නිසා අපි ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරනවා. ගාල්ල දිස්ත්‍රික්කයේත් වතුකර ජනතාව විශාල වශයෙන් ඉන්නවා. ඒ අයත් අපේ දරුවන් විධියට සලකලා, ඒ දරුවන්ට මේ අවස්ථාව ලබා දීමට කැප වෙන්න, උනන්දු වෙන්න, මැදිහත් වෙන්නය කියලා අපි ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. ඔබතුමා කෙරෙහි අප තුළ යම් ආකාරයක විශ්වාසයක් තිබෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.21ට, 2019 අගෝස්තු මස 23 වන සිකුරාදා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி.ப. 6.21 மணிக்கு பாராளுமன்றம், 2019 ஓகஸ்ட். 23, வெள்ளிக்கிழமை மு.ப.10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 6.21 p.m. until 10.30 a.m. on Friday, 23rd August, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து
அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.